*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Leader of the House to move the Adjournment.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Adjournment Motion to be moved by the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 12 minutes.

## 2026 මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ දක්වා ඇති රාජ්‍ය මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම
## நிதி செயல்நுணுக்கக் கூற்று, 2026இல் குறிப்பிடப்பட்டுள்ள அரச நிதி இலக்குகளின் சாதனை
## ACHIEVEMENT OF PUBLIC FINANCE OBJECTIVES SET OUT IN FISCAL STRATEGY STATEMENT, 2026

[පූ.භා. 9.52]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "නිදහසින් පසු මෙරට මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදයට හේතු වූ ප්‍රධානතම සාධකය වන්නේ රාජ්‍ය මූල්‍ය විනය පිරිහීමයි. පැවති සියලු ආණ්ඩු සිය දේශපාලන වාසි සහගත දේ පිළිබඳව අවධානය යොමු කිරීම හේතුවෙන් රට දරුණු ආර්ථික අර්බුදයකට මුහුණ දෙද්දී, එහි කටුක සහ නීරස ප්‍රතිඵල භුක්ති විඳීමට සිදු වූයේ මෙරට සාමාන්‍ය දුක් විඳින මිනිසුන්ට සහ සුන්දර ළමාවියක් අපේක්ෂා කරන දරුවන්ට බව අප සියලුදෙනා අවිවාදිතව පිළිගත යුතුය.
>
> රටක රාජ්‍ය මූල්‍ය මනා විනිවිදභාවයකින් සහ වගකීමෙන් යුතුව කළමනාකරණය කිරීම හරහා ඉතා වෙහෙස මහන්සියෙන් උපයා, ගෙවනු ලබන මහජනතාවගේ බදු මුදල් සාධාරණව රටේ සංවර්ධනයට යෙදවීමේ වගකීම විධායකයට මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව පරිදි මෙම ගරු සභාවට තිබේ. කටුක අතීතයක් උරුම කර දුන් සැබෑ වරදකරුවන් හඳුනාගෙන ඔවුන් නීතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කරන අතරතුරම නැවත කිසිදා එවන් අවාසනාවන්ත තත්ත්වයක් ඇති නොවීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාව සහ වගකීම ජාතික ජන බලවේග රජය සැබෑ ලෙසම හඳුනාගෙන ඇත.
>
> ඒ අනුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි 11(2) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලැබූ, "මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය" මඟින් උපාය මාර්ගික රාජ්‍ය මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වූ මධ්‍යකාලීන මාර්ග සිතියම (2026-2030) දක්වා ඇත. එම අරමුණු කරා රට මෙහෙයවීමේ වගකීමත්, එහි ප්‍රතිලාභ ජනතාවට අත්පත් කරදීමේ වගකීමත් මහජන නියෝජිතයන් වන අප සියලුදෙනාට ඇති බැවින්, "මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය" තුළ සඳහන් ඉලක්ක ළඟා කර ගැනීමට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අදාළ සියලු සහායන් ලබා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 10වෙනි වගන්තියෙහි දක්වනවා, රටේ මූල්‍ය කළමනාකරණය පිළිබඳව රජයට යම් වගකීම් ටිකක්. මොනවාද, ඒ වගකීම්? සාර්ව ආර්ථික ස්ථාවරත්වය, රටේ ආර්ථික වර්ධනය, පරම්පරා අතර සාධාරණත්වය කියන එම කාරණා සම්බන්ධයෙන් ආණ්ඩුව වග වෙන්න ඕනෑ. ඒ කියන්නේ accountability එක තිබෙන්න ඕනෑ; කාර්යක්ෂම වෙන්න ඕනෑ; සාධාරණ වෙන්න ඕනෑ; විනිවිදභාවයෙන් යුතුව වැඩ කරන්න ඕනෑ; තිරසර - sustainable - විධියට මූල්‍ය කළමනාකරණය කරන්න ඕනෑ.

ඒ වාගේම පනතේ 10වන වගන්තියේ වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයක තිබිය යුතු අරමුණු සඳහන්ව තිබෙනවා. ඒ අරමුණු තමයි, රාජ්‍ය ණය තිරසර මට්ටමකට අඩුකර පවත්වාගෙන යන බවට සහතික වීම, අනාගත කම්පනවලින් ආරක්ෂා වෙන්න පුළුවන් ආකාරයට රටේ සංචිත පවත්වාගෙන යෑම, මූල්‍ය අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම - ඒ කියන්නේ, ගරු ඇමතිතුමා කිව්වා වාගේ අපි පූර්ව පුරෝකථනයන්ගෙන් විතැන්වීම තමයි අවදානම කියන්නේ - විනය සහ විනිවිදභාවය සහතික කිරීම, වාර්ෂික මූල්‍ය ක්‍රමෝපායක් සහ පස් අවුරුදු මධ්‍ය කාලීන මූල්‍ය රාමුවක් ස්ථාපිත කිරීම, ආණ්ඩුවේ මූල්‍ය කාර්යයන් ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම.

මෙම පනතේ 11වන වගන්තියට අනුව අද දින ඉදිරිපත් කරන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ මේ කියන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තමයි මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. දීර්ඝ කාලයක් නැති නිසා මම ඉතා කෙටියෙන් මේ වාර්තාවේ සඳහන් යම් කාරණා ටිකක් කියන්නම්. අද ඉදිරිපත් කරලා තිබෙන මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ පහත මූලික කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එකක් තමයි, රජයේ මධ්‍ය කාලීන මූල්‍ය ක්‍රමෝපාය. ඒ කියන්නේ, ඉදිරි වැඩ පිළිවෙළ. ඊළඟට දක්වලා තිබෙනවා, සංඛ්‍යාත්මක මූල්‍ය ඉලක්ක. ඒ කියන්නේ, විශේෂයෙන් ණය අඩු කරන එක, ප්‍රාථමික ශේෂය ඉලක්ක සහ ප්‍රාථමික වියදම් සීමාව වාගේ කාරණා. ඒ වාගේම ඒ ඉලක්කවලට පාදක වෙන්න පුළුවන්, රජයේ උපාය මාර්ගික ප්‍රතිපත්ති ප්‍රමුඛතා - priorities - දක්වලා තිබෙනවා; උපකල්පන දක්වලා තිබෙනවා. ඒ වාගේම වැදගත් ලෙස පාර්ලිමේන්තුවේ අධීක්ෂණය සහ මහජන වගකීම් සඳහා වන යන්ත්‍රණය ඉදිරිපත් කරලා තිබෙනවා.

මේ වාර්තාවෙන් ගත්ත යම් දත්ත ප්‍රමාණයක් ගැන මම ඉතා කෙටියෙන් කියන්නම්. ප්‍රාථමික ශේෂයේ ඉලක්කය 2025 සිට 2030 වසර දක්වා කාල සීමාව තුළ දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් සියයට 2.3ක්. 2026 වසර සඳහා ප්‍රාථමික වියදම් සීමාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13කට සීමා කර තිබෙනවා. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 12.9ක් ලෙස පුරෝකථනය කර තිබෙනවා.

රාජ්‍ය ණය පහත හෙළීමේ අරමුණ ගත්තොත්, 2032 වසර වනවිට රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95කට පහත හෙළීමට, -ඒ කියන්නේ 2022දී මේක සියයට 119ක්ව තිබුණා.- දිගුකාලීන වශයෙන් ක්‍රමයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60කට වඩා අඩු මට්ටමකට එය ගෙන ඒමට බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අතිරේක ඉලක්ක ලෙස බලාපොරොත්තු වෙනවා, 2026 වසරේ සිට රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15ක් ඉක්මවීම, රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීම සහ 2028 වසර වනවිට සමස්ත අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5කට වඩා පහළ මට්ටමකට අඩු කිරීම වැනි කාරණා.

2024දී අපි ඉදිරි දැක්මක් ලෙස ඉදිරිපත් කර තිබෙනවා, 2024දී ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2ක් දක්වා ළඟා වෙන්න. අපි ඒ මට්ටමට ළඟා වුණා. එය පුරෝකථනය කරපු අගය වන සියයට 0.8 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. සමස්ත අය වැය හිඟය 2023 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.3 සිට 2024දී සියයට 6.8 දක්වා අඩුවෙලා තිබෙනවා. ප්‍රාථමික අතිරික්තය නිසි පරිදි පුළුල් වීම හේතුවෙන් 2025 වසරේ ආර්ථිකයේ ධනාත්මක වර්ධනය අඛණ්ඩව පවතිනු ඇතැයි අපි පුරෝකථනය කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා එක්කම මම තවත් වැදගත් කාරණයක් කියන්නට ඕනෑ. ගෝලීය වශයෙන් දකුණේ රටවල් විශේෂයෙන්ම මේ කාලයේ මුහුණ දෙන ණය අර්බුදය තනි හුදෙකලා, එක පාලකයෙකුගේ වැරැද්දෙන් සිදු වුණු දෙයකට වඩා, නිදහසින් පස්සේ සිද්ධ වෙච්ච සමස්ත ආර්ථික ක්‍රියාවලියේම ප්‍රතිඵලයක් ලෙස තමයි අපි තේරුම් ගන්නේ. විශේෂයෙන් ජාත්‍යන්තර මට්ටමේ දේශපාලන ආර්ථික විශ්ලේෂණවරියක් වන ජයති ගෝෂ් කියනවා, මේකට ඇත්තටම තිබෙනවා කියලා යටත් විජිත උරුමයක්, colonial legacy එකක්. මොකක්ද ඒ? ඒ කියන්නේ, යටත් විජිත රාජ්‍යවලින් raw materials විධියට අරගෙන ගිහිල්ලා බටහිර කාර්මික රටවල් නිෂ්පාදනය කරපු භාණ්ඩ ගෙනෙන යටත් විජිත විධි ක්‍රමය විසින් තමයි දිගින් දිගටම පශ්චාත් යටත් විජිත කාලයේත් මෙන්න මේ කියන යැපීම, - ගෝලීය දකුණේ රටවල්, ගෝලීය උතුරේ රටවලින් යැපීම - කියන ක්‍රමය පවත්වාගෙන ගිහින් තිබෙන්නේ කියලා ඇය සඳහන් කරනවා. ඒකට කියනවා, "peripheral capitalism" කියලා. ඒ කියන්නේ, පරිධියේ තිබෙන ධනවාදයත්, විශේෂයෙන් පශ්චාත් යටත් විජිත රටවල.

අපි ශ්‍රී ලංකාව උදාහරණයකට ගනිමු. නිදහස ලැබුවායින් පසුව ශ්‍රී ලංකාවේ පත් වෙච්ච හැම පාලකයෙක්ම වාගේ නිෂ්පාදන ආර්ථිකය වෙනුවට අර කියන විධියේ යටත් විජිත ක්‍රමය පවත්වාගෙන යනවා. ඒ කියන්නේ, නව ලිබරල් ප්‍රතිසංස්කරණ තමයි මේ ක්‍රමයේ තිබෙන හොඳම ක්‍රමය විධියට භාර ගැනීම. ඒක taken for granted නිසා අපි වාගේ රටවල නිෂ්පාදනය පුළුල් කිරීමේ හැකියාව ගිලිහී ගිහින් තිබෙනවා. මේ නව ලිබරල් model එක දේවත්වයෙන් අදහපු පාලකයන් විසින් මේ ක්‍රමය පවත්වාගෙන යන්න දිගටම කටයුතු කරමින් සිටිනවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට ලෝකයේ ණය ගැනීම පිළිබඳ ක්‍රමය ඇති වනවා. එතකොට ඒ ණය, ඇත්තම කිව්වොත් රටවල් යටත් කර ගන්නා ආකාරයක, නව යටත් විජිතවාදී ණය බවට මේ වනකොට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම මේ පාලකයින් ණය අරගෙන ඒවා නිෂ්පාදනය සඳහා එහෙම නැත්නම් ආදායම උපයන ව්‍යාපෘති බවට පත් කළේ නැහැ. ඒවා දූෂිත ව්‍යාපෘතිවලට විනිවිදභාවයකින් තොරව යෙදෙව්වා. ඒ වාගේම යම් කොටසක් හොරකම් කරගෙන විලාසිතාවට වාගේ කිසිම අවශ්‍යතාවක් නැතුව හදනවා, project එකක්. හම්බන්තොට හදනවා 5,000කට ඉන්න පුළුවන් සම්මන්ත්‍රණ ශාලාවක්. මම එක උදාහරණයක් විතරයි මේ කියන්නේ. ඉතින් මේවායේ මිල ගෙව්වේ හැමදාම වැඩ කරන පන්තියේ ජනතාව. අද කාලයේ මේ ණය උගුලෙන් ගැලවෙන්න අපි පාවිච්චි කරන ප්‍රතිකර්ම, උපක්‍රම සඳහා වූ ඒවායේ මිලත් ගෙවන්නේ අන්තිමට බැලුවාම වැඩ කරන ජනතාවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ භයානකම තත්ත්වය තමයි මහජනයාගේ මුදල් කෙරෙහි වගවීමක් නැති, අදූරදර්ශී දූෂිත පාලකයින් රට බංකොලොත් කරන තෙක්ම මහජනතාව ඒවා ප්‍රශ්න නොකර, මේක තමයි ක්‍රමය කියලා භාර ගැනීම. මේක තමයි ලංකාව ඇතුළු ගෝලීය දකුණේ බොහෝ රටවලට අද වෙද්දී අත්වෙලා තිබෙන ඉරණම. හැබැයි, 2022දී මහජනතාව පාරට බැස්සා. ලංකාවේ මිනිස්සු මේ දූෂිත ක්‍රමය ප්‍රතික්ෂේප කරලා නව ක්‍රමයක් ඉල්ලා සිටියා. ඒ ඉල්ලා සිටියේ මේ සම්පූර්ණ system එකේ change එකක්. හිටපු පාලකයින් එළවා දමා අලුත් අලුත් මුහුණු විතරක් නොවෙයි, අලුත් system එකක් ගෙනාවා. 2024දී අපි භාර ගත්තේ අන්න ඒ වාගේ රටක්; ඒ වාගේ අපේක්ෂාවන් ගොඩක්.

අපි හිතන විධියට අපට බලය ලැබුණා කියන්නේ මොකක්ද? බලය කියන්නේ වගකීමක්. ඒ වගකීම අපේ උරහිස් මත තිබෙනවා; අපේ හදවතේ බරට තිබෙනවා. මිනිස්සු ඓතිහාසිකව පවරපු දශක ගණනක වගකීමක් තමයි අපි 2024 නොවැම්බර් මාසයේදී භාර ගත්තේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපට ඒ බරින්, ඒ වගකීමෙන් මිදෙන්න බැහැ. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අපි මූල්‍ය විනිවිදභාවය - ඒ කියන්නේ වග වීම - වෙනුවෙන්, මිනිස්සුන්ගේ සල්ලිවලට වග වෙන්න පුළුවන් ක්‍රමයක් වෙනුවෙන් මේ වෙනස කරගෙන යන්නේ; මේ වැඩ කරගෙන යන්නේ. ඒ නිසා මේ මූල්‍ය ක්‍රමෝපාය වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලබා දෙමින් රටේ පද්ධතියේ වෙනසක් කරන්න, ක්‍රමයේ වෙනසක් කරන්න, තවදුරටත් මේ දූෂිත ක්‍රමය නොවන, වග වන, විනිවිදභාවය ඇති කාර්යක්ෂම මූල්‍ය විනයක් පවත්වාගෙන යන්න මේ ගෙන ආ යෝජනාවට සහයෝගය දක්වන්න කියා මා ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Wijesiri Basnayake to second the Motion. You have 11 minutes.

[පූ.භා. 10.03]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - Fiscal Strategy Statement එක - මඟින් ඒ උපායමාර්ගික රාජ්‍ය මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වූ මධ්‍යකාලීන මාර්ග සිතියම (2026-2030) දක්වා තිබෙනවා. එම අරමුණු කරා රට මෙහෙයවීමේ වගකීම සම්බන්ධයෙන් ගරු කෞශල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආ යෝජනාව ස්ථිර කරමින් මම කැමැතියි, මේ විවාදයට සම්බන්ධ වෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, නිදහසින් පසු බලයට ආපු ඒ විවිධ ආණ්ඩු ක්‍රියාත්මක කරපු ආර්ථික ප්‍රතිපත්තිවල තිබුණු ව්‍යුහාත්මක - structural - වාගේම මූලධර්ම දෝෂ සහ ඒ වැරදි ආර්ථික කළමනාකරණය හේතුවෙන් ලංකාවේ ආර්ථිකය තුළ ගැටලු ගණනාවක් මතු වුණු බව. එහි උච්චතම අවස්ථාව උදා වුණේ 2022 වර්ෂයේ. අපි දැක්කා, 2022 වසරේ මුල් භාගයේ ශ්‍රී ලංකාව බංකොලොත් රාජ්‍යයක් බවට පරිවර්තනය වන ආකාරය. ශ්‍රී ලංකා මහ බැංකුව 2022 අප්‍රේල් 12වන දා ශ්‍රී ලංකාව බංකොලොත් රාජ්‍යයක් බවට නිල වශයෙන් ප්‍රකාශ කළා. මෙන්න මේක තමයි මෑත ඉතිහාසයේ රටක් විධියට අප මුහුණ දුන් බරපතළම, දරුණුතම ආර්ථික අර්බුදය. එයට ප්‍රධාන සාධකය වන්නේ මොකක්ද? මේ රටේ රාජ්‍ය මූල්‍ය විනය පිරිහීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු රාජ්‍ය පාලකයින් දේශපාලනික මතවාද කරපින්නා ගෙන, ඒ පෙළඹවීම් මත බොහොම අවදානම් සහගත ආර්ථික තීන්දු තීරණ ගන්නවා අපි

[ගරු විජේසිරි බස්නායක මහතා]

දැක්කා. ඒ වාගේම, 2019 නොවැම්බර් මාසයේ රාජ්‍ය අය බදු මහා පරිමාණයෙන් කපා හරිනවා අපි දැක්කා. ඒ නිසා මොකක්ද වුණේ? පිරිහෙමින් තිබූ රාජ්‍ය ආදායම් අනුපාතය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට තවදුරටත් උග්‍ර පිරිහීමකට භාජනය වුණා. ඒ විතරක් නොවෙයි, එවකට පැවැති රජය රසායනික පොහොර භාවිතය කෘෂි කර්මාන්තයට තහනම් කළා. ඒ වාගේම, රාජ්‍ය වියදම් ගෙවන්න අඛණ්ඩව මුදල් අච්චු ගැහුවා. එමෙන්ම පොලී අනුපාත ද පහළ මට්ටමකට ගෙන ආවා; විදේශ විනිමය අනුපාතය පාලනය කළා. මෙන්න මේ විධියට යනකොට අපේ දළ විදේශ සංචිත ආරක්ෂා කර ගන්න බැරුව ඉතා වේගයෙන් පරිහෙන ආකාරය අපි දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ නිසා 2022දී පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට අපි මුහුණ දුන්නා. මෙහි බලපෑම - impact එක - මේ රටේ දිළිඳු කොටස්වලට, ඒ වාගේම අවදානමට ලක් වූවන්ට පමණක් නොව සමාජයේ සියලුම ස්ථරයන්ට තදින් දැනෙන්න ගත්තා. රටේ උද්ධමනය ඉහළ ගියා; ශ්‍රී ලංකා රුපියල දැඩි ලෙස අවප්‍රමාණය වුණා. ඒ වාගේම, විදේශ සංචිත ටිකෙන් ටික ක්ෂය වෙලා ගියා. එහි ප්‍රතිඵලයක් විධියට මේ රට තුළ ඉන්ධන හිඟයක් ඇති වුණා, ඖෂධ හිඟයක් ඇති වුණා, අමු ද්‍රව්‍ය, ආහාර ද්‍රව්‍ය ආදි සියල්ල හිඟ වුණා, විදුලියත් විසන්ධි වුණා. ඒ හේතුවෙන් මේ සමාජය තුළ ඉතා දැඩි අසහනකාරී තත්ත්වයක් නිර්මාණය වුණා. ඒ වැරදි දේශපාලන තීන්දු මේ රටේ ආර්ථිකයට බලපෑවා. ඒ හරහා මේ සමාජය තුළ දැවැන්ත පරිහාණියක්, බෙදවාවකයක් නිර්මාණය වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ඇති වූ ආර්ථික අර්බුදය මෙන්න මේ හේතුවල ප්‍රතිඵලයක් විධියට තමයි අප දකින්නේ.

විශේෂයෙන්ම 2022 වර්ෂයේදී විදේශ රටවලට ගෙවිය යුතු ණය, විශේෂයෙන්ම බහු පාර්ශ්වීය ණය ගෙවන්න ශ්‍රී ලංකාවට බැරි වුණා. ඒක නිල වශයෙනුත් ප්‍රකාශයට පත් කළා. එම නිසා මේ රටේ දැවැන්ත ආර්ථික අර්බුදයක් නිර්මාණය වුණා. ඒක පාලනය කරන්න - ඒක සමනය කරන්න - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පනත් කෙටුම්පතක් සම්මත කර ගත්තා. ඒ තමයි, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත. ඒ පනත යටතේ ඒ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - Fiscal Strategy Statement එක - අද ඔබතුමන්ලාට දකින්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොත වන විට ලංකාව ඒ ආර්ථික අර්බුදයේ ඉඳලා ආර්ථික ස්ථායීතාව දක්වා ඇවිත් ඒ තිරසාර වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යැම සඳහා වන ගමනක යනවා. මෙන්න මේ සඳහා නායකත්වය දෙන්නේ ජාතික ජන බලවේගය ආණ්ඩුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව අද දවසේ අප සාකච්ඡා කරන මේ මූල්‍ය ප්‍රකාශය තුළින් ඔබට දකින්න පුළුවන්, ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ ආර්ථිකය මනා ලෙස කළමනාකරණය කරන්නේ කොහොමද කියලා. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත පදනම් කරගත් මූල්‍ය වගකීම් රාමුවක් - framework එකක් - තිබෙනවා. ඒ පනතට අනුව මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය වාර්ෂිකව සකස් කරලා ප්‍රකාශයට පත් කරන්න සිදු වෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි අද -ජූනි මාසයේ 30වන දා- අප ඔබ හමුවේ මේ "මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026" ඉදිරිපත් කරන්නේ.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 10වන වගන්තියේ පැහැදිලිව සඳහන්ව තිබෙනවා, වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට අදාළ අරමුණු මොනවාද කියලා. ඒ වාගේම, එහි සඳහන්ව තිබෙනවා එම අරමුණු ළඟා කර ගැනීමේදී එයට බාධා වෙන්න පුළුවන් මූල්‍ය අවදානම්වල ප්‍රධාන විභවයන් මොනවාද කියලා. එහෙම නම්, මෙන්න මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මනා ලෙස අධ්‍යයනය කිරීමෙන් ඔබතුමන්ලාට මේ පිළිබඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන්. විශේෂයෙන්ම මේ තුළ අපි සඳහන් කරනවා, අප විසින් ළඟා කර ගත යුතු ඉලක්ක මොනවාද කියන එක, අරමුණු මොනවාද කියන එක.

එහි මූලිකවම තිබෙනවා ප්‍රාථමික ශේෂ ඉලක්කය. 2025-2030 දක්වා අවුරුදු 5ක කාල පරිච්ඡේදයේදී අපි අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක වර්ධනයක් පවත්වා ගෙන යැම සිදු කළ යුතු වෙනවා. ඒ වාගේම ප්‍රාථමික වියදම් සීමාව ගත්තොත්, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13කට සීමා කර තිබෙනවා. 2026 වර්ෂය සඳහා මේ ඉලක්කය සියයට 12.9ක් වනවා. එසේම මෙහි තිබෙන අනෙක් අරමුණ තමයි රාජ්‍ය ණය පහත හෙළීමේ අරමුණ. අපට ඉලක්කයක් තිබෙනවා. ඒ තමයි 2032 වන විට රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95ක් දක්වා පහත හෙළීම. මෙන්න මේ මූලික අරමුණු එක්ක තවත් අතිරේක ඉලක්ක කිහිපයක් තිබෙනවා. ඒවා නම්, 2026 සිට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15ක් ඉක්ම වීම, රාජ්‍ය ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4කට වඩා ඉහළින් පවත්වාගෙන යැම, 2028 වන විට සමස්ත අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5කට වඩා පහළ මට්ටමකට ගෙන ඒම යනාදියයි. මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - Fiscal Strategy Statement එක - තුළ ඒ ඇස්තමේන්තු, දත්ත පැහැදිලි කර තිබෙනවා.

මේ මොහොත වන විට පවතින කාර්යසාධනය සහ අපේ ඉදිරි දැක්ම ගත්තොත්, 2024දී ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2ක් - රුපියල් බිලියන 650ක් - දක්වා ළඟා වුණා. ඒ කියන්නේ, පුරෝකථනය කරපු අගය 0.8කින් ඉක්මවා ගිහින් තිබෙනවා. ඒ වාගේම, 2023 අවුරුද්දේදී සමස්ත අය වැය හිඟය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.3ක් වනවා. 2024 වනකොට එය සියයට 6.8 දක්වා අඩු කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. බදු ප්‍රතිසංස්කරණ, මනා බදු පරිපාලනය හේතුවෙන් 2024දී රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13.7ක් දක්වා වැඩිදියුණු වෙලා තිබෙනවා. මේ මොහොත වන විට අපි මේ වසරේ ඉලක්ක අබිබවා ගිහින් තිබෙනවා. විශේෂයෙන්ම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව තමන්ට ලබා දුන් ඉලක්කවලින් එහාට ගිහින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාථමික අතිරික්තය නිසි පරිදි පුළුල් වීම හේතුවෙන් 2025 අවුරුද්දේ ආර්ථිකයේ ධනාත්මක වර්ධනය අඛණ්ඩව පවතිනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. මේ අවුරුද්දේ මුල් කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 4.8ක අගයක් වෙත ළඟා කර ගැනීමට අපට හැකි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි මෙන්න මේ විධියට ප්‍රතිපත්තිමය, ව්‍යුහාත්මක පියවර රාශියක් ගෙන තිබෙනවා. මා ඉස්සෙල්ලාත් පැහැදිලි කළ පරිදි මේ බදු ප්‍රතිසංස්කරණ හරහා අපේ ඉලක්ක පහු කරලා අවශ්‍ය ආදායම ළඟා කර ගන්න අපට හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම, රජය සතු ව්‍යවසායයන් මනාව ප්‍රතිසංස්කරණය කරලා, රාජ්‍ය වියදම අඩු කරලා, ඒවායේ සේවකයන්, වෘත්තීය සමිති, ඒවායේ කළමනාකරණය එක්ක එකතු වෙලා ඒ රාජ්‍ය ව්‍යවසායයන් ලාභ ලබන තැනට ගෙන එන්න අපට හැකි වෙලා තිබෙනවා.

මේ මොහොත වන විට ජාතික ජන බලවේගය රජය අනුගමනය කරපු ඒ ක්‍රියාදාමය නිසා අපේ අපනයන ආදායම වේගයෙන් වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ සෘජු විදේශ ආයෝජනත් වැඩි වෙලා තිබෙනවා. මෙන්න මේ තුළින් පැහැදිලි වෙනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රට සම්බන්ධයෙන්; විශේෂයෙන්ම අප පොරොන්දු වෙච්ච ඒ

පොහොසත් රට, ඒ ලස්සන ජීවිතය ගත කරන්න අවශ්‍ය දැවැන්ත නායකත්වය සපයනවා කියා. මෙන්න මේ පිළිබඳව තමයි අද මේ විවාදය පැවැත්වෙන්නේ. මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතියි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order under Standing Order No. 26 (3).

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Ravi Karunanayake, what is your point Order?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, the Public Financial Management Act is in vogue at the present time. Section 11 of the Act very clearly stipulates that the Fiscal Strategy Statement must come up with certain minimum parameters. Section 11(4)(a) states, I quote:

> "provide the Parliament and the public with a formal statement of the Government's fiscal strategy…."

In the process, it is required to give the following, Sir. Section 11(5)(b) states, I quote:

> "include proposed timeframe for the reduction of public debt to sustainable level;"

Then, Section 11(5)(c) states, I quote:

> "explain how the Government's fiscal targets and polices are consistent with the objectives of responsible fiscal management;"

Section 11(5)(e) (iii) states, I quote:

> "an assessment of expected compliance with the fiscal targets for the next financial year and the four succeeding years;"

The next one is, Section 11(5)(g), which states, I quote:

> "disclose the macroeconomic impact of fiscal decisions taken over the past three years."

Only half of that information is in front of us, Sir. This is the first time the Public Financial Management Act is coming into play. The most important thing is the public debt fiscal reduction and I do not see that given in this Statement, Sir. The Fiscal Strategy Statement is there. The Act gives that there are minimum requirements that you need to comply with and that compliance is not to be seen.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Thank you very much, Hon. Ravi Karunanayake. All the required provisions are given in the Public Financial Management Act, No. 44 of 2024. But, this is basically the Fiscal Strategy Statement. The indicators with regard to debt sustainability and how best we are going to achieve those are in our Annual Borrowing Plan. There are other requirements as well and those would come later. But, as far as this particular Statement is concerned, we have clearly mentioned that we are reaching that particular target of 95 per cent of the GDP by 2032. Even in the Debt Sustainability Analysis - DSA - there is a possibility that that level could be further brought down to somewhere around 90 per cent. These details would be dealt with accordingly then and there in different statements.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Shall we proceed with the Debate? - *[Interruption.]* Hon. Ravi Karunanayake, you are listed to speak later on and you have 15 minutes to speak on this. You can bring this matter up then. - *[Interruption]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
It is the main point of debating this Statement under this Act. So, there is no point in discussing it without your four-year target, which is a specific requirement under this Act. That is what is expected by this Act.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Anyway, we listened to the Hon. Minister.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
The medium term plan is for four years and how best we are planning to achieve those targets is stipulated here. So, our plan is to achieve those revenue targets subject to risk assessment. Identification of risk variables and how best we are going to mitigate them, all those things are stated in this Fiscal Strategy Statement.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Minister, it is not there. That is the reason why I raised it.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
It is there.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, could we go ahead with the Debate?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
It is there. There are two sections, Part I and Part II.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කියන කාරණය ගත්තොත්, එතැන කිසිම විවාදයක් නැහැ. අපි major statement එක table කරලා තිබෙනවා. ඒ එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට අනුබද්ධ තවත් විස්තර වාර්තා දෙකක් අපි කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා තිබෙනවා. ඒ පිළිබඳව අද විවාදයේදී අපි කරුණු ඉදිරිපත් කරනවා. අපි ප්‍රධාන වශයෙන් සභාගත කරලා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වූ -ජුනි 30ට පෙර ඉදිරිපත් කළ යුතු- ප්‍රධාන ලියවිල්ල තමයි මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙන්නේ. මීට අදාළ අනෙක් වාර්තා දෙකත් කැබිනට් මණ්ඩලය අනුමත කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කියන්න තිබෙන්නේ මෙකයි. අපි පළමුවෙනි වතාවට තමයි මෙය විවාදයට පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ. ඒක එකක්. කරුණාකරලා - *[බාධා කිරීමක්]* ඒ ප්‍රතිපත්ති ප්‍රකාශය හරි විධියට ගෙනෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විවාදය දැනුයි පටන් ගත්තේ. විවාදය තුළදී ඉතුරු documents දෙක පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරනවා. අපේ කථිකයෝ 17දෙනෙක් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ 17දෙනා විසින් රටේ ජනතාවට පාර්ලිමේන්තුව මඟින් නීත්‍යානුකූලවත්, අපි දේශපාලන වශයෙනුත් බැඳී තිබෙන එම වාර්තා පිළිබඳ කරුණු ඉදිරිපත් කරනවා. අපි ප්‍රධාන වාර්තාව table කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, විවාදය තුළදී ඒ පිළිබඳව කරුණු දැනගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, shall we proceed with the next speaker?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. (Dr.) Harsha de Silva?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, just to add something as the Chairman of the Committee on Public Finance. ගරු සභානායකතුමා, මේ පනත ඉදිරිපත් කරනකොට ඇත්ත වශයෙන්ම එදා ඔබතුමන්ලා විරුද්ධ වුණා. හැබැයි, අද මේක ඉදිරිපත් කරනවා. මම කියන්න හදන්නේ මේකයි. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, you are the next speaker, by the way.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
පොඩ්ඩක් ඉන්නකෝ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ පනතේ points 8ක් තිබෙනවා, ගරු සභානායකතුමා. මම යෝජනා කරන්නේ මෙච්චරයි. මේක තර්කයක් නොවෙයි. අපි ඒ points 8 explain වෙන විධියට මේක reformat කළොත් - මම කියන්නේ නැහැ, මේකේ නැහැ කියලා. මේකේ තැන් තැන්වල තිබෙනවා. අපි සැහෙන තර්ක කරලා තමයි එදා මේ පනත pass කර ගත්තේ. පළමුවැනි වරට ඉදිරිපත් කරන නිසා මේ document එක reformat කළොත් මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා කියන එකයි මගේ යෝජනාව.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත අපේ ආණ්ඩුවෙන් සම්මත කළ පනතක් නොවෙයි. නමුත් අපි රටේ නීතියට අනුව කටයුතු කරන්න අවශ්‍යයි. එම නිසා තමයි අපි අද විශේෂ රැස්වීම් දිනයක් යොදා ගෙන මෙය ඉදිරිපත් කරන්නේ පළමු වතාවට, එම වගකීම ඉටු කරමින්. මෙම ප්‍රධාන වාර්තාවට අමතරව තවත් අනුබද්ධ අනුවාර්තා දෙකක් තිබෙනවා. ඒ පිළිබඳ තොරතුරු පනතට අනුකූලව අපි සභාවට අද විවාදයේදී ඉදිරිපත් කරනු ලබනවා. අපි ප්‍රධාන document එක ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is, Hon. Mujibur Rahman. You have 18 minutes at your disposal.

[පූ.භා. 10.22]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ආණ්ඩු පාර්ශ්වය විසින් සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව යටතේ ආණ්ඩුවේ මධ්‍ය කාලීන ඉදිරි වැඩ පිළිවෙළ සම්බන්ධව, ආදායම් වැඩි කර ගැනීම සම්බන්ධව, ඉදිරි ආර්ථික සැලසුම් සම්බන්ධව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධව කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි කථා කරන මේ යෝජනාව තුළ තිබෙන ඉතාම වැදගත් ආයතනය තමයි රේගුව. අපේ රටේ රාජ්‍ය ආදායම වැඩි කරගන්න, රාජ්‍ය ආදායම ඉහළ දමන්න තිබෙන එක ආයතනයක් තමයි රේගුව. එහි තිබෙන කාර්යක්ෂමතාව පිළිබඳව අපි කථා කරනවා. පසුගිය කාලයේ රේගුවට අදාළව ආන්දෝලනාත්මක සිදුවීම් රාශියක් වුණා. හැම ආණ්ඩුවක් කාලයේම රේගුව සම්බන්ධයෙන් සිදුවීම් හුඟක් වෙලා තිබෙනවා.

මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ ජනවාරි මාසයේ රේගුවේ බහලුම් තදබදයක් ඇති වෙලා ආන්දෝලනාත්මක සිදුවීමක් සිද්ධ වුණා. ඒක තමයි රේගුවේ තිබුණු බහලුම් 323ක් රේගුවෙන් පිට කළාය කියන චෝදනාව. එසේ චෝදනාවක් එල්ල වුණාම, ඒ ගැන පරීක්ෂා කරන්න ජනාධිපතිතුමා යම් කමිටුවක් පත් කළා. 2025 ජනවාරි මාසයේ 30 වැනි දා තමයි ඒ කමිටුව පත් කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම කමිටුවේ සභාපතිවරයා හැටියට ඒ.කේ. සෙනෙවිරත්න, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්; ඒ.පී. කුරුම්බලපිටිය, අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව; ඊ.එම්.එස්.බී. ජයසුන්දර, අතිරේක ලේකම් (පාලන), ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය; එම්.කේ. ප්‍රදීප් කුමාර, අධ්‍යක්ෂ ජනරාල්, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව; එම්.කේ.එස්.පී. ජයවර්ධන, රේගු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ කටයුතු කළා. එම කමිටුවේ කැඳවුම්කරු හැටියට කටයුතු කළේ, ආචාර්ය විශාඛා විජේරත්න ඇලපාත, අධ්‍යක්ෂ, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව.

ආනයන බහලුම් 323ක් පිටමං කිරීම සිද්ධ වෙලා තිබෙන ප්‍රශ්නය පිළිබඳව පරීක්ෂා කරලා වාර්තාවක් ඉදිරිපත් කරන්නය කියලා ජනාධිපතිතුමා මේ කමිටුව තමයි පත් කළේ. එම කමිටුව 2025.05.22 දක්වා රැස් වෙලා තිබෙනවා. ඊට පස්සේ 2025 ජූනි මස 12 වෙනිදා මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වාර්තාව ඉදිරිපත් කරලා අද වෙනකොට සති දෙකකට වාගේ ආසන්න කාලයක් වෙනවා. අද ජූනි මාසයේ 30. තවම මේ වාර්තාව එළියට ආවේ නැහැ. පාර්ලිමේන්තුවට සභාගත කළේත් නැහැ. අපි නොයෙකුත් දේවල් ඇහුවාම ආණ්ඩුවේ ඇමතිවරු නොයෙකුත් දේවල් කිව්වා "එහෙම හොරකමක් වෙලා නැහැ. එහෙම වංචාවක් වෙලා නැහැ. අපි මේක සද්භාවයෙන් කළේ. මේකේ විනිවිදභාවයක් තිබෙනවා" කියලා. අපේ ඇමතිවරු විශාල ප්‍රමාණයක් එදා වෙච්ච සිදුවීම සාධාරණීකරණය කරලා කථා කළා.

"ආනයන බහලුම් 323ක් රේගු පරීක්ෂාවකින් තොරව නිදහස් කර ඇතැයි පළ වන ප්‍රවෘත්ති පිළිබඳව සිදු කළ පරීක්ෂණයේ කමිටු වාර්තාව" මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

මොකද, මේ වාර්තාව ඔබතුන්ලාගේ පැත්තෙන් ඉදිරිපත් වෙන්නේ නැති නිසා, අපි හරි මේ වාර්තාව ගෙනැල්ලා සභාගත කරන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලා වාර්තා කිසිවක් එළියට දාන්නේ නැහැ නේ. ඉන්දියාව එක්ක ගහපු ගිවිසුම් එළියට ආවෙත් නැහැ. චීනය එක්ක ගහපු ගිවිසුම් එළියට එන්නෙත් නැහැ. ඔක්කෝම ගිවිසුම් ටික ජනාධිපති ලේකම් කාර්යාලයේ පෙට්ටියේ දාලා වහලා තියා ගෙන ඉන්නවා. ඒ වාගේම මේ වාර්තාවත් පෙට්ටියේ දා ගෙන ඉන්නවා. මේ වාර්තාව එළියට දාන්නෙත් නැහැ. ඒ නිසා අපිට සිද්ධ වෙනවා, ඔබතුමන්ලාගේ කාර්යභාරය කරන්න. මොකද, ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂය හැටියට ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාට දෙන වාර්තාවත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැහැ. අපිට සිද්ධ වෙනවා හොයා ගෙන හෝ ඇවිල්ලා මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. රටේ ජනතාව දැන ගන්න ඕනෑ, ආනයන බහලුම් 323ට මොකද වුණේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාර්තාවේ කරුණු ගණනාවක් හෙළිදරව් කරලා තිබෙනවා. පිටු අංක 6හි "නිරීක්ෂණ" කියන කාරණාව යටතේ, පැහැදිලිවම එතුමන්ලා මේ කාරණය සඳහන් කරනවා. දැන් මේ රේගුවේ අවදානම් කළමනාකාරිත්වය යටතේ 'රතු' ලේබල් කියලා බහාලුම් වර්ගයක් තිබෙනවා, 'කහ' ලේබල් කියලා බහලුම් වර්ගයක් තිබෙනවා, 'කොළ' ලේබල් කියලා බහාලුම් වර්ගයක් තිබෙනවා. 'රතු' ලේබල් එක ගැහුවාම කියන්නේ, ඒ රතු ලේබල් කන්ටේනර් වර්ගය භෞතික පරීක්ෂාවට හා ස්කෑන් පරීක්ෂාවට ලක් කරන්න ඕනෑ කියන එකයි. 'කහ' ලේබල් එක තිබෙන කන්ටේනර් වර්ගය සාම්පල් පරීක්ෂාවට ලක් කරන්න ඕනෑ, ස්කෑන් පරීක්ෂාවටත් ලක් කරන්න ඕනෑ. 'කොළ' ලේබල් එක තිබෙන බහලුම් වර්ගයේ documents විතරක් පරීක්ෂා කරලා යවන්න පුළුවන්, ඒකෙදී භෞතික පරීක්ෂාව අවශ්‍යත් නැහැ, ස්කෑන් පරීක්ෂාව අවශ්‍යත් නැහැ. මේක තමයි රේගුවේ කළමනාකරණය සම්බන්ධව; අවදානම් කළමනාකාරණය සම්බන්ධව ඒගොල්ලන්ගේ ප්‍රතිපත්තිය. මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියන එක තමයි මේ පරීක්ෂණ වාර්තාව තුළ හෙළිදරව් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පරීක්ෂණ වාර්තාව දෙස බලනකොට අපිට පෙනෙන දෙයක් තිබෙනවා. විශේෂයෙන්ම මේ කමිටු වාර්තාවේ 6වන පිටුවේ තුන්වන ඡේදයේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "......ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව තුළ බහලුම් නිදහස් කිරීමේ ක්‍රමවේදය, මෙම අවදානම් කළමනාකරණ පද්ධතිය මඟින් වර්ගීකරණය සිදුකරන ආකාරයට අනුව නිර්ණය කරනු ලබයි. එනම්, "රතු" ලෙස පද්ධතිය මඟින් නම් කරන බහලුම් භෞතික හා ස්කෑන් පරීක්ෂාවන්ට යොමු කරන අතර "කහ" ලෙස වර්ගීකරණය වන බහලුම් සාම්පල් පරීක්ෂාවක් සහ/හෝ ස්කෑන් පරීක්ෂාවකටත් ද, "කොළ" ලෙස වර්ගීකරණය වන බහලුම් භෞතික හෝ ස්කෑන් පරීක්ෂාවකින් තොරව ලියකියවිලි පරීක්ෂාව මත පමණක් නිදහස් කිරීම සිදු කරනු ලබයි."

මේ, මෙම වාර්තාවේ කියලා තිබෙන දේ. මම දැන් කියපු දේ ඒ ගොල්ලෝ කියලා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණාව මෙයයි. මේ වාර්තාවේ පිටු අංක 7හි දෙවැනි ඡේදයේ මෙසේ සඳහන් වනවා:

"රේගු ආඥා පනතේ 2වන වගන්තියේ, 'The Director-General of Customs shall throughout Sri Lanka, have the general Superintendence of all matters relating to Customs.' වශයෙන් සඳහන් වේ. (ඇමුණුම 10)

කෙසේ නමුත්, රේගු ආඥා පනතේ මෙම වගන්තිය කිසිදු අවස්ථාවක දී රාජ්‍ය ප්‍රතිපත්තියක් හෝ ජාතික ආරක්ෂාව යන්න ව්‍යතිරේකයක් ලෙස සඳහන් කර නොමැති නිසා භෞතික පරීක්ෂාවකින් තොරව 'රතු' ලෙස හඳුනා ගනු ලබන බහලුම් නිදහස් කිරීම නිවැරදි තීරණයක් නොවන්නේය."

කවුද මේ කියන්නේ? ජනාධිපතිතුමා පත් කළ කමිටුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඊළඟට පිටු අංක 10ට යමු . පිටු අංක 10හි මෙසේ සඳහන් වෙනවා:

"ඒ අනුව, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රේගු පරිශ්‍රය තුළ උද්ගත වූ බහලුම් තදබදය සමනය කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුව තුළ නීත්‍යානුකූලව ස්ථාපිත කර තිබූ අවදානම් කළමනාකරණ පද්ධතිය මඟින් හඳුනා ගන්නා ලද ඉහළ අවදානමක් සහිත එනම් 'රතු' ලෙස වර්ගීකරණය කරන ලද බහලුම් භෞතික පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීමට ලබා දුන් නියෝගය අනුව පත්කළ කමිටුවක් මඟින් බහලුම් නිදහස් කිරීම ක්‍රියාවලිය මඟින්;"

ඒ කියන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා කමිටුවක් පත් කරලා ඒ කමිටුවට බලය දීලා තිබෙනවා, රතු ලේබලය සහිත කන්ටේනර් නිදහස් කිරීම සම්බන්ධව පරීක්ෂා කරලා කටයුතු කරන්න කියලා.

පිටු අංක 10හි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"iii. බහලුම් තදබදය නැති කිරීමේ යහපත් චේතනාවෙන් මෙම නිදහස් කිරීම සිදුකළ බව පැවසුවත්, එමඟින් පිළිගත් ක්‍රියා පටිපාටිවලින් අපගමනයක් සිදුවී ඇති බව."

මේ කවුද කියන්නේ? මේ කමිටුව කියන්නේ. මේ බහලුම් පිට කිරීමේදී අපගමනයක් සිදු වෙලා තිබෙනවා. මේ තදබදය නැති කිරීමේ යහපත් චේතනාවක් තිබෙන්න පුළුවන්. නමුත් මේක තුළ යම් කිසි ආකාරයේ දූෂණයක් සිදු වෙලා තිබෙනවා කියලා ඒ ගොල්ලන් කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිටු අංක 11හි මෙසේ සඳහන් වෙනවා:

"ඒ අනුව, රේගු දෙපාර්තමේන්තුව තුළ නීත්‍යානුකූල අනිවාර්ය ක්‍රියාවලියක් වන අවදානම් කළමනාකරණ පද්ධතිය මඟින් තෝරා ගනු ලබන ඉහළ අවදානම් 'රතු' ලේබලය සහිත බහලුම් භෞතිකව පරීක්ෂාවකින් තොරව සහ එකී බහලුම්වලින් කොටසක් ස්කෑන් පරීක්ෂාවකින් පමණක් නිදහස් කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පනතින් ප්‍රකාශිත බලයක් හෝ ඇඟවෙන (Implied) බලයක් නොමැති අතර, ඔහු රේගු ආඥා පනතේ යටතේ ලබා දී ඇති නීත්‍යානුකූල අධිකාරියේ විෂය පථයෙන් ඔබ්බට ක්‍රියාකර ඇති බව නිරීක්ෂණය වේ."

ඒ කියන්නේ ඔහුට දීලා තිබෙන බලය ඔහු අනිසි ලෙස පාවිච්චි කරලා තිබෙනවා. ඒ බලයෙන් එහාට - ඔබ්බට - ගිහින් තිබෙනවා. එතකොට ඔහු බලය අවභාවිත කරලා තිබෙනවා. ඒ අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ක්‍රියාකලාපය ගැන මේ කමිටුව කියලා තිබෙනවා.

ඊළඟට තව හොඳ වැදගත් කරුණක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිටු අංක 11හි, කමිටුවේ ක්‍රියාකාරිත්වය යටතේ අංක 2. වශයෙන් මෙසේ සඳහන් වෙනවා:

"... (ප්‍රස්තුත ගැටලුව වූයේ රේගුව පත් කළ කමිටුවක් විසින් බහලුම් 323ක් නිදහස් කිරීම වුවත් සත්‍ය වශයෙන්ම කමිටුව විසින් 2025 ජනවාරි 18 දින නිදහස් කළ බහලුම් ප්‍රමාණය 309කි.)"

මාධ්‍යවල 323ක් කියලා කිව්වාට, ඇත්තටම නිදහස් කරලා තිබෙන්නේ 309යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රේගු අධ්‍යක්ෂ ජනරාල්තුමා කමිටුවක් පත් කරලා තිබෙනවා. Red-labelled containers ටික නිදහස් කිරීම සම්බන්ධව මේ කමිටුව තමයි තීන්දු කරන්නේ.

පිටු අංක 12හි, අංක 2 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"2. අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් සීවලී අරුක්ගොඩ මහතාගේ ලිඛිත ප්‍රකාශය අනුව නිලධාරීන් තිදෙනෙකුගෙන් (03) යුතු කමිටුවක් ඉහතින් සඳහන් කළ 'රතු' ලේබල් සහිත, ඉහළ අවදානම් බහලුම් භෞතික පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීම සඳහා ඔහු විසින් නිර්දේශ කර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත එය කළ බවත්, එම කමිටුවේ අධීක්ෂණ කටයුතු ඔහු විසින් සිදු කළ බවත් ප්‍රකාශ කරන ලදී. මෙහිදී, ඔහු විසින් තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ කමිටුවේ වගකීමකින් හා පාරදෘශ්‍යභාවයකින් කටයුතු කිරීම සඳහා නිලධාරීන් තිදෙනෙකු (03) සහ එම කමිටුවේ කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම තමා විසින් භාරගත් බවත්, එමඟින් භාණ්ඩ නිදහස් කිරීම සඳහා තීරණ ගැනීමේදී අවම වශයෙන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් (02) සහභාගිත්වය ලබා ගැනීම අපේක්ෂා කළ බවයි."

ඒ කියන්නේ, එතුමා තුන් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළා. ඒ කමිටුව අධීක්ෂණය කිරීමේ වගකීම තමන් භාර ගත්තා. අඩුම ගණනේ ඒ කමිටුවේ දෙදෙනෙක් ඉන්න ඕනෑ මේ කාර්ය භාරය කරන්න කියලා එතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. ජනාධිපතිතුමා පත් කළ කමිටුව ගැන.

තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"එසේ වුවද, ප්‍රස්තුත බහලුම් 309 නිදහස් කිරීම සිදුකළ, එනම් 2025 ජනවාරි 18 දින රැස්වූ කමිටුව සඳහා සහභාගි වී ඇත්තේ එක් කමිටු සාමාජිකයකු පමණකි."

තුන් දෙනෙක් ඉන්න ඕනෑ. රැස්වෙන්න අඩුම ගණනේ දෙදෙනෙක් ඕනෑ.

එතකොට මේවා නිදහස් කරන්න එක කමිටු සාමාජිකයායි ඉඳලා තිබෙන්නේ. එකී කමිටු වාර්තාවේ 12 සහ 13වැනි පිටුවල තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"...එනම්, එස්.ඒ.ටී.බී. සුරවීර මහතා පමණි. කමිටුවේ අධීක්ෂණ නිලධාරියා ලෙස කටයුතු කළ සීවලී අරුක්ගොඩ මහතා ද එදින බහලුම් නිදහස් කිරීමේ ක්‍රියාවලිය සඳහා සහභාගි වී ඇති අතර, ඒ අනුව බහලුම් නිදහස් කිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු (02) සහභාගි වුව ද, සීවලී අරුක්ගොඩ මහතා එම කමිටුවේ අධීක්ෂණ නිලධාරියා වන බැවින්, ඔහු බහලුම් නිදහස් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධවීම තුළින් බහලුම් නිදහස් කිරීමේ අධීක්ෂණ කාර්ය සිදු වී නොමැති අතර, එදින රැස් වූ, එනම්, 2025 ජනවාරි 18 කමිටුවේ කාර්යභාරය කිසිදු නිලධාරියෙකුගේ අධීක්ෂණයකට ලක් වී නොමැත."

ඒ කියන්නේ අධීක්ෂණ නිලධාරිතුමාත් මේ කමිටුවේ සාමාජිකයකු හැටියට ගිහිල්ලා තිබෙනවා, මේ බහලුම් නිදහස් කරන්න. ඔහුට එහෙම බලයක් නැහැ. ඔහු ඉඳලා තිබෙන්නේ ඒක

අධීක්ෂණය කරන්න. කමිටුවට තුන්දෙනෙක් පත් කළාම කමිටුවේ ඉඳලා තිබෙන්නේ එක්කෙනයි. දෙදෙනෙක් ඉන්න ඕනෑ. දෙවැනියා වශයෙන් ඉඳලා තිබෙන්නේ කවුද? අධ්‍යක්ෂ ජනරාල්තුමා. මේක අධීක්ෂණය කරන්න ඉන්න එතුමාත් ගිහිල්ලා දෙවැනියා හැටියට කමිටුවේ වාඩි වෙලා තිබෙනවා. එහෙම වාඩි වෙලා ඒ ගොල්ලෝ තමයි මේවා නිදහස් කරලා තිබෙන්නේ. මේක නීතිවිරෝධී කියලා මේ කමිටුව කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණාව මෙයයි. පිටු අංක 13හි මෙසේ සඳහන් වෙනවා:

"2025 ජනවාරි 18 දින රැස් වී බහලුම් 309ක් නිදහස් කිරීමේදී පහත සඳහන් පරිදි, අනුමත කාර්යභාරයෙන් හා නිර්ණායකවලින් බැහැරව කමිටුව විසින් ක්‍රියා කර ඇති බව නිරීක්ෂණය වේ."

ඒ කියන්නේ, ඒ අනුමත කරපු කාර්යභාරයෙන් එළියට ගිහිල්ලා ඒ ගොල්ලෝ වැඩ කරලා තිබෙනවා කියලා නිරීක්ෂණය වෙනවා. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"කමිටුව සඳහා බලය ලබා දී තිබුණේ අවදානම් කළමනාකරණ පද්ධතිය මඟින් 'රතු' ලෙස වර්ගීකරණය කරන ලද බහලුම් ස්කෑන් පරීක්ෂාවකින් පසු භෞතික පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීම සඳහා නැවත මාර්ගගත (re-route) කිරීමටයි. නමුත්, කමිටුව විසින් 'කහ' ලෙස වර්ගීකරණය කරන ලද බහලුම් 158ක්ද නිදහස් කර තිබුණි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කමිටුවට බලය තිබුණේ "රතු" ලෙස වර්ගීකරණය කරන ලද කන්ටේනර් නිදහස් කරන්න විතරයි. "කහ" ලෙස වර්ගීකරණය කරන ලද කන්ටේනර් නිදහස් කරන්න බලය දීලා තිබුණේ නැහැ. නමුත්, කමිටුව මොකක්ද කරලා තිබෙන්නේ? "කහ" කන්ටේනර් කියලා හඳුනා ගත්ත ඒවා අනිවාර්යයෙන්ම ස්කෑන් පරීක්ෂාවට ලක් කරන්න ඕනෑ, samples check කරන්න ඕනෑ. අන්න ඒ වර්ගයේ කන්ටේනර් 158ක් මේ කමිටුව මඟින් නිදහස් කරලා තිබෙනවා. ඒ ගොල්ලන්ට අයිති නැති දෙයක් කරලා තිබෙනවා. කමිටුව පත් කරන්නේ, "රතු" ලෙස වර්ගීකරණය කරන ලද අවදානම් සහිත ඒවා නිදහස් කිරීම පිළිබඳව තීරණය ගන්න. නමුත්, කමිටුව ඒ ගොල්ලන්ට අයිති නැති කහ ලේබල් එක ගහපු 158ක් නිදහස් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම වාර්තාවේ 13වන පිටුවේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"අවදානම් කළමනාකරණ පද්ධතිය මඟින් 'රතු' ලෙස වර්ගීකරණය කරන ලද බහලුම් නිදහස් කිරීමට ප්‍රථම ස්කෑන් පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, 'රතු' ලෙස වර්ගීකරණය කරන ලද බහලුම් 151 අතුරින් බහලුම් 37ක් ස්කෑන් කර නොතිබුණි."

ඒ කියන්නේ, අඩුම ගණනේ ඒවා නිදහස් කරනකොට ස්කෑන් කරන්න ඕනෑය කියලා තිබෙනවා. එතැන බහලුම් 151ක්. ඒ 151න්, 37ක් ස්කෑන් කරන්නේ නැතුව නිදහස් කරලා තිබෙනවා. ඉතින් මේක තමයි සැකය. ඉතින් එහෙම කළාම ඒ සැකය සාධාරණ නැද්ද? තමුන්නාන්සේලාට කියන්න පුළුවන්ද, ඒ සැකය අසාධාරණයි කියලා?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahman, you have two more minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Deputy Speaker, on behalf of the Chief Opposition Whip, I would request you to give him five more minutes. The Hon. Gayantha Karunathilleka is not here.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 37ක් ස්කෑන් කරලා යවන්න තිබුණත් අපට පෙනෙනවා, එම 37 ස්කෑන් කරලා නැති බව. එම පිටුවේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"විශේෂයෙන් භෞතික පරීක්ෂාවකින් තොරව නිදහස් කරන 'රතු' වර්ගීකරණය යටතේ වූ ඉහළ අවදානම් සහිත බහලුම් අවම වශයෙන් ස්කෑන් පරීක්ෂාවට ලක් කර, එකී බහලුම්වල අවදානම් සහිත භාණ්ඩ නොතිබුණු බවට ලබාගත හැකිව තිබූ අවම තහවුරු කිරීම ද මෙම ස්කෑන් පරීක්ෂාව සිදු නොකිරීම හේතුවෙන් මග හැරී ඇත."

ඒ කියන්නේ, ස්කෑන් කළා නම් අඩුම ගණනේ අවදානම් ඒවා තිබෙනවාය කියලා හරි හඳුනාගන්න තිබුණා. නමුත් ස්කෑන් කරන්නේ නැතුව තමයි නිදහස් කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් වැදගත් කාරණාවක් සම්බන්ධයෙන් එහි තවදුරටත් මෙසේ ද සඳහන් වනවා:

"එමෙන්ම, ඉහත පරිදි ස්කෑන් කරන ලද බහලුම් සම්බන්ධයෙන් එකී ස්කෑන් ක්‍රියාවලිය සිදු කළ නිලධාරින් විසින් තබා තිබූ සටහන් නිරීක්ෂණය කිරීමේදී ඇතැම් බහලුම්වල විවිධ වර්ගයේ සහ සමානත්වයෙන් වෙනස් භාණ්ඩ නිරීක්ෂණය වන බැවින් එකී බහලුම්වල අඩංගු ද්‍රව්‍ය හා ප්‍රමාණය තහවුරු කර ගැනීම සඳහා භෞතික පරීක්ෂාවක් සිදු කළ යුතු බව සටහන් කර තිබුණි."

ඒ කියන්නේ, ඒවා පරීක්ෂා කරලා යවනකොට ඒ ස්කෑන් කරපු නිලධාරින් සටහනක් දාලා තිබුණා, අනිවාර්යයෙන්ම මේක භෞතික පරීක්ෂාවට ලක් කරන්න කියලා. එම නිලධාරින් එහෙම සටහනක් දාලා තිබියදීත් තමයි ඒ බහලුම් ටික එළියට ගිහිල්ලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ වැදගත් කාරණාව තමයි පිටු අංක 14හි තිබෙන කාරණාව. එම වාර්තාවේ පිටු අංක 14හි මෙසේ සඳහන් වනවා:

"කමිටුව පත් කිරීම සිදු කළ ලිපියට අනුව 'කහ' ලෙස වර්ගීකරණය කරන ලද බහලුම් නිදහස් කිරීම පිළිබඳව බලය ලබා දීමක් සිදු නොවුවද, 2025 ජනවාරි 18 දින රැස් වූ කමිටුව විසින් 'කහ' ලෙස වර්ගීකරණය කරන ලද බහලුම් 158ක් භෞතික පරීක්ෂාවකින් තොරව නිදහස් කර තිබූ අතර, එම බහලුම්වලින් ද බහලුම් 103ක් සඳහා ස්කෑන් පරීක්ෂාවක්ද සිදු කර නොතිබුණි."

ඒ කියන්නේ, කහ channel එක යටතේ තිබෙන ස්කෑන් පරීක්ෂාව කරන්න ඕනෑ බහලුම් 103ක් ස්කෑන් පරීක්ෂාව නොකර එළියට දාලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙලාව පිළිබඳ ප්‍රශ්නය නිසා හුඟක් කාරණා මට මඟ හැරිගෙන යනවා. නමුත් මම මේ වාර්තාව සභාගත කළා; සියලුදෙනාට බලන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට තවත් වැදගත් කාරණාවක් ගැන එම වාර්තාවේ 16වැනි පිටුවේ මෙසේ සඳහන් වනවා:

"... 2025.01.17 දින නිදහස් කරගෙන ඇත. ඒ අනුව, එම බහලුම් දෙක කමිටුව රැස්වී, බහලුම් නිදහස් කිරීමේ තීරණය ලබා දුන් දින වන 2025 ජනවාරි 18 දිනට පෙර රේගු පරිශ්‍රයෙන් භෞතික පරීක්ෂාවකින් තොරව ඉවත් කර ගැනීම ප්‍රශ්න සහගත බැවින්, ඒ සඳහා අදාළ අනුමැතිය ලබා දුන් ආකාරය පිළිබඳ රේගු අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු කළ යුතුය."

මොකක්ද ඒ? ඒ කියන්නේ, 2025 ජනවාරි 18වැනි දින තමයි තීන්දු කරන්නේ, මේ containers ටික නිදහස් කරන්න ඕනෑය කියලා. 2025 ජනවාරි 18වැනි දින ඒ තීන්දුව ගන්නකොට 2025

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ජනවාරි මාසයේ 17වැනි දා, ඒ ලැයිස්තුවේ තිබුණු containers දෙකක් එළියට ගිහිල්ලා තිබෙනවා. තීන්දුව ගන්න කලින්, භෞතික පරීක්ෂාවකින් තොරව ඒ containers එළියට ගිහිල්ලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒක අර අර්ච්චුනා කියන containers දෙකද කියලා. ඔය එළියට ගියේ ඒ containers දෙකද දන්නේ නැහැ. 18වැනි දායි තීන්දුව ගන්නේ, containers 309 එළියට දමමු කියලා. නමුත්, 17වැනි දා containers දෙක එළියට ගිහිල්ලා තිබෙනවා. කොහොමද එහෙම වෙන්නේ? මේක මාර අවුලකට ගිහිල්ලායි තිබෙන්නේ. මේ දූෂණය සම්බන්ධව, මේ වංචාව සම්බන්ධව ජනාධිපතිතුමා පත් කළ කමිටුවම තමයි මෙහෙම කියන්නේ. මේ, අපි හදපු වාර්තා නොවෙයි.

මේ වාර්තාව තුළින් තව හොඳ කාරණාවක් ඔවුන් එළිදක්වා තිබෙනවා. එහි පිටු අංක 28හි මෙසේ සඳහන් වනවා:

> "බහලුම් නිදහස් කිරීම සඳහා පත් කළ කමිටුව විසින් 2025 ජනවාරි 18 දින නිදහස් කළ ඉහළ අවදානමක් ඇති 'රතු' වර්ගීකරණය යටතේ වන බහලුම් 151 අතුරින් බහලුම් 114ක් ස්කෑන් පරීක්ෂාවකට ලක් කර ඇති අතර, එම ස්කෑන් පරීක්ෂාවේදී ඇතැම් බහලුම්වල අඩංගු ද්‍රව්‍ය හා ප්‍රමාණයන් පිළිබඳව අවිනිශ්චිතතාවක් තිබෙන බවත් ඒවා වැඩිදුර විමර්ශනය කරන ලෙස අදාළ බහලුම් ස්කෑන් කරන ලද නිලධාරින් ලිඛිතව දන්වා තිබියදීත්, ඒ පිළිබඳව අවධානය යොමු නොකර අදාළ බහලුම් නිදහස් කිරීම මඟින් ඒ සඳහා වගකිව යුතු නිලධාරින් තම රාජකාරි වගකීම පැහැර හැර ඇති අතර, එකී නිලධාරින්ට විරුද්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය"

මේවා ස්කෑන් කළ පසු නිලධාරින් කියා තිබෙනවා, මේ බහලුම් 151න්, 114ක් අනිවාර්යයෙන්ම භෞතික පරීක්ෂාවට ලක් කරන්න කියලා. එහෙම තීන්දුවක් ලිඛිතව ලබා දී තිබියදීත් ඒක ගණන් ගන්නේ නැතුව මේවා එළියට දමා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, red label ගහපු බහලුම් 37ක් ස්කෑන් පරීක්ෂාවක් නොකර එළියට දාලා තිබෙනවා. බලාගෙන යනකොට අපට දැන් පෙනෙනවා, මේකේ සිදු වෙලා තිබෙන දේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahman, you have two more minutes left of your additional time.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ජනාධිපතිතුමා පත් කළ කමිටුව මඟින් ඉදිරිපත් කළ මේ වාර්තාවෙන් කරුණු ගණනාවක් පැහැදිලිවම පෙන්වා තිබෙනවා. මේ containers 309 නිදහස් කිරීම තුළ විශාල දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා. ඇයි මේක වහන්න උත්සාහ කළේ? ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් ඇවිල්ලා TVවලට, මාධ්‍යවලට voice-cuts දුන්නේ ඇයි, මේක හරි, මේක හරියට වෙලා තිබෙනවා කියලා. මෙතැනදී හොරකමක් සිද්ධ වෙලා නැහැයි කිව්වා. ඇයි මේක වැහුවේ? අපට සැකයක් තිබෙනවා, තමුන්නාන්සේලාට මැතිවරණවලට උදවු කරපු ව්‍යාපාරිකයන්ගේ බහලුම් ද මේ එළියට දැම්මේ කියලා. එදා ගෝඨාභය රාජපක්ෂ බදු අඩු කළා. ගෝඨාභය බලයට ඇවිල්ලා තමන්ට උදවු කරපු ව්‍යාපාරිකයන්ගේ බද්ද එදා අඩු කළා. ඒක රාජ්‍ය ආදායම අඩු වෙන්න එක හේතුවක්. එහෙමනම් තමුන්නාන්සේලා රාජ්‍ය ආදායම අඩු කරගත්තා, තමුන්නාන්සේලාට උදවු කරපු ව්‍යාපාරිකයන්ගේ containers ටික හොර පාරෙන් එළියට ආලා. ඒ සැකය, ඒ අවිශ්වාසය අපට තිබෙනවා. ඒකට තමුන්නාන්සේලා උත්තර දෙන්න ඕනෑ.

ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඇයි, CID එක මේ ගැන විමර්ශනය නොකරන්නේ? CID එකේ මේ සම්බන්ධයෙන් පැමිණිලි තිබෙනවා. ඇයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මේක ගැන විමර්ශනය නොකරන්නේ? ඒකේත් මේ සම්බන්ධ පැමිණිලි තිබෙනවා. ඒ සියලුදෙනාම නිශ්ශබ්දයි. ඇයි ඒ අය එලෙස නිශ්ශබ්දතාව රකින්නේ? ඇයි, CID එකෙන් ඒ විමර්ශනවලට නොයන්නේ? CID එකෙන් අනෙක් විමර්ශනවලට යනවා නේ. ජනාධිපතිතුමාට විරුද්ධව මොකක් හරි බොරුවක් කියපු ගමන් CID එකෙන් ඒ ගැන විමර්ශන පටන් ගන්නවා, හෙට ඉඳන්. ඒකට තිබෙන හදිස්සිය, වුවමනාව containers 309ක් නිදහස් කිරීමේ සිද්ධිය ගැන නැත්තේ ඇයි? මේක රටේ ආන්දෝලනාත්මක සිද්ධියක්. මේක ගැන වාර්තා නොකරන්නේ, මේක ගැන නොසොයන්නේ ඇයි කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අවසාන වශයෙන් මේ කාරණයත් මම කියනවා. අපි දන්නවා, මහ බැංකු සිද්ධියේදී රනිල් වික්‍රමසිංහට චෝදනාව එල්ල වුණු බව. ඇයි, එතුමාට චෝදනාව එල්ල වුණේ? මහ බැංකු සිද්ධියේදී රනිල් වික්‍රමසිංහ මහත්මයාට චෝදනාව එල්ල වුණේ මහ බැංකුව තිබුණේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ යටතේ හින්දා. හොඳට මතක තියාගන්න, අද රේගුව තිබෙන්නේ ජනාධිපතිතුමාගේ යටතේ කියලා. ඒක හින්දා මේ චෝදනාවෙන් අනුර කුමාර ජනාධිපතිවරයාටත් ගැලවෙන්න බැහැ. එදා රනිල් වික්‍රමසිංහට ඒකේ වගකීම දරන්න සිද්ධ වුණා වාගේ අනුර කුමාර දිසානායකටත් මේකේ වගකීම දරන්න වෙනවාය කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම සඳහන් කරලා තිබුණා. Sir, give me 30 seconds; not one minute, but 30 seconds.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you 15 seconds.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir. මගේ නම සඳහන් කරලා තිබුණා. ඒ containers 323 ගැන කියනවාට වඩා ගොඩක් දේවල් මට කියන්න තිබෙනවා. මම ඇතුළේ කියපු කථාවට CID එකෙන් මාව කැඳවා මට තර්ජනය කළා. ඊට වඩා ගොඩක් දේවල් මට කියන්න තිබෙනවා. මම ඒවා කියන්න කැමැතියි. හැබැයි ඒවා කියන්න භයයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

That is not a point of Order, Hon. Member. Anyway, you have an allocation today and you can speak about it then.

The Hon. (Dr.) Upali Pannilage. You have 15 minutes.

[පූ.භා.10.46]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි විවාදයට ලක් කරන්නේ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙන් පැවරෙන නීතිමය ප්‍රතිපාදන අනුව ඉදිරිපත් කරන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පිළිබඳවයි. මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි කියන භාෂාත්‍රයෙන් අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රකාශය පිළිබඳ විවාදයේදී කරුණු දෙකක් මතු කළා. ඉන් එකක් විධියට එක මන්ත්‍රීවරයෙක් නැඟිටලා කිව්වා, මේ ප්‍රකාශයේ නිශ්චිතවම ඉලක්ක සඳහන් කරලා නැහැ කියලා. විපක්ෂයේම තවත් මන්ත්‍රීවරයෙකු ඊට ප්‍රතිපක්ෂව අදහස් ඉදිරිපත් කරමින් කිව්වා, ඉලක්ක තිබෙනවා, නමුත් ඒවා නිවැරදිව පෙළ ගස්වලා නැහැ, ඒ නිසා ඒක reformat කරන්න ඕනෑය කියලා. ඊටත් වඩා හාස්‍යයට ලක් වන කරුණ මේකයි. තවත් මන්ත්‍රීවරයෙකු මේ ප්‍රකාශය පිළිබඳව අදහස් ඉදිරිපත් කරනවා වෙනුවට අපේ ගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබූ කමිටුවක වාර්තාවක් ගෙන හැර දක්වමින්, ඒ කමිටු වාර්තාවේ තිබුණු සමහර කරුණු තමන්ට අවශ්‍ය විධියට හුවා දක්වමින් වෙනම කථාවක් කරලා ඒ කමිටු වාර්තාව සභාගත කරනවාය කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුව විසින් පත් කළ කමිටුවක, කමිටු වාර්තාව මහ ජනතාවට දැනගැනීම සඳහා අපි අනිවාර්යයෙන්ම ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාව ඉදිරිපත් කිරීම පිළිබඳව අපි නැවතත් බෙහෙවින් සතුටට පත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත්, මේ කථා අහගෙන ඉන්නකොට රටේ ජනතාවට හිතෙනවා ඇති, මේගොල්ලන් නින්දෙන් අවදි වෙලා ද එහෙමත් නැත්නම් නැවත වතාවක් පුනරුත්පත්තිය ලබලා ද කියලා. මොකද, මේ එක්කෙනෙකු පසුගිය කාලයේ මාධ්‍ය සන්දර්ශන ගොඩක් තිබ්බා නේ. මාධ්‍ය සන්දර්ශන තියාගෙන තියාගෙන ගියා, කොළඹ මහ නගර සභාවේ බලය පිහිටුවන එක සම්බන්ධයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තමන්ගේම පක්ෂයේ නායකයෝ අමතක කරලා ඒකපාර්ශ්වික මාධ්‍ය සාකච්ඡා තියාගෙන දැවැන්ත මෙහෙයුමක් කළා. ඒ මෙහෙයුමෙන් ඇති වෙච්ච හිත් වේදනාව දැන් දරා ගන්න බැරිව මේ සභාවේ වෙනත් මාතෘකා සාකච්ඡා කරන අතරතුර මේ කොහේ දෝ නැති, "යන්නේ කොහේද මල්ලේ පොල් වාගේ" ප්‍රකාශ ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට නම් මේක තේරුම් ගන්න පුළුවන්. මොකද, මේගොල්ලන් දශක ගණනාවක් මේ රටේ පාලනයට සම්බන්ධ වෙලා මේ රටේ ජනතාවට අත් කර දීලා තිබෙන ආර්ථික අර්බුදයත්, මේ රටේ ජනතාව පත් කර තිබෙන සමාජයීය අර්බුදත්, ඔවුන් ඇදගෙන ගිහින් තිබෙන සංස්කෘතික ව්‍යසනයත් පිළිබඳව අපට ඉතාම හොඳ අවබෝධයක් තිබෙනවා. ඒ වාගේම මේ රටේ මහ ජනතාවත් ඒ පිළිබඳව හොඳ අවබෝධයකින් ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි ඉදිරිපත් කර තිබෙන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අපේ අවධානයට යොමු කරන ඉතා වැදගත් අංශ කිහිපයක් තිබෙනවා. මා මෙහිදී ඉතාම වැදගත්කොට සලකන ප්‍රධාන කරුණු තුනක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එයින් පළමුවැනි කරුණ තමයි, රාජ්‍ය මූල්‍ය විනය ආරක්ෂා කිරීම. අපි රටක් විධියට මහ ජනතාවගේ මුදල්, රාජ්‍ය මුදල් පරිහරණය කරනකොට ඒවා විනිවිදභාවයකින්, විනයානුකූලව භාවිත කරන්න ඕනෑ වාගේම ආරක්ෂා කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ජනාධිපතිතුමා නිතරම කියපු දෙයක් තමයි මහ ජනතාවගේ බදු මුදල්, භාණ්ඩාගාරයට ලැබෙන බදු මුදල් අපි සාංඝික දේපොළ වාගේ ආරක්ෂා කරනවා කියන එක. ජනතාවගේ මුදල් තමයි අපි රජයක් විධියට, ආණ්ඩුවක් විධියට පරිහරණය කරන්නේ. අන්න ඒ නිසා රාජ්‍ය මූල්‍ය විනය ආරක්ෂා කර ගැනීම, රාජ්‍ය මුදල් ඉතාම සුපරීක්ෂාකාරීව පරිහරණය කිරීම අපි රජයක් විධියට ඉතා වැදගත්කොට සලකනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ දෙවැනි වැදගත් අරමුණ තමයි, ණය බර අඩු කර ගැනීම. ඔබතුමා දන්නවා, 2024 සැප්තැම්බර් 21වැනි දායින් අවසන් වුණු, වසර 47කට ආසන්න කාලයක් තුළ මේ රට ඉතා බරපතළ ණය අර්බුදයක හිර කරනු ලැබූ බව. 2022 වසර වෙනකොට අපේ සමස්ත ණය බර ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 104කට ආසන්න ප්‍රමාණයකට ආවා. මේ ණය ප්‍රමාණයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 38කට ආසන්න ප්‍රමාණයක් විදේශීය ණය. අපි දේශීය මූලාශ්‍රවලින් ණය ගත්තා; විදේශීය මූලාශ්‍රවලින් ණය ගත්තා; ද්විපාර්ශ්වික ණය ගත්තා; බහුපාර්ශ්වික ණය ගත්තා. අන්තිමට අපි ඒ සියල්ල අබිබවා විදේශීය වාණිජ වෙළෙඳ පොළේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර -international sovereign bonds- හරහා ණය ලබා ගත්තා. මෙන්න මේකේ අනිවාර්යය ප්‍රතිඵලයක් විධියට අපිට මේ රට බංකොලොත් රාජ්‍යයක් ලෙස ප්‍රකාශ කරන්න සිදු වුණා. එහෙනම් දැන් අපට සිදු වෙලා තිබෙනවා, අපේ රටේ ණය බර අඩු කර ගැනීමට. අපි දන්නවා, අපේ රටේ ණය බර අඩු කර ගැනීම කියන එක අපට ලෙහෙසි පහසු ඉලක්කයක් නොවෙයි කියන එක. නමුත් මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අපි සඳහන් කරලා තිබෙනවා, අපේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අපේ ණය බර සියයට 95ක සීමාවකට ගේනවා කියලා. 2022දී සියයට 119ක සීමාවේ තිබුණු ණය බර සියයට 95ක සීමාවට ගෙන එන එක මම හිතන්නේ කොහෙන්වත් එන එකක් විධියට නොවෙයි, අපි රජයක් විධියට එකඟ වෙන ඉලක්කයක් විධියට සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ තිබෙන තවත් වැදගත් අරමුණක් තමයි, වියදම් කළමනාකරණය කර ගැනීම. අපි දන්නවා, අපට තිබෙන ආදායම් සීමිත බව. එම නිසා ඒ සීමිත සම්පත්වලින් අපට ලැබෙන සීමිත ආදායම අපි ඉතා ප්‍රවේශමෙන් කළමනාකරණය කරගෙන වියදම් කළ යුතුයි. අන්න ඒ නිසා තමයි දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 13කට ආසන්න අගයක අපේ වියදම් කළමනාකරණය කර ගැනීමට අපි එකඟ වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙන්න මේ අරමුණු ගත්තාම අපේ රාජ්‍ය මූල්‍ය විනය ආරක්ෂා කර ගැනීම, රටක් විධියට අපේ ණය බර අඩු කර ගැනීම වාගේම අපේ වියදම් කළමනාකරණය කර ගැනීමට අපට ඉතාම වැදගත් සිද්ධි, ඉතාම වැදගත් සාධක ලෙස මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය හඳුන්වා දෙන්න පුළුවන්.

[ගරු උපාලි පන්නිලගේ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට මෙහිදී ඉතා වැදගත් කරුණක් මතක් වෙනවා. බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලින්ක් කියන විද්වතා ප්‍රකාශ කරලා තිබෙනවා, "Failing to plan is planning to fail." කියලා. If you fail to plan, that means, you are planning to fail. ඔබ සැලසුම් කරන්න අසමත් වන්නේ නම් එයින් අදහස් වන්නේ ඔබ අසමත් වීම සඳහා සැලසුම් කරනවා කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වසර 47කට ආසන්න කාලය තුළ මේ රටේ ඇතැම් පාලකයෝ අපේ රට අසමත් වීම සඳහා සැලසුම් කළා. අසමත් වීම සඳහා සැලසුම් කිරීමේ ප්‍රතිඵලයක් විධියට තමයි අපේ රට ඉතා බරපතළ ආර්ථික අර්බුදයක නිමග්න වුණේ. එහි උච්චතම අවස්ථාව තමයි 2022 අප්‍රේල් මාසයේ අපි බංකොලොත් රටක් විධියට ප්‍රකාශයට පත් කළේ. මෙන්න මේ අසමත් වීම සඳහා සැලසුම් කරලා අපේ රට අසමත් කරපු පාලකයෝ මම කලින් කිව්වා වාගේ නින්දෙන් ඇහැරිලා අද අමුතුම විධියේ දේශපාලන ව්‍යායාමයක නිරත වෙලා ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපට ඉතාම වැදගත් වනවා, අපේ රටේ ආර්ථිකය ඉතා හොඳින් කළමනාකරණය කිරීම. ඒ නිසා අපි සැලසුම්කරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කරනවා. අන්න ඒ නිසා තමයි, ආර්ථික ස්ථායීතාව ඇති කර ගැනීම සඳහා අපි ඉතා හොඳින් සැලසුම් කරලා කටයුතු කරමින් ඉන්නේ. ඒ වාගේම රජයේ ආදායම් ඒකරාශි කර ගැනීම අපි ඉතාම සැලසුම්සහගතව ඉටු කරනවා. එමෙන්ම ඒ ආදායම් ඒකරාශි කර ගැනීමේ ක්‍රියාවලිය අපි ඉතාම සමීපව මෙහෙයවලා, සමීපව අධීක්ෂණය කරලා ඒ ඉලක්ක ලබා ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ව්‍යායාමයේ ප්‍රතිඵලයක් විධියට මේ මාසයේ 19වැනි දා වෙනකොට අපේ රජයට ආදායම් ලැබෙන ප්‍රධාන ප්‍රභව තුනේම ඉලක්ක අපි අබිබවා ගිහිල්ලා තිබෙනවා. උදාහරණයක් විධියට සඳහන් කළොත්, ජූනි මස 19වැනි දා වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉලක්ක සියයට 101ක් දක්වා ලබා ගැනීමට අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම, ශ්‍රී ලංකා රේගුව ගැන සඳහන් කළා. ඔවුන් සඳහන් කළේ ජනාධිපතිතුමා විසින් පත් කළ කමිටු වාර්තාවක් ගැන. ඒ කමිටු වාර්තාව දෙස බලන ගමන්ම බලන්න, 2025 මුල් මාස 6 තුළ ශ්‍රී ලංකා රේගුව කාර්යක්ෂම ලෙස ඔවුන්ගේ ආදායම් ඉලක්ක සියයට 106 දක්වා ඉහළ නංවාගෙන තිබෙනවා.

අපට ආදායම් ලැබෙන ඊළඟ ප්‍රධාන ප්‍රභවයක් තමයි සුරාබදු දෙපාර්තමේන්තුව. සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් ඉලක්ක සියයට සියය ඉක්මවා තිබෙනවා; 2025 ජූනි මාසයේ 19වැනි දා වෙනකොට සියයට 104ක ආදායම් ඉලක්කයක් අත් කරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව අපේ රජය ඉතාම සැලසුම් සහගතව මූල්‍ය කළමනාකරණයේ යෙදෙනවා කියන එක ඉතා පැහැදිලියි. ඒ වාගේම අපට ආදායම් ලැබෙන ප්‍රධාන ආදායම් ප්‍රභව අපි කාර්යක්ෂමව මෙහෙයවමින්, ඒවා ඉතාම සමීපව අධීක්ෂණය කරමින්, ඒ ආදායම් ලබා ගැනීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා.

මෙන්න මේවාත් එක්ක වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා අපි අනුගමනය කරන ක්‍රියාමාර්ග ගණනාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අනෙක් වැදගත්ම දේ තමයි, අපි වියදම් කළමනාකරණය කර ගැනීම. මේ වන විටත් අපේ රටේ මහජනතාව දන්නවා, වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා අපි දේශපාලන සංස්කෘතියක් හඳුන්වා දී තිබෙන බව. ජනාධිපතිවරයාගේ සිට, කැබිනට් මණ්ඩලයේ සිට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දක්වා අපි දේශපාලනික වශයෙන් දේශපාලන සංස්කෘතියක් හඳුන්වා දීලා තිබෙනවා. මහජනතාවගේ මුදල් ඉතාම අරපිරිමැස්මෙන් භාවිත කරමින්, අනවශ්‍ය වියදම් සම්පූර්ණයෙන්ම කපා හරිමින් අත්‍යවශ්‍ය වියදම්වලට පමණක් වියදම් කිරීම සඳහා අපි කටයුතු කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ වියදම් කළමනාකරණය කර ගැනීම කියන එක රටක් විධියට අපට ඉතා වැදගත්.

අපි මේ සභාවේදීත් මීට කලින් අවස්ථා ගණනාවකදීම ප්‍රකාශ කර තිබෙනවා, රටේ මහජනතාවගේ මුදල් වියදම් කිරීමේදී කිසිම කළමනාකරණයකින් තොරව අදූරදර්ශී වැඩ පිළිවෙළක් තුළින් කටයුතු කිරීම නිසා අපට බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිදු වුණා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2005-2014 කාලය තුළ අපේ රටේ ක්‍රියාත්මක වෙච්ච ඒ ආර්ථික වැඩ පිළිවෙළ විසින් අපේ රටේ සමස්ත ආදායමෙන් විශාල ප්‍රමාණයක් එක පළාතකට විතරක් සංවර්ධන කටයුතු සඳහා වෙන් කළා කියන එක ඔබතුමාත් දන්නවා. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, එහිදී අධිවේගී මාර්ගවලට, ක්‍රීඩාංගණවලට, වරායවලට, කුරුළු උයන් හදන්න සහ සම්මන්ත්‍රණශාලා හදන්න විශාල මුදලක් වැය කළ බව. එවායේ සැබෑ ශක්‍යතාව සොයා බලන්නේ නැතුව එක පළාතකට විතරක් සමස්ත වියදම්වලින් සියයට 44ක්, 45ක් වැය කළා. මෙන්න මේ වාගේ අදූරදර්ශී වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නේ නැතුව රටේ මහ ජනතාවගේ ධනය ඉතා ප්‍රවේශමෙන් කළමනාකරණය කරලා, වියදම් කිරීම සම්බන්ධව මේ මූල්‍ය ප්‍රකාශයෙන් ඉදිරිපත් කරනවා.

අපි ප්‍රාථමික ගිණුමේ සියයට 2.3ක අතිරික්තයක් පවත්වාගෙන යන ගමන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 13ක ආසන්න අගයක ප්‍රාථමික වියදම් කළමනාකරණය කර ගැනීමේ ක්‍රියාවලියක් මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තුළින් ඉදිරිපත් කර තිබෙනවා. අපට මොන වැඩසටහන තුළින් ආවත් විශේෂයෙන්ම අපි ඉතා අගයකොට සලකන කාරණා කිහිපයක් මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තුළ සඳහන් වනවා. ඒ අනුව අපි රාජ්‍ය වියදම් ඉතා විනයකින් යුතුව කළමනාකරණය කිරීම, අපේ ආදායම් ප්‍රභව වර්ධනය කර ගනිමින් භාණ්ඩාගාරය තුළට හැකිතාක් දුරට ආදායම් ඒකරාශී කර ගැනීම වාගේම අපේ වියදම් ඉතා ප්‍රවේශමෙන් කළමනාකරණය කර ගැනීම සිදු කිරීම අරඹයා අපි මේ වෙනුවෙන් අපි කටයුතු කරනවාය කියන කාරණය සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Ramanathan Archchuna. You have seven minutes.

[පු.ව. 11.00]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Good morning! Thank you, Hon. Deputy Speaker, for giving me time to speak.

இன்றைய விவாதத் தலைப்புடன் சம்பந்தமில்லாத சில விடயங்களை நான் இங்கு கட்டாயம் சொல்லவேண்டி இருக்கிறது.

குறிப்பாக, செம்மணிப் புதைகுழி விவகாரம் தொடர்பில் ஆங்கிலத்திலும் சிங்களத்திலும் சொல்லவேண்டிய தேவை எனக்கு இருக்கின்றது. அண்மையில் ஐ.நா. மனித உரிமைகள் உயர் ஸ்தானிகர் வோல்கர் டர்க் அவர்கள் பாராளுமன்றத்துக்கு வருகை தந்தபோது இடம்பெற்ற meetingஇல் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் என்னைக் கதைக்க விடாமல் தடுத்தார். அது மாத்திரமன்றி, வோல்கர் டர்க் அவர்களைச் செம்மணிக்கு அழைத்துச் சென்றபோது, அங்குகூட அவரை எங்களுடைய மக்கள் சந்திக்க முடியாதவாறு திட்டமிட்டு மிகப் பெரியதொரு நிகழ்ச்சிநிரலைச் செய்திருந்தார்கள். அதையும் தாண்டி எங்களுடைய மக்கள் அவரைச் சந்தித்து இருக்கின்றார்கள். நான் இங்கு இன்னுமொரு முக்கியமான விடயத்தைச் சொல்ல வேண்டும்.

මම මේක සිංහලෙන් කියන්නම්. එතැන චෙම්මනි කියන murders කරපු තැනට, බිම,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, could you please stick to the topic of the Debate?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I am sorry, Sir. The only thing is, these matters have to be stated in Parliament because we would not get any other chance to speak on this. Therefore, I should definitely mention this. You are only constraining me, not others. Sir, you have never said to anyone -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have stated it previously. Had you been in the House, you would remember that. Anyway, as much as possible, you confine yourself to the topic of the Debate.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sure, Sir. But, this is very important and it is a matter of concern for the Tamil people. So, let me speak. ඒ මිනිස්සු යට කරලා තිබෙනවා. ඊයේ skeleton එකක් ගත්තා අවුරුදු 6ක ළමයකුගේ; යුනිසෙෆ් schoolbag එකක් එක්ක තිබෙන skeleton එකක්. එතකොට හිතලා බලන්න, අවුරුදු 6ක ළමයෙකුත්, මාස තුනේ ළමයෙකුත් එතැන යට කරලා තිබෙනවා. අඩි තුනක් යට කරලා තිබෙනවා. දැනට skeletons 33ක් විතර ඒගොල්ලෝ හාරලා අරගෙන තිබෙනවා. බටලන්ද ගැන inquiry එකක් කරන්න පුළුවන් නම්, බටලන්ද ගැන කවුරු හරි,- අපි රණ විරුවන්ට ගරු කරනවා. හැබැයි, ආයුධ තියාගෙන හිටපු හැමෝම රණ විරුවෙක් නොවෙයි. සමහරු ඇවිල්ලා, ඒගොල්ලන්ගේ ජීවිතය එතැන නැති වෙලා තිබෙනවා. ඒගොල්ලන්ගේ අම්මාගේ, තාත්තාගේ සිතේ තිබෙන රිදීම අපට තේරුම් ගන්න පුළුවන්. හැබැයි, එතැන ඇවිල්ලා අම්මා කෙනෙක්වත් rape කරලා, මාස තුනක බබෙක්වත් rape කරනවා කියන්නේ,- ඒගොල්ලන් යට කරලා තිබෙන්නේ අඩි තුනයි. දැනට skeletons 33ක් එළියට ඇවිල්ලා තිබෙනවා.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஓர் அம்மாவை rape பண்ணி, உடம்பில் ஆடை இல்லாமல் உயிருடன் புதைத்திருக்கிறார்கள். அது மாத்திரமன்றி, அவள் சாகும் நிலையில் குற்றுயிராகக் கிடந்தபோது அவளுடைய மூன்று மாதக் குழந்தையைக் கையால் அமர்த்திக் கொலை செய்திருக்கிறார்கள். அந்த மண்ணில் இருக்கின்ற வலிகளை நான் உங்களுக்குச் சொல்கின்றேன். நான் இந்தப் பாராளுமன்றத்தில் இவ்வளவு சத்தமாகவும் உணர்ச்சிவசப்பட்டும் கதைப்பதை நீங்கள் சற்று சிந்தித்துப் பாருங்கள்! கிருஷாந்தி படுகொலை பற்றி உங்களுக்குத் தெரியும்! ஒரு பெண்மணியை 4.00 மணியிலிருந்து இரவு 11.00 மணிவரை rape பண்ணிவிட்டு, அவளுடைய குழந்தையையும் கையால் அமர்த்திக் கொலை செய்திருக்கிறார்கள். பின்னர், குற்றுயிராகக் கிடந்த அவளை மூன்று அடி பள்ளத்துக்குள் போட்டுவிட்டு, அவளுடைய குழந்தையையும் அவளது நெஞ்சில் போட்டிருக்கிறார்கள். அந்தப் பெண்மணியின் எலும்புக்கூடு, குழந்தையைக் கட்டியணைத்தவாறுதான் அந்த இடத்தில் இருந்திருக்கிறது. அந்த வலியைத்தான் நாங்கள் வெளியில் சொல்ல ஆசைப்படுகின்றோம்.

அன்று நடைபெற்ற ஐ.நா. மனித உரிமைகள் உயர் ஸ்தானிகர் உடனான சந்திப்பில், எதிர்க்கட்சியில் இருக்கின்ற இலங்கைத் தமிழ் அரசுக் கட்சியைச் சேர்ந்த சிறீதரன் அவர்கள் மட்டும்தான் கதைக்கலாமே ஒழிய, வேறு யாரும் கதைக்க முடியாதென கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் சொன்னார். அப்பொழுது நான் அவரிடம், "ஏற்கெனவே நீங்கள் பாராளுமன்றத்தில் என்னுடைய குரல் ஒலிப்பதை நிறுத்தியிருந்தீர்கள்; நான் வோல்கர் டர்க் அவர்களிடம் இரண்டு நிமிடங்கள் கதைக்கலாமா?" என்று கேட்டேன். அதற்கு அவர், "கதைக்க முடியாது" என்று சொன்னார். ஆனாலும், நான் அவருடன் கதைத்தேன். அதற்குப் பிறகு, வோல்கர் டர்க் அவர்களை அழைத்துச் செல்வதற்கு செம்மணியில் வாகனம் தயார்நிலையில் இருந்தபோது, நான் அவரிடம் சென்று, "ஐயா! அங்கே 15,000 மக்கள் அழுகின்றார்கள்; வந்து பாருங்கள்!" என்று சொன்னேன். அதனால்தான் அவர்களை அழைத்து வந்து காட்டக்கூடியதாக இருந்தது. அன்று எங்களுடைய கௌரவ அமைச்சர் சந்திரசேகர் அவர்கள் செருப்பு இல்லாமல் ஓடியதுதான் எனக்குக் கவலை! அவருடைய செருப்பு இப்போது என்னுடைய காரில்தான் இருக்கின்றது; வந்தால் எடுத்துக் கொள்ளலாம். இராமநாதன் அர்ச்சுனாவை தமிழ் மக்கள் அடித்து விரட்டுவார்கள் என்று இந்தப் பாராளுமன்றத்தில் கூறிய அதே சந்திரசேகர் அவர்களையும் றஜீவன் அவர்களையும் செருப்பு இல்லாமல் ஓடக்கூடிய அளவுக்குத் தமிழ் மக்கள் துரத்தியடித்தார்கள். எனவே, தயவுசெய்து எங்களுடைய மக்களது மனங்களிலுள்ள வலிகளைப் புரிந்து கொள்ளுங்கள்! ஐயா, அரசியல் செய்வது மிகவும் இலகு! தங்களுடைய வலிகளைப் புரிந்து கொள்ளுமாறுதான் தமிழ் மக்கள் கேட்கின்றார்களே ஒழிய, நாடு இரண்டாகப் பிளவுபட வேண்டும் என்ற தேவை அவர்களுக்கு இல்லை.

මම දැන් සිංහලෙන් කියන්නම්. අපේ දෙමළ ජනතාවට කවදාවත් මේ රට දෙකට බෙදන්න ඕනෑ කියන expectation එකක් නැහැ. රණ විරුවෝ කියලා සියයට 99ක්, 98ක් ඉන්න කොට, සියයට දෙකක් ඇවිල්ලා rape කරලා තිබෙනවා නම්, එතැන මිනී මරලා තිබෙනවා නම්, ඒ කට්ටිය විතරක් නඩුවට ගේන්න කියලා තමයි අපි ඉල්ලන්නේ.

මම "නාමල් රාජපක්ෂ මගේ යාළුවා" කියලා කියපු එකට ඒගොල්ලෝත් කියනවා, නාමල් රාජපක්ෂ මගේ යාළුවා කියලා. ඔව්, එයා මගේ "පොලිටිකල් යාළුවා". මට මෙතැනදී කථා කරන්නේ නැතුව යන්න බැහැ. හැබැයි, එක කාලයක අපේ දෙමළ මිනිස්සු මරපු එකට එයාගේ තාත්තා වග කියන්න ඕනෑ. එයා කොටි එක්ක යුද්ධ කරලා දිනුවා. ඒකේ කිසි අවුලක් නැහැ. ඒක

[ගරු රාමනාදන් අර්ච්චුනා මහතා]

එයාගේ politics. එයා කථා කරන්න ඕනෑ, එයාගේ සිංහල මිනිසුන්ගේ පැත්තට; මම කථා කරන්න ඕනෑ, මගේ දෙමළ මිනිසුන්ගේ පැත්තට. දෙමළ මිනිස්සු මට "හා" කියන්න ඕනෑ, ආදරය කරන්න ඕනෑ කියලා මට කියන්න බැහැ; සිංහල මිනිස්සු මට ආදරය කරන්න ඕනෑ කියලාත් මට කියන්න බැහැ. මට කථා කරන්න පුළුවන් ඇත්ත සිද්ධිය ගැන, මොකක්ද වුණේ කියලා. එතැන skeletons 33ක් තිබෙනවා කියන එක ගැන හිතලා බලන්න. මගෙන් ඉස්සරහා පැත්තේ ඉන්න ඇමති කෙනෙක් - හර්ෂණ නානායක්කාර ඇමතිතුමා- කියනවා, ඒවා hearsay කියලා; ඒවා මිනිස්සු කථා කරපු දේවල් කියලා. හිතලා බලන්නකෝ, මිනිස්සු 33දෙනෙකුගේ bodies කොහේ හරි එකම තැන වළ දමන්න පුළුවන් කියන්නේ, ඒක hearsay ද කියලා. ඒක hearsay නොවෙයි; ඒක ඇත්ත සිද්ධියක්. අපි සාක්ෂි. මගේ තාත්තාත් නැති වෙලා තියෙනවා. මගේ තාත්තාවත් එක්කරගෙන ගිහිල්ලා නැති කරලා තියෙනවා. ඒක අපි අනිවාර්යයෙන් කියන්න ඕනෑ.

ඒ වාගේම මම තව දෙයක් කියන්න කැමැතියි. කන්ටේනර් 323ක් ගැන කථා කළා. මම මේක පැහැදිලිව කියන්න ඕනෑ. මට නඩුවක් දාලා තිබෙනවා, මාව අයින් කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, you have two more minutes.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir.

මාව අයින් කරන්න කියලා නඩුවක් දාලා තිබෙනවා. ඒක මම උසාවියේදී බලාගන්නම්. හැබැයි, මට බයයි. මා ළඟ තියෙනවා තොරතුරු ටික. ඒ කන්ටේනර් 323 ඇතුළේ මොනවාද තිබුණේ කියලා මට list එකක් දෙන්න පුළුවන්. ඒවා කොහෙන්ද, මොන රටෙන්ද ගෙනාවේ කියලා මට කියන්න පුළුවන්. ජර්මනියෙන් ඒගොල්ලෝ එවලා තිබෙනවා. මම ඒක මගේ ඇස්වලින් දැකලා තිබෙනවා. හැබැයි, ඒ list එක දුන්නාම මගේ MPකම නැති කරලා හෙට ගිහිල්ලා කුඩු case එකකට ඇතුළට දමන්නේ නැහැ කියලා ඒගොල්ලන්ට පොරොන්දු වෙන්න කියන්න. Sir, ඒ ඇත්ත **තොරතුරු** ටික, ඒවා ඇතුළේ තිබුණු ඔක්කොම ටික ගැන **තොරතුරු** මම මේ පාර්ලිමේන්තුවේ table කරන්නම්. එහෙම නැත්නම් මගේ ජීවිතය ගැන හිතලා මම වෙන රටකට පැනලා ගිහිල්ලා ඒ ටික එළියට දමන්න ඕනෑ. ඒ කන්ටේනර් 323 ඇතුළේ මොනවාද තිබුණේ කියලා මට කියන්න පුළුවන්. මම බය නැතුව කියන්නේ. අපේ රත්තරන් බඩු කොහෙන්ද ආවේ? අවුරුදු 15ක් එළියට ගෙනාවේ නැති රත්තරන් බඩු එක පාරටම එළියට ඇවිල්ලා, mediaවලට ආවේ කොහේ ඉඳන්ද? ඒවා බෑග්වල තිබුණේ කොහේ ඉඳන් ගෙනැල්ලාද? ඒවා අපේ රටේ කොහේ හරි ඉඳන් ගෙනාවා නොවෙයි. ඒවා ගෙන්නලා තිබෙන්නේ වෙනත් තැන්වලින්. මට ඒ සම්පූර්ණ details කියන්න පුළුවන්. හැබැයි මට බයයි. මම මැරෙන්න බය නැහැ. හැබැයි, මේගොල්ලෝ මාව නිකම් ඕනෑ නැති නඩුවකට දාලා ඇදගෙන යනවා. දැන් පොලිසියේ power එක මේගොල්ලන්ට තිබෙනවා. දැන් ආපහු ගිහිල්ලා justiceවලට මේගොල්ලෝ අත දමනවා. මන්ත්‍රීකමත් අයින් කරලා මේගොල්ලෝ කරන්න හදන්නේ මොකක්ද? ඒ ඇත්ත එළියට කියන එක්කෙනාගේ කට වහන්න පුළුවන්. CID එකට අරගෙන ගිහිල්ලා මම පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරපු එකක් ගැන අහනවා, "ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්ද?" කියලා. මම කිව්වා, "ඔයා ගිහිල්ලා Parliament (Powers and Privileges) Act එක කියවලා බලන්න. මම පාර්ලිමේන්තුව ඇතුළේ කියපු එකකට එළියේදී උත්තර දෙන්න ඕනෑ නැහැ" කියලා. ඒ වාගේම දිලිත් ජයවීර අයියා කථා කළා කියලා, ඒ වාගේම තව MP කෙනෙක් කථා කළා කියලා, ඒක ගැනත් ඇහුවා. Hon. Speakerට ලියුමක් දුන්නා නම්, Parliament (Powers and Privileges) Act එක,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, your time is up.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I will finish, Sir.

Parliament (Powers and Privileges) Act එකට අනුව මගේ right එකක් breach කළා කියලා - Hon. Speaker මට ලියුමක් දෙනවා. ඒකේ කොහේවත් ලියැවිලා නැහැ, කන්ටේනර් 323 ගැන පාර්ලිමේන්තුව ඇතුළේ කථා කළා කියලා. එතකොට මට දුකයි, ඒ ගැන තවත් කියන්න බැරි වෙනවා. අපේ ළඟ තිබෙනවා තොරතුරු. ඒවා කිව්වොත්, ඔයගොල්ලන්ගේ 159දෙනා මට නිකම් ඉන්න දෙන්නේ නැහැ. ඒ නිසා මට ඒවා කියන්න බැරි වෙනවා. මගේ කට වහලා තිබෙන්නේ.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chandana Sooriyaarachchi, you have 11 minutes.

[පූ.භා. 11.08]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තුවේදී අපේ රටේ අනාගතය පිළිබඳවත්, අපේ රටේ ඉදිරි ආර්ථික ස්ථාවරත්වය පිළිබඳවත්, ඊට අදාළ වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පිළිබඳවත් වැදගත් සාකච්ඡාවක්, අදහස් දැක්වීමක්, විවාදයක් නිර්මාණය වෙලා තිබෙන මොහොතක්.

මෙම විවාදය ආරම්භ කරමින් අපේ ආණ්ඩු පක්ෂයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ ගරු කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමියත්, ඉන් අනතුරුව අදහස් දක්වපු අපේ ගරු ඇමතිවරු සහ මන්ත්‍රීවරුනුත් මේ පිළිබඳව ඉතා පැහැදිලිව කරුණු ඉදිරිපත් කළා. විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන අනුව මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු "මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026" පිළිබඳව පැවැත්වෙන මේ විවාදයේදී ඊට අදාළ කරුණු තමයි මේ සාකච්ඡා වෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පළමුවැනි අවස්ථාව මෙයයි කියන කාරණය මීට පෙර ප්‍රකාශයට පත් වුණා. විශේෂයෙන්ම සෑම වර්ෂයකම ජුනි 30වන දාට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වාර්තාවක් විධියට තමයි අද දවසේ මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ වාර්තාවේ මූලික අඩංගුව ගත්තොත්, මූලික කාරණා දෙකක් මත පදනම්ව මේ වාර්තාව සකස් වෙනවා සහ සංඛ්‍යා දත්ත, කරුණු ඉදිරිපත් වෙනවා. එකක්, අපේ රාජ්‍ය ආදායම සකස් කර ගන්නා ආකාරයයි. දෙවෙනි කාරණාව, අවදානම් හඳුනා ගැනීම සහ ඒ අවදානම් අවම කිරීම සඳහා ගත යුතු පියවරයි. ඒ සඳහා අවශ්‍ය කරන ක්‍රමෝපායන් ගැනත් මේ වාර්තාව එක්ක සාකච්ඡා වෙනවා. විශේෂයෙන්ම ආර්ථික වර්ධනය ඇති කර ගත යුතු උපාය මාර්ගික සැලසුම් ද අපි මේ හරහා ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 නොවැම්බර් 21න් පසු අපි ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් මේ රටේ ස්ථාපිත කළා. අපට තිබිච්ච ප්‍රධානම අභියෝගය තමයි විශේෂයෙන්ම පසුගිය අවුරුදු කිහිපය ඇතුළේ අපේ රටේ ආර්ථිකය බිඳ වට්ටලා, ආර්ථිය බංකොලොත් කරලා, ඒ වාගේම අපේ රටේ විදෙස් සංචිතය සැලකිය යුතු ප්‍රමාණයකට දුර්වල කරලා තිබීම. රට ඉදිරියට ගෙන යන්න බැරි මට්ටමට, ආනයන ක්‍රියාවලිය පවත්වාගෙන යන්න බැරි මට්ටමට අපේ රටේ විදෙස් සංචිතය සැලකිය යුතු මට්ටමකින් දුර්වල කරලා තිබුණා. මීට කලින් අදහස් දක්වපු අපේ ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා මතු කළා වාගේම අපේ රට තුළ දැවැන්ත පෝලිම් තත්ත්වයක් ඇති කර තිබුණා. විදුලිය දී ගන්න බැරි වන, තෙල් ටික දී ගන්න බැරි වන, ඖෂධ ටික දී ගන්න බැරි වන මට්ටමට, ගොවියාට පොහොර ටික දී ගන්න බැරි වන මට්ටමට අපේ රටේ ආර්ථිකය බංකොලොත් කළා. ඒ පැවතිච්ච ආණ්ඩු, ඒ පාලකයන්, ඒ වගකිව යුතු මැති ඇමතිවරුන් ගනු ලැබූ වැරදි ආර්ථික ප්‍රතිපත්තිවලින් ඇති වූ සියලු පීඩාවලින් දුක් වින්දේ හිටපු ජනාධිපතිවරුන්වත්, හිටපු අගමැතිවරුන්වත්, හිටපු කැබිනට් ඇමතිවරුන්වත්, ආණ්ඩු පක්ෂයේ හිටපු කවුරුවත් නොවෙයි. දුක් වින්දේ මේ රටේ සාමාන්‍ය ජනතාව, වෘත්තිකයෝ. එදා වෘත්තිකයන්ට රට දාලා යන්න සිද්ධ වුණා; දරුවන්ට පාසල් අහිමි වුණා; රෝහල්වල බෙහෙත් නැති නිසා රෝගීන් මිය යන්න පටන් ගත්තා. මේ ආදී සියලු පීඩාවලින් දුක් වින්දේ මේ රටේ සාමාන්‍ය ජනතාව; මේ රටේ දුක් විඳින ජනතාව, මේ රටේ දැන උගත් ප්‍රජාව, වෘත්තිකයන්. අද මේ ආර්ථිකය පිළිබඳව විවිධ අදහස් යෝජනා ඉදිරිපත් කරමින් අපේ වැඩ පිළිවෙළෙහි මෙවැනි අඩු පාඩු තියෙනවා, මේක හරි නැහැ, මේ ඉලක්කම් මදි, මෙහෙම යන්න බැහැ ආදී වශයෙන් විවිධ කථා බහ අද මේ සමාජයට ගේන්න උත්සාහ කරන විපක්ෂයේ උදවිය තමයි එදා මේ රටේ සාමාන්‍ය ජනතාවට හුස්ම ගන්න බැරි වන මට්ටමට මේ රටේ ආර්ථිකය බංකොලොත් කරලා විනාශ කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වත්මන් ආණ්ඩුවේ අපේ පළමු අභියෝගය වුණේ, අන්න ඒ වට්ටපු ආර්ථිකය, බිඳ වට්ටපු ආර්ථිකය, බංකොලොත් කරපු ආර්ථිකය ක්‍රමානුකූලව ස්ථාවරත්වයකට ගෙන ඒමයි; ආර්ථික ස්ථාවරත්වය මේ රට තුළ නිර්මාණය කිරීමයි. විශේෂයෙන්ම මුදල් අමාත්‍ය ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක සහෝදරයාගේ නායකත්වයෙන් සහ මූලිකත්වයෙන් ආණ්ඩුවක් විධියට අපේ අමාත්‍ය මණ්ඩලය, පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම ඇතුළු අපි සියලු දෙනා එකට පෙළ ගැහිලා කටයුතු කරගෙන යනවා. අපේ ඉලක්කය බවට පත් වුණේ, අන්න ඒ වැරදි ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළේ හිටපු පාලකයන්, දේශපාලනඥයන්, නායකයන් විසින් වට්ටපු ආර්ථිකය නැවත ගොඩ ගැනීමයි; යළි වතාවක් එවැනි අත්දැකීමක් මේ රටේ ජනතාවට උරුම නොවන ආකාරයට මේ රටේ ආර්ථික ස්ථාවරත්වය නිර්මාණය කිරීමයි; ආයෝජකයන් තුළ විශ්වාසය නිර්මාණය කිරීමයි; රට තුළ ජීවත් වන මිනිසුන් මේ රට දාලා යන්නේ නැති මට්ටමේ විශ්වාසයක් යළි ගොඩ නැඟීමයි. අන්න එවැනි අභියෝග හමුවේ තමයි අපේ මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය කරන මැදිහත් වීම කරන්න භාර ගත්තේ. අද අපට පුළුවන් වෙලා තිබෙනවා ඒ ක්‍රම, ඒ වැඩ පිළිවෙළ ඇතුළේ අපේ රට ක්‍රමානුකූලව ඉදිරියට ගෙනයන්න. ඒ වගකීම අපි දැන් ඉටු කරමින් තිබෙනවා. අප විසින් කළ යුතු පළමු කාර්යය විධියට තිබුණේ රටේ ආර්ථිකය ස්ථායිකරණයකට, නැත්නම් ස්ථායිභාවයකට පත් කර ගැනීම. මේ වෙනකොට ඒක අපි ක්‍රමානුකූලව, පියවරෙන් පියවර සිදු කරමින් තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාල සීමාව තුළ අපේ රටේ ආර්ථිකයේ බිඳ වැටීම කොච්චරද කියලා. ඒ ගැන කියන්න ආපසු මම සංඛ්‍යා, දත්ත කියන්න සූදානම් නැහැ. ඒවා මේ පාර්ලිමේන්තු සභා ගැබේ අපි ඇති තරම් සාකච්ඡා කරලා තිබෙනවා. ඒ ආර්ථික පසුබෑම, බිඳ වැටීම, බංකොලොත්භාවය නිසා අපේ රටේ සියලු ක්ෂේත්‍රවල සිදු වුණු බිඳ වැටීම අද මේ රටේ සාමාන්‍ය ජනතාව, පාසල් යන දුවා දරුවන් පවා ඉතා හොඳින් දන්නවා. හැබැයි, අපේ ප්‍රධාන ඉලක්කය වෙලා තිබුණේ මේ ආර්ථික ස්ථාවරත්වය නිර්මාණය කරන එක. පසුගිය මාස කිහිපය තුළ -2025 මුල් මාස 5 තුළ- අපේ අපනයන ආදායම ඩොලර් මිලියන 6.9 දක්වා ඉහළ නංවන්න ආණ්ඩුවක් විධියට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ අනුව 2024 මුල් කාල පරිච්ඡේදයට සාපේක්ෂව ගත්තොත්, අපනයන ක්ෂේත්‍රය තුළ සියයට 7.14ක වර්ධනයක් නිර්මාණය කරගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ ආදී වශයෙන් ගත්තොත්, එවැනි ආර්ථික ස්ථාවරත්වයක් ගෙනෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ඒ වාගේම, අපි දන්නවා රාජ්‍ය ආදායම ශක්තිමත් කරගන්නා ක්‍රියාවලිය පිළිබඳව. අපි දැක්කා, එදා රාජ්‍ය ආදායමට මොකක්ද සිද්ධ වුණේ කියලා. ඒ රාජ්‍ය ආදායම විශාල වශයෙන් විවිධ ප්‍රශ්නවලට, ගැටලුවලට මුහුණ පෑවා. අපි දන්නවා, පසුගිය කාලයේ රාජ්‍ය ආදායම පිළිබඳ විවිධ ප්‍රශ්න නිර්මාණය වුණා. පැවැති ආණ්ඩු කාලයේ විවිධ ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට විවිධ චෝදනා එල්ල වුණා. හාල් ආනයනය පිළිබඳව හැරිසන් හිටපු ඇමතිවරයා රුපියල් කෝටි 100කට ආසන්න චෝදනාවලට ලක්වෙලා තිබෙනවා. ඒවා ගැන කොයි තරම් විමර්ශනය වුණාද, විමර්ශන අවසන් වුණාද කියලා පැහැදිලි නැතත් තවත් එවැනි සිද්ධි තිබෙනවා. තඹ කන්ටේනර්වලට අදාළ රුපියල් කෝටි 50 චෝදනාව, හයිවේ ටෙන්ඩර්වලට අදාළ රුපියල් කෝටි 450ක චෝදනාව, සමෘද්ධියේ එවකට හිටපු ඇමතිවරයාට රුපියල් කෝටි 30ක චෝදනා, විදෙස් ශ්‍රමිකයන්ගේ මුදල් රුපියල් කෝටි 50ක චෝදනාව, බාල බෙහෙත්-උපකරණවලට අදාළ රුපියල් කෝටි 1,500ක චෝදනාව, ගල් අඟුරුවලට අදාළ රුපියල් කෝටි 180ක චෝදනාව, හම්බන්තොට වරායට අදාළ රුපියල් කෝටි 1,500ක චෝදනාව ආදී වශයෙන් විවිධ චෝදනා තිබෙනවා. මේ රටේ රාජ්‍ය ආදායමට එකතු වෙන්න තිබුණු ඒ මුදල් එවකට හිටපු විවිධ පාලකයන් සහ පක්ෂවල අය, විවිධ මැති ඇමතිවරු තමන්ගේ සාක්කුවට දමාගත් ආකාරය ගැන මේ රටේ කථා වෙනවා. ඒවා ගැන තවම විභාග කර, විනිශ්චය කර අවසන් නොවුණත්, ඒ චෝදනා අනුව අපේ රටේ ආර්ථික මට්ටම විනාශ වුණේ කොහොමද කියලා පැහැදිලියි. අපේ රට ආර්ථිකමය වශයෙන් වැටෙන්න බලපෑ ප්‍රධාන කාරණාවක් තමයි, අපේ රටේ මූල්‍ය විනයක් පවත්වාගෙන යන්න හිටපු හැම පාලකයෙක්ම අසමත් වෙලා තිබීම; පැවැති හැම ආණ්ඩුවක්ම අසමත් වෙලා තිබීම. නමුත්, වත්මන් ආණ්ඩුව, මුදල් අමාත්‍ය ගරු ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඇතුළු අපේ ආණ්ඩුව මේ රටේ මූලික ආර්ථික ස්ථාවරත්වය නැවත ගොඩනඟා ගැනීමේදී එතෙක් මේ රටට අහිමි වෙලා තිබුණු, මේ රටේ ආණ්ඩුකරණය තුළ දැක්කේ නැති, ඒ මූල්‍ය විනය නිර්මාණය කරන්න සමත් වෙලා තිබෙනවා.

අද එක පැත්තකින් මූල්‍ය විනය නිර්මාණය කරමින් ඒ අවශ්‍ය කරන වැඩකටයුතු ටික අපි කරමින් යනවා. මීට කලින් කෝටි 800,000ක ආයෝජනවලින් කෝටි 500,000ක්ම බහිරවයා ගිලලා කියලා විගණන වාර්තාවකින් ඔප්පු කර, තහවුරු කර තිබෙනවා. මෙන්න මේ ආකාරයෙන් රාජ්‍ය මුදල් අවභාවිත කරමින්, මූල්‍ය

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

විනයක් නොමැතිව ගෙන ගිය වැඩ පිළිවෙළ වෙනස් කරලා, රාජ්‍ය ආදායම ශක්තිමත් කරමින්, මූල්‍ය විනය නිර්මාණය කරමින්, ආයෝජකයන්ට මේ රට පිළිබඳ විශ්වාසයක් නිර්මාණය කරමින් අපි මේ ගමන් කරමින් තිබෙන්නේ. රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමේ ඉලක්ක ගත්තොත්, අපි ඒ ඉලක්කගත පුරෝකථන, ඉලක්කගත සීමාව ඉක්මවමින් ක්‍රමානුකූලව ගමන් කරමින් තිබෙනවා. කලින් ප්‍රකාශ වුණා වාගේම රාජ්‍ය ආදායම් ඉලක්ක ගත්තොත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ සීමාව අවසන් වෙනකොට සියයට 101ක් දක්වා ඉලක්ක සපුරා ගනිමින් තිබෙනවා, සුරාබදු දෙපාර්තමේන්තුව සියයට 104ක් දක්වා ඒ ඉලක්ක සපුරා ගනිමින් තිබෙනවා, ශ්‍රී ලංකා රේගුව සියයට 106ක ඒ ඉලක්ක සපුරා ගනිමින් තිබෙනවා. මේ ආදී වශයෙන් අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, ඒ ඉලක්ක සපුරා ගනිමින් ක්‍රමානුකූලව මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න.

ඒ නිසා අපි විශ්වාස කරනවා, විශේෂයෙන්ම මේ මූල්‍ය ක්‍රමෝපාය වැඩ පිළිවෙළ, මේ ප්‍රකාශය අපට වැදගත් බව. මොකද, රටක් විධියට මෙතෙක් ආපු මාවත අපි වෙනස් කරලා මේ රටේ අනාගතය යළි නිර්මාණය කරන්නත්, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නත්, නිෂ්පාදනය වැඩිදියුණු කරන්නත්, ආනයන-අපනයන ක්‍රියාවලිය ඇතුළේ ශක්තිමත්භාවයක් සහ ස්ථාවරත්වයක් ඇති කරගන්නත්, මේ රටට එන්න නියමිත සහ ඇවිත් ඉන්න ආයෝජකයන්ට මේ රට තුළ ස්ථාවරත්වය ගොඩ නගා ගෙන ඒ ව්‍යාපාර ඉදිරියට ගෙන යන්නත් ආදි වශයෙන් වූ විවිධ ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් අවශ්‍ය ආර්ථික වටපිටාව නිර්මාණය කිරීම තමයි මේ වැඩ පිළිවෙළ තුළ ඉලක්ක වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වෙලා තිබෙන වින්නැහිය දරාගන්න බැරි අමාරුවට අද විවිධ දේවල් ඇදබැවත්, අපි ආණ්ඩුවක් විධියට අනාගතය වෙනුවෙන්, අනාගත පරපුර වෙනුවෙන්, රටේ ස්ථාවරත්වය වෙනුවෙන් මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යනවා කියන එක තමයි අද මේ සංඛ්‍යා දත්ත තුළින් අපි තහවුරු කරමින් තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Dilith Jayaweera. You have 10 minutes.

[පූ.භා. 11.20]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11(3) වගන්තිය ප්‍රකාරව, "2026 වර්ෂය සඳහා මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය" සම්බන්ධයෙන් කෙරෙන මේ විවාදයේදී, 2026 මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තුළින් උද්ගත වන වැදගත් කරුණු දෙකක් පමණක් මම සංවාදයට ලක් කිරීමට කැමැතියි.

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට අපි ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නේ "Fiscal Strategy Statement" කියලා. කියන විධියටම මේක ක්‍රමෝපාය ප්‍රකාශයක්. ක්‍රමෝපාය ප්‍රකාශයක අන්තර්ගතය විය යුත්තේ මොකක්ද? මේ සඳහා මොකක්ද තිබෙන කේන්ද්‍රීය උපාය මාර්ගය? මම මේ වචනය පාවිච්චි කරන්නේ මේ නිසායි. Without a clear fiscal strategy, a nation cannot move forward. හැබැයි, මේ සිදුවන කථා බහත්, මේ ප්‍රකාශයේ අන්තර්ගතයත් දිහා බැලුවාම පැහැදිලිව පෙනී යන කාරණයක් තමයි, මෙය ඉතාම සාම්ප්‍රදායික ඉදිරිපත් කිරීමක් බව. මේ ඉදිරිපත් කිරීමේ කිසිම නවතාවක්, නැවුම්බවක්, අලුත් අදහසක් නැහැ. ඒ නිසාම තමයි මම හිතන විධියට මේ කථිකයන්ට සිද්ධ වෙලා තිබෙන්නේ අර පරණ ආණ්ඩුවලට ටිකක් බැණලා, අතිශයෝක්තියෙන් වචන ගොඩක් කථා කරලා ඒ වචනවල හිර වෙන්න. මොකක්ද මේක ඇතුළේ තිබෙන ක්‍රමෝපාය? මොකක්ද මේක ඇතුළේ තිබෙන නිශ්චිත උපාය මාර්ගය?

මූල්‍ය කළමනාකරණය කියන එක, එක පැත්තක්. ධනය නිර්මාණය කියන එක තව පැත්තක්. ධනයක් නිර්මාණය කරන්නේ නැතුව මූල්‍යයක් නැහැ, කළමනාකරණය කරන්න. විනයක් ඇතුව මූල්‍ය කළමනාකරණය කිරීමට දරන උත්සාහය අගය කරනවා, ගොඩක් අඩු පාඩු තිබුණත්. මම ඒකත් කියන්නට ඕනෑ. අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ මම බය බිරාන්ත වුණා, මේක දැක්කාම. මම හිතන හැටියට ජනාධිපතිතුමා තමයි නියෝජ්‍ය ඇමතිතුමාට දීලා තිබෙන්නේ මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. කොහොම වුණත් ඒක ඇහුවාම, මොන මූල්‍ය විනයක්ද මේක කියලා බය හිතෙනවා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා වාගේම මේක අර මහ බැංකු හොරකමට ඉතාම සමානයි. මහ බැංකු හොරකමේ තිබෙනවා, ඉලක්කම්. නමුත් මේකේ ඉලක්කම් නැහැ. කොහොම වුණත්, මූල්‍ය විනය ගැන කථා කරන මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි, අපි මේ රටේ අහිංසක මිනිස්සු උකසට තියාගෙන, වචන ගොන්නකට හිර කරගෙන දේශපාලනය කරනවා නම්, අතිශයෝක්තියට යටත් වෙලා අපි මේ කටයුතු කරනවා නම්, අපි කරන්නේ මිනිස්සු රවට්ටන එක බව. මේ නව රජයට අලුතින් කියන්නට පුළුවන් උපාය මාර්ගයක් - strategy එකක් - මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අන්තර්ගත වෙන්නේ නැහැ. මේක බොහොම සම්ප්‍රදායක ලියවිල්ලක්. ඉතින් මම යෝජනා කරන්නේ මේකයි. අපි මේ විවාදයේ දී කථා කළ යුත්තේ තිබෙන සල්ලි ටික කොහොම හරි හොඳට බලා කියා ගන්නා ගමන් ධනය නිර්මාණය කරන්නේ කොහොමද කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මේ ආදරණීය රට ඉස්සරහට නොගියේ මේ රටේ මේ පාර්ලිමේන්තුව ඇතුළු දේශපාලන නායකත්වය ඒ ගෝලීය නව ප්‍රවණතා හඳුනා නොගනිමින්, ඒවාට සංවේදී නොවී බොහොම ග්‍රාමීය තැනක ඉඳලා මේ කරුණු දෙස බැලූ නිසායි. ඒක ඇත්ත. හැබැයි, ග්‍රාමීය තැන ඉඳලා අද මේ රට යාවක තැනකට ගෙනාවා නම් අපි හිතන්නට ඕනෑ, මේ එළැඹෙමින් තිබෙන්නේ අපේ අවසාන හෝරාව බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, with due respect to all my Colleagues, I want to say that we all are products of the education which we got free. Our learned Colleague, the Hon. Minister Sunil Handunnetti, recently participated in the World Economic Forum. I do not want to go into the contents of his contribution, but, in fact, the way he handled the whole thing, I think, was a disaster. So, what it shows is that we have got into, as we call in technical terms, a weak state. We do not have a statement issued on behalf of our nation which can impress the world. That is where we face the biggest issue. In terms of creating wealth, we need to attract foreign investments. What is the message that we get across to the world? Why should investors come to Sri Lanka now? Is it because we have put some ex-Ministers and some politicians in jail? Will that attract investors? අපේ රටට අලුතින් ආයෝජකයෝ එන්න හේතුව කුමක්ද? අලුතින්

ආයෝජකයන්ට ඒමට ඇති ඒ ආකර්ෂණය කෙබඳු ද? අපි වෙනස් කර තිබෙන්නේ මොන හැඟීමද? මේ රට ගැන මොන perception එක ද? අපි අදූෂිත ශ්‍රී ලංකාවක් නිර්මාණය කර ආයෝජකයන්ට රටට එන්න කියලා, එමඟින් ධනය නිර්මාණය කරන්නට පුළුවන් කියලා හිතා ගෙන ඉන්නවා නම් ඒක සම්පූර්ණ විහිළුවක්. එහෙම ආයෝජකයෝ එන්නේ නැහැ. ඒ ආයෝජකයන්ට ආයෝජනය කිරීම සඳහා වූ ආයෝජන පරිසරයක් අවශ්‍යයි. එම පරිසරය නිර්මාණය කිරීම සඳහා අපි අලුතින් දෙයක් කරලා තිබෙනවාද? එහෙම නම් අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලනවා, අපේ රටේ ආයෝජනය කරන්න පිටරට ඉන්න ආයෝජකයන්ට අපි එන්න කියන්නේ මෙන්න මේ හේතු නිසා කියන එක කරුණාකරලා කියන්න. මෙන්න, අපේ නව නිර්මාණාත්මක ප්‍රවේශය, නව නිර්මාණාත්මක වැඩ පිළිවෙළ, නව නිර්මාණාත්මක දිරි ගැන්වීම් කියලා පෙන්වන්න. අපි ගෝලීයව ගත්තොත් - මේ ප්‍රදේශය, කලාපය ගත්තොත් - ඒගොල්ලන්ට වැඩිය අපි මොනවාද වෙනස්ව කරලා තිබෙන්නේ? ඒගොල්ලන් වෙනත් රටකට නොගිහින් අපේ රටට එන්න ඕනෑ ඇයි? මෙන්න මේවා කියන්න. ඒවා තමයි ක්‍රමෝපායන්වල තිබෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට-අනිද්දා අපේ දේශීය ව්‍යවසායකයාගේ හොම්බෙන් අල්ලලා ඔළුව බිම අනින්නයි හදන්නේ. පරාටේ නීතිය නැවත ක්‍රියාත්මක කරන්න හදනවා. දැන් මේ රජය ඉදිරිපත් කරන නිර්මාණශීලී වැඩ පිළිවෙළ මොකක්ද? ව්‍යවසායකයන්ගේ වරදක් නොවන හේතු නිසා ඔවුන්ට මේ සිදු වුණු අකරතැබ්බයෙන් ඔවුන් මුදා ගන්නට ක්‍රමෝපාය වැඩ පිළිවෙළක් තිබෙන්නේ කොහේද? ක්‍රමෝපාය වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. මේ රටට ධනය නිර්මාණය කරන, මේ රටට බදු ගෙවන, බදු ගෙවපු, ආණ්ඩුවට බරක් නොවී තමන්ගේ ස්වශක්තියෙන් නැඟී හිටපු ඒ ස්වදේශික ව්‍යවසායකයා රැක ගන්නට වැඩ පිළිවෙළක් අවශ්‍යයි, ඔහුගේ ඉඩම්-කඩම් ටික බැංකුවට සින්න වෙන්න කලින්. එවැනි වැඩ පිළිවෙළක් නැතිව අපි මේ කථා කරන්නේ මොනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. මේ සම්බන්ධයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමාට මම ප්‍රශ්නයක් ඉදිරිපත් කරලාත් තිබෙනවා. නමුත්, මම කියන්න ඕනෑ වැදගත් කරුණක් තිබෙනවා. සංචාරක කර්මාන්තයෙන් එන ධනය ගැන සඳහන කරනවා. මේ ගරු සභාවේත් ඒ ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වගකීමෙන් කියන්නේ මෙයයි. සංචාරකයින් හරහා මේ රටට නව ධනයක් නිර්මාණය වෙනවාය කියලා කියන්නේ විශාල අතිශයෝක්තියක්. මේ රටට ඇත්තටම දැන් සිදු වෙමින් පවතින්නේ, අඩු වියදම් සංචාරකයින් ආකර්ෂණය කර ගත්ත නිසා මේ රටේ ජනතාව මත විශාල බරක් පැටවීමක්. බදු ගෙවන ජනතාවගෙන් තමන් වින්දනයක් ලබමින්, ඒ මුදල් පරිභෝජනය කරමින්, මූර්ත වශයෙන් ඔවුන් මේ රටට පාඩුවක් සිද්ධ කරනවා. කරුණාකරලා මේ ගැන සොයලා බලන්නට ඕනෑ. ඔබතුමන්ලා මේ ගැන සමීක්ෂණයක් කරන්න ඕනෑ. මෙතුමන්ලා ධනය ගැන කථා කළාට, බොහොම අවාසනාවකට වාගේ, unfortunately, ලංකාවට එන සංචාරකයින් මේ රට ඇතුළේ කීයක් වියදම් කරනවාද කියලා කිසිම දත්තයක් කවදාවත් අපට තිබිලා නැහැ; අදටත් නැහැ. අපට ඒක සොයාගන්න ක්‍රමවේදයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක නිසා තමයි අපි කියන්නේ මේ ඩිජිටල් අනන්‍ය අංකය නිකුත් කරලා මේක වහාම digital platform එකට ගෙනෙන්න කියලා. එකිනෙකාට අවලාද කරමින් ඉන්නේ නැතිව මේ digital platform එක immediately හදන්න.

අපි කියනවා, අපේ රටට මෙපමණ සංචාරකයන් ප්‍රමාණයක් ආවා කියලා. "සංචාරකයා" කියන වචනය නිර්වචනය කරන විධියත් අද ලොකු ප්‍රශ්නයක්. ඒක නොවෙයි ප්‍රශ්නය. අපේ රටට එන සංචාරකයන් ඩොලර් කීයක් ගෙනැවිත් වියදම් කරනවාද කියලා සොයාගන්න විධියක් නැහැ, ඒගොල්ලන් විධිමත් ලෙස, formal system එකක, හෝටල්වල හිටියේ නැත්නම්. දැන් මෙගොල්ලන් ඇවිල්ලා ඉන්නේ එක එක තැන්වල; ගෙවල්වල. ඒගොල්ලන් අපට සහනාධාර ලෙස ලැබෙන කෑම, බීමවල සිට, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dilith Jayaweera, your time is up.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, please give me a few seconds.

ඇත්තටම මට කියන්නට ඕනෑ, අපේ අස්වැසුම ප්‍රතිලාභීන් පවා අපේ රටට එන සංචාරකයින්ට කෑම ටික දීලා තිබෙනවා කියන එකයි. මෙහෙම වුණාම අපේ රටේ ධනයක් නිර්මාණය වෙන්නේ නැහැ, මොන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කළත්. මම නැවතත් වගකීමෙන් කියනවා, මේකට තාර්කිකව, විද්‍යාත්මකව, නිර්මාණශීලී නව සංකල්ප ඇතුළත් වෙලා නැහැ කියලා. මේ තුළ අපේ රට ඉදිරියට යන වැඩ පිළිවෙළක් කොහෙත්ම නැහැ. තිබෙනවා නම්, - *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. Budget එකේ තිබුණු එක ගැන කථා කළොත් ගොඩක් කථා කරන්න තිබෙනවා, ඇමතිතුමනි. මම කියන්නේ අපේ රටට, - *[බාධා කිරීමක්]* මේ වාර්තාව ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් වෙලා තිබෙනවා නේ. ඔබ මේක පාවිච්චි කරන්නට ඕනෑ. ඔබගේ Fiscal Strategy එක present කරනකොට ආයෝජකයින් ගැස්සිලා යන විධියට ඉදිරිපත් කරන්න ඕනෑ, "මෙන්න, Fiscal Strategy එකේ බඩු තිබෙනවා, අපේ රට ඇතුළේ ධනය නිර්මාණය කරනවා" කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dilith Jayaweera, could you please wind up now?

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Nishantha Samaraweera. You have 12 minutes.

[පූ.භා. 11.32]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ පැවැත්වෙන මේ විවාදයට සම්බන්ධ වී අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව මුලින්ම ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාව ගත්තාම අපි හැමෝම බලාපොරොත්තු වෙන්නේ සාරගර්භ විවාදයක්. මේ තිබෙන දත්ත, තොරතුරු මත පදනම් වෙලා මේ රටේ අනාගතය, මේ රටේ ඉදිරි පරම්පරාව මොන තැනකට යන්න ඕනෑද කියා කරුණු ඉදිරිපත් කරමින්, ඉදිරි කාලය යහපත් කර ගැනීම සඳහා වෙච්ච ප්‍රවේශයක් සහිත සාකච්ඡාවක් අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේ බලාපොරොත්තු වෙනවා.

[ගරු නිශාන්ත සමරවීර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට පෙර අවස්ථා ගණනාවකදී මතු කළා වාගේ අද දවසෙත් මේ සාකච්ඡාව, මේ මාතෘකාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට අපේ විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරන්නේ මේ සාකච්ඡාවට ගැළපෙන්න නොවෙයි. තමන්ගේ ඔළුවේ තිබෙන මොනවා හරි දෙයක් පාර්ලිමේන්තුවට ඇවිල්ලා දවස ඇතුළත කියලා යන්න තිබෙන වුවමනාව විතරමයි ඒ අයට තිබෙන්නේ. ඒක හරියට ගත්තොත්, "යන්නේ කොහේද, මල්ලේ පොල්" වර්ගයේ විපක්ෂයක් තමයි අපට තිබෙන්නේ. "යන්නේ කොහේද, මල්ලේ පොල්" තමයි. අද දවසේ යම් ප්‍රකාශයක් කළ යුතුයි කියන හැඟීමෙන් ආපු බවක් මිසක්, මේ ඉදිරිපත් කර තිබෙන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පිළිබඳ යම් අදහසක් දක්වන්න ආපු ආකාරයක් අපට පෙනෙන්නේ නැහැ. අපි පසුගිය විවාද දෙක තුනේදී දැක්ක කාරණයක් තිබෙනවා. අපි යම් මාතෘකාවක් ඉදිරිපත් කළාම ඔවුන් ඒ මාතෘකාවට අදාළව කොයි වෙලාවකවත් කථා කරන්නේ නැහැ.

මීට කලින් කථා කරපු කථිකයා පවා උත්සාහ කළේ, ආණ්ඩු පක්ෂයේ අය ඒ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ කියලා කියන්න. නමුත් එය එහෙම නැහැ. අපි මේ කාරණය ඉදිරිපත් කරලා, මේ වනතෙක් කථා කරපු අපේ කථිකයන් මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අඩංගු කරුණු පිළිබඳව, ඒවා මේ රටට බලපාන්නේ කොහොමද, මේ රටේ ජනතාවට ඒකේ ප්‍රතිඵල ලැබෙන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව පැහැදිලි කරමින් සිටියා. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කලින් කරපු කථා සියල්ල අධ්‍යයනය කරලා බලන්න, ඒවා තුළ ඒ සම්බන්ධව කිසිදු කාරණයක් නැහැ. අපි විපක්ෂයේ සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා, අඩුම ගණනේ මේ ඉතිරි කාලය තුළ හෝ මේ මාතෘකාවට අදාළව කථා කළ යුතුයි කියලා. ඒ යෝජනාව මේ සාකච්ඡාව පටන් ගන්න කලින් අපේ පැත්තෙන් කරන්න ඕනෑ.

අපේ රට ආර්ථික අර්බුදයක ගිලිලා තිබුණේ. ඊට පස්සේ අපි දැන් යම් ආර්ථික වර්ධනයක් සහ ආර්ථික ස්ථායීතාවක් අපේක්ෂා කරමින් ඉන්නවා. අපි ඒ වෙනුවෙන් ගමන් මඟක් තීරණය කරලා, ඒ ගමන් මඟ ඔස්සේ ඉදිරියට කටයුතු කරමින් ඉන්නවා. ඒ ගමන් මඟේ තීරණාත්මක සන්ධිස්ථානයක් තමයි, අද දවසේ ඉදිරිපත් කර තිබෙන 2026 - මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය. 2026-2030 කාලය සඳහා මධ්‍ය කාලීන වැඩසටහනක් විධියට, මධ්‍ය කාලීන මාර්ග සිතියමක් විධියට තමයි අපි මේ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ. එතකොට මේ මධ්‍ය කාලීන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කිරීමත්, ඒ වාගේම මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් ප්‍රමාණාත්මක මූල්‍ය ඉලක්ක නියම කරලා, ඒ මූල්‍ය ඉලක්කවලට ළඟාවීම සඳහා සමාජයට යම් අදහසක් ගොනු කර ගැනීමත් මේ ප්‍රකාශය තුළින් අපි බලාපොරොත්තු වෙනවා. ඒ අතර ණය අඩු කර ගැනීමේ ඉලක්ක සහ එහි අරමුණ පැහැදිලි කිරීමත්, ප්‍රාථමික ශේෂයේ ඉලක්කය සහ එය පැහැදිලි කිරීමත්, ප්‍රාථමික වියදම් සීමාව පිළිබඳව පැහැදිලි කිරීමත් යන සියල්ල ඒකට ඇතුළත් වෙනවා. හැබැයි, මේක Budget එක නොවෙයි. මේ ප්‍රකාශය අපි කරන කාර්යයන් සියල්ල අඩංගු කරලා කරන ප්‍රකාශයක් නොවෙයි. මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තුළින් අපි ඉදිරිපත් කර තිබෙන්නේ, ඉදිරි වසර පහක කාලය තුළ මේ රටේ ආර්ථික ඉලක්ක මොනවාද, ඒවා ළඟා කර ගැනීම සඳහා අපි යා යුතු මාර්ගයේ තිබෙන සලකුණු කර ගත යුතු යම් සන්ධිස්ථාන මොනවාද කියන එක සම්බන්ධවයි. ඒ නිසා මේ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී අපේ ගරු ඇමතිතුමා විසින් විශේෂයෙන්ම සඳහන් කළා, පනතේ සඳහන් වෙලා තිබුණත්, ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි අපි අද දවසේ මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ කියන එක. මෙතැන් සිට ඉදිරියට එන සෑම වසරකම ජූනි 30වැනි දාට මේ ඉදිරි ප්‍රකාශය පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට ලක් කරලා, මේ සමාජයට ඒක දැනෙන්න සලස්වන්න අපි සූදානම් වෙලා ඉන්නවා.

ඇත්තටම මේ තුළින් විපක්ෂයට තමන්ගේ කාර්යය පහසු කරන වැඩක් වෙලා තිබෙනවා. පසුගිය කාලය ගත්තාම, කවදාවත් ඉදිරි වර්ෂවල ආණ්ඩුව කටයුතු කරන්නේ කොහොමද කියන එක ජනතාව දන්නේත් නැහැ, විපක්ෂය දන්නේත් නැහැ, කවුරුවත් දන්නේත් නැහැ. හැබැයි, මෙතැනින් පස්සේ අපි ඇත්තටම මේ රටේ ජනතාවට ඒක දැනෙන්න සලස්වනවා. මේ රටේ මේ ආර්ථිකය ගැන මැදිහත් වෙන්න කැමැති, මේ ආර්ථිකයත් එක්ක තමන්ගේ දැනුම, තමන්ගේ හැකියාවන් මුසු කරන්න කැමැති ජනතාවට ඒ සඳහා අපි අවස්ථාව ලබා දෙනවා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ රට ගෙනියන්නේ මොන තැනකටද කියලා ඉලක්ක සහගතව අපි කියනවා. ඒක තමයි ජනතාව බද්ධ වෙන තැන. එතැනට ජනතාව බද්ධ වෙනකොට මේ රටේ ආර්ථිකය අනිවාර්ය ලෙසම ඉදිරියට ගමන් කරන බව අපට පැහැදිලියි.

මේ ප්‍රකාශයේ අරමුණු ගත්තාම, "රජයේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ විධිමත් ප්‍රකාශයක් වාර්ෂික අය වැය සකස් කිරීමට පෙර පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත ඉදිරිපත් කිරීම" කියන වගන්තිය අපි පැහැදිලි කරලා තිබෙන්නේ එම නිසායි. ඒ වාගේම ඉදිරි වාර්ෂික අය වැය සඳහා යෝජනා සකස් කිරීමේදී අමාත්‍යාංශවලට අවශ්‍ය උපාය මාර්ගික මඟ පෙන්වීමක් ලබා දෙන්නත් මෙවැනි ප්‍රකාශයක් වැදගත් වනවා. රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සාධාරණව, අපක්ෂපාතීව සහ කරුණු හෝ සාක්ෂි මත පදනම්ව තක්සේරු කිරීමට අවශ්‍ය පදනම ස්ථාපිත කිරීමත් මෙහි අරමුණුවලට ඇතුළත් වනවා. ඒ වාගේම රජයේ මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳව පාර්ලිමේන්තු අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ මූල්‍ය අංශයේ විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කිරීමත් මේ ප්‍රකාශයේ එක අරමුණක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි COPE සහ COPA කියන කමිටුවලිනුත් මෙන්න මේ රජයේ මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව පසුගිය කාලයේ අත්කර ගත් කාර්ය සාධනය පිළිබඳව යම් අධීක්ෂණයක් කරමින්, ඒ සියලු ආයතනවල විනිවිදභාවය සහ වගවීම පරීක්ෂා කරමින් ඉන්නවා. හැබැයි අපට දකින්න තිබෙන දේ තමයි, ඇත්තටම රජයේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳව කිසිදු පුරෝකථනයක් නැතුව තමයි පසුගිය වර්ෂ ගණනාවක් -අපි අධීක්ෂණය කරන සම්පූර්ණ කාලය- පුරාම කටයුතු සිදු වෙලා තිබෙන්නේ කියන එක. එම නිසා බොහෝ ආයතනවල කටයුතු තමන්ට වුවමනා පරිදි වෙනස් කරමින්, ඒවායේ මුදල් හැසිරවීමේ සියලු ක්‍රියාකාරකම් ඇමතිවරයාට, අනෙකුත් දේශපාලන බලාධිකාරීන්ට වුවමනා ලෙස වෙනස් කරමින් කටයුතු කිරීමේ හැකියාව ඔවුන්ට මීට කලින් තිබුණා. හැබැයි, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කරලා අපි ඒ ඉලක්ක නිගමනය කරලා ඒ ඉලක්ක ජන සමාජයට තහවුරු කළාට පස්සේ ජන සමාජයේ අවධානයත්, ජන සමාජය මේ ඉලක්ක වෙනුවෙන් අනුගතවීමත් කියන කාරණා දෙක මත කිසිවෙකුට මේ රටේ ධනය හොරකම් කරන්න, වංචා කරන්න, නාස්ති කරන්න, දූෂණ සිදු කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. මේක අත්‍යවශ්‍ය පියවරක්.

මධ්‍ය කාලීන ප්‍රතිපත්ති රාමුවක්, එහෙම නැත්නම් මධ්‍ය කාලීන ක්‍රමෝපාය සම්බන්ධව මේ රටේ ජනතාවත්, මේ පාර්ලිමේන්තුව ඇතුළු වග කිව යුතු ආයතන සියල්ලත් දැනුවත් කරන එක සහ ඒ සම්බන්ධ ඉලක්ක සකස් කරලා දෙන එක මේ රටේ පාර්ලිමේන්තුව ලෙස අපේ වගකීමක් වෙලා තිබෙනවා. අපි විශේෂයෙන්ම COPE සහ COPA කියන කමිටු විධියට හිතුවත්, ඒ කියන්නේ අධීක්ෂණ කාර්යභාරයන් පැවරිච්ච පාර්ලිමේන්තුව ලෙස හිතුවත් මේක අත්‍යාවශ්‍ය වැඩ පිළිවෙළක්. ඒ නිසා අපි විපක්ෂයෙන් මේ මොහොතේත් ඉල්ලා සිටිනවා, ඇත්තටම ඒ සඳහා උපරිම වශයෙන් ඔබතුමන්ලාගේ දායකත්වය ලබා දෙන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Nishantha Samaraweera, you have two more minutes.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සම්බන්ධ කරුණු කෙරෙහි අවධානය යොමු කරලා, ඒ කරුණුවල යම් ගැටලු ස්වභාවයන් තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරමින් ඒවා නිවැරදි මාවතට ගැනීම සඳහා, ඔබතුමන්ලා දකින යම් වැරදි, අඩුපාඩු තිබෙනවා නම් ඒවා පෙන්වා දීම සඳහා මැදිහත් වෙන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි විපක්ෂයෙන් කරනවා. නමුත් ඔවුන් ඒ කාර්යභාරය කරන්නේ නැහැ. ඇත්තටම මෙවැනි ප්‍රකාශයක් අපේ රටේ වුවමනාවක් බව තහවුරු කර ගනිමින්, තේරුම් ගනිමින් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Namal Rajapaksa. You have ten minutes.

[පූ.භා. 11.43]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

රාජ්‍ය ආදායම, ආර්ථිකය, මූල්‍ය විනය ගැන කථා කරන මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ, මේ ආණ්ඩුව බලයට පත් වෙනකොට ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයට වඩා හාත්පසින් වෙනස් ක්‍රියාදාමයකට අනතුරුව එළඹුණු බව. එදා මෙතුමන්ලා තනිකර IMF විරෝධියි. ආපු ගමන් IMF එක එළවනවා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ ආර්ථික ප්‍රතිපත්තිය අපට ගැළපෙන්නේ නැහැ, අපේ රටට හරියන්නේ නැහැ කියලා බලයට ආපු අය දැන් රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති, IMF එකේ, වොෂින්ටන්වල හදන දේවල් කොළඹදී, රනිල් මහත්මයාටත් වඩා හොඳට කරගෙන යනවා. වෙලාවට බදු ටික වැඩි කරනවා. නමුත් ජනතාවගේ ආර්ථිකය වර්ධනය කරන්න, ජනතාවගේ ආදායම වැඩි කරන්න මේ ආණ්ඩුව අද වෙනකල් ගත් ක්‍රියාමාර්ග මොනවාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කරන්න ආණ්ඩුව ගත් ක්‍රියාමාර්ගය මොකක්ද?

අද මම දැක්කා ආණ්ඩුව පැත්තේ සමහර කථිකයෝ කිව්වා, විපක්ෂය කථා කරන්නේ විෂයානුබද්ධව නොවෙයි කියලා. හැබැයි ඉතින් ආණ්ඩුව පැත්තෙන් කළ ඒ හැම කථාවකදීම ඉතිහාසය ගැන කිව්වා මිසක්, අනාගතය සහ ඉලක්කවලට යන වැඩ පිළිවෙළ ගැන කවුරුවත් කථා කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රශ්නය කියනවා, ප්‍රශ්නය අපි දන්නවා. ප්‍රශ්නය දන්නා නිසා තමයි ආණ්ඩුව ක්‍රමානුකූලව මාරු වෙලා ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් බලයට ආවේ. ඔබතුමන්ලාත් බලයට ඇවිල්ලා දැන් අවුරුද්දකට ළඟයි. ඒ නිසා තවමත් ඒ ප්‍රශ්න ටික ගැන කිය කියා ඉන්නවාද, එහෙම නැත්නම් ඒ සඳහා ඔබතුමන්ලාගේ විසඳුම මොකක්ද, මේක ඉදිරියට යන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව තමුන්නාන්සේලා තීන්දුවක් ගන්නවාද?

පසුගිය දවසක අතිගරු ජනාධිපතිතුමා ආයෝජන සම්බන්ධයෙන් කථා කළා. එක්තරා අමාත්‍යවරයෙක් කිව්වා, ඩොලර් මිලියන 650ක ආයෝජන ඇවිල්ලා තිබෙනවා කියලා. හැබැයි, අනෙක් පැත්තෙන් ජනාධිපතිවරයා කියනවා, ඩොලර් මිලියන අනූ ගණනක තමයි ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ කියලා. ඊට පස්සේ ඒක නිවැරදි කරලා කියනවා, නැහැ, ඩොලර් බිලියන 4.6ක ආයෝජන අපි සැලසුම් කර තිබෙනවා කියලා. ඔබතුමන්ලාම පත් කරපු BOI එකේ සභාපතිවරයා පසුගිය දිනෙක කිව්වා, ඉන්දියාවෙන් සහ චීනයෙන් ලංකාවට එන්න නියමිත ඩොලර් බිලියන හතරයි දශම ගණනක, තුනයි දශම ගණනක, එකයි දශම ගණනක -නිවැරදි කිරීමට යටත්ව- ආයෝජන ලංකාවට ඒම පිළිබඳව නිශ්චිත තීන්දුවක් ඒ ආයතන සහ BOI එක අතර තවමත් අරගෙන නැහැ කියලා. එතකොට ජනාධිපතිවරයාට මේ ඉලක්කම් දෙන්නේ කවුද? ඔබතුමන්ලා මේ fiscal policy හදන්නේ, මේ රටේ ආයෝජන සැලැස්මවල් හදන්නේ, මනස්ගාතයක් ඔළුවේ තියාගෙන; හීන මාළිගාවක් හදාගෙන. ඔබ හිතනවා, අර ආයෝජකයා එනවා කියලා. හැබැයි, ඒ ආයෝජකයා එන්නේ නැහැ. එහෙම හිතලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා නොමමර ටිකක් කියලා සියයට 10ක ආර්ථික වර්ධනයක් හදාගෙන යනවා කියනවා. හැබැයි, ADB එක සියයට 3.644ක ආර්ථික වර්ධනයක් තමයි මේ අවුරුද්දේ project කරලා තිබෙන්නේ. හැබැයි, ඔබතුමන්ලා කියනවා, අපි සියයට 10ක ආර්ථික වර්ධනයක් හදනවා කියලා. සියයට 10ක ආර්ථික වර්ධනයක් හදන්න පුළුවන්, අඩුම ගණනේ අර එනවා කියපු ආයෝජන ගෙන්න ගන්නවා නම්. හැබැයි, ඒ ආයෝජන ගෙන්වා ගන්නේත් නැහැ. ඉන්න ආයෝජකයෝත් යනවා.

පසුගිය කාලයේ කර්මාන්තශාලා වැහුණා. එතකොට ආණ්ඩුව මොකක්ද කිව්වේ? ඒ, එක garment factory එකක් විතරයි, ඒකේ සේවකයින් ඉන්නේ 1,500යි කිව්වා. තවත් කර්මාන්තශාලාවක් වැහිලා ඔබේම කැබිනට් අමාත්‍යවරයෙකුට චෝදනා නැඟුවා, විපක්ෂයේ ඉන්න කාලයේ වෘත්තීය සමිතියක් හදලා ඒක විනාශ කළා කියලා. හැබැයි, එතකොට මොකක්ද කිව්වේ? ඒ, එක ආයතනයක් නේ, කමක් නැහැ කිව්වා. මේ විධියට ආයතන කීයක් දැන් වැහෙනවාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒවා වහන්නේ නැතුව රැකියා ටික ආරක්ෂා කරගන්න ඔබතුමන්ලාගේ සැලැස්ම මොකක්ද? අපි අදාළ ආයතනයේ හිටපු ප්‍රධානීන් හිරේ දැම්මා, අපි මෙච්චර නඩු දාලා තිබෙනවා, මෙච්චර හිරේ දාලා තිබෙනවා කියලා ආයෝජකයාට ගිහිල්ලා කිව්වාට, ආයෝජකයෙක් රටට ආයෝජන අරගෙන එන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි ඇත්ත කථාව. හැබැයි, මේ system එකේ තිබෙන සමහර දේවල් වෙනස් කරන්නේ නැතුව නිලධාරින් මාරු කරනවා; නිලධාරින් හිරේ දමනවා. අන්තිමට මොකක්ද වෙන්නේ? ඔබතුමන්ලාගේ න්‍යාය ඒක නම්, පත් වෙන නිලධාරියාත් අර නීති යටතේම අනාගතයේදී හිරේ යනවා.

ඔබතුමන්ලා පොරොන්දු වුණා, මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය ඩිජිටල්කරණයට පරිවර්තනය කරනවා කියලා; procurement guidelines ටික ඩිජිටල්කරණයට පරිවර්තනය කරනවා කිව්වා. අද වෙනකම් ඒ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? ටෙන්ඩර් පටිපාටිය විනිවිදභාවයකින් යුතුව කරනවාය කිව්වා. ලෝකයේ තිබෙන best practice එක ලංකාවට ගේන්න ඕනෑ. එහෙම

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

ගෙනාවොත් තමයි මේකට විසඳුමක් දෙන්න පුළුවන් වෙන්නේ. හැබැයි, ඒ සඳහා ඔබතුමන්ලාගේ සැලැස්ම මොකක්ද? ඔබතුමන්ලා ඒකට සූදානම්ද? නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමන්ලා කරන්නේ, නිලධාරියෙක් මාරු කරලා, එහෙම නැත්නම් නඩුවක් දාලා ඔහු හිරේ දමලා ඔබෙන් වෙන වැරැද්ද වහ ගන්න එක.

අපි දන්නවා, ඔබතුමන්ලාට රාජ්‍ය සේවය පිළිබඳව විශ්වාසයක් නැතුව ඇති කියලා. ඒ හින්දා තමයි ඔබතුමන්ලා ජනාධිපති ලේකම්වරයාගේ ඉඳන් පොලීසිය භාර ලේකම්වරයා දක්වා, වර්තමානයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා දක්වා තමන්ගේ මැතිවරණ වේදිකාවෙන් ගිහිල්ලා වාඩි කරවන්නේ. ඔබතුමන්ලා මේ රටේ රාජ්‍ය සේවය විශ්වාස කරන්නේ නැහැ කියන එක පැහැදිලියි. රාජ්‍ය සේවය විශ්වාස කළේ නැති වුණාට කමක් නැහැ. හැබැයි, ඒ රාජ්‍ය සේවය බිඳ දමන්න එපා, කඩා දමන්න එපා.

ඊළඟට, කෘෂි කර්මාන්තය ගැන කථා කළා. ඉස්සර නම් කිව්වේ හාල් පිට රටින් ගේන්නේ හොරකම් කරන්න කියලා. කන බොන දේවල් පිට රටින් ගෙනැල්ලා මේ රටේ විකුණන්නේ, හොරකම් කරන්න, කොමිස් ගහන්න කිව්වා. එහෙම නේ ඔබතුමන්ලා කිව්වේ. හැබැයි, අද කොහොමද? ගොවියාට දෙන පොහොර ටික ප්‍රමිතියට නැහැ. ගොවි සංවිධාන පාරට බැහැලා. කථා කරන්න මනුස්සයෙක් නැහැ. ඒකට විසඳුමක් දෙන්න විධියක් නැහැ. අනෙක් පැත්තෙන් ආණ්ඩුව මොකක්ද කරන්නේ? වගා කරලා රටේ ජනතාවට කන්න දෙනවා වෙනුවට සාකච්ඡා තියමින් පිට රටින් හාල් ගේන්න කථා කරනවා; පිට රටින් ලූණු ගේන්න කථා කරනවා. මේ, රටේ මිනිස්සුන්ට කන්න දෙන ගොවියා ආරක්ෂා කරනවා කියලා බලයට ආපු ආණ්ඩුව. හැබැයි, එහෙම බලයට ආපු ආණ්ඩුවටත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවියාට ප්‍රමිතියට පොහොර ටික දෙන්න බැරි නම්, ඒ ගැන ඇහුවාම පසුගිය කාලයේ ඒවාට බැණ බැණ ඉන්නවා නම්, මේ රටේ ගොවි ජනතාවට සාධාරණයක් සිද්ධ වෙන්නේ නැහැ කියන එකත් අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ.

ඊළඟට, මේ ගත්ත ණය අපි ගෙවන්න ඕනෑ. ඒ වෙනුවෙන් මොකක්ද තිබෙන සැලැස්ම, plan එක? නොම්මරයක් කිව්වා කියලා, අපි රාජ්‍ය ආදායම මෙච්චර වැඩි කරනවාය කිව්වා කියලා හරියනවාද? ඔව්, බදු වැඩි කර ගනිමින් රාජ්‍ය ආදායම වැඩි කරගන්න ඔබතුමන්ලා උත්සාහ කරනවා. එහෙම නැතුව ඔබතුමන්ලා ඉලක්කවලට යන්නේ නැහැ. Tax net එක වැඩි කරනකම්, බදු ගෙවන ප්‍රමාණය වැඩි කරනකම් බදුවල ප්‍රතිශතය වැඩි කළා කියලා -බදු ප්‍රමාණය කොච්චර වැඩි කළත්- රාජ්‍ය ආදායම වැඩි වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, ආණ්ඩුව අද වෙනකම් මොකක්ද කරන්නේ? ආණ්ඩුවේ ඉදිරි කාල සීමාව තුළ තිබෙන සැලැස්ම තුළත් බදු ගෙවන ප්‍රමාණය වැඩි කරලා, tax net එක expand කරලා simplify කරනවා වෙනුවට බදුවල ප්‍රතිශතය වැඩි කරනවා මිස මොකක්ද කරන්නේ? හැම දාම ආණ්ඩුවේ රාජ්‍ය ආදායම වැඩි කරන්න බදු වැඩි කරනවා.

අනෙක් පැත්තෙන් මොකක්ද වෙන්නේ? ආණ්ඩුව පොහොසත්, හැබැයි මිනිස්සු දුප්පත් කියලා කියයි. අවසානයේ ඒකේ බර දැනෙන්නේත් මේ රටේ මහ ජනතාවට. ජීවන වියදම වැඩි වෙනවා. ජීවන වියදම අඩු කරන්න ආණ්ඩුවට තිබෙන සැලැස්ම මොකක්ද? ඔබතුමන්ලාට පසුගිය ආණ්ඩුවලට බණින එක ලේසියි. අවුරුදු 76ක් ගැන ඔබතුමන්ලා කථා කරනවා. ඒ අවුරුදු 76ම කළේ පසුගිය ආණ්ඩුවලට බැණපු එක. ඒක නොවෙයි දැන් තිබෙන ප්‍රශ්නය. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා කරන්නේත් පසුගිය ආණ්ඩුවලට බණින එක; බලයට ඇවිල්ලා කරන්නේත් ප්‍රශ්නයට විසඳුමක් දෙන එක නොවෙයි, පසුගිය ආණ්ඩුවලට බණින එක. හැබැයි, විසඳුමක් දෙන්න කිව්වාම මොකක්ද කියන්නේ? හොරු අල්ලනවාය කියනවා. හොරුත් අල්ලන්න, ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒක දේශපාලන න්‍යායෙන්, තමන්ගේ අවශ්‍යතාව ඉටු කරගන්න කරනවා නම් ඒකත් සාර්ථක වෙන්නේ නැහැ කියන එක අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ඔබතුමන්ලා අපේ රටට එන ආයෝජකයන්ව රවට්ටන්න හිතනවා නම් ඒක කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද ලෝකයේ ඕනෑ තරම් රටවල් තිබෙනවා, මිනිස්සුන්ට ආයෝජනය කරන්න. ආයෝජකයා එන්නේ ලාභයක් බලාපොරොත්තුවෙන්. අපේ රටට ඇවිල්ලා ආයෝජනය කරලා, රැකියා උත්පාදනය කරලා, අපේ රටේ දරුවන්ට රස්සා ටික හදලා ආණ්ඩුවට බදු ගෙවන්න ආයෝජකයා සූදානම්. ඒ සඳහා ආණ්ඩුව ලැහැස්ති වෙන්න ඕනෑ. හැබැයි, මේ රටේ මිනිස්සුන්ගේ අතට මුදල් යන්නේ නැතුව, ඔවුන්ගේ ආදායම වැඩි කරන්නේ නැතුව, වියදම් කරන්න අතට මුදල් දෙන්නේ නැතුව ඒ තිබෙන මුදල්වලින් බදු ගහමින් තමන්ගේ රාජ්‍ය යන්ත්‍රණය ශක්තිමත් කරනවා කියන මුවාවෙන් ඔවුන්ව අමාරුවේ වට්ටලා ආර්ථිකය හදන්න පුළුවන් කියලා ආණ්ඩුව හිතනවා නම් ඒක ප්‍රායෝගික නැහැ කියන එකත් මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම, බාර් ලයිසන් එක දීපු එක වැරදියි, හැබැයි බාර් ලයිසන් එක නොදුන්නාට ඉස්කාගාරයක් හදන්න අවසර දෙන එක හරි, කැසිනෝ ලයිසන් දෙන එක වැරදියි, කැසිනෝ ලයිසන් දුන්නේ නැති වුණාට slot machines ගේන්න අවසර දෙන එක හරි, ඒවායෙන් තමන්ගේ ආර්ථිකය හදන්න පුළුවන් කියලා ආණ්ඩුව හිතනවා නම් ඒ කාරණය සාර්ථක වෙන්නේත් නැහැ කියන එකත් අපි ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ. එදා නම් කිව්වේ ඒවා දෙන්න ඕනෑ ටෙන්ඩර් කරලා කියලා. එහි නීත්‍යානුකූලභාවය පිළිබඳව මම තර්ක කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, එදා අපිට චෝදනා කළා නේ, ඒවා ටෙන්ඩර් කරලා දෙන්න ඕනෑ කියලා. හැබැයි, අද ඒවා දෙනකොට කොහොමද දෙන්නේ කියන ක්‍රමවේදය ගැන අපි වෙලාව ආවාම අහන්නම්. ඒවා වෙලාව ආවාම අපි අහගන්නම්. හැබැයි, එදා කියපු කාරණාවලට වඩා සම්පූර්ණයෙන් වෙනස් කාරණයක් අද තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරනවා. මඩ ගහලා, චෝදනා කරලා, බොරු චෝදනා හදලා ඔබතුමන්ලාට මේ ආණ්ඩුව අවුරුදු 5ක් ගෙනියන්න පුළුවන් කියලා හිතනවා නම් ඒක සාර්ථක වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඔබතුමන්ලා මේ පොත් print කරන එක හොඳයි. ඒවා කරන්න. හැබැයි, අද ඔබතුමන්ලා මේ පොත් print කළාට මේවායේ තිබෙන දේවල් මේ ගරු සභාවේ ඉන්න අයට තේරෙනවාද කියන්න මම දන්නේ නැහැ. ඒ අය මේවා කියවලා තිබෙනවාද දන්නේත් නැහැ. මොකද, අය වැයේදී කියපු එකක්වත් අද ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අය වැය ලේඛනය අරන් බලන්න. ආණ්ඩුව පිහිටුවා මේ වනකොට මාස 8ක් ගත වෙලා තිබෙනවා; අවුරුද්දකට ළඟයි. 2025 වසරට අය වැය ඉදිරිපත් කළා. ජනාධිපතිවරයා ඇවිල්ලා අය වැය කථාව කියෙව්වා. ඒ අය වැයේ තිබෙන එකක්වත් අද ක්‍රියාත්මක කරනවාද, ඒවා ප්‍රායෝගිකද, අපි ණය ගෙවනවා නම් ISB ණය ටික ගෙවන්නේ කොහොමද, විදේශ රටවලට තිබෙන ණය ගෙවන්නේ කොහොමද, රාජ්‍ය ආදායම වැඩි කරගන්නේ කොහොමද, ආයෝජකයෝ ගෙනැල්ලා රැකියා උත්පාදනය කරන්නේ කොහොමද කියන කාරණා පිළිබඳවත් හොයා බලන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා,

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Eranga Gunasekara. You have 13 minutes.

[පූ.භා. 11.53]

**ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පාර්ලිමේන්තුව තුළ අද පළමුවන වතාවට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11(3) වගන්තියට අනුව රජයේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කළා. මෙහිදී විශේෂයෙන්ම 2026 සිට 2030 දක්වා සැලසුම් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් පිළිගන්නවා, අප බංකොලොත්භාවයට පත් වෙච්ච රටක් කියන එක. එලෙස අපි බංකොලොත්භාවයට පත් වෙන්න බලපෑ කාරණා හඳුනා ගන්න ඕනෑ. ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න පෙර, ප්‍රවේශයක් ගන්න පෙර ඒ ප්‍රශ්නයේ පදනම අපි තේරුම් ගන්න ඕනෑකම තිබෙනවා.

රටක් විධියට අපි බංකොලොත් වීමේ ක්‍රියාවලියේ කාරණා එක, දෙක, තුන, හතර, පහ කියලා බැලුවොත්, ඉන් ප්‍රධාන එකක් තමයි අපේ රටේ මූල්‍ය පද්ධතියට විනිවිදභාවයක් නොතිබුණු එක, නිසි කළමනාකාරිත්වයක් නොතිබුණු එක, විනයක් නොතිබුණු එක. එහෙම විනයක් නොතිබුණු රටකට, වැඩ පිළිවෙළක් නොතිබුණු රටකට අද මේ රටේ ජනතාවත් එකතු වෙලා අප ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට විනයක්, වැඩ පිළිවෙළක්, ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශ පොත්වල අච්චු ගහන්නේ නැතිව, අංක විධියට කියන්නේ නැතිව වෙන මොන ක්‍රමවේදයකට ද කියන්න තිබෙන්නේ? මේවා නිසි වැඩ පිළිවෙළකට අනුව අච්චු ගහලා යම්කිසි ක්‍රමවේදයකට තමයි අපට කියන්න ඕනෑකම තිබෙන්නේ; ඒවා ගැන කථා කරන්න ඕනෑකම තිබෙන්නේ. ඒවා කියෙව්වොත්, ඒවා බැලුවොත් ඒ වැඩ පිළිවෙළ මොකක්ද කියන එක ඒවායේ තිබෙනවා; ඒවායේ මොනවාද තිබෙන්නේ කියා පෙනෙනවා. හැබැයි, ඒවා බලන්නේ නැතිව වෙන වෙන දේවල් කියවන්න ගියොත් මේවා අහු වෙන්නේ නැහැ. ඒකට අපට කරන්න දෙයක් නැහැ.

අද මේ සංවාදය ඇතුළේ ඇත්තටම විපක්ෂය මොකක්ද කරමින් ඉන්නේ? මේ ගරු සභාවේ ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියන්නේ නැහැ, ආණ්ඩු පක්ෂය පිළිබඳ ගුණ ගායනා කරන්න, සුදු හුනු ගාන්න කියලා. එහෙම එකක් ඕනෑ නැහැ. දේශපාලනික වශයෙන් අපෙන් සිද්ධ වන අඩුපාඩුවක් තිබෙනවා නම්, ඒක පෙන්වා දෙන්න, ඒක සාකච්ඡා කරන්න අයිතියක් තිබෙනවා. ඒ ගැන ගැටලුවක් නැහැ. හැබැයි, දැන් විපක්ෂය කරමින් ඉන්නේ මොකක්ද? පසුගිය අවුරුදු ගණනාව තුළ රට බංකොලොත් කරලා, රට කාලා, දූෂණය කරලා, ඒ ඔක්කොම කරලා තිබෙද්දී අද මහජනතාවත් එක්ක මේ රට පියවරෙන් පියවර ඔසවා තබන්න අප සූදානම් වෙද්දී මේ ගැලරිය ඇතුළෙත්, පිටතත් මාධ්‍ය නාළිකා ටිකක් එකතු කරගෙන විශේෂයෙන්ම මේ රට ගොඩ නඟන්න යන ක්‍රියාවලිය ඇතුළේ ඉන්න ආයෝජකයන්, ව්‍යාපාරිකයන්, ඒකට මැදිහත් වන මිනිස්සුන්ව භය කරන, සලිත කරන හීනයක විපක්ෂය ජීවත් වනවා. අද මේ කථා කරන මහත්වරු මීට අවුරුද්දකට පෙර මොනවාද කිව්වේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපේ රටට විදේශ ආයෝජන එන්නේ නැහැ කිව්වා, ජාත්‍යන්තර සබඳතා නැහැ කිව්වා. ඊළඟට, තෙල් පෝලිම්, ගෑස් පෝලිම් එනකල් බලාගෙන හිටියේ. ඒවා තමයි මේ මහත්වරු පසුගිය කාලයේ කිව්වේ.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, විශේෂයෙන්ම ඇමෙරිකාව -ලංකාවට විතරක් නොවෙයි- දැන් පනවා තිබෙන මේ තීරු බදු පිළිබඳ ප්‍රශ්නය ගැන. පොදුවේ ගත්තොත් American පාලනය මඟින් පැන වූ තීරු බදු සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නැඟුණු බව අපි දන්නවා. හැබැයි, විපක්ෂය මොකක්ද කළේ? පුදුම සතුටකින් හිටියේ. මේකත් එක්ක මේ ආණ්ඩුවට ප්‍රශ්නයක් එයි, එහෙම වුණොත් ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න පුළුවන් වෙයි කියලා බල බලා ප්‍රකාශ නිකුත් කරන්න පටන් ගත්තා. හැබැයි, මොකද වුණේ? අපි කියන්නේ නැහැ, ඒ ප්‍රශ්නය සියයට සියයක් ඉවරයි කියලා. මොකක්ද ඒ ප්‍රශ්නයට කළේ? අපි රාජ්‍ය තාන්ත්‍රිකව මුදල් අමාත්‍යාංශය, මුදල් නියෝජ්‍ය ඇමතිවරු ඇතුළු සියලුදෙනා ඒක කළමනාකරණය කරන්න මැදිහත් වෙමින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ඉරානය, ඊශ්‍රායලය, ඇමෙරිකාව සහ මැද පෙරදිග කලාපය ඇතුළේත් යම් යුදමය වාතාවරණයක් මතු වෙමින් ආ බව. ඒ මතු වෙමින් ආ තත්ත්වය තුළ ඔබ දන්නවා, ගල්ෆ් කලාපය තුළ ගුවන් සීමාව වසා දැමූ බව. හැබැයි, විපක්ෂයේ හිටපු මහත්වරු මොකක්ද කළේ? උදේ හවස social mediaවල voice-cut දෙන්න පටන් ගත්තා, "තෙල් නැති වෙනවා, තෙල් නැති වෙනවා, තෙල් නැති වෙනවා" කියලා. මොකක්ද, මේ පටු මානසිකත්වය?; මොකක්ද ඒ මානසිකත්වය? ඒක තමයි ඔවුන්ගේ ක්‍රියාමාර්ගය බවට පත් වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, අද අපි අවුරුදු පහකට යම් නිශ්චිත වැඩ පිළිවෙළක්, මූල්‍ය ක්‍රියාමාර්ග ටිකක් ඉදිරිපත් කර තිබෙද්දී අද අපට ඇවිල්ලා කියන්නේ මොනවාද? අද මේ සභාව තුළ ගෝරනාඩු කරන්න පටන් අරගෙන තිබෙනවා, "කන්ටේනර්, කන්ටේනර්, කන්ටේනර්" කියලා. මේ කන්ටේනර් ප්‍රශ්නය මොකක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරයා මීට පෙර මොකක් කියලාද කෑ ගැහුවේ? මේ, දවස දෙකේ දේශපාලනය නේ කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මීට පෙර ඒ මහත්මයාට පුදුම අසනීපයක් තිබුණා. ඒ පක්ෂයේ හිටපු කට්ටියවත් පැත්තකට දාලා, එයා කොඩිය ගහලා පෙන්වන්න හැදුවා, "කොළඹ නගර සභාවේ ලොක්කා මම තමයි" කියලා. Media දෙක තුනක් අල්ලාගෙන හතර වටේ දා ගෙන පක්ෂයේ කට්ටියටත් ගේම දීගෙන කොඩිය ගහන්න බලාගෙන හිටියේ. කොඩිය වැදුණු තැන කොතැනද කියලා ඔබ දන්නවා. ඒ නිසා මොකක්ද වුණේ? දැන් ඒක ඉවරයි.

අද ඇවිල්ලා මේ සංවාදය ඇතුළේ කන්ටේනර් කථාවක් කියනවා. මොකක්ද මේ කන්ටේනර් කථාව? ඒ මතු කරපු මන්ත්‍රීවරයාම මීට පෙර මොකක්ද මතු කළේ? ජාතික ජන බලවේගයට උදව් කළ ව්‍යාපාරිකයෙක් පදනම් කරගෙන, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ආණ්ඩුකාරයා ඉලක්ක කරගෙන කිව්වා ඔහුගේ කන්ටේනර් ටික තමයි නිදහස් කළේ කියලා. දැන් අද කෝ ඒවා? අද ඒ කථා ඉවරයි. ඊට පස්සේ අපේ බිමල් රත්නායක අමාත්‍යවරයා අල්ලාගෙන කිව්වා, ඒකට එතුමා සම්බන්ධයි කියලා. දැන් අද කෝ ඒවා? අද ඒවා නැහැ.

හැබැයි, අපි මොකක්ද කළේ? අපි ඒ මතු වුණු තත්ත්වය ඉතාම හොඳින් කල්පනා කරමින් ඒකට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගත්තා. සිදුවීමක් වුණාට පස්සේ, විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය මැදිහත් වෙලා ජනවාරි මාසයේ 30වෙනි දා මේකට අදාළව

[ගරු එරංග ගුණසේකර මහතා]

කමිටුවක් පත් කරනවා. ඒ කමිටුව පත් කළේ කවුද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපේ රජය. මහ බැංකුව පිළිබඳ කාරණයේදී වාගේ, අනෙක් හොරකම්වලදී වාගේ අපි ලිස්සලා ගියේ නැහැ. ප්‍රශ්නයක් තිබෙනවා නම් සොයන්න අපි ඒකට අදාළව කමිටුවක් පත් කළා. ඒ කමිටුව පත් කළේ අපේ ආණ්ඩුවෙන්, අපේ ඇමතිවරු, මුදල් අමාත්‍යාංශයෙන්. ඒ පත් කළ කමිටුවේ වාර්තා ටික අරගෙන අද මේ සභාවේ සිංහනාද කරනවා. මොකක්ද මේ ජීවිතේ? අපි පත් කළ කමිටුවේ වාර්තාවේ තිබෙන සමහර චූටි චූටි කෑලි අරගෙන අද මේ සභාවේ මාර ප්‍රකාශයක් වාගේ කියවනවා. ඒ අපි ලියපු පොත නේ, අපි කථා කරපු වැඩේ නේ, අපි දාපු ක්‍රමය නේ. ඒක අරගෙන එයාගේ පොත වාගේ කියවනවා. මොකක්ද මේ වැඩේ? මේ, දවසේ දේශපාලනය. දවසේ දේශපාලනය මේ කරමින් ඉන්නේ.

මේ සභාවේ බලාගෙන හිටපු සමහර මන්ත්‍රීවරුන්ගේ තත්ත්වයත් ඕකම තමයි. දැන් පොඩ්ඩකට ඉස්සෙල්ලා එක මන්ත්‍රීවරයෙක් සභාවට ඇවිල්ලා කථා කරගෙන, කථා කරගෙන ගියා. ඊට පස්සේ ගියා යන්න. දැන් එතුමා මොනවාද කියන්නේ? දැන් අහනවා වැඩ පිළිවෙළක් නැද්ද, වැඩ පිළිවෙළක් නැද්ද කියලා. පොත් ගහලා තිබෙනවා, තමන්ගේ මේසය උඩ පොත තිබෙනවා. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි කියන භාෂා තුනෙන්ම පොත තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතින් ඒක බලන්න පුළුවන් නේ. ඒක බලන්නේ නැතිව ඇවිල්ලා මොකක් හරි තිබෙන එකක් කියවලා යනවා. මොකක්ද මේ දේශපාලනය? ඒ විතරක් නොවෙයි. දැන් අහනවා මොනවාද ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියලා. මම ඒ මන්ත්‍රීවරයාට කියනවා, පුළුවන් නම් අහන්න ජපානයේ තානාපතිවරයාගෙන්, අපි ආවාට පස්සේ අපි ගත්ත ක්‍රියාමාර්ග ඇතුළේ ආයෝජන වැඩි වුණේ නැද්ද කියලා. ඒගොල්ලන්ගේ ආණ්ඩුවේ හිටපු ඇමතිවරු ඒගොල්ලන්ගේ බාප්පලා, මහප්පලා රකිද්දී ජපානයේ ආයෝජකයෝ අපේ රට දාලා ගියා. හැබැයි, අද අපි මොකක්ද කරමින් සිටින්නේ? අපි හදපු මූල්‍ය විනය ඇතුළේ අද ඒ ආයෝජකයන් ඇවිල්ලා අපිත් එක්ක වැඩ කටයුතු කරනවා. එහෙම කරන අපෙන් අහනවා මොකක්ද වැඩ පිළිවෙළ කියලා. ඒ මන්ත්‍රීවරයාගේ මාමලා SriLankan Airlines එකේ ගහපු ගේම්වලට අන්න අද නීතිය ක්‍රියාත්මක වෙමින්, ඒවාට අදාළ කටයුතු වෙනවා. ඒවා වෙද්දී මොකක්ද කියන්නේ? ඒවා දේශපාලන මැදිහත්වීම් ලු.

පසුගිය කාලයේ මේ ඉස්සරහ පේළි දෙකේ තුනේ හිටපු සමහර ඇමතිවරු ලොකු ගෝරනාඩු දමමින් සිටියා නීතිය ක්‍රියාත්මක කරන්න, කෝ හොරුන්ට දඬුවම් දෙනවාද කියලා අහමින්. අද කිසි කෙඳිරියක් නැහැ. දැන් ඔහේ බලාගෙන ඉන්නවා.

රටක මූල්‍ය විනයක් හදන්න ඕනෑ. රටක් ඇතුළේ යම් අපරාධ රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙනවා නම් එතැනින් එහාට රටක් දියුණු වෙන්නේ නැහැ. අපි කියන්නේ නැහැ ඒක එකම ක්‍රියාමාර්ගය කියලා. හැබැයි එයට මහ පෙන්වීමක් කරන්න ඕනෑකම තිබෙනවා, නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑකම තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා අපි රටක් විධියට බංකොලොත් වෙලා තිබුණේ. අපට ප්‍රධාන ගැටලු දෙකක් තිබුණා. එකක් තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි අපට ඩොලර් පෙට්ටියක් තිබෙනවා, අනෙක් පැත්තෙන් රුපියල් පෙට්ටියක් තිබෙනවා. ඒ නිසා අපි එක පැත්තකින් ඩොලර් සහ රුපියල් ප්‍රමාණය ආරක්ෂා කර ගන්න ඕනෑ, අනෙක් පැත්තෙන් ඒක වර්ධනය කර ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි ආර්ථික ක්‍රියාමාර්ග ගන්නවා. ඒකේ පළමුවෙනි ක්‍රියාමාර්ගය මොකක්ද? පළමුවෙනි ක්‍රියාමාර්ගය තමයි අපි ජන වරමට ගරු කරමින් දූෂණයට, වංචාවට අදාළ ක්‍රියාමර්ග ගේනවා. ඒ වාගේම අපි ආදර්ශය ලබා දෙනවා. අපි දන්නවා ඒවායින් විතරක් රටක් දියුණු වෙන්නේ නැහැ කියලා. අපි ඒවා කරලා, ඒ වැඩ කටයුතු පෙන්වාගෙන යද්දී දැන් අහනවා ඒකෙන් විතරක් කරන්න පුළුවන්ද කියලා. ඔව්, ඒකෙන් විතරක් කරන්න බැහැ. හැබැයි ඒක අත්‍යවශ්‍යයි. ඒක නිසා තමයි ජනාධිපතිතුමාගේ ඉඳන්, නියෝජ්‍ය ඇමතිවරුන්ගේ ඇමතිවරුන්ගේ ඉඳන්, අනෙක් මූලික නිලධාරින්ගේ මට්ටමින් ඒ ආදර්ශය දෙමින් තිබෙන්නේ. වියදම් කපාගෙන අරපරිස්සමින් අර රුපියල් පෙට්ටියයි, ඩොලර් පෙට්ටියයි පරිස්සරම් කරන්නේ කොහොමද කියන එකයි අපි මේ පෙන්වමින් සිටින්නේ. එතකොට, දැන් අපි ඒක කරන්න ඕනෑ නැද්ද? අපි ඒක කරමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. පසුගිය කාලය ඇතුළේ ඒ වෙච්ච දූෂණ, වංචා පිළිබඳව අපි නීතිමය ක්‍රියාමාර්ග ටික ගනිමින් සිටිනවා. එය මේකට අත්‍යවශ්‍ය නැද්ද?

විශේෂයෙන්ම "මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026" සම්බන්ධයෙන් මම යම් අදහසක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඇත්තටම මොකක්ද අප මේ ඉදිරිපත් කර තිබෙන්නේ? 2026 - 2030 දක්වා වන මූල්‍ය සැලැස්මක් ආණ්ඩුව විධියට අපි ඉදිරිපත් කර තිබෙනවා. මෙයින් පසුව සෑම වසරකම -වසරක් පාසා- ජූනි මාසයේ මෙවැන්නක් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේක හුදු ලියවිල්ලක්ද? නැහැ. නිශ්චිත, ප්‍රායෝගික වාගේම උපාය මාර්ගික වැඩ පිළිවෙළක් තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර පැවැති ආණ්ඩුත් මහ ජනතාවගෙන් බදු අය කර ගත්තා. හැබැයි, ඒ බදු මුදල්වලට මොකක්ද කරන්න යන්නේ, ඒ බදු මුදල්වලින් කොයි කොයි තැන්වලින්ද මේ රටේ ජනතාවට සේවය වෙන්නේ කියලා සැලසුම් කළ වැඩ පිළිවෙළක් මීට පෙර තිබුණේ නැහැ. ඒවා තිබුණා, කැබිනට් මණ්ඩලයේ පස්දෙනා දාගෙන හිටපු අර කල්ලිය ඇතුළේ. ඒ හිටපු කල්ලි ගාව තමයි වැඩ පිළිවෙළ තිබුණේ. අඩුම තරමින් ඇමතිවරුවත්, මන්ත්‍රීවරුවත් ඒ ගැන දැනගෙන හිටියේ නැහැ. නමුත්, අප මොකක්ද කරමින් තිබෙන්නේ? අද අපි අපේ රටේ ජනතාව හමුවේ මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සභාගත කරනවා, මෙය තමයි අපේ වැඩ පිළිවෙළ කියලා. මෙය සාර්ථක කර ගන්න අපි මැදිහත් වෙනවා.

අපේ මේ සැලසුම කුමක්ද? විශේෂයෙන් 2032 වෙද්දී රාජ්‍ය ණය රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95කට වඩා අඩු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. විපක්ෂය ඇහුවා අපේ සැලැස්ම මොකක්ද කියලා. අපේ ඉලක්කය එයයි. ඒ විතරක් නොවෙයි. රජයේ ඇපකර දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.5ක පවත්වාගෙන යෑම සඳහාත් අපි වැඩ කටයුතු කරමින් යනවා. ඒ විතරක් ද නොවෙයි. විපක්ෂය අපෙන් ඇහුවා, "දැන් අවුරුද්දක විතර වාගේ කාලයක් වෙනවා. ආණ්ඩුව මොකක්ද කරමින් යන්නේ" කියලා. අප කරන දේවල් සංඛ්‍යා දත්ත හරහා තමයි ඉදිරිපත් කරන්න වෙන්නේ. එහෙම නැත්නම් ඒ කරන දේවල් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා මේ සීට් ඉස්සරහා තියන්නද? මෙතුමන්ලා ගත්තු දේවල්, හොරකම් කරපු දේවල් නම් එහෙම දෙන්න පුළුවන්. නමුත් ඉලක්ක පෙන්වන්න වෙන්නේ සංඛ්‍යාලේඛනත් එක්ක තමයි.

අපනයන ආදායම සම්බන්ධයෙන් අපි මොකක්ද කරලා තිබෙන්නේ? අපි එය ක්‍රමානුකූලව වැඩි කරගෙන තිබෙනවා. 2025 මුල් මාස 5 ඇතුළේ අපනයන ආදායම ඩොලර් මිලියන 6.9කින් වැඩි කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ කියන්නේ 2024ට සාපේක්ෂව ගත්තොත් සියයට 7.14කින් අපි එය වර්ධනය කරගෙන තිබෙනවා. එහෙම නම්, අපි මේ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න ඕනෑ නැද්ද? අපි මේවා ගැන කියන්න ඕනෑ නැද්ද? අපි බලාපොරොත්තු වෙනවා, රාජ්‍ය ආදායම GDP එකෙන් සියයට

15 දක්වා ඉහළට දමන්න. ඒ විතරක් නොවෙයි. පසු ගිය ආණ්ඩු බදු හොරුන්ට සහන දෙද්දී, විශේෂයෙන්ම ඒවා තමන්ගේ දේශපාලන agenda එකට පාවිච්චි කරද්දී අපේ ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා, දේශීය ආදායම මාස 5ක් ඇතුළත සියයට 101ක් දක්වා ගෙන එන්න; ඒ වාගේම, රේගු ආදායම සියයට 104ක් දක්වා වැඩි කර ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Eranga Gunasekara, your time is up. Please wind up now.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

සුරාබදු ආදායම සියයට 106ක ඉහළ අගයකින් පවත්වාගෙන යන්න අපි සමත් වෙලා තිබෙනවා. මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සමඟ අපි රටේ ජනතාවට නිශ්චිත වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. ඒකට අනුව මේ රටේ ජනතාවත් එක්ක මේ රට ආර්ථික වශයෙන් ක්‍රමානුකූලව ඉදිරියට ගෙන යන්න මැදිහත් වෙන්න මේ රජය සූදානම්. එම කාරණය ප්‍රකාශ කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Gayantha Karunathilleka. You have 12 minutes.

[අ.භා. 12.08]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට විදේශීය වශයෙනුත්, දේශීය වශයෙනුත් අර්බුද ගණනාවකට මුහුණ දී තිබෙන අවස්ථාවක ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් කරන ලද ඉල්ලීමක් පරිදි විශේෂ පාර්ලිමේන්තු දිනයක් හැටියට සලකා අද දින පාර්ලිමේන්තුව කැඳවා මේ විවාදය පවත්වන අවස්ථාවට සම්බන්ධ වෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

මට පෙර කථා කරපු ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරද්දී මම බලාගෙන හිටියා, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සම්බන්ධව දැන් නැතුවට දැන් කියයි කියලා; '2026 - 2030 අපේ මධ්‍ය කාලීන මාර්ග සිතියම මෙන්න මේකයි' යනුවෙන් යම් යම් කරුණු ඉදිරිපත් කරයි කියලා. නමුත්, එතුමා දිගින් දිගටම "විපක්ෂය, විපක්ෂය, විපක්ෂය" කියමින් චෝදනා කළා. අතරින් පතර තැනින් තැන කිව්වා, "අපි මෙන්න මෙච්චර ඉලක්ක ගත්තා. අපි මේක දිනුවා" වාගේ දේවල්. නමුත්, අප පක්ෂ නායක රැස්වීමේදී බලාපොරොත්තු වුණේ, රජයේ ඉදිරි සැලැස්ම පිළිබඳව අපට මේ විවාදයේදී කථා කරන්න ලැබෙයි කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ අනෙකුත් කථිකයන් කථා කරද්දී, මේ රට බංකොලොත් වුණු විධිය ගැන කියමින් විපක්ෂයට දැඩි ලෙස චෝදනා කරනවා අපි බලාගෙන හිටියා. වත්මන් අගමැතිනියත්, ජනාධිපතිතුමාත්, විදේශ කටයුතු ඇමතිතුමාත් එවකට හිටියේ විපක්ෂයේ; මේ අප -සමගි ජන බලවේගයේ අප- හිටියේත් විපක්ෂයේ. හරියට නිකම් රට බංකොලොත් කරපු ආණ්ඩුවක අපත් හිටියා වාගේ එකට තියලා තමයි තමුන්නාන්සේලා කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ රට බංකොලොත් වුණු වෙලාවේ නැවත රට ප්‍රකෘතිමත් කරන්න IMF කොන්දේසිවලට අනුව ගමන් කරන්න ඒ කාලයේ හිටපු පාලකයෝ තීරණය කළා. දැන් වැල් පාලමේ මැද හරියේ රටත්, ආණ්ඩුවත් ගමන් කරමින් සිටින බවක් අපට පෙනෙනවා. ඒ නිසා දැන් මේ යන ගමන නවත්වන්නවත්, ආපසු හරවන්නවත් ආණ්ඩුවට වෙලාවක් නැහැ. ජනාධිපතිතුමාටත්, රජයටත් සිද්ධ වෙලා තිබෙනවා, අසීරුවෙන් හෝ වැල් පාලමේ ඉදිරියට යන්න. මොකද, වෙන විකල්පයක් නැහැ. මෙතැනදී වැදගත් වන්නේ මේ ගමන සමබරතාව පවත්වා ගනිමින් යෑමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නැත්නම් රට විශාල ප්‍රපාතයකට වැටෙන්න ඉඩ තිබෙනවා කියන එක අප කාටත් හොඳින් වැටහෙනවා. මේ ගමන යන විට සුක්කානම ජනාධිපතිතුමාගේ අතේ තමයි තිබෙන්නේ. සුක්කානම ජනාධිපතිතුමා අතේ තිබුණාට, එන්ජින් එක මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ළඟ තිබෙනවා වාගේ තමයි අප දකින්නේ. සුක්කානම ජනාධිපතිතුමා අතේ තිබුණාට, පසුගිය දවසක මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා විශ්‍රාම ගිය නිසා එන්ජින් එක අලුතින් දමන්න වුණා. දැන් මුදල් අමාත්‍යාංශයට අලුත් ලේකම්වරයෙකු පත් කර තිබෙනවා. දැන් සුක්කානම ජනාධිපතිතුමා අතේ තිබෙනවා, අලුත් එන්ජිමකුත් එක්ක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අසීරු මාර්ගයේ රට ගෙන යන්න සුක්කානමයි, එන්ජිමයි දෙකම එක වගේ වැදගත් වෙනවා. සුක්කානම පොඩ්ඩක් හරි අත හැරුණොත් අර පසුගිය දවස්වල අපට අහන්න, දකින්න ලැබුණා වාගේ ඛේදවාචකයක් වෙලා ආර්ථික වශයෙන් මහා ප්‍රපාතයකට අපේ රට වැටෙන්න ඉඩ තිබෙනවා. ඒ වාගේම තමයි, යන්තම් හරි එන්ජිම නතර වුණොත් අර ඉන්දියන් ගුවන් යානයට වුණා වාගේ බරපතළ විපාක ආර්ථික වශයෙන් විඳින්න අපට සිද්ධ වෙනවා. ඒ නිසායි මේ දෙකම එක වාගේම වැදගත් කියලා අප කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රගතිශීලී විපක්ෂයක් විධියට රට ගැන හිතලායි අප කටයුතු කරන්නේ. අපේ ගරු කෞශල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය කියා තිබෙනවා මම දැක්කා, පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ කටයුතුවලට උදව් කරන්න කියලා. මම කියන්න කැමැතියි, ප්‍රගතිශීලී විපක්ෂයක් විධියට අපි මේ ගමන දිහා සුභවාදීව බලන්න කැමැති බව. මේ ගමනේදී අපට පාලනය කරන්න පුළුවන් දේවල් වාගේම අපේ පාලනයෙන් ගිලිහුණු බොහෝ දේවලුත් අනන්ත වාරයක් මුණ ගැහෙයි. රටේ ජනතාව බඩගින්නේ තියන්නේ නැතිව, රට සංවර්ධනය දක්වා ගෙන යෑමේ විශාල පරාසයක අභියෝගයන්ට ඉදිරියේදී මුහුණ දෙන්නත් ආණ්ඩුවට සිද්ධ වෙයි. ඒ වාගේම, ලෝකය පුරා වර්ධනය වෙමින් පවතින යුද ගැටුම් තවදුරටත් වර්ධනය වුණොත් -විශේෂයෙන්ම මැද පෙරදිග කලාපයේ ඇති වෙච්ච මේ ගැටුම්කාරී තත්ත්වය වර්ධනය වුණොත්- ඒ හරහා අපේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇති වෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකයි බොහෝ දෙනෙක් කියන්නේ ලෝකයට කිඹුහුමක් ගියත් අපට හෙම්බිරිස්සාව හැදෙනවා කියලා. මේ යුද ගැටුම්වලට තාවකාලික විරාමයක් ලැබුණාට, යළිත් ඕනෑම මොහොතක එවැනි තත්ත්වයක් ඇති වීමේ අවදානමක් නැත්තේ නැහැ. මේ යුද ගැටුම් තත්ත්වය නිසා ඊශ්‍රායලයට අපේ ශ්‍රමිකයන් යවන එක තාවකාලිකව නතර වෙලා තිබෙනවා; බොර තෙල් බැරලයක මිල වෙනස් වෙලා තිබෙනවා; වැඩි වෙලා තිබෙනවා. අපේ ලොකුම තේ වෙළෙඳ පොළවල් අතරින් එකක් ඉරානය. ඉරානය, ඉරාකය ආදි රටවලට තමයි අපි වැඩියෙන් තේ අපනයනය කළේ. ඉරානය කියන්නේ අපේ හොඳම වෙළෙඳ පොළක්. යුද තත්ත්වය වර්ධනය

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

වුණොත් අපේ අනෙකුත් අපනයනවලටත් බලපෑමක් ඇති වෙන්න පුළුවන්කම තිබෙනවා. එම රටවල ජීවත් වන අපේ ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව ගැනත් කල්පනා කරන්න අපට සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැද පෙරදිග යළි යුද තත්ත්වයක් ඇති වුණොත්, තේ අපනයනකරුවන්ගේ සංගමයේ දත්තවලට අනුව එය අපේ රටේ සමස්ත තේ අපනයනයෙන් සියයට 60කට සෘජුව බලපානවා. පසුගිය අප්‍රේල් මාසයේ ඉරාකයට තේ මෙට්‍රික්ටොන් 11,575කුත්, ලිබියාවට තේ මෙට්‍රික්ටොන් 7,612කුත්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයට තේ මෙට්‍රික්ටොන් 5,521කුත්, ඉරානයට තේ මෙට්‍රික්ටොන් 4,090කුත් අපනයනය කර තිබෙනවා. ඒ නිසා ඒ කලාපයේ යම් සිදුවීමක් වුණොත් ඒක අපේ රටේ තේ කර්මාන්තයටත්, විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කය ආදි දිස්ත්‍රික්කවල ජනතාවටත් බලපානවා. කුඩා තේ වතු හිමියන්ටත් ඒක විශාල වශයෙන් බලපානවා. රටේ සමස්ත ආර්ථිකයට ඒක ලොකු බලපෑමක් වෙනවා. මෙවැනි තත්ත්වයක් ඇති වුණොත් රටක් ලෙස රජයට තිබෙන සූදානම මොකක්ද කියලා ගිය සතියේ පාර්ලිමේන්තුව රැස් වුණු වෙලාවේ අපි දිගින් දිගටම ප්‍රශ්න කළා. අපි ඒ ගැන කථා කරන්න හදන කොට ඒකට ඉඩ දුන්නේ නැහැ. අපි ගරු කථානායකතුමාගෙන් විනාඩි එකහමාරක් ඉල්ලුවා, මේ සම්බන්ධයෙන් පොඩි කාරණයක් පැහැදිලි කර ගන්න; ආණ්ඩුවේ සූදානම මොකක්ද කියලා අහන්න. ඒකට ඉඩ දුන්නේත් නැහැ. අන්තිමට අපට සිද්ධ වුණා, මන්ත්‍රීවරුන් 20දෙනෙකු එක්ක නැඟිටලා ඒ ඉල්ලීම කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාවලදී රාජ්‍ය තාන්ත්‍රිකභාවය ඉතාම වැදගත් වනවා. අසල්වැසි රටවල සහයෝගය ලබා ගැනීම අත්‍යවශ්‍ය වනවා. ලෝකයේ ප්‍රබල රටවල සහයෝගයත් ඉතාම වැදගත් වනවා. ඒ වාගේම, අත්‍යවශ්‍ය භාණ්ඩ අපනයනය සඳහා විකල්ප වෙළඳපොළවල් අපට ඉතා වැදගත් වනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකාව විසින් අපේ රටට පනවලා තිබෙන තීරුබදු අනුපාතය අඩු කර ගැනීමත් ඉතා වැදගත් වනවා. මේ ගැන පසුගිය කාලයේ රජය සාකච්ඡා ගණනාවක් පැවැත්වූවා. නියෝජ්‍ය ඇමතිවරයෙක් ගිහිල්ලා ඒ රටේ අදාළ ප්‍රධානීන් එක්ක සාකච්ඡා කරනවා කිව්වා. මට මතකයි, අපි විපක්ෂය හැටියට ඉල්ලීමක් කළාම ඒ ගැන කථා කරන්න සර්ව පාක්ෂික සමුළුවකුත් අපට ලබා දුන්නා. අපි එතැනදී අදහස් ඉදිරිපත් කළා. ජනාධිපතිතුමා කිව්වා, "මේ ගැන රටවල් දෙකම එකතු වෙලා අපි ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරනවා" කියලා. නමුත්, තවම එවැනි නිල ප්‍රකාශයක් අපි දැක්කේ නැහැ. ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිතුමා අපට ලබා දුන්න සහන කාල සීමාවත් දැන් අවසන් වෙමින යනවා. තමුන්නාන්සේ දන්නවා මේ ආණ්ඩුව ගැනත්, ජනාධිපතිතුමා ගැනත්, ජනතාව අතිවිශාල බලාපොරොත්තුවක් තබා තිබෙන්නේ කියලා. ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් ඔබතුමන්ලාට ඡන්දය දුන්නා විශාල වශයෙන්, මිනිස්සු. 159ක් මන්ත්‍රීවරු ඉන්නවා තමුන්නාන්සේලාට. තුනෙන් දෙකකටත් වැඩි අසීමිත බලයක් තමුන්නාන්සේලාට ලැබිලා තිබෙනවා. මෑත කාලයේ මට නම් මතක් වෙන්නේ නැහැ ඒ වාගේ ජනවරමක් ලැබුණු ආණ්ඩුවක් තවත් තිබුණාද කියලා. නමුත්, මාස හය, හතකින් පස්සේ ඡන්දයක් තිබ්බාම තමුන්නාන්සේලා විශාල පසුබෑමකට ලක් වෙලා තිබෙනවා. ඒ ඡන්ද පදනම ලක්ෂ 23කින් නාය ගියා. මේ තරම් ඉක්මනට ජනතා විශ්වාසය පලුදු කර ගත් ආණ්ඩුවක් මෑත කාලයේ අපි දැක්කේ නැහැ.

ඔබතුමන්ලා මැතිවරණ කාලයේ ජනතාවට අසීමිත බලාපොරොත්තු දුන්නා. විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කිව්වා. රුපියල් 9,000ක බිල රුපියල් 6,000ක් වන හැටි, රුපියල් 6,000ක බිල රුපියල් 3,000ක් වන හැටි ගැන ගණන් හදලා ජනතාවට පොරොන්දු වුණා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඡන්දයක් දීලා ජනතාවට වුණු දේ බලන්න. ආණ්ඩුව ආපු ගමන් හාල් හිඟ වුණා. හාල් මිල නැග්ගා. ඉතිහාසයේ වැඩිම හාල් මිල වාර්තා වුණා. ඊට පස්සේ පොල් ගණන් ගියා. කවදාවත් පොල් ගෙඩියක් මේ තරම් මිලක් දීලා අපේ රටේ මිනිසුන් අර ගත්තේ නැහැ. මේ ආණ්ඩුව ආවාට පස්සේ තමයි ඒකත් සිද්ධ වුණේ. ආණ්ඩුව ආවාම බුරියානි කන්න බලාගෙන හිටපු ජනතාවට අන්තිමට ලුණුයි බතුයි කන්න බැරි තත්ත්වයක් උදා වුණා.

විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කියලා දැන් යළිත් වතාවක් සියයට 15කින් ඉහළ දාලා තිබෙනවා. ඉදිරියේදී ජනතාවට ඒකත් විශාල වශයෙන් දැනෙන්න පටන් ගන්නවා. ජනතාවගේ ජීවන වියදම අද වනකොට විශාල වශයෙන් වැඩි වෙලා. ඒක මේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කියලා කොයි විධියට තර්ක නැගුවත් මහ ජනතාවට හොඳට දැනෙනවා. ඉදිරියේදී ඉන්ධන මිල එහෙම වැඩි වෙන්න වුණොත්, තවදුරටත් ජීවන බර වැඩි වනවා, ඒක වළක්වන්න බැරි වනවා. ඒ නිසායි ජනතාව කියන්නේ, ඔවුන් බලාපොරොත්තු වුණු සහන ආණ්ඩුවෙන් තවම ලැබිලා නැහැ කියලා.

ආණ්ඩුව ආපු ගමන් ලොකු සද්ද දාලා ව්‍යාපෘති පටන් ගත්ත හැටි අපට මතකයි. ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති දෙකක් මට මතක් වනවා. Clean Sri Lanka කියලා එකක් මහ සද්දයක් දාලා පටන් ගත්තා. අද ලත් තැනම ඒක ලොප් වෙලා තිබෙනවා. රිළා සංගණනයත් ඒ වාගේමයි. ඒකත් සද්දේ දාලා පටන් ගත්තා. ජනතාවගෙන් ඒකට කිසිම ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. මාස ගණනකට පස්සේ වාර්තාවක් නිකුත් කරලා තිබෙනවා. ඒ වාර්තාවට අනුව ගන්න ක්‍රියා මාර්ගය ගැන දැන ගන්න අපි හරි ආසයි. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඇඟලුම් කර්මාන්තශාලා අද බොහොම අමාරුවෙන් පවත්වාගෙන යන්නේ කියලා. ඒ සේවකයන්ට වැටුප් ගෙවීම ප්‍රශ්නයක් වෙලා. සමහර කර්මාන්තශාලා වැහිලා. මම දැක්කා, ගිය පාර්ලිමේන්තු සතියේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් ඇමතිතුමා ප්‍රශ්නයකට උත්තර දෙනකොට කියනවා, තේ කර්මාන්තශාලා හැම දිස්ත්‍රික්කයේම විශාල වශයෙන් වැහීගෙන යන හැටි. ඒ නිසා ලොකු අර්බුදයක් රටේ තිබෙන්නේ. මොනවා කථා කළත්, මොන දේශපාලන කථා මෙතැන පැවැත්වුවත් ඒක නැහැයි කියන්න කාටවත් පුළුවන්කමක් නැහැ.

තමුන්නාන්සේලාගේ මංගල අය වැයේදී සල්ලි වෙන් කරපු හැටි අපට මතකයි. කෘෂිකර්ම වාගේ අමාත්‍යාංශයකට මුදල් වෙන් කළේ අටවැනි තැනට තමයි. ලෝක ආහාර වැඩසටහනේ 2023 ගෘහස්ථ සුරක්ෂිතතා දළ විශ්ලේෂණයට අනුව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ පවුල්වලින් සියයට 24ක්ම ඉන්නේ ආහාර අනාරක්ෂිතභාවයෙන්. ඒක සුළුපටු ප්‍රශ්නයක් නොවෙයි. ඒ අතර කාන්තා ගෘහමූලික පවුලුත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. වතුකරයේ ජනතාව අතරත් ආහාර අනාරක්ෂිතතාව බහුලවම දකින්න තිබෙනවා. ඒ නිසා රටේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව ඉතා වැදගත්කොට සැලකීමට ආණ්ඩුවට වගකීමක් තිබෙනවා.

අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම කියන්න කැමැතියි, ගෙවුණු මාස හය, හතට වැඩිය ඉදිරි මාස හය ආණ්ඩුවට අභියෝගාත්මක වෙන්න පුළුවන් කියන එක. ඒ නිසා IMF එකේ මාර්ගෝපදේශවලට යටත්ව, ජනතාවට සහන දෙමින්, රටේ ආර්ථිකය ශක්තිමත් කරමින්, වැල් පාලමේ ඉතිරි ටික යන විධිය ගැන රටේ ජනතාවත්, සමස්ත විපක්ෂයත් -අපි කවුරුත්- ඉතා විමසිල්ලෙන් ආණ්ඩුව දිහා බලාගෙන ඉන්නවාය කියන එක තමයි මට අවසාන වශයෙනුත් කියන්න තිබෙන්නේ.

ඔබතුමා මට කාලය ලබා දීම ගැන ස්තුති කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Chandima Hettiaratchi. You have 11 minutes.

[අ.භා. 12.20]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026" පිළිබඳ විවාද කරන මේ අවස්ථාවේ මම කැමැතියි, Fiscal Strategy Statement - FSS - එක ඉදිරිපත් කිරීමේදී එයට පදනම් වෙච්ච පනතේ අරමුණු ගැන කථා කරන්න.

ඇත්තටම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අරමුණු තුනක් තිබෙනවා. පළමුවැනි එක, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමේ දී ආදායම්, වියදම්, වගකීමට බැඳීම, මූල්‍යයනය කිරීම, රජයේ කොටස් අයිතිය, වත්කම් සහ බැරකම් පිළිබඳ විනිවිදභාවය, වගවීම, විනය, ඵලදායීතාව, කාර්යක්ෂමතාව සහ අරපිරිමැස්ම සඳහා ප්‍රමිති, නියමයන්, රීති සහ කාර්ය පටිපාටි සකස් කිරීම.

දෙවැනි එක, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමේ දී මූල්‍ය වගවීම සඳහා වූ අරමුණු හා රීති ක්‍රියාත්මක කිරීම ඇතුළුව වාර්ෂික අය වැය සැලසුම් කිරීම, සකස් කිරීම, සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අධීක්ෂණය කිරීම, ඇගයීම, අභ්‍යන්තර පාලනය, ගිණුම්කරණය සහ වාර්තා කිරීම සඳහා අනුගමනය කළ යුතු නියමයන් සහ කාර්යපටිපාටි නිශ්චිතව දැක්වීම. තුන්වැනි එක තමයි, කාර්යසාධන සහ වගවීම් නියමයන් නිශ්චිතව දැක්වීම. ඒවා තමයි මේ පනතේ අරමුණු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත කාගේ වුණත්, කවුරු හැදුවත් මේක තමයි අපේ රටේ නීතිය. ඒකට යටත්ව අපට කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ පනත මොන සන්දර්භයක් යටතේ ද එළියට ආවේ? රට වට්ටපු යථාර්ථයක් ඇතුළේ, මංකොල්ල කාපු යථාර්ථයක් ඇතුළේ, අපි බංකොලොත් කියලා ලෝකය ඉස්සරහා කියලා පිළිගත්ත මොහොතක, ජනතාව විසින් පාලකයන් පලවා හැරපු මොහොතක තමයි මේ පනත ආවේ. ඒ විනාශයට වග කිවයුතු දේශපාලනඥයන්, නිලධාරීන් ඇතුළු සියලුදෙනා මේ පනතේ අරමුණුවලින් බැඳ දමන්න සිද්ධ වුණා. ඔවුන්ටම මේ මේ පනත අරගෙන එන්නත් සිද්ධ වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි වාගේ දූෂණ විරෝධී ව්‍යාපාරයකට, අපි වාගේ දූෂණ විරෝධී ආණ්ඩුවකට මෙවැනි නෛතික බැඳීමක් සමඟ ප්‍රතිපත්තිමය ලෙස, හරයාත්මක ලෙස එකඟ වෙන්න පුළුවන් පනතක් එක්ක කටයුතු කරන්න බාධාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ FSS එක මොකක් වෙනුවෙන්ද? ඒක තමයි වැදගත්ම කාරණය. ඉදිරි අවුරුදු පහ තුළදී කොහොමද මේ කටයුතු පවත්වාගෙන යන්නේ, ඒවා කරන්න යන්නේ කොහොමද කියන කරුණු තමයි අපි මේක ඇතුළේ කියන්න යන්නේ. මොන දිශානතියකටද රට අරගෙන යන්නේ කියන එක තමයි කියන්න යන්නේ. ඒ කථාව රටට කියන්න ඕනෑ. ඒක තමයි මේ තුළින් කරන්න උත්සාහ කරන්නේ. ණය ගන්නේ කොහොමද, ණය සීමා මොනවාද, වියදම් මොනවාද, කොපමණ සීමා පවත්වාගෙන යනවාද කියනා කාරණා තමයි මේකේ තිබෙන කාරණා. මේ FSS එක හදද්දී, ඒ කාර්යයන් නිශ්චය කරලා තිබෙනවා බොහොම පැහැදිලිව.

ඒවා මොනවාද කියලා බැලුවොත්, පළමුවෙනි එක තමයි, වාර්ෂික අය වැය පිළියෙල කිරීමට පෙර ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ විධිමත් ප්‍රකාශයක් පාර්ලිමේන්තුව වෙත සහ මහජනතාව වෙත ඉදිරිපත් කිරීම. දෙවැනි එක, එළඹෙන වර්ෂයට අදාළ වාර්ෂික අය වැය සඳහා උපායමාර්ගික මාර්ගෝපදේශ සැපයීම. තුන්වැනි එක, මූල්‍ය කාර්යසාධනය වාස්තවික ලෙස ඇගයීමේ පදනමේ පිහිටුවීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාස්තවික ලෙස ඇගයීමේ පදනම පිහිටුවීම කියන එක ඉතාම වැදගත්. හතරවැනි එක තමයි, ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපායෙහි කාර්යසාධනය පිළිබඳව වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ මූල්‍ය විනිවිදභාවය සහ වගවීම වැඩි කිරීම. මේ තමයි මේ පනත යටතේ අපට පැවරිච්ච කාර්යය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න එතකොට තමයි සැලැස්මක් සහිතව, පීලි පනින්නේ නැතුව, කලින් පීලි පැන්නා වාගේ නැවත නැවත පීලි පනින්නේ නැතුව රට ඉස්සරහට අරගෙන යන්න පුළුවන් වෙන්නේ. ඒ කොහොමද? අර ශ්‍රීලන්කන් ගුවන් සේවයේ , ගුවන් සේවිකාවක් අරගෙන ජනාධිපති ලේකම් කාර්යාලයේ ජොබ් එකක් දීලා, අතැන පඩියයි, මෙතැන පඩියයි, පඩි දෙකම දීලා, පඩි ගත්ත වැඩේ නැතුව වෙන වැඩවලට යොදාගෙන කළා වාගේ, ඒ ජාතියේ අවභාවිත වළක්වන්න පුළුවන් වෙන්නේ මේ වැඩ පිළිවෙළ හරහා තමයි. ඒ වාගේම ඇස් පොට්ට කරන බෙහෙත් ගේන්න බැරි වෙන්නේ එතකොට තමයි. ඒ වාගේම බෙහෙත් කියලා ලුණු වතුර පිළිකා රෝගීන්ට විදින්න බැරි වෙන්නේ එතකොට. එතකොට තමයි ඒවා කරන්න බැරි වෙන්නේ. එතකොට තමයි ජනතාවට තේරෙන්නේ කිරි හරක් ගේන්න කියලා මේ රටේ හිටපු හොර හරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 62ක්, මිලියන 11ක් වශයෙන් ණය දෙකක් ගත්ත බව. අරගෙන ඒකත් හොරා කෑව බව. අන්තිමට Performance Bond එකක් නැතුව රුපියල් ලක්ෂ 17,000ක් ගෙවලා දැම්මා කියන එක ජනතාවට තේරෙන්නේ මේ වගේ ක්‍රියාමාර්ග ගත්තාමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර හිඟන නයි අප්පුලාට මේවා තේරෙන්නේ නැහැ. එක්කෝ, පෙනෙන්නේ නැහැ. එහෙමත් නැත්නම් පෙනෙන්නේ නැහැ වාගේ ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මේ රට ගොඩනඟන්න අපට තිබෙන උපකරණ හොරු විසින් හදපුවා නම්; ඒවා මේ හිඟන කාණ්ඩය විසින්ම හදපුවා නම්, ඒවා කොච්චර කැඩිලා තිබුණත්, ඒවා කොච්චර සවුත්තු වෙලා තිබුණත්, රට ඉස්සරහට අරගෙන යන්න; රට ප්‍රගමනය කරා අරගෙන යන්න ඒවා පාවිච්චි කරන්න වුණොත්, ඒවා හරි විධියට පාවිච්චි කරන්න අපි සූදානම්. දැන් සමහර බබාලා කියනවා; සමහර පුංචි පුතාලා කියනවා, "මොනවාද කරන්නේ කියලා මේ වාර්තාවේ කියලා නැහැ, ඒවා කියන්න" කියලා. අපට කියන්න තිබෙන්නේ, "අප්පා කළ දේ නම් කරලා නැහැ, පුතේ" කියන එකයි. මේ පොත කියෙව්වේ නැත්නම් පුතාලාට පහසු වෙන්න 12වැනි පිටුව කියවා ගත්තොත් හොඳයි. 2026, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි 12වැනි පිටුවේ මෙහෙම තිබෙනවා:

> "මෙම ඉලක්ක වෙත ළඟා වීම සඳහා, ශ්‍රී ලංකා රජය විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇත. බදු නිදහස් සීමාවෙන් අඩු කිරීම, බදු අනුපාත සංශෝධනය කිරීම සහ සංස්ථාපිත ආදායම් බදු අනුපාත ඉහළ නැංවීම වැනි බදු ප්‍රතිපත්තිවල වෙනස්කම් මේ සඳහා ඇතුළත් වේ. ඊට අමතරව, එකතු කළ අගය මත බදු අනුපාත සහ නිෂ්පාදන බදු/සුරාබදු සඳහා සිදුකරන ලද ගැලපීම් මෙම ආදායම් වර්ධනයට සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට දායක විය.
>
> ආදායම් වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගයන්ට සමගාමීව වියදම් තාර්කිකරණ ක්‍රියාමාර්ගයන් ද මධ්‍ය කාලීනව පවත්වා ගනු ඇත. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ/අලෙවිකරණය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ව්‍යවසාය සහ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත පැවරුම් අඩු කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් සහාය දක්වන සංවර්ධන ව්‍යාපෘතිවල විචක්ෂණශීලී ආයෝජන, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව තාර්කිකරණය කිරීම මෙයට ඇතුළත් වේ."

කියවා ගන්න බැරි වුණා නම්, මොනවාද කරන්නේ; කරන විධිය මොකක්ද කියලා ඔන්න 12වැනි පිටුවේ තිබෙනවා. අවශ්‍ය නම් කියවා ගන්න පුළුවන්.

[ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා]

ඊට පස්සේ තව කෙනෙක් හරියට කුලප්පු වෙලා දැඟලුවා. මොකක්ද වාර්තාවක් අරගෙන ඇවිල්ලා කියෙව්වා. "හොරකම් කරලා, හොරකම් කරලා, රේගුවෙන් හොරකම් කරලා ආවා" කියලා කිව්වා. හරි සරලයි. මේ කමිටුව කවුරු පත් කළ එකක්ද? විපක්ෂ නායකතුමා පත් කරපු කමිටුවක්ද? නැහැ, මේක ගරු ජනාධිපතිතුමා පත් කරපු කමිටුවක්. මොකක්ද, ජනාධිපතිතුමාගේ අරමුණ, - intention එක - ඉලක්කය? ඒක හරි පැහැදිලියි. වරදක් වෙලා තිබෙනවාද, වරදක් වෙලා නැද්ද කියලා විමර්ශනය කරලා බලන්න ජනාධිපතිතුමාට ඕනෑ වෙලා තිබෙනවා. වරදක් වෙලා නැත්නම්, නිවැරදි බව සහ සත්‍යගරුක බව තහවුරු කරන්න. ඒ වාගේම වරදක් වෙලා තිබෙනවා නම් ඒක නිවැරදි කරන්න. මේ වාර්තාව ගෙනාවේ කවුද? මේක හැදුවේම ජනාධිපතිවරයාගේ වුවමනාව මත, එම විමර්ශන අවශ්‍යයි කියලා කරපු ඉල්ලීම මත. එම නිසා ජනාධිපතිතුමා ක්‍රියාමාර්ග ගන්නකල් බලාගෙන ඉන්නේ නැතුව, හදිසියේ කොළයක් අරගෙන ඇවිල්ලා මේක ඇතුළේ කෑ ගහගෙන, කෑ ගහගෙන ගියාට මොකුත් වෙන්නේ නැහැ. TV එකට පෙනෙන්නට කරන වැඩ තමයි, මේ. හදිසි වුණාට වැඩක් නැහැ. ඔය හදිසියෙන් මොකුත් වෙන්නේ නැහැ. මේ වාර්තා හරියට මහ බැංකුව කොල්ල කාලා footnotes ගහනවා වාගේ නොවෙයි කියන එකත් විශේෂයෙන්ම අපි මතක් කරන්නට ඕනෑ. මේ වාර්තාව හරියට මහ බැංකුව මහා දවාලේ කොල්ල කාලා ලොක්කා බේරාගන්න පොත ලියනවා වගේ නොවෙයි. ඒ කට්ටිය කවුද කියලා රටම දන්නවා. මේක ඒ වාගේ නොවෙයි. එම නිසා ඉවසාගෙන ඉන්න ඕනෑ. එතකොට තමයි මේක හරියට ක්‍රියාත්මක වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් හොරු එක්ක ගිය කාලය ඉවරයි; හොර ක්‍රමත් එක්ක ගිය කාලය ඉවරයි. ඒ වාගේම හොරු එළියේ ඉන්න කාලයත් ඉවරයි. දැන් ප්‍රතිපත්තියකට, සැලැස්මකට අනුව යන්නේ කොහේද, යන්නේ කොහොමද කියන එක ජනතාවට කියලා, ජනතාවත් එක්ක යන ගමනක් තමයි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා "යකො මල් පොල් දේශපාලනය" දැන් ඉවරයි; "යන්නේ කොහේද, මල්ලේ පොල්" දේශපාලනය, ඒ කියන්නේ "යකො මල් පොල් දේශපාලනය" දැන් ඉවරයි. මේ විපක්ෂය "යන්නේ කොහේද, මල්ලේ පොල්" ජාතියේ "යකො මල් පොල්" දේශපාලනය කරන විපක්ෂයක්, කෙබර විපක්ෂයක්. ඒ දේශපාලනය දැන් ඉවරයි. එම නිසා අපි යහ පාලනයක්, වඩාත් ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක් ගොඩනඟන්න උත්සාහ කරනවා. අපි එය වඩාත් සාර්ථකව ඉදිරියට අරගෙන යමු. ඒක තමයි මේ වෙලාවේ රට වෙනුවෙන් අපට ගන්න තිබෙන වැදගත්ම තීරණය වන්නේ.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අද අපි සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විධියට කථා කරන්නේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026 සම්බන්ධයෙන්. ඇත්ත වශයෙන්ම සතුටුයි, අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරියක වන ගරු කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන සහ ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා එම යෝජනාව ස්ථිර කිරීම ගැන. මොකද, අපේ කාරක සභාව තුළදී අපි මූල්‍ය විනය පිළිබඳව, රාජ්‍ය මූල්‍යය පිළිබඳව දීර්ඝ සහ ගැඹුරු සාකච්ඡාවල නිරත වෙනවා. ආධුනික මන්ත්‍රීවරියක සහ මන්ත්‍රීවරයෙකු වන එම දෙපළ සම්බන්ධයෙන් මා සතුටු වෙනවා.

මම ඉස්සර වෙලාම කියන්න ඕනෑ, අපේ කාරක සභාවේ සාමාජිකයෙකු වුණු ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමා අපේ කමිටුවෙන් ඉල්ලා අස්වුණු බව. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙනුත් ඉල්ලා අස්වෙලා මුදල් අමාත්‍යාංශයේ ලේකම් බවට පත් වෙලා තිබෙනවා. මම ඒ ගැන දේශපාලන විවේචන මොකුත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එතුමා මාත් එක්ක ගොඩක් තර්කවල පැටලුණා, පාර්ලිමේන්තුවේදීත්. නමුත්, එතුමාට මම සුබ පතනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම් විධියට හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමාට භාරගන්න වෙලා තිබෙන්නේ දැවැන්ත වගකීමක්. මොකද, මීට කලින් හිටපු අපේ මහින්ද සිරිවර්ධන ලේකම්තුමාත් විශාල අභියෝග මැදයි කටයුතු කළේ. එතුමාගේ සේවාවත් අපි අගය කරන්න ඕනෑ. ඇත්තවශයෙන්ම එතුමාට ගල්, මුල් ප්‍රහාර එල්ල වෙද්දී මේ පාර්ලිමේන්තුවේදී අපි එතුමා වෙනුවෙන් අපේ සම්පූර්ණ සහයෝගය පළ කළා. මොකද, ලෙහෙසි දෙයක් නොවෙයි එතුමාට කරන්න සිද්ධ වුණේ. ඊට කලින් මුදල් අමාත්‍යාංශයේ හිටපු අපේ ආර්.එච්.එස්. සමරතුංග ලේකම්තුමා ඇතුළු ඒ සියලුදෙනාම ඉතාම බැරෑරුම් කාර්යභාරයක් ඉෂ්ට කළේ. ඉතින්, රජය වෙනුවෙන් හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමාටත් ලොකු වැඩක් කරන්න තිබෙනවා. අපට පුළුවන් සහයෝගයක් පාර්ලිමේන්තු සම්ප්‍රදාය ඇතුළේ විපක්ෂය හැටියට ඒ සඳහා ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කෞෂල්‍යා ආරියරත්න මැතිතුමිය කථා කරනකොට, එතුමිය කථාව focus කළේ Jayati Ghosh සම්බන්ධයෙන්. මොකද, Professor Jayati Ghosh, Professor Martín Guzmán වැනි අය ලංකාවට ආ වෙලාවේ පැලවත්ත කාර්යාලයටත් ගියා. අපේ ගරු අනිල් ජයන්ත ඇමතිතුමාත් ඒ සාකච්ඡාවේ සිටියා, ලේකම්තුමාත් සිටියා. එතැනදී සාකච්ඡා වෙච්ච කාරණාව තමයි දැන් මේ ආරියරත්න මන්ත්‍රීතුමිය කිව්වේ. යටත් විජිත ක්‍රමයට මේ ගෝලීය දකුණ, ගෝලීය උතුර වෙනස් කරගෙන අපි raw material මෙහෙන් යවලා පිට රටවලින් ඒවා නිෂ්පාදනය කරලා නැවත අපට එවනවා, ඒක දේවත්වයෙන් නව ලිබරල් ක්‍රමය හදපු අයට ඉතාම හොඳයි, නමුත් මේ ආණ්ඩුව නම් එහෙම කරන්නේ නැහැ වාගේ කථාවක් තමයි එතුමිය කිව්වේ.

හැබැයි, මෙතැනදී කාරණා දෙකක් මම මතක් කරන්න ඕනෑ. Jayati Ghosh, Martín Guzmán වැනි අය සමඟ සාමාන්‍ය අපේ කියවන සමාජයට ඉදිරිපත් කරපු අදහස් නොවෙයි අද මේ රජය ක්‍රියාත්මක කරන්නේ. මොකද, එතැනදී ඔවුන් මූලික කාරණා දෙකක් කථා කළා. මටත් හොඳට මතකයි, Sri Lanka Foundation Institute එකේ packed audience එකක් තිබුණා. මමත් එහි ඉස්සරහ පෙළේම වාඩිවෙලා සිටියා. එතැනදී ඔවුන් කාරණා දෙකක් කිව්වා. ඉන් එකක් වන, IMF එකත් එක්ක ගොඩ ගිය රටවල් නැහැ කියනකොට එදා NPP එකේ හිටපු අය මහා සද්දෙට අත්පුඩි ගැහුවා. ඊට පස්සේ තව කථාවක් කිව්වා. මේවා odious debt, ඒ කියන්නේ මේ ණය අරගෙන තිබෙන්නේ මූලික වශයෙන් හොරකම් කරන්න, ඒ නිසා debt audit එකක් කරලා මිසක් ශත පහක්වත් මේ ණය ගෙවන්න අවශ්‍ය නැහැ වාගේ කථාවක් කිව්වා. එතකොටත් ඒ අය මහා සද්දෙට අත්පුඩි ගැහුවා. මට එහා පැත්තේ හිටපු පුද්ගලයාගෙන් මම ඇහුවා, "ඇයි ඔයා අත්පුඩි ගහන්නේ, මෙහෙම කරන්න පුළුවන් කියලා ඇත්තටම විශ්වාස කරනවාද?" කියලා. ඔහු කිව්වා, "ඔව්" කියලා. ඒ දීපු පොරොන්දු සහ අද වෙන දේ සම්බන්ධයෙන් අපට කථා කරන්න පුළුවන්. හැබැයි, මම මේ මොහොත ඒකට අවස්ථාවක් කරගන්නේ නැහැ.

අද අපට මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කර තිබෙනවා. මම ඒ පිළිබඳව කථා කරන්නම්. මේ තුළ ඉදිරිපත් කර තිබෙන මධ්‍යකාලීන මූල්‍ය රාමුව 2025-2030 තමයි මම හිතන විධියට මේ තුළ තිබෙන වැදගත්ම දේ. එම වගුව තිබෙන්නේ මෙම ප්‍රකාශයේ 5වැනි පිටුවේ. මේ වගුවෙන් කියන්නේ මොකක්ද? ගිය අවුරුද්දේ ආර්ථිකය සියයට 5කින් වර්ධනය වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. නමුත් මේ අවුරුද්දේ එය සියයට 3.5ට ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ අඩු වෙනවා. ඊළඟට, ඔවුන් පුරෝකථනය කර තිබෙන්නේ එන අවුරුද්දේ ඉඳලා 2030 අවුරුද්ද වෙනකම් සියයට 3.1කින් සිදුවන ආර්ථික වර්ධන වේගයක් ගැන. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව අද ඉදිරිපත් කරපු, යාවත්කාලීන කරපු අවුරුදු 4 වැඩ පිළිවෙළ යටතේ 2026 වසරේ ඉඳලා මේ රජය බලාපොරොත්තු වෙන්නේ සියයට 3.1ක උපරිම ආර්ථික වර්ධනයක්.

මට තිබෙන මූලික ගැටලුව මේකයි. සියයට 3.1ක ආර්ථික වර්ධනයකින් මේ රට දියුණු කරන්න බැහැ. අපි දැක්කා, අපි කවුරුත් ගරු කරන ආචාර්ය ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මැතිතුමා ඊයේ-පෙරේදා කියා තිබුණා, අවම වශයෙන් සියයට 8කවත් ආර්ථික වර්ධනයක් නැත්නම් අපි බලාපොරොත්තු වන තැනට කිට්ටු කරන්නවත් හැකියාවක් නැහැ කියලා. ඒ නිසා Jayati Ghosh කියපු විධියට, එහෙම නැත්නම් Martín Guzmán කියපු විධියට රජය විසින් මේ පිළිබඳව තමන්ගේ දැක්ම ඇත්තටම වෙනස් කරගෙන තිබෙනවා නම්, මේක මෙහෙම වෙන්න බැහැ, මේක මීට වඩා වෙනස් වෙන්න ඕනෑ. පසුගිය කාලයේ ලොකු විවේචනයක් ඉදිරිපත් කළා, ආර්ථික වර්ධනය අඩු කරනවා නම් ආණ්ඩු මොනවාටද කියලා. මේ කරන්නේත්, අඩු කිරීමක් නේ. සියයට 5 ඉඳලා සියයට 3.5ට අඩු වෙනවා. ඊළඟට, සියයට 3.1ට අඩු වෙනවා. මම අහන්නේ මේකයි. System එක change වෙලා නම්, අලුත් විධියට හිතනවා නම්, ඩොලර් බිලියන ගණන් ආයෝජන එනවා නම් ඇයි, ආර්ථිකය වර්ධනය නොවෙන්නේ?

මම කැමැතියි, මේකට තවත් යමක් එකතු කරන්න. මධ්‍යකාලීන මූල්‍ය රාමුව කියන කොටසේම දක්වා තිබෙනවා, අපේ වියදම් සීමාවත්. කලිනුත් මේ කථාව කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ප්‍රාථමික වියදම, ඒ කියන්නේ ණය සේවාකරණය හැර අපි කරන සියලු වියදම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13කට සීමා කරන්න ඕනෑ. අපි උදාහරණයක් ගනිමු. රජය කියා තිබෙනවා, සියයට 15ක් ආදායම ලබා ගන්නවා කියලා. ඒක හොඳයි. ප්‍රේමදාස ජනාධිපතිතුමා ඉන්නකොටත් එය සියයට 21කට වාගේ ගියා. අපට අවස්ථාව තිබෙනවා, අපේ සමකාලීන රටවල් සමඟ, සමාන රටවල් සමඟ එක්ව ආදායම තව වැඩි කරගන්න. නමුත් අපි උපකල්පනය කරමු, යම් කිසි විධියකට මේක සියයට 15ට වඩා වැඩි වුණා කියලා. එසේ වැඩි වුණාට ඒ ආදායම අපට වියදමට පාවිච්චි කරන්න බැහැ. මොකද, ගරු අනිල් ජයන්ත ඇමතිතුමා අත්සන් කරපු IMF Agreement එකේ වැඩබලන මුදල් ඇමති හැටියට එතුමා පිළිගන්නවා, සියයට 13 තමයි රජය විසින් වියදම් කරන්න බලාපොරොත්තු වෙන්නේ කියලා. එදිනෙදා වියදම් ගැන නොවෙයි මම මේ කියන්නේ. ප්‍රාග්ධන වියදම් නැතුව අපි බලාපොරොත්තු වන ආර්ථික වර්ධනය සියයට 8ට, 9ට ගෙනියන්න අමාරුයි. ඒක තමයි මේ සියයට 3ට හිර වෙලා තිබෙන්නේ. එහෙම නම් මොකක්ද, කළ යුත්තේ? කළ යුත්තේ අපි දේශීය සහ විදේශීය ආයෝජන ලබා ගැනීමයි. ඒ ආයෝජන ලබා ගැනීමේදී නොයෙකුත් ආර්ථික ප්‍රතිසංස්කරණ කරන්න ඕනෑ. ඔන්න ඔතැන තමයි ඕකේ catch එක තිබෙන්නේ.

ඔබතුමන්ලා කිව්වා, ලංකාවේ පළමුවෙනි වතාවට රුපියල් බිලියන 1,400ක් මෙවර ප්‍රාග්ධන වියදම් හැටියට දරනවා කියලා. ගරු ජනාධිපතිතුමාම ඒක කිව්වා. හැබැයි අපි දන්නවා, දැනට කොපමණද ඒ සඳහා වියදම් කර තිබෙන්නේ කියා. එදා අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අහනකොට, මාස 5කට වියදම් වෙලා තිබුණේ මම හිතන විධියට රුපියල් මිලියන 160 ගණනක්. අපි හිතමු, රුපියල් මිලියන 400ක් දැන් වෙනකොට වියදම් වෙලා කියලා. එහෙම නම් කොහොමද, රුපියල් බිලියන 1,400ක් වියදම් කරන්නේ? ඇයි, මේකේ හිර වෙලා තිබෙන්නේ? මොකක්ද, අවුල? මේ අවුල ලිහා ගන්නේ කොහොමද? පෞද්ගලික ආයෝජන ගැන කථා කරනකොට ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කිව්වා, පළමුවෙනි කාර්තුවේ ඩොලර් මිලියන 650ක් ඇවිත් කියලා. නමුත් ජනාධිපතිතුමාගේ කාර්යාලයෙන් කිව්වේ, "නැහැ, එහෙම නොවෙයි, ඩොලර් බිලියන 4.7ක්ද කොහේද ඇවිල්ලා තිබෙනවා" කියලායි. ඇත්තවශයෙන්ම ඩොලර් බිලියන 4.7ක් ඇවිල්ලා නැහැ. ඇවිල්ලා තිබෙන්නේ ඩොලර් මිලියන අසූ ගණනක්. පළමුවන කාර්තුවේ ගිවිසුම් 11ක් අත්සන් කරලා තිබෙනවා. ඒකට සාපේක්ෂව, ඊට ප්‍රකාරව පළමුවන කාර්තුවේ ඩොලර් මිලියන 80 ගණනක් බලාපොරොත්තු වෙනවා. හැබැයි, කලින් අත්සන් කරපු agreementsවලට අනුව පළමුවන කාර්තුවේ ඩොලර් මිලියන 203ක් ද කොහේද ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඒක තමයි ඇත්ත ගණන. ඩොලර් බිලියන 4.7ක් එතුමාට කවුද දුන්නේ කියලා මම දන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, BOI එකේ ප්‍රධානියා කියලා තිබෙනවා, ඩොලර් බිලියන 4.7 ඇතුළේ proposed projects තිබෙනවා කියලා. මම හිතන විධියට, ඔතැන තිබෙන ලොකුම project එක තමයි, තෙල් පිරිපහදුව - refinery එක. ඒ පිළිබඳව විශාල ගැටලු කිහිපයක් තිබෙනවා කියලා අද BOI එකේ ප්‍රධානියා කියලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, උදාහරණයක් හැටියට මම එක දෙයක් පිළිබඳව කථා කරන්නම්. අද ගරු නියෝජ්‍ය කථානායකතුමා Sri Lanka Electricity (Amendment) Bill එකේ Supreme Court Determination එක ඉදිරිපත් කළා. ඒකේ පිටු 29ක් තිබෙනවා. මම මේක කියවලා notes ගත්තා. මේකේ තිබෙන කාරණා මූලික වශයෙන් අද අපි කථා කරන කාරණයත් එක්ක ආඳන්නේ කොහොමද කියන එක පිළිබඳව මම හිතන්නේ වැදගත් සාකච්ඡාවක් ඉදිරියේදී සිදු වෙන්න ඕනෑ. නමුත්, මම දන්නා විධියට ප්‍රථම වතාවට ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා JICA එක කියන ආයතන තුනම එකතු වෙලා Hon. (Eng.) Kumara Jayakody ඇමතිතුමාට ලියුමක් ලියලා තිබෙනවා, "ඔබතුමන්ලා විදුලිබල පනතට කරන්න යන සංශෝධන හරහා බලාපොරොත්තු වන විධියේ ආයෝජන ලබා ගැනීමේ ගැටලුවක් මතු වේවි" කියලා. ඔවුන් කාරණා 4ක් ඉදිරිපත් කරලා තිබෙනවා.

[ගරු හර්ෂ ද සිල්වා මහතා]

එක කාරණයක් තමයි, හැම දාම generating companies, distribution companies, transmission companiesවල සියයට සියයක රාජ්‍ය අයිතියක් තියා ගෙන ඉන්න එක සුදුසු ද කියන එක. මොකද, අදහස වෙලා තිබුණේ මහවැලි ව්‍යාපෘතිය වාගේ hydro generate එකෙන් කරන ආයතනයකුත්, coal power එක වෙනම, thermal power එක වෙනම යනාදී වශයෙන් ආයතන හදලා, hydro ආයතනය පමණක් හැම දාටම සදාකාලිකව සියයට සියයක්,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

හොඳයි. මම තවත් විනාඩි තුනක් ගන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ඊළඟට, මේ national transmission company එක සම්බන්ධයෙන් වාගේම distribution company එක සම්බන්ධයෙන් ප්‍රශ්න මතු වෙනවා කියලා ඔවුන් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ඉදිරිපත් කරපු ලියුමට අදාළව Power Sector Reforms Secretariat එකේ Director General පුබුදු නිරෝෂන් කියන කෙනා කුමාර ජයකොඩි ඇමතිතුමාට යවපු ලියුමක් සමාජ මාධ්‍යයට leak කරලා තිබෙනවා. ඔවුන්ගේ අදහස වන්නේ ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව මොනවා කිව්වත් අපේ ප්‍රතිපත්තිය තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එකයි. අපි මේ සංශෝධන,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි තුනක් දෙන්නේ විපක්ෂයේ මොන මන්ත්‍රීතුමාගෙන් ද කියලා කිව්වේ නැහැ නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මම ඒ ගැන ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා සභාවට ආවාම කියන්නම්.

Transfer plan එක සම්බන්ධව ඒගොල්ලන්ගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවාය කියා කියලා තිබෙනවා. අද ඉදිරිපත් කළ Supreme Court Determination එකේ - මම මෙන්න මේ කාරණය note කර ගත්තා - මෙසේ සඳහන් වනවා:

> "...goal of the reforms introduced by the Act was to 'unbundle' the Ceylon Electricity Board,..."

> "...recognises the need, and is designed to attract new investment into the Electricity Industry..."

එතකොට මේ පනතේ අවශ්‍යතාවයම රජයට එහා ගිහිල්ලා. දැන් මම මේ කියපු විධියට සීමා තිබෙන නිසා පෞද්ගලික ආයෝජන මේ ක්ෂේත්‍රයට ලබා ගන්න. එතකොට ඒ තිබෙන හිඩැස් අවහිර වෙනවා කියන එක තමයි ලෝක බැංකුවයි, ආසියානු සංවර්ධන බැංකුවයි, JICA එකයි කියලා තිබෙන්නේ. හැබැයි, උසාවියට ගියාම උසාවිය බලන්නේ මේ පනත් කෙටුම්පත ව්‍යවස්ථාවට පටහැනිද, නැද්ද කියන එක විතරයි. ඇත්තවශයෙන්ම ක්ෂේත්‍රයේ ආර්ථික ප්‍රතිසංස්කරණ කරන එක ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය වැඩක්. ඒකට ආණ්ඩුවෙන් ඉදිරිපත් කරන්න පුළුවන්, ඔවුන්ගේ වැඩ පිළිවෙළ. ඊට පස්සේ පාර්ලිමේන්තුවේ කාරක සහා අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න පුළුවන්. World Bank, ADB and JICA කියන ආයතන තුනම එකතුවෙලා සකස් කරපු ලියුමේ copy එකක් යවලා තිබෙනවා, Sectoral Oversight Committee on Infrastructure and Strategic Development එකට. මම දැක්කා, ගරු ඇමතිතුමා දොස් කියනවා, මේක දේශපාලනීකරණය කරලාද, මේ කට්ටියට මේක එවලා තිබෙන්නේ ඇයි කියලා. හැබැයි, පාර්ලිමේන්තුවේ Committee එකට මේක එවලා තිබෙන්නේ. එහෙම නැතුව සමගි ජන බලවේගයේ කට්ටියට හෝ වෙන කට්ටියකට එවලා නැහැ. සියලුම කමිටු මන්ත්‍රීවරුන්ට එවලා තිබෙන්නේ. මොකද, කමිටුවේදී තමයි Committee Stage Amendments දැන් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එතැනදී මේ පාර්ලිමේන්තුවට කිසිම වගකීමක් - responsibility එකක් - නැති පුද්ගලයෙක් විසින් මේ සම්බන්ධයෙන් මත ඉදිරිපත් කිරීම පාර්ලිමේන්තුවටම කරන අගෞරවයක් කියායි මම හිතන්නේ. මම මේ අවස්ථාවේදී මේ ගැන දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් අද සුප්‍රීම් උසාවිය දීලා තිබෙන Determination එක අනුව ඔවුන් කියලා තිබෙන්නේ මෙහෙමයි, I quote:

> "........again a matter of policy, and is not a matter on which this Court can deliberate,......"

ඒ කියන්නේ, මේ ප්‍රතිපත්තිමය වෙනස සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබ අපට ඉදිරිපත් කර තිබෙන යාවත්කාලීන වැඩ පිළිවෙළ යටතේ ලබන අවුරුද්දේ ලබා ගත හැකි උපරිම ආර්ථික වර්ධන වේගය සියයට තුනක් නම්, එය හොඳටම මදියි කියායි මම යෝජනා කරන්නේ. ප්‍රාග්ධන ආයෝජන කරන්න රජයට හැකියාවක් නැත්නම් ඒකට විසඳුම තමයි, දේශීය සහ විදේශීය පෞද්ගලික අංශය සමඟ එකතු වීම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මේ ඉදිරිපත් කරන සංශෝධනය හරහා එයට තිබෙන ඉඩකඩ අවහිර කරනවා නම්, අපට මේ සියයට තුනේ ඉලක්කම ඉක්මවා යන්න හැකියාවක් තිබෙනවාද කියන එක පිළිබඳව ලොකු ප්‍රශ්නයක් මතු වෙනවා. ඉතින්, මේ කාල සීමාවේදී ඔන්න ඔය කරුණු ටික තමයි මට කියන්න ඕනෑ වුණේ. වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.18]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நன்றி!

நிதி செயல்நுணுக்கக் கூற்று என்ற தலைப்பிலான மிகவும் முக்கியமான சபை ஒத்திவைப்பு விவாதமொன்று இன்று இடம்பெறுகின்றது. இதனுடைய பிரதான நோக்கம் என்னவென்றால், 2026-2030 ஆண்டிற்குள்ளான செயல் நுணுக்க அரச நிதிக் குறிக்கோள்களை எய்துவதாகும். ஒரு

நாட்டினுடைய நிலைமையை அல்லது ஒரு குடும்பத்தினுடைய நிலைமையை எடுத்துக்கொண்டால் அந்த நாடோ அல்லது அந்தக் குடும்பமோ ஒரு ஸ்திர நிலையில் இருக்கவேண்டுமென்றால், பொருளாதாரம் அதில் மிகவும் முக்கியத்துவம் செலுத்துகின்றதென்பது எங்கள் எல்லோருக்கும் தெரியும். அந்த வகையில், பொருளாதார ஸ்திரத்தன்மை என்பது அத்தியாவசியமான ஒன்றாகும். எங்களுடைய நாட்டின் பொருளாதார ஸ்திரத்தன்மையானது, கடந்த 2022ஆம் ஆண்டு பாரிய சீர்குலைவுக்கு உள்ளானது. அதன் காரணமாக, 2022ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 12ஆம் திகதி இந்த நாடு வங்குரோத்தடைந்த நாடாக அறிவிக்கப்பட்டது. அக்காலப் பகுதியில் நாட்டு மக்கள் பொருளாதார ரீதியாகப் பாரிய நெருக்கடியைச் சந்தித்ததுடன், வரிசை யுகமும் தோன்றியது. அது மாத்திரமல்ல, அன்றைய காலகட்டத்தில் ஆட்சியில் இருந்தவர்கள் அடித்து விரட்டப்பட்ட சம்பவம்கூட நடைபெற்றது.

இந்த நிலையில், கடந்த செப்ரெம்பர் மாதம் இந்த நாட்டினுடைய சனாதிபதியாக மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் தெரிவானார். வங்குரோத்தடைந்த, நெருக்கடிக்கு உள்ளாக்கப்பட்ட, பொருளாதார ஸ்திரமற்ற, வங்கிகள் உட்பட அனைத்து சேவைகளும் தளம்பல் நிலையில் இருந்த ஒரு நாட்டைத்தான் அவர் பொறுப்பேற்றார் என்பது எங்கள் எல்லோருக்கும் தெரியும். அந்த வகையில், இந்த நாட்டில் வாழுகின்ற மக்களுக்கு நாங்கள் வழங்கிய பிரதானமான வாக்குறுதி வேறெதுவுமல்ல, அத்தகைய நிலைமைகளில் இருந்து இந்த நாட்டை மீட்டு, அந்நாள் வரைக்கும் தளம்பல் நிலையில் அல்லது ஸ்திரமற்ற நிலையில் இருந்த எமது நாட்டினுடைய பொருளாதாரத்தை மீளக் கட்டியெழுப்பி, நாட்டில் ஸ்திரத்தன்மையை உருவாக்குவதற்கான அடித்தளத்தை இடுவோம் என்பதுதான். அதுதான் எங்களுடைய பிரதானமான நோக்கமாகவும் குறிக்கோளாகவும் இருந்தது. அந்த குறிக்கோளை அடையும் முகமாகக் கடந்த 7 மாதங்களாக நாங்கள் மேற்கொண்ட முயற்சிகளைத் திரும்பிப் பார்க்கின்றபொழுது, இன்றைக்கு எங்களுக்குத் திருப்திகரமான, சந்தோசமான ஒரு சூழல் ஏற்பட்டிருப்பதைக் காண்கின்றோம். இந்நாள் வரைக்கும் தளம்பல் நிலையில், ஸ்திரமற்ற நிலையில் இருந்த நாட்டின் பொருளாதாரம் இன்றைக்கு நிலையான, ஸ்திரத்தன்மையான நிலையை அடைந்திருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று வங்கிகளை எடுத்துக்கொண்டாலும் சரி, நாட்டினுடைய பொருளாதார நிலைமைகளை எடுத்துக்கொண்டாலும் சரி, டொலரினுடைய ஏற்ற, இறக்கங்களை எடுத்துக்கொண்டாலும் சரி, பங்குச் சந்தையினுடைய நிலைமைகளை எடுத்துக்கொண்டாலும் சரி, இவை அனைத்தும் சீரான ஒரு நிலையில் சென்றுகொண்டிருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. கடந்த 7 மாதங்களாக எங்களுக்குக் கிடைத்த சந்தர்ப்பத்தை நாங்கள் சரியான முறையில் பயன்படுத்தி நாட்டை இந்த நிலைமைக்குக் கொண்டு வந்திருக்கின்றோம். கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் கடைப்பிடித்த கொள்கைகள்தான் இந்த நாடு இவ்வாறு பொருளாதார ரீதியாக நெருக்கடிக்குள்ளானதற்கான காரணமாகும். பொருளாதாரத்தில் வெளிப்படைத் தன்மை இல்லாமை, உறுதித் தன்மை இல்லாமை, கொள்கைகள் மற்றும் திட்டமிடல்கள் இல்லாமை என்பன காரணமாகவே அந்த நிலைமைக்கு நாடு தள்ளப்பட்டது. இது ஒரு பக்கம்! மறுபுறத்தில், இந்த நாட்டினுடைய பொருளாதாரத்தையே தின்று விழுங்குகின்ற அளவுக்கு இலஞ்ச பேர்வழிகள் நிறைந்து காணப்பட்டனர். இலஞ்ச பேர்வழிகள் நிறைந்து காணப்படுகின்ற நாட்டில் பொருளாதார ஸ்திரத் தன்மையை ஏற்படுத்துவது என்பது கேள்விக்குறியாகும். அரச துறையை எடுத்துக்கொண்டாலும் சரி, தனியார் துறையை எடுத்துக்கொண்டாலும் சரி, ஸ்ரீ லங்கன் எயர்லைன்ஸ் நிறுவனத்தை எடுத்துக்கொண்டாலும் சரி, உப்புத் தொழிற்சாலையை எடுத்துக்கொண்டாலும் சரி, அனைத்து துறைகளும் சீர்குலைந்துபோன நிலையிலே காணப்பட்டது. அந்த நிலைமைகளிலிருந்து நாடு மீண்டிருக்கின்றது. அவ்வாறான சூழலை இன்றைக்கு நாங்கள் ஏற்படுத்தியிருக்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டினுடைய ஸ்திரத்தன்மையைப் பாதுகாப்பதற்கு சட்டங்கள் மிகவும் முக்கியமாகும். இந்த நாட்டில் மக்கள் பல்வேறு சவால்களுக்கு முகங்கொடுக்கின்றார்கள். அந்த சவால்களிலிருந்து மக்களை மீட்டெடுப்பது எப்படி? கடந்த காலங்களில் இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கு அனைவரும் தயாராக இருந்தபோதும்கூட, பொருளாதார ஸ்திரத்தன்மையற்ற தன்மை காரணமாக இங்கு வந்து முதலீடுகளைச் செய்ய யாரும் விரும்பவில்லை. இன்றைக்கு வட பகுதியைப் பொறுத்தவரை, ஆயிரக் கணக்கான தமிழ் மக்கள் அங்கு தங்களுடைய முதலீடுகளைச் செய்வதற்கு முன்வந்திருக்கிறார்கள். கிளிநொச்சியில் மாத்திரம் 20 புலம்பெயர் முதலீட்டாளர்கள் எங்களிடம் வந்து, “எங்களுடைய பிரதேசத்தைக் கட்டியெழுப்ப வேண்டும்; அதற்கு எங்களுக்குக் காணிகளைத் தாருங்கள்” என்று கேட்கின்றனர். அது மாத்திரமல்ல, இன்றைக்கு டென்மார்க்கிலிருந்து ஒரு நண்பர் எங்களோடு தொடர்புகொண்டு, “எங்களுக்கு 50 ஏக்கர் காணி மாத்திரம் தாருங்கள்; நாங்கள் இந்த நாட்டிலிருக்கின்ற முட்டைப் பிரச்சினையை முற்றாகத் தீர்க்கின்றோம்” என்று கூறினார். மேலும், பாரிய கோழிப் பண்ணைகளைச் செய்யக்கூடிய அனுபவம் தங்களுக்கு இருப்பதாகவும், அந்தப் படிப்பினைகளை இலங்கைக்குப் பெற்றுக்கொடுக்க விரும்புவதாகவும் அவர் கூறினார். அதிலும் கிளிநொச்சியிலே அதனைச் செய்ய விரும்புவதாகக் கூறினார். ஏனென்றால், கிளிநொச்சி அவருடைய ஊராகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அதேபோன்று டென்மார்க்கைச் சேர்ந்த இன்னுமொரு நண்பர், “வெளிநாட்டுக்கு ஏற்றுமதி செய்கின்ற மரக்கறி வகைகளை மாத்திரம் நாங்கள் உற்பத்தி செய்கின்றோம்; எங்களுக்குக் காணி தாருங்கள்!” என்று கேட்டிருந்தார். மேலும், தென்னைச் செய்கையை மேற்கொள்வதற்குக் காணி தருமாறும் அவர் கேட்கிறார். அது மாத்திமல்ல, KKSஇல் எங்களால் உருவாக்கப்படுகின்ற தொழிற்பேட்டையில் பல்லாயிரம் கோடி டொலர்களைக் கொண்டுவந்து முதலீடுகளைச் செய்வதற்கு இன்றைக்கு பலர் முன்வந்திருக்கிறார்கள். அந்த வகையில் கடந்த காலங்களில் நாட்டுக்கு வருவதற்குக்கூட பயந்துகொண்டிருந்தவர்களுக்கு - அஞ்சிக்கொண்டிருந்தவர்களுக்கு - இன்றைக்கு எங்களுடைய நாட்டுக்கு வரலாம், முதலீடுகளைச் செய்யலாம் என்ற மனநிலை வந்திருக்கின்றது. அது எங்களுக்குக் கிடைத்த வெற்றி! இனி மீளமுடியுமா என்கின்ற நிலையில்தான் இந்த நாடு இருந்தது. எமது அரசாங்கம் ஆட்சிக்கு வந்து 7 மாதங்களில் பெருந்திரளானவர்கள் இந்த நாட்டில் முதலீடு செய்ய முன்வந்திருப்பது வரவேற்கத்தக்க விடயமாகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2026-2030ஆம் ஆண்டுக்கான பொருளாதார இலக்குகளை அடைவதற்கான திசையை நோக்கிச் செல்கின்றபோது, எமது

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

நாடு முகம்கொடுக்கின்ற பிரச்சினைகள் என்ன? சவால்கள் என்ன? அதிலிருந்து மீண்டெழுவது எப்படி? அதற்கான செயற்றிட்டங்கள் என்ன? என்பது தொடர்பாக இன்றைய தினம் நாங்கள் உரையாடுகின்றோம். அந்த வகையில், எங்களுடைய அமைச்சர்கள் மிகவும் திறமையானவர்களாகவும், அர்ப்பணிப்புகளைச் செய்கின்றவர்களாகவும் இருக்கின்றார்கள். அந்த இலக்கினை அடைவதற்காக எங்களுடைய கூடுதலான பங்களிப்பைச் செய்வோமென்று கூறிக்கொள்ள விரும்புகின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! கடந்த வாரம் நான் ஒரு நிகழ்வுக்குச் சென்ற வேளையில் ஏற்பட்ட பிரச்சினை தொடர்பாக ஒருசில வார்த்தைகளைக் கூறியே ஆக வேண்டும். செம்மணி மனிதப் புதைகுழி பிரச்சினை மிகவும் முக்கியமானது. அது ஒரு கூருணர்வுமிக்க பிரச்சினை என்று எங்கள் எல்லோருக்கும் தெரியும். ஏனென்றால், கிருசாந்தி படுகொலை செய்யப்பட்ட சம்பவம் தொடர்பான வழக்கு பல வருடங்களாக விசாரணை செய்யப்பட்டது. விசாரணையின் பின்னர் குற்றவாளிகளுக்குச் சிறைத் தண்டனை விதிக்கப்பட்டுள்ளது.

மேலும், செம்மணிப் பகுதியில் மீண்டும் மீண்டும் தோண்டும்போது கிடைக்கின்ற எலும்புக்கூடுகள் அடையாளம் காணப்பட்டுக் கொண்டிருக்கின்றன. அவ்வாறு அடையாளம் காணப்படுகின்ற எலும்புக்கூடுகள் தொடர்பில் விசாரணைகள் முன்னெடுக்கப்பட வேண்டும். அது மட்டுமன்றி, செம்மணி மனிதப் புதைகுழி அகழ்வுப் பணிகளுக்கான நிதி ஒதுக்கீட்டினை எங்களுடைய அரசாங்கம் செய்துள்ளது. அண்மையில் ஐக்கிய நாடுகளின் மனித உரிமைகளுக்கான உயர் ஸ்தானிகர் வோல்கர் டர்க் அவர்கள் இலங்கைக்கு வருகை தந்திருந்தார். அவர் எங்களைச் சந்தித்திருந்தார். யாழ். செம்மணி மனிதப் புதைகுழியையும் பார்வையிட்டார். அதன் பின்னர் நாங்கள் அவரிடம் கதைக்கும்போது, செம்மணி மனிதப் புதைகுழியில் காணப்படுகின்ற மனித எச்சங்கள் தொடர்பாக விசாரணை நடவடிக்கைகளை மேற்கொள்வதற்கான பரிசோதனைகளைச் செய்வதற்குரிய இயந்திரங்களைப் பெற்றுத் தருமாறு மிகத் தெளிவாகக் கேட்டுக் கொண்டோம்.

அது மாத்திரமன்றி, அங்கு பல்வேறு பிரச்சினைகள் காணப்படுகின்றன. அன்றையதினம் நானும் குறித்த நிகழ்வுக்குச் சென்றிருந்தேன். அப்போது அங்கு 10-15 பேர் சுலோகங்களோடு நின்று எங்களுக்கு எதிராக கோஷங்களை எழுப்பினார்கள். நான் முதலில் அங்கு கூடியிருந்த மக்களைச் சந்தித்து அவர்களுடன் உரையாடிக்கொண்டிருந்தவேளை, அங்கு திட்டமிட்டு ஏவப்பட்டிருந்த அந்த கும்பலினால் செய்யப்பட்ட செயற்பாடே அது ஆகும். அங்கிருக்கின்ற மக்கள்மீது எந்தவிதமான குற்றச்சாட்டுகளையும் நாங்கள் முன்வைக்கப் போவதில்லை. மக்கள் அவ்வாறான நடவடிக்கையில் ஈடுபடவுமில்லை. அங்கிருந்த மக்களின் பிரச்சினைகளைப் பார்ப்பதற்காகவே நான் சென்றிருந்தேன். பிரச்சினை நடைபெறுகின்ற இடங்களைப் பார்ப்பதற்கு அரசாங்கத்தினுடைய Cabinet அமைச்சர் வருகை தருவதென்பது, அந்தப் பிரச்சினைக்கான அங்கீகாரத்தைப் பெற்றுக்கொள்ளக்கூடியதாக இருக்கும். அந்த அங்கீகாரத்தைக் குழிதோண்டிப் புதைக்கின்ற வகையில், சாக்கடையிலிருக்கின்ற ஒருசில அரசியல்வாதிகள் செயற்பட்டார்கள். அன்றையதினம் நடைபெற்ற அசப்பாவிதத்திற்கு அவர்களுடைய செயற்பாடே காரணமாக இருந்தது. அதன் பின்னர், அந்த இடத்திலிருந்து எங்களை விரட்டியடித்தார்கள். அந்த சம்பவங்களை நேரடியாக YouTubeஇல் பார்க்க முடியும். நாங்கள் இவ்வாறான பிரச்சினைகளைக்கண்டு ஓடுகின்றவர்கள் அல்லர். கிருஷாந்தி படுகொலை செய்யப்பட்ட சம்பவம் 1996ஆம் ஆண்டு நடைபெற்றது. அந்தக் காலத்தில் நாங்கள் பாராளுமன்றத்தில்கூட இருக்கவில்லை. எங்களுக்கும் அந்த சம்பவத்திற்கும் எந்தவிதமான தொடர்புமில்லை. அந்தப் பிரச்சினையை வைத்து அரசியலைச் செய்கின்ற ஒருசில அரசியல் வியாபாரிகள் இருக்கின்றார்கள். அத்துடன், சமூக வலைத்தளங்களில் அரசியல் செய்கின்ற ஒருசில அரசியல் வியாபாரிகளும் இருக்கின்றார்கள். அவர்கள் தங்களுக்கு viewsஐ அதிகரிப்பது எப்படி, அதன்மூலம் சம்பாதிப்பது எப்படி என்பதையே சிந்திக்கின்றார்கள். அப்படியான மொக்கத்தனமான அரசியல்வாதிகளுடைய கூடாரமாகவே அன்றைய செம்மணி களம் இருந்தது. எந்த விதத்திலும் மக்களுடைய பங்களிப்போடு அந்த எதிர்ப்பு எங்கள்மீது ஏற்படவில்லை என்பதை இங்கே கூறியாக வேண்டும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாங்கள் மிகத் தெளிவாகச் சொல்லியிருந்தோம். அதாவது, செம்மணி மனிதப் புதைகுழி தொடர்பாக உரிய முறையில் ஆய்வு செய்வதற்கும், விசாரிப்பதற்கும், உரிய நடவடிக்கை எடுப்பதற்கும் நாங்கள் தயார் எனக் கூறியிருந்தோம். அப்படியிருக்கும்போது, அன்று அங்கே நடந்த சம்பவத்துக்கு அங்கிருக்கின்ற ஒருசில காவாலித்தனமான அரசியல்வாதிகளே காரணமாகும். ஏன் நான் இதைச் சொல்கிறேன் என்றால், நாங்கள் இந்த விடயத்தை நேர்மையாகப் பார்க்கின்றவர்கள் என்பதனால்தான்.

இன்றைக்கு எங்களுடைய அரசாங்கத்தால் வட மாகாணத்தில் மக்களுடைய காணிகள் விடுவிக்கப்படுகின்றன. வீதிகள் திறக்கப்படுகின்றன. இன்று யாழ்ப்பாணத்தில் இருக்கின்ற அனைத்து வீதிகளையும் புனரமைக்கின்ற வேலைகளை நாங்கள் முன்னெடுக்கின்றோம். அங்கிருக்கின்ற கிராம வீதிகளை எடுத்துக்கொண்டாலும்சரி; குளங்களை எடுத்துக்கொண்டாலும் சரி, அனைத்தையும் மக்கள் நலனுக்காகப் புனரமைக்கின்ற நடவடிக்கைகளையே நாங்கள் முன்னெடுத்து வருகின்றோம். அதன் காரணமாக அங்குள்ள மக்கள் மிக மிக வேகமாக தேசிய மக்கள் சக்தியின் பக்கம் அணி திரண்டு வருகின்றார்கள். அதைப் பொறுத்துக்கொள்ள - சகித்துக்கொள்ள - முடியாதவர்கள் தொடர்ந்தும் தங்களுடைய இனவாத அரசியலை, பிரதேசவாத அரசியலை மாத்திரம் முன்னெடுக்கின்றார்கள். நாட்டைப் பற்றி கடுகளவும் சிந்திக்காத செயல்களையே அவர்கள் செய்கின்றார்கள். இந்த நாடு பொருளாதார ரீதியாக வீழ்கின்றபோது அதைப் பார்த்துச் சிரிக்கின்றனர். நாட்டில் எண்ணெய்த் தட்டுப்பாடு ஏற்பட்டு விடுமென மக்களை அவர்கள் அச்சமூட்டுகின்றனர். அவ்வாறான அரசியல்வாதிகளே இன்றைக்கு தமிழ் மக்களைப் பிரதிநிதித்துவம் செய்கின்றவர்களாக இருக்கின்றார்கள். “போற்றுவோர் போற்றட்டும்; தூற்றுவோர் தூற்றட்டும்! நாம் செல்லும் வழி நேர்வழியாகட்டும்!" என்பதே எங்களுடைய தாரக மந்திரமாகும். அதுதான் நாங்கள் அந்த அரசியல்வாதிகளுக்குச் சொல்கின்ற பதிலாகும். எங்களுடைய பயணம் வெற்றியை நோக்கி நகர்ந்து கொண்டிருக்கின்றது. நாங்கள் முழு நாட்டில் இருக்கின்ற மக்களையும் அணி திரட்டுகின்ற வேலையை முன்னெடுக்கின்றோம். அத்தோடு, வடக்கில் இருக்கின்ற தமிழர்களையும் ஆரத் தழுவிக்கொண்டு இருக்கின்றோம் என்பதையும் இந்த இடத்தில் கூறிக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 92(2) යටතේ අහන්නේ. රීති ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ස්ථාවර නියෝග 92(2)හි මොන අකුර යටතේද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මා ළඟ තිබෙන්නේ ඉංග්‍රීසි එක. ඒකේ No. 92(2)(b).

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, තත්පර 30කින් කියලා ඉවර කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Chairperson of Committees, thank you. මම දෙමළ භාෂාවෙන් කියන්නම්. *[බාධා කිරීමක්]* ඔව්, තත්ත්පර 30යි ගන්නේ.

கௌரவ அமைச்சர் அவர்களின் கூற்றை நான் கவனித்துக் கொண்டிருந்தேன். நான் இதே செம்மணிப் பிரச்சினை தொடர்பாக மக்களின் குரலாக இங்கே கதைத்தபோது, அது சம்பந்தமில்லாத விடயம் என்றுகூறி அதைப் பற்றி கதைக்க முடியாதென Chair சொன்னது. ஆனால், அங்கே சென்றபோது கௌரவ அமைச்சருக்கு நடந்த அநியாயத்தை சம்பந்தப்பட்ட அமைச்சர் சொல்வதற்கு Chair அனுமதி வழங்கியது. அன்று கௌரவ அமைச்சரை அங்கிருந்து துரத்தியது அரசியல்வாதிகளுடைய கையாளா? என்பதை சம்பந்தபட்ட அமைச்சர் சொல்ல வேண்டுமென நான் கேட்டிருந்தேன். இங்கே எனக்கொரு நியாயம் அவருக்கு இன்னொரு நியாயம் இருக்க முடியாது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. කරුණාකර ඉඳගන්න.

ඊළඟට, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.35]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றையதினம் இச்சபையில் நிதி செயல்நுணுக்கக் கூற்றுத் தொடர்பான சபை ஒத்திவைப்பு வேளையின்போதான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது.

எமது நாடு தேவைக்கு அதிகமான பாடங்களைக் கற்றிருக்கின்றது. அதாவது, கடந்த காலத்தில் எமது நாடு பின்பற்றிய பொருளாதாரக் கொள்கைகள் மற்றும் பொருளாதார முன்னெடுப்புகள் காரணமாக அளவுக்கு அதிகமான பாடங்களைக் கற்றிருக்கின்றது. உலகத்தில் இரண்டு வகையான பொருளாதாரக் கொள்கைகள் பின்பற்றப்பட்டு வருகின்றன. ஒன்று, Capitalism என்று சொல்லப்படுகின்ற முதலாளித்துவப் பொருளாதாரக் கொள்கை. இரண்டாவது, Socialism என்று சொல்லப்படுகின்ற சமதர்ம பொருளாதாரக் கொள்கை. சுதந்திரமடைந்த பின்னர், இலங்கையை முதலாளித்துவப் பொருளாதாரக் கொள்கையின் அடிப்படையில்தான் நீண்ட காலம் ஆட்சிசெய்து இருக்கின்றார்கள். அந்த ஆட்சியானது, ஆட்சியாளர்களின் பொருளாதாரத்தை உயர்த்தி இருக்கின்றதே ஒழிய, நாட்டின் பொருளாதாரத்தை உயர்த்தவில்லை என்பதுதான் உண்மை! குறிப்பாக, 2022ஆம் ஆண்டில் மிகவும் பிற்போக்குவாத அடிப்படையில், தவறான நிதிக் கொள்கையையும் பொருளாதாரக் கொள்கையையும் பின்பற்றியதன் காரணமாகதான் எமது நாடு 'வங்குரோத்து அடைந்த நாடு' என்ற பெயரைப் பெறவேண்டி ஏற்பட்டது. அதிலும் குறிப்பாக, 1971ஆம் ஆண்டு உருவாக்கப்பட்ட வங்காளதேசத்திடமிருந்து கடன்பெறக்கூடிய அளவுக்கு எமது நாடு தள்ளப்பட்டது. அப்படியென்றால், 1971இல் பாகிஸ்தானிலிருந்து பிரிந்து சென்ற வங்காளதேசம் எமது நாட்டுக்குக் கடன் தரக்கூடிய நிலைக்கு வந்திருக்கின்றது. இந்த நிலையைப் பார்க்கும்போது, நாங்கள் அந்த நாட்டைப் போற்ற வேண்டும். அதேநேரம், எமது நாட்டின் நிலையைப் பார்த்து துயரப்பட வேண்டும்.

நான் இந்த இடத்தில் இன்னுமொரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். இரண்டாம் உலக மகா யுத்தத்தில் யப்பான் நாடு அமெரிக்காவின் அணுகுண்டுகளால் தாக்கப்பட்டு சாம்பல் மேடாகக் காணப்பட்டதெனக் கூறுவார்கள். அந்த நாடு முதலாளித்துவப் பொருளாதாரக் கொள்கையைப் பின்பற்றியிருந்தாலும், பொருளாதாரத்தில் உச்ச வளர்ச்சியைக் கண்டிருக்கின்றது. அதாவது, அந்த நாடு முதலாளித்துவப் பொருளாதாரக் கொள்கையைப் பின்பற்றியது; வளர்ச்சியடைந்து இருக்கின்றது. சீனா சோசலிச கொள்கையைப் பின்பற்றுகின்ற நாடு! அந்த நாடும் வளர்ச்சியடைந்து இருக்கின்றது. எந்தப் பொருளாதாரக் கொள்கையைப் பின்பற்றினாலும், ஊழல், மோசடி, இலஞ்சம், வீண்விரயம் இல்லாத நாடுகள் வளர்ச்சியடைந்து இருக்கின்றன என்பதுதான் நாங்கள் இதிலிருந்து பெற்றுக்கொள்ளக்கூடிய படிப்பினையாகும்.

எமது நாட்டை டி.எஸ். சேனாநாயக்க, டட்லி சேனாநாயக்க, எஸ்.டபிள்யூ.ஆர்.டி. பண்டாரநாயக்க, டபிள்யூ. தஹநாயக்க, சிறிமாவோ பண்டாரநாயக்க, ஜே.ஆர். ஜயவர்த்தன, ஆர். பிரேமதாஸ, டீ.பி. விஜேதுங்க, சந்திரிக்கா பண்டாரநாயக்க குமாரதுங்க, மஹிந்த ராஜபக்ஷ, மைத்திரிபால சிறிசேன, கோட்டாபய ராஜபக்ஷ எனப் பலர் ஆட்சிசெய்து இருக்கிறார்கள். எனினும், அவர்கள் இந்த நாட்டில் குறிப்பிடத்தக்க மாற்றங்களை ஏற்படுத்தவில்லை.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

அதாவது, அவர்கள் இந்த நாட்டில் பொருளாதார ரீதியான மாற்றத்தை ஏற்படுத்தவில்லை என்பதுதான் வெளிப்படையான உண்மை! அதற்கு மாறாக அவர்கள் உள்நாட்டு யுத்தத்தை உருவாக்கி, அதன்மூலம் குளிர்காய்ந்துகொண்டு இருந்தார்கள் என்றுதான் சொல்ல வேண்டும். அந்த உள்நாட்டு யுத்தம் வேண்டுமென்றே உருவாக்கப்பட்டதல்ல. அது பொருளாதாரக் கொள்கையாக இருக்கலாம், சமூக ரீதியான கொள்கையாக இருக்கலாம், அரசியல் கொள்கையாக இருக்கலாம், கடந்த கால ஆட்சியாளர்கள் கடைப்பிடித்த கொள்கைகள் - காரணமாக ஏற்பட்ட பிரச்சினையால்தான் அந்த யுத்தம் ஏற்பட்டது. இதனால் எமது நாடு 30 ஆண்டுகள் யுத்தத்துக்கு இரையாகி, மிக மோசமான நிலைக்குச் சென்றது. எமது நாட்டில் திறந்த பொருளாதாரக் கொள்கையின் பேரில் ஊழல், மோசடிகள், இலஞ்சம், வீண்விரயம் என்பன தாராளமாக நடைபெற்றன. அதுமாத்திரமன்றி, கையூட்டு பெறுகின்ற கலாசாரம், commission பெறுகின்ற கலாசாரம், தமக்கு வேண்டியவர்களுக்கு வாய்ப்புகளைக் கொடுத்து அதன்மூலம் உழைக்கின்ற கலாசாரம் என்பன காணப்பட்டன. இந்த நிலையில், கடந்த காலத்தில் கற்றுக்கொண்ட விடயங்களை மையமாக வைத்து, இனிவரும் காலத்தில் இந்த நாட்டைச் சரியான பொருளாதாரப் பாதையில் நுணுக்கமான ஓர் ஆய்வின் அடிப்படையில் கொண்டுசெல்வதற்கு என்ன செய்யப்போகின்றோம் என்பதை அரசாங்கம் நிதி செயல்நுணுக்கக் கூற்றுமூலம் முன்வைத்திருக்கிறது.

கடந்த காலத்தில் மோசடி செய்தவர்களுக்கு, அரச சொத்துக்களைச் சூறையாடியவர்களுக்கு எதிராக இப்பொழுது சட்ட நடவடிக்கை எடுக்கப்பட்டு வருவது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். ஏனெனில், கடந்த காலத்தில் நோயாளிகளுக்கு வழங்குகின்ற மருந்தில்கூட மோசடிசெய்து இருக்கின்றார்கள். இப்படிப்பட்ட செயல்கள் மிகவும் வேதனைக்குரியது. இவற்றை மன்னிக்க முடியாத குற்றங்கள் என்றுகூட கூறலாம். மருந்தை விஷமாக்குகின்ற, வியாபாரப் பொருளாக்குகின்ற செயற்பாடுகளில் ஈடுபட்டவர்களைச் சட்டத்தின்முன் நிறுத்த வேண்டும், விசாரிக்க வேண்டும், தராதரம் பார்க்காமல் தண்டிக்க வேண்டும் என்பதை நாங்கள் வரவேற்கின்றோம். ஏனெனில், அவர்கள் சாதாரண அப்பாவி மக்களின் உயிருடன் விளையாடக்கூடிய விதத்தில் செயற்பட்டு இருக்கிறார்கள். அவர்கள் என்ன செய்து இருக்கிறார்கள் என்றால், மருந்துப் பொருட்களைத் தங்களது வியாபாரப் பொருட்களாக மாற்றியிருக்கிறார்கள். அதாவது, குறைந்த விலைக்கு வாங்கி, கூடிய விலைக்கு விற்கக்கூடிய ஒரு பொருளாதாரச் செயற்பாடாக அதனை மாற்றியிருக்கிறார்கள். இதனை நாங்கள் மன்னிக்க முடியாது. எனினும், கடந்த ஆட்சிக் காலத்தில் அவ்வாறான ஒருவருக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டபோது, அவருக்கு ஆதரவாகப் பெரும்பாலான உறுப்பினர்கள் தங்களது கைகளை உயர்த்தி, அவரைப் பாதுகாத்தார்கள் என்பதும் குறிப்பிடத்தக்கது.

தற்போதைய அரசாங்கம் நாட்டில் ஸ்திரமான - உறுதியான - பொருளாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டும் என்ற அடிப்படையில் செயற்படுகின்ற பாங்கு வரவேற்கத்தக்கது. யுத்தம் நடைபெறுவதற்கு முன்னர் வடக்கு, கிழக்கில் அதிகமான தொழிற்சாலைகள் காணப்பட்டன. இன்று அவற்றில் அதிகமானவை மூடப்பட்டு இருக்கின்றன. தற்போது, இந்த நாட்டில் இருக்கின்ற தொழிற்சாலைகள் தொடர்பான புள்ளிவிபரத்தை எடுத்துப் பார்ப்போம். வடக்கு, கிழக்குக்கு வெளியே கிட்டத்தட்ட 96 சதவீதமான தொழிற்சாலைகள் காணப்படுகின்ற அதேநேரம் 4 சதவீதத்துக்கும் குறைவான தொழிற்சாலைகளே வடக்கு, கிழக்கில் காணப்படுகின்றன. பாரபட்சமில்லாத, சமத்துவமான பொருளாதாரக் கொள்கையைப் பின்பற்ற நினைக்கின்ற இந்த அரசாங்கம் நிச்சயமாக வடக்கு, கிழக்கில் மூடப்பட்டிருக்கின்ற தொழிற்சாலைகளை மீளத் திறப்பதற்கும், புதிய தொழிற்சாலைகளை அமைப்பதற்கும் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

ஒரு காலத்தில் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள வாழைச்சேனையில் காகிதத் தொழிற்சாலை காணப்பட்டது. இந்தக் காகிதத் தொழிற்சாலையானது 4,000க்கும் மேற்பட்ட குடும்பங்களுக்கு வருவாயைப் பெற்றுக்கொடுத்ததுடன், சிறந்த உற்பத்தித் திறனையும் காட்டியது. அந்தத் தொழிற்சாலை யுத்த காலத்தில்கூட, அதாவது 1996ஆம் ஆண்டு காலப்பகுதியில் உற்பத்தித் திறனுக்கான விருதைப் பெற்று, சிறந்ததொரு தொழிற்சாலையாக விளங்கியது. இந்தத் தொழிற்சாலை சில பிழையான அமைச்சர்களின் கைகளுக்குச் சென்றதனால் - ஆளுகைக்கு உட்பட்டதனால் - நஷ்டத்தில் இயங்கி, கடைசியில் மூடப்படவேண்டிய நிலைக்குச் சென்றது. அந்தத் தொழிற்சாலையை மீண்டும் புனருத்தாரணம் செய்ய வேண்டும் என்றும் கட்டமைக்க வேண்டும் என்றும் அபிவிருத்தி செய்ய வேண்டும் என்னும் அதில் பலருக்குத் தொழில்வாய்ப்புகளைக் கொடுக்க வேண்டும் என்றும் நாங்கள் கடந்த காலத்திலிருந்து கோரிக்கைகளை விடுத்து வருகின்றோம். ஆனாலும், அவை நிறைவேற்றப்படவில்லை. கடந்த ஆட்சிக் காலத்தில் அது 'தொழிற்சாலை' என்ற பெயரில் இயக்கப்பட்டது. தற்பொழுது, அதில் 300க்கு உட்பட்டவர்கள் தொழில்வாய்ப்புகளைப் பெற்றிருக்கிறார்கள். 4,000க்கும் மேற்பட்டவர்கள் தொழில்புரிந்த அந்தத் தொழிற்சாலை, இப்பொழுது 300க்கு உட்பட்டவர்கள் தொழில்புரியக்கூடிய ஒரு தொழிற்சாலையாக மாற்றமடைந்திருக்கிறது. எனவே, நாங்கள் பொருளாதாரத்தை நுணுக்கமாகத் தந்திரோபாயமான முறையில் நகர்த்தி, நாட்டை அபிவிருத்தி செய்ய வேண்டும் என்றால், மூடப்பட்டுள்ள தொழிற்சாலைகள் திறக்கப்பட்டு, அவை இலஞ்சம், ஊழல், மோசடிகள் இல்லாத சிறந்த நிர்வாகத்தின்கீழ் கொண்டுவரப்பட வேண்டும்.

தொய்ந்துபோய் கிடந்த பொருளாதாரத்தை அல்லது மட்டமாகக் கிடந்த பொருளாதாரத்தை அல்லது வங்குரோத்து நிலையில் இருந்த பொருளாதாரத்தைக் கட்டியெழுப்பக்கூடிய விதத்தில் நுணுக்கமானதொரு திட்டத்தை வகுத்துச் செயற்பட்டமைக்காக அண்மையில் திறைசேரியின் செயலாளர் அவர்களைக் கட்சி பேதம் இல்லாமல் எல்லோரும் பாராட்டக்கூடிய ஒரு நிலைமை காணப்பட்டது. இப்படிப்பட்ட நிர்வாகிகள்தான் இந்த நாட்டுக்குத் தேவை! கடந்த காலத்தில் அரசியல்வாதிகள் பிற்போக்கான பல்வேறு செயற்பாடுகளில் அதாவது இலஞ்சம், ஊழல், மோசடி போன்ற செயற்பாடுகளில் ஈடுபட்டார்கள் என்பது பகிரங்கமாக ஏற்றுக்கொள்ளப்படவேண்டிய விடயமாகும். அவ்வாறான செயல்களைச் செய்தவர்கள் இன்று கைதுசெய்யப்படுவதையும், சிறைகளில் அடைக்கப்படுவதையும், கைகளில் விலங்கிட்டு அழைத்துச் செல்லப்படுவதையும் நாங்கள் காண்கின்றோம். உண்மையிலே இது இப்போது இருக்கின்றவர்கள் கற்றுக்கொள்ளக்கூடிய ஒரு விடயமாக அமைந்திருக்கின்றது. இவ்வாறான தவறுகளைச் செய்தவர்கள் தண்டிக்கப்பட்டுத்தான் ஆகவேண்டும். எனவே, நாங்கள் இதனை வரவேற்கின்றோம்.

மட்டக்களப்பு மாவட்டத்தில் காகிதத் தொழிற்சாலை, ஓட்டுத் தொழிற்சாலை, அச்சகம் என 5-6 தொழிற்சாலைகள் காணப்பட்டன. யுத்தம் காரணமாக அவை

மூடப்பட்டிருக்கலாம். இப்போது யுத்தம் ஓய்ந்துவிட்டது. மக்கள் மத்தியில் நம்பிக்கையைக் கட்டியெழுப்பவேண்டிய தேவை இருக்கின்றது. அதுமாத்திரமன்றி, தொழில்வாய்ப்புகளை வழங்கவேண்டிய தேவையும் இருக்கின்றது. அதற்காக அந்தத் தொழிற்சாலைகளை மீளத் திறப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். எல்லாவற்றையும் ஒரே தடவையில் திறக்க வேண்டுமென நாங்கள் சொல்லவில்லை. அவற்றைப் படிப்படியாகத் திறக்கும்போது மக்கள் நம்பிக்கை கொள்ளக்கூடியதாக இருக்கும். வட புலத்தில் சீமெந்துத் தொழிற்சாலை, இரசாயனத் தொழிற்சாலை, ஆடைத் தொழிற்சாலை எனப் பல தொழிற்சாலைகள் காணப்பட்டன. அந்தத் தொழிற்சாலைகளும் இன்று மூடப்பட்டே காணப்படுகின்றன. எனவே, இந்தத் தொழிற்சாலைகளை மீளத் திறப்பதற்கான சாத்தியம் எந்தளவுக்குக் காணப்படுகின்றது, அதன்மூலம் எத்தனை பேருக்குத் தொழில்வாய்ப்புகளைப் பெற்றுக்கொடுக்க முடியும் என்ற விடயங்களைக் கருத்திற்கொண்டு, உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இன்று மத்திய கிழக்கை நோக்கி ஆண்கள் மாத்திரமல்லாது பெண்களும் தொழிலுக்குச் செல்லவேண்டிய நிலை ஏற்பட்டுள்ளது. அங்கு அவர்கள் அடிமைபோல் தொழில்செய்ய வேண்டிய நிலைக்குத் தள்ளப்பட்டு இருக்கின்றார்கள். இது கலாசார ரீதியாகக்கூட ஒரு பிறழ்வான நிலைமையை ஏற்படுத்தி இருக்கின்றது. எனவே, அவர்கள் உள்நாட்டிலேயே தங்களுடைய பொருளாதாரச் செயற்பாடுகளை மேற்கொள்வதற்குரிய வசதி, வாய்ப்புகளை அரசாங்கம் செய்துகொடுக்க வேண்டும். வடக்கு, கிழக்கில் 90,000க்கும் மேற்பட்ட பெண் தலைமைத்துவக் குடும்பங்கள் இருப்பதாகச் சொல்லப்படுகின்றது. அவர்களும் தொழில்வாய்ப்புகளை எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றார்கள். வருமானம் இல்லாத பெண் தலைமைத்துவக் குடும்பங்களில் வறுமை தாண்டவமாடிக்கொண்டு இருக்கின்றது. அதனால் அவர்கள் ஏழ்மை நிலையில் காணப்படுகின்றார்கள். அவர்களுடைய வாழ்வாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு என்ன செய்யவேண்டும் என்பதைப் பற்றியும் நாங்கள் சிந்திக்க வேண்டும்.

கடந்த காலத்தில் ஏறத்தாழ 18 இலட்சம் பேர் வரியிறுப்பாளர்களாக இருந்தார்கள். கோட்டாபய ராஜபக்ஷ அவர்கள் ஆட்சிக்கு வந்த பின்னர், கிட்டத்தட்ட 12 இலட்சம் பேரை வரி செலுத்துவதிலிருந்து நீக்கிவிட்டார். கிட்டத்தட்ட 4 இலட்சம் பேர்தான் வரியிறுப்பாளர்களாக இருந்தார்கள். இதன் காரணமாக இலங்கை அரசாங்கத்துக்குக் கிடைத்த வருமானத்தில் கிட்டத்தட்ட 60,000 கோடி ரூபாய் இழக்கப்பட்டதாக ஒரு புள்ளிவிபரம் கூறுகின்றது. ஒரு நாட்டின் நிர்வாகத்தைச் செய்வதற்குரிய அடிப்படை அறிவு அற்றவர்கள்கூட, தங்களது குடும்பச் செல்வாக்கைப் பயன்படுத்தி இந்த நாட்டில் ஆட்சிபீடம் ஏறினார்கள். அவர்களுடைய அறிவு எந்தளவு என்பது குறுகிய காலப் பகுதியிலேயே வெளிப்பட்டது. அப்படி இல்லாமல், இனிவரும் காலத்தில் இந்த நாட்டின் பொருளாதாரம் தொய்வுபெறாமல், வங்குரோத்து நிலைக்குச் செல்லாமல் இருப்பதற்குச் சகல மாகாணங்களிலும் மாவட்டங்களிலும் பொருளாதாரத்தை மீட்டெடுப்பதற்கான முற்போக்கானதும் செயல்நுணுக்கமானதுமான செயற்பாடுகளை முன்னெடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன். இலங்கையானது, 2024இல் பொருளாதார ரீதியாக 5 சதவீத வளர்ச்சியைக் கண்டிருப்பதாகக் கூறப்படுகின்றது. ஆனாலும், இன்னும் இந்த நாட்டில் வறுமை நிலை, விலைத் தளம்பல் என்பன காணப்படுகின்றன என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இறுதியாக சம கால அரசியல் சார்ந்த ஒரு விடயத்தைச் சொல்லலாமென நினைக்கின்றேன். கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்களும் இது பற்றிக் குறிப்பிட்டிருந்தார். செம்மணிப் புதைகுழி என்பது ஒரு வரலாற்றைக் கூறுகின்ற புதைகுழியாகும். அந்த இடத்தில் கிருஷாந்தி என்று சொல்லப்படுகின்ற மாணவி படுகொலை செய்யப்பட்டு இருக்கிறார். அந்த மாணவி இன்று உயிரோடு இருந்திருந்தால், ஒரு வைத்தியராக வந்திருப்பார். அன்று அந்த மாணவி செம்மணியால் செல்லும்போது, அவரை கோப்ரல் சோமரத்ன ராஜபக்ஷ தலைமையிலான குழுவினர் பாலியல் பலாத்காரம் செய்து கொலை செய்ததாக அப்போது செய்திகள் அடிபட்டன. இந்தக் குற்றச்செயலோடு சம்பந்தப்பட்ட கோப்ரல் இப்போது சிறையில் இருக்கின்றார். சந்திரிக்கா அம்மையாரின் ஆட்சிக் காலத்திலேயே இந்தப் படுகொலை நடைபெற்றது. விசாரணைகள் நடைபெற்று, கோப்ரல் சோமரத்ன ராஜபக்ஷ தண்டிக்கப்பட்டார். அவர் சில தகவல்களை நீதிமன்றத்தில் சொல்லியிருந்தார். அதாவது, எத்தனை பேரைக் கொன்றார்கள், எத்தனை பேரைப் புதைத்தார்கள் என்ற விடயத்தைச் சொல்லியிருந்தார். சில இராணுவ அதிகாரிகளின் பெயர்களைக்கூடச் சொல்லியிருந்தார். சிறுவர்களை, பெண்களை, புதுமணத் தம்பதிகளை அழைத்துவந்து, அவர்களை மண்வெட்டியால் அடித்துக் கொன்றுவிட்டுத் தங்களிடம் புதைக்கச் சொன்னதாகக்கூட சோமரத்ன ராஜபக்ஷ சொல்லியிருந்தார். இப்போது அவர் ஆயுட்கால சிறைத் தண்டனையை அனுபவித்து வருகின்றார் என நான் நினைக்கின்றேன். செம்மணிப் புதைகுழியில் 600க்கும் மேற்பட்ட அப்பாவி மக்கள் புதைக்கப்பட்டு இருப்பதாகவும் அவர் சொல்லியிருந்தார். அந்தப் புதைகுழியில் இருக்கும் ஓர் எலும்புக்கூட்டைப் பார்க்கும்போது, அதில் ஒரு தாயின் நெஞ்சின்மீது குழந்தை ஒன்று இறந்து கிடக்கின்றது. அந்த எலும்புக்கூடுகளை அப்படியே எடுத்துக்காட்டுகின்றார்கள். இப்படியெல்லாம் கடந்த காலத்தில் மிக மோசமான, வக்கிரமான, இனவாத, மதவாத அடிப்படையிலான கொலைகள் நடைபெற்று இருக்கின்றன.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
நான் முடிக்கின்றேன்.

இந்தச் செம்மணிப் புதைகுழி விவகாரத்துடன் சம்பந்தப்பட்ட, வக்கிரத் தன்மையுடன் மேற்கொள்ளப்பட்ட கொலைகளால் பாதிக்கப்பட்டவர்களுக்கு நீதி கிடைக்க வேண்டும். பட்டலந்த வதை முகாமில் எவ்வாறு சித்திரவதைகள் நடைபெற்றனவோ, அதேபோன்று வடக்கு, கிழக்கிலுள்ள பல முகாம்களிலும் நடைபெற்றன. அவற்றால் பாதிக்கப்பட்டவர்களுக்கும் நீதி கிடைக்க வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.50]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

විශේෂයෙන්ම අද මේ ඉදිරිපත් කරපු මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය කියන්නේ, ආර්ථිකය පිළිබඳව අපේ ආණ්ඩුව ගත්ත තව ඉදිරි පියවරක්. අපි, අපේ ආදර්ශයන් තුළින් ආර්ථිකයේ ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රායෝගික භාවිතාවක් හඳුන්වා දුන්නා. අපේ වියදම් සීමා කර ගැනීමෙන්, අපට තිබෙන පහසුකම් අවම කර ගැනීමෙන්, මහජන නියෝජිතයන් හැටියට මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට තිබෙන පෙන්ෂන් එක ඉවත් කර ගැනීමෙන් අපි ආදර්ශයක් ලබා දීලා තිබෙනවා. ඒ ආදර්ශයෙන් එහාට ගිහිල්ලා තිරසාර ආර්ථික දැක්මට ගැළපෙන, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නිර්මාණය කරන ආර්ථික දැක්මට ගැළපෙන, ඉදිරි අවුරුද්දේ අපේ ආර්ථිකයේ මූලෝපායයන්, උපාය උපක්‍රම ක්‍රියාවට නැඟෙන්නේ කොහොමද කියන කාරණාව තමයි දැන් අපි මේ ඉදිරිපත් කරන්නේ. එහිදී ආර්ථික අවදානම අපි කළමනාකරණය කරන්නේ කොහොමද? ඒක තමයි වැදගත්ම දේ. මෙහි වැදගත්ම දේ තමයි, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සහ මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය. ඇත්තටම, විපක්ෂය සතුටු වෙන්න ඕනෑ. මොකද, අපේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අපිම විලංගු දමා ගැනීමක් තමයි මේකෙන් කරන්නේ. ආණ්ඩුවට, මුදල් ඇමතිතුමාට, අපේ අමාත්‍ය මණ්ඩලයට -අපට- ඕනෑ ඕනෑ හැටියට අත දිගහැරලා නාස්ති කරන්න, වියදම් කරන්න ක්‍රමයක් නැහැ. ඒකයි මේකේ තිබෙන විශේෂත්වය. මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්ම ඇහුවා, මේකේ තිබෙන ක්‍රමෝපායයන් මොනවද, මේකේ පියවර මොනවද, මේක නිකම් ලැයිස්තුවක්, මේකෙන් අංක 1,2,3 මොකක්ද කියලා කියන්න කියලා. ඒගොල්ලන් හරියට අහන්නේ, බත් පිහාන දුන්නාට පසුව මේකේ විටමින් කෝ, මේකේ ප්‍රෝටීන් කෝ, මේකේ කාබෝහයිඩ්‍රේට් කෝ, මේකේ මේදය පෙනෙන්න නැහැ වාගේ එකක්. විපක්ෂයේ මන්ත්‍රීවරු එහෙම අහන එක හොඳයි. මම ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. හැබැයි ඉගෙන ගත්ත කෙනාට තේරෙනවා, බත් පිහාන අනුභව කළාම - කෑවාට පස්සේ - තමයි මේදය, කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන් ඇඟට එන්නේ කියලා. කවුරු හරි බත් පිහානක ප්‍රෝටීන්, කාබෝහයිඩ්‍රේට් හෙව්වොත්, ඒවා හොයාගන්න අමාරුයි. ඒ වාගේ දෙයක් තමයි මේ අහන්නේ. මෙතුමන්ලා එහෙම අහනවා. අපේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා පොත් පෙරළ පෙරළා බලනවා, මේකේ කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන් කොහොමද පෙන්වන්නේ කියලා. එහෙම නේද ගරු අනිල් ජයන්ත ඇමතිතුමනි? පෙන්වන්න බැහැ. හැබැයි මේකෙන් පෙනෙනවා, දැක්මක්. මේකෙන් පෙනෙනවා, ගමන් මඟක්. 2026 අවුරුද්දේ අය වැය හදනකොට අය වැය හදන්න යන පරාසය මේකෙන් කියනවා. අපි 2026ට යන්නේ මෙන්න මෙහෙමයි කියලා මේකෙන් කියනවා. මේකේ තිබෙන වැදගත්කම ඒකයි. එහෙම නැතුව ඉබාගාතේ ගියොත් 2020, 2022 දී රට ගිය තැනට අපි යනවා. අපට මතකයි, 1994 දී -චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගෙන් පටන් ගත් කාලයේ- මේ රට සෘණ ආර්ථිකයකට ගිය බව. හැබැයි, දැන් එහෙම නොවෙයි. දැන් ඉදිරි පාර පෙනෙනවා, මෙන්න මෙහෙමයි යන්නේ කියලා.

2026 අය වැයට අපි වැඩි බරක් දමාගන්නවාද, එහෙම නැත්නම් 2025 කළමනාකරණය කරගෙන 2026ට යන්නේ කොහොමද? 2026 දී එන්න තිබෙන අවදානම අපි දැන් දකිනවා. ඒක හොඳ නැද්ද? 2027 වෙන්න තිබෙන අවදානම අපි දකිනවා. මෙහිදී විශේෂයෙන් අවධාරණය කරනවා, මූල්‍ය අංශයේ අවදානම, දේශගුණික විපර්යාස, නීතිමය හිමිකම්, පළාත් පාලන ආයතන ගැන. අපට සැලැස්මක් තිබෙනවා. ඒ පළාත් පාලන ආයතනවල වියදම්වල සීමාවන් කොහොමද කරන්නේ? ඒ ගැන මේකේ තිබෙනවා. ඉතින්, විපක්ෂය සතුටු වෙන්න ඕනෑ. විපක්ෂයට කරදරයක් නැහැ. මොකද, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පෙරළා බැලුවාම බලාගන්න පුළුවන්, දැන් කොහේද යන්නේ කියලා. ගරු ගයන්ත කරුණාතිලක හිටපු අමාත්‍යතුමා, මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිතුමාට හොඳ සුක්කානමක් තිබෙන්න ඕනෑ, හොඳ එන්ජින් එකක් තිබෙන්න ඕනෑ කියලා. මුදල් අමාත්‍යාංශයේ ලේකම් හැටියට පත් වුණු හර්ෂණ සූරියප්පෙරුම හිටපු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ඒ එන්ජිම සුක්කානමට ගැළපෙන්න ඕනෑ කියලා. ඒක විතරක් මදි. අපට මුළු වාහනයම තිබෙනවා. එන්ජිම, සුක්කානම විතරක් තිබිලා වාහනයක් සම්පූර්ණ වෙන්නේ නැහැ. අපේ මුළු වාහනයම දැන් හොඳයි. පළාත් පාලන ආයතනත් මේකට ඒකාබද්ධ වෙලා තිබෙනවා. මේ යන්ත්‍රණයම දැන් හොඳයි. හොඳ විතරක් නොවෙයි, 2026 වෙනකම් ඒ යන්ත්‍රණය ගමන් කරන විධිය ගැනත් අද අපි පාර්ලිමේන්තුවට කියනවා. අන්න ඒ ගමන් කරන විධිය, අපේ ඉලක්ක සහ අපේ සීමාවන් අද අපි කියනවා. අපි පාර දැනගෙන යන ආණ්ඩුවක්. අපේ බැරිකම අපි මේකේ කියලා තිබෙනවා. අපේ හැකියාව, නොහැකියාව අපි හඳුනාගෙන තිබෙනවා. අපේ ශක්තීන් අපි හඳුනාගෙන තිබෙනවා. ඒක තමයි නිල වශයෙන් ලේඛනයක් හැටියට මේ ඉදිරිපත් කරන්නේ. ඒක ව්‍යවස්ථානුකූල, නීත්‍යානුකූල ලේඛනයක් වෙනවා. මොකද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11 (2) සහ 11 (3) වගන්ති අනුව අපි ඒක ඉදිරිපත් කරනවා. මේකෙන් අපේ හැකියාවන්, නොහැකියාවන් අපි ජාත්‍යන්තරයට කියලා තිබෙනවා. මේක අර නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා වාගේ නිව්යෝර්ක්, වොෂින්ටන්වලින් හදලා දෙන එකක් නොවෙයි. අපි ඔවුන්ටත් අපේ බැරිකම, හැකියාව හරි විවෘතව කියලා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සීමාවන් ගැන අපි කියලා තිබෙනවා.

"අපි 2028දී මේකෙන් අයින් වෙන්න ලැහැස්තියි" කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂතුමිය ආපු වෙලාවේ ජනාධිපතිතුමා එතුමිය ඉස්සරහා තියාගෙනම කිව්වා. අපි මෙතැන රැඳිලා ඉන්න ලැහැස්ති නැහැ. මොකද, අපි දන්නවා, අපිට අත දිග හැරලා වැඩ කරන්න අමාරු සීමාවක් මේකේ තිබෙනවා කියලා. ඒ ටික අපි මේ ප්‍රකාශයේ කියලා තිබෙනවා. අද ඒක නිල වශයෙනුත් පාර්ලිමේන්තුවට කියනවා, එච්චරයි. මේකේ වෙන මොකුත් නැහැ. "කෝ, මේකේ ඉලක්කම් නැහැ" කියලා දැන් කියනවා නේ. "මේකේ අකුරු නැහැ, වචන නැහැ, පෙළගැස්ම නැහැ" කියලාත් කියනවා. මොකද, මේකේ මුල පිටුව පෙරළලා අනික් පැත්තේ පිටුව පෙරළුවාම මොකුත් නැහැ තමයි. මේ මුළු වාර්තාවම කියවන්න ඕනෑ. මේ ප්‍රකාශය භාෂා තුනෙන්ම තිබෙනවා.

මේකේ සිංහල භාෂාවෙන් තිබෙන කොටසේ 33වැනි පිටුවේ ඇමුණුම IIහි "මූල්‍ය තිරසාරභාවයට සහාය වීම සඳහා ගනු ලැබූ නිශ්චිත ප්‍රතිපත්තිමය පියවර" කියන මාතෘකාව සඳහන් වෙනවා. ඒ කියන්නේ, මූල්‍ය ස්ථාවරත්වය වෙනුවෙන් ගන්න නිශ්චිත ක්‍රියාමාර්ග. එම ක්‍රියාමාර්ග පියවර වශයෙන් මෙහි සඳහන් වෙනවා. පළමු පියවර වශයෙන්, "මූල්‍ය විනය සඳහා නව නීතිමය ආකෘතියක්" යනුවෙන් සඳහන් වෙනවා.

දෙවැනි පියවර වශයෙන්, "ප්‍රධාන බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ; බදු පදනම පුළුල් කිරීම, අනුපාත දර්ශකගත කිරීම" සඳහන් වෙනවා. ඒ යටතේ 2024 වසරේ ජනවාරි මස පළමුවැනි දා ඉඳලා ක්‍රියාත්මක වන පරිදි කරන දේවල් ටික අංක

යටතේ දක්වා තිබෙනවා. ඊළඟට 2025 වසරේ ජනවාරි මස 11වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කරන දේවල් ටික අංක යටතේ දක්වලා තිබෙනවා. ඊළඟට, 2025 වර්ෂයේ අප්‍රේල් මස පළමුවැනි දා සිට ක්‍රියාත්මක වන පරිදි කරන දේවල් සහ පුද්ගල ආදායම් බදු - PIT - ව්‍යුහයේ සංශෝධන සඳහන් කර තිබෙනවා.

තුන්වැනි පියවර, "බදු පරිපාලනය සහ ආයතනික ව්‍යුහය නවීකරණය කිරීම" යනුවෙන් සඳහන් වෙනවා. එහි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කරන ක්‍රියාමාර්ග යටතේ "අපරාධ විමර්ශන ඒකකය පිහිටුවීම" කියන එක දක්වා තිබෙනවා. ඒ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේත් අපරාධ විමර්ශන ඒකකයක් හදනවා. එතකොට කට්ටියට එතැනටත් යන්න වෙනවා. ඒ වාගේම, ඒ යටතේ රැකියා සහ පොලී ආදායම පමණක් ඇති පුද්ගලයින් සඳහා 2023/2024 තක්සේරු වර්ෂය සඳහා සරල කළ පුද්ගල ආදායම් බදු වාර්තා යොමු කිරීමේ පෝරමයක් හඳුන්වා දීම, අවදානම් කළමනාකරණ ඒකකය පුළුල් කිරීම, SVAT එක අහෝසි කිරීමේ යෝජනාව සහ අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම දක්වා තිබෙනවා.

ශ්‍රී ලංකා රේගුව විසින් කරන ක්‍රියාමාර්ග යටතේ, "2024-2028 වර්ෂයන් සඳහා උපායමාර්ගික සැලැස්මක් දියත් කිරීම" කියන එක දක්වා තිබෙනවා. නැත්නම් ඊට පස්සේ 2024-2028 උපායමාර්ගික සැලැස්ම කෝ කියලා ඇහුවොත්, ඒක මේ ප්‍රකාශයට ඇමුණුවොත් මේක මාගල වාගේ වෙනවා. ඒක හදන්නේ ශ්‍රී ලංකා රේගුවෙන්. හැබැයි ශ්‍රී ලංකා රේගුව ඒක හදන බව මේකේ කියලා තිබෙනවා.

ඊළඟට සුරාබදු දෙපාර්තමේන්තුව කරන ක්‍රියාමාර්ගත් මේකේ කියලා තිබෙනවා. ඒ වාගේම, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සඳහා අවශ්‍ය අන්තර්ගතයන්ද මෙහි සඳහන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේකේ 24වැනි පිටුවේ, අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර ගැනත් කියලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම විශේෂයෙන්ම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා. මේ පාර්ලිමේන්තුවේ සම්පූර්ණ පොත්ම කියවන්නේ නැති අය ඉන්නවා නේ. පිටු විතරක් බලන අය ඉන්නවා. ඒක නිසා මේ ප්‍රකාශයේ 24වැනි පිටුවයි, 32වැනි පිටුවයි, 33වැනි පිටුවයි හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලමින් මා **සභාගත*** කරනවා.

එතකොට අඩුම තරමේ ඒ පිටු ටික හරි කියවනවා නේ. *[බාධා කිරීමක්]* බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ගරු මන්ත්‍රීතුමනි, මේක සම්පූර්ණයෙන් බලන්නේ නැතුව මුල පිටුව විතරක් කියවන සමහර කට්ටිය ඉන්නවා නේ. ඒගොල්ලෝ මුල පිටුව විතරක් පෙරළලා බලලා මේක ගැන අර්ථකථන දෙනවා. ඒක නිසායි මම මේ කියන්නේ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
භාෂා තුනෙන්ම තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Thank you. මේක භාෂා තුනෙන්ම තිබෙනවා. ඒකයි වෙන්න ඕනෑ. මේකේ එහෙම තිබෙනවා. තේරෙන භාෂාවකින් කියවන්න පුළුවන් විදියට මේකේ කරුණු කියලා තිබෙනවා.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

දැන් මේකෙන් වෙන්නේ මොකක්ද? මේකෙන් වෙන්නේ අපේ ආණ්ඩුවේ කාර්යසාධනය - performance එක - ඇගැයීමට ඔබතුමන්ලා හැමෝටම අවස්ථාවක් ලැබෙන එක. පාර්ලිමේන්තුවට විතරක් නොවෙයි, විද්වතුන්ට, සමාජ මාධ්‍යවලට, මාධ්‍යවලට, එළියේ ඉන්න අයට ඒ සඳහා අවස්ථාව ලැබෙනවා. මෙන්න මෙහෙමයි ආණ්ඩුව ක්‍රියා කරන්නේ. අපි හෙට මේක අරගෙන ලැහැස්ති වෙමු, අපි 2025 වර්ෂයේදී නොකර 2026 වර්ෂයට තල්ලු කරන ඒවා මොනවාද කියලා බලන්න. 2025 වර්ෂයේදී තියාගන්න ඕනෑ බර 2026 වර්ෂයට තල්ලු කරන්න අපි කැමැති නැහැ. මොකද, 2026 වර්ෂයේ දීත් තිබෙන්නේ අපේ ආණ්ඩුව. 2027 වර්ෂයේ දීත් තිබෙන්නේ අපේ ආණ්ඩුව. අපි දැන් උත්සාහ කරන්නේ මොකක් කරන්නද? අපේ ඉලක්කය මොකක්ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? අවදානම 2026 වර්ෂය දක්වා යන්න නොදී 2025 වර්ෂයේ දී බේරාගන්න; අපේ ඉලක්ක 2026 වර්ෂයට යන්න නොදී 2025 වර්ෂයේ දී සම්පූර්ණ කරගන්න. අපේ ගරු ඇමතිතුමා පාර්ලිමේන්තුවට මේක ඉදිරිපත් කරනකොට මුලින්ම කිව්වේ ඒකයි, අපේ ආදායම් ඉලක්ක බලාපොරොත්තු වුණාට වඩා ඉහළට ඇවිල්ලා තිබෙනවා කියලා. ඒක සාර්ථකත්වයක්.

ආදායම් ඉලක්ක ඉහළට ඇවිත් තිබෙනවා කියන්නේ අපි 2026ට තිබෙන බර අඩු කරගෙන තිබෙනවා කියන එකයි. මේ අවුරුද්දේ අපේ රටට සංචාරකයින් වැඩියෙන් එනවා කියන්නේ, සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම වැඩි වෙනවා කියන්නේ ලබන අවුරුද්දට තිබෙන බර අඩු කරගෙන තිබෙනවා කියන එකයි.

මම දැක්කා අපේ දිලිත් ජයවීර මන්ත්‍රීතුමා කියනවා, සංචාරක කර්මාන්තය අපේ ජනතාවට බරක් කියලා. සංචාරක කර්මාන්තය අපේ රටේ ජනතාවට බරක් වෙන්නේ නැහැ. මොකද, සංචාරක කර්මාන්තයේ විවිධ ක්ෂේත්‍රවලට යටිතල පහසුකම් හදන්න ඕනෑ; homestays ඇති කරන්න ඕනෑ. ගෙවල්, රැකියා, මුහුද නිකම්ම නිකම් තිබිලා වැඩක් නැහැ. මම දන්නවා, මඩකලපුව ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට විශාල විභවතාවක් තිබෙනවා කියලා. එම ප්‍රදේශයේ දූපත් තිබෙනවා; lagoons ගොඩක් තිබෙනවා. ඒවාට මේ කර්මාන්තය යොදවන්න ඕනෑ. අපි ඉදිරියේදී ඒ සඳහා එම ප්‍රදේශවලට යන්න බලාපොරොත්තු වෙනවා. මඩකලපුවේ airport එකක් තිබෙනවා. ඒකත් හරියට ප්‍රයෝජනයට ගන්නේ නැහැ. ඒකත් දියුණු කරන්න ඕනෑ. මොකද, දැන් නැගෙනහිර පළාතේ, උතුරු පළාතේ තමයි වැඩිම සංචාරක විභවයක් තිබෙන්නේ; කර්මාන්ත විභවයක් තිබෙන්නේ. මේ මන්ත්‍රීතුමන්ලා කිව්වා, ඒ ප්‍රදේශයේ තිබුණු කර්මාන්තශාලා වසා තිබුණු බව. අද National Paper Company එක පැය 24ම වැඩ; රෑටත් වැඩ, උදේටත් වැඩ. ඒවා රැකියා ජනිත කරනවා. අපට සංචාරක කර්මාන්තයේත් එහෙම විභවයක් තිබෙනවා. ඒ විභවය තිබෙන්නේ නැහැ, රටේ නීතිය කඩා වැටිලා නම්; ආර්ථිකය බිඳ වැටිලා නම්.

මම ලෝක ආර්ථික සමුළුවට ගිහින් කරපු කථාව විකෘති කරලා සහ ඒගොල්ලන්ට ගැළපෙන විදියට සමාජ මාධ්‍යවල ඉදිරිපත් කර තිබෙනවා මම දැක්කා. මම එතැනදී කිව්වේත් ඒකයි. අපේ රටේ බුද්ධිමය ජනතාව, තරුණ තරුණියන් පිටරටවලට යනවා. අපේ නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත් අය පිටරටවලට යන එක අපරාධයක්. ඒක අපේ රටේ පවතින අර්බුදයක් විතරක් නොවෙයි, මේ ආසියානු කලාපයේම තිබෙන අර්බුදයක්. අපේ රටවලට යුරෝපයේ තිබෙන මත් ද්‍රව්‍ය එනවා. බ්‍රසීලයේ තිබෙන මත් ද්‍රව්‍ය එනවා. අපි සංචාරක කර්මාන්තයට කැමැතියි. හැබැයි,

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අපි මත් ද්‍රව්‍යවලට කැමැති නැහැ. අපි ඒකෙන් බේරෙන්න ඕනෑ. මෙන්න මෙවැනි සීමා සහිතව අපේ ආර්ථිකය වර්ධනය කරගන්න ඕනෑ. ඒ හැකියාව දැන් අපි හඳුනාගෙන තිබෙනවා.

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, මෙච්චර කාලයක් තිබුණු ප්‍රශ්නය මොකක්ද? පසුගිය ආණ්ඩු කටයුතු කරගෙන ගියේ ඒ වියදම් කිරීමේ හැකියාවන් දැනගෙන නොවෙයි. ඔබතුමාත් දන්නවා, පසුගිය කාලයේ පැවති ආණ්ඩු කොහොමද මුදල් වියදම් කළේ කියලා. අපි මෙතැනදී ඒ ගැන කථා කළා. ඔහේ ඉබාගාතේ තමයි වියදම් කළේ. මන්ත්‍රීවරුන්ට තෑගි දෙනවා වාගේ තමයි ටෙන්ඩර් දුන්නේ, කොන්ත්‍රාත් දුන්නේ, වැඩ කර ගන්න දුන්නේ. මොකද, එහෙම කරන්න එක පැත්තකින් සාධාරණ හේතුවක් තිබුණා. ඒ ආණ්ඩු, සභාග ආණ්ඩු. මහින්ද රාජපක්ෂ මහත්මයාට තිබුණු අභියෝගය තමයි, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ වටේ තිබෙන පක්ෂ ටික අල්ලාගෙන තබා ගන්නේ කොහොමද, නඩත්තු කරන්නේ කොහොමද කියන එක. ඒ නිසා ඒගොල්ලන්ට සමහර ඒවා දෙන්න සිද්ධ වුණා. සමහර ඒවා එහෙම දුන්නා, එහෙම දීලා තමයි නඩත්තු කළේ. තානාපති සේවාවේ ඉඳලා, තනතුරුවල ඉඳලා, වියදම් කිරීමේ ඉඳලා, මාර්ගවල ඉඳලාම දුන්නා. අපි දන්නවා, ඒ කාලයේ සමහරු පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් නඩත්තු කළේ පාරවල් හදන්න දීලා බව. මේ පාර කර ගන්න කියලා දීලා තමයි ඒ මන්ත්‍රීවරුන් නඩත්තු කළේ. දැන් එහෙම කරන්න බැහැ. අපි එහෙම කරන්නේත් නැහැ. අපිම අපට විලංගු දමා ගන්න එකක් තමයි, මේ අවදානම් ප්‍රකාශය කියන්නේ. අපි මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ මොකකටද? වඩා හොඳ දත්ත හා ආකෘති නිර්මාණය කරන්න, වැඩිදියුණු කරන ආයතනික සම්බන්ධතා හදන්න, උපකල්පන අඛණ්ඩව යාවත්කාලීන කරලා යථාර්ථයක් බවට පත් කරන්න. මේ ප්‍රකාශයේ උපකල්පන තිබෙනවා. හැබැයි, අපි උපකල්පන එක්ක පොර බදනවා. ඒ මොනවාටද? යථාර්ථයට ගේන්න. මොකද අපි හොඳටම දන්නවා, අපි මේක යථාර්ථයට ගෙන ආවොත් විතරයි, මේ රට සාර්ථක වෙන්නේ කියන එක. නැත්නම් මේ රට සාර්ථක කරන්න බැහැ. අපි හැමදාම කියන්නා වාගේ අද දේශපාලන තලයේ දූෂණය zero. අද ඔබතුමන්ලාට කියන්න පුළුවන්ද, මේ ඉන්න මන්ත්‍රීවරුන්ට හෝ පළාත් පාලන ආයතනවල ඉන්න මන්ත්‍රීවරුන් කාටවත්, මේ මන්ත්‍රීතුමා හොරෙක්, මෙච්චර හොරකම් කරලා තිබෙනවා කියලා? එහෙම කියන්න බැහැ. ඒක zero.

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, බහලුම් 300 ගණනක් නිදහස් කිරීම පිළිබඳව ඒ කමිටුවේ වාර්තාව ඉදිරිපත් කළා. මම ඒකට සතුටුයි. ඒකට මම සතුටු වෙන්නේ මොකද දන්නවාද? අපි තවම ඒ වාර්තාව රජය හැටියට, ආණ්ඩුව හැටියට නිල වශයෙන් ප්‍රකාශයට පත් කරලා නැහැ. කමිටුව ඒ වාර්තාව ජනාධිපතිතුමාට දීලා ක්‍රමවේදයකට ඒ වැඩ කටයුතු ටික කෙරීගෙන යනවා. නමුත්, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඒක කොහොම හරි අරගෙන තිබෙනවා. ඒක හොඳයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒකට මොකක්ද කරන්නේ?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අනිවාර්යයෙන්ම ඒ වාර්තාව සම්බන්ධයෙන් කටයුතු කරනවා. අනිවාර්යයෙන්ම කටයුතු කරනවා විතරක් නොවෙයි, ඒ අනුව ගන්න තිබෙන සියලු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගත් ගන්නවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමනි, ඒ කන්ටේනර් ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක්. ඒක ඔබතුමන්ලාගේ ආණ්ඩුවට කළු පැල්ලමක්. අපට දැනෙනවා ඒක. ගරු ඇමතිතුමනි, ඒක පාර්ලිමේන්තුවේ table කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ කමිටුව පත් කළේ ජනවාරි 30වැනි දා. ජුනි 16වැනි දා වාර්තාව සකස් කරලා අවසන් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාම කල්පනා කරලා බලන්න, මීට කලින් එහෙම දෙයක් වුණා නම්, එක්කෝ ආණ්ඩුවට ගැළපෙන බොරු වාර්තාවක් හදනවා. මම තවම ඒ වාර්තාව දැකලා නැහැ. හැබැයි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා සභාගත කළ වාර්තාව නිවැරදි එක නම්, එතුමා කියන කාරණා ඇත්ත නම්, බලන්නකෝ ආණ්ඩුවෙන් පත් කරපු, ජනාධිපතිතුමා පත් කරපු කමිටුව කිසි නිලධාරියෙක් ආරක්ෂා කරනවාද කියලා. මම එහෙම කියන්නේ ඒ කියපු ටික ඇත්ත නම්. මම කියන්නේ ඒ වාර්තාවේ සඳහන් නිර්දේශ නිල වශයෙන් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලායි. දඬුවම් දෙන්න ඕනෑ අයට අනිවාර්යයෙන්ම දඬුවම් දෙනවා. ඒ ගැන අපට කිසිම බාධාවක් නැහැ. මොකද, අපට කිසි කෙනෙක් එක්ක යාළුකම් නැහැ. හැබැයි මම දන්නවා, මීට කලින් කරපු විමර්ශනවල වාර්තා කොච්චර තිබෙනවාද, හමස් පෙට්ටියට ගිය ඒවා. මේ පාර්ලිමේන්තුවේම ඇමතිවරුන් 33දෙනෙකු සම්බන්ධයෙන් ජනාධිපති පරීක්ෂණ කොමිසමක් පත් කරලා වාර්තාවක් ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමාට මතකද? දේපළ, අරවා මේවා සම්බන්ධයෙන් කරපු අයථා ගනුදෙනු ගැන ජනාධිපති පරීක්ෂණ කොමිසමක් පත් කරලා, ඒ තුළින් ලබා දුන් වාර්තාවට මොනවාද වුණේ? ඒවා ආණ්ඩුව හැටියටම හදාගෙන, ආණ්ඩුවම හමස් පෙට්ටියට යැව්වා. මේ වාර්තාව ගැන අපට සතුටුයි. අපි ක්‍රමවේදයකට අනුව ජුනි 16වැනි දා වෙනකොට පරීක්ෂණය අවසන් කරලා වාර්තාව අරගෙන තිබෙනවා. ඒක නිල වශයෙන් භාර දීලාත් තිබෙනවා. ඊට පස්සේ ඒකට දැන් ක්‍රියාමාර්ග ගන්නවා. හැබැයි, ඊට කලින් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ඒ වාර්තාව ලැබිලා, එතුමන්ලා ඒක ඉදිරිපත් කළා. ඒක හොඳයි. ඉතින්, විපක්ෂය සතුටු වෙන්න ඕනෑ නැද්ද? විපක්ෂය සතුටු වෙන්න ඕනෑ. මමත් සතුටුයි, විපක්ෂයත් සතුටුයි. මේක දැන් එහෙම රටක්. මම කියන්නේ ඒ විනිවිදභාවය වෙනුවෙන් තමයි, අද මේ රාජ්‍ය මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි ඔබට සහතිකයක් දෙනවා. මේ පාර්ලිමේන්තුවට අපි වගකියනවා, ජනතාවට අපි වගකියනවා, මීට පිටින් අපි එක වචනයක්වත් ක්‍රියාවට නඟන්නේ නැහැ කියලා.

බොහොම ස්තුතියි.

***සභාමේසය මත තබන ලද ලේඛන:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:*
*Documents tabled:*

අනාගතයේ දී නිකුත් කිරීමට නියමිත මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශයන්හි දී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය පිරික්සන මෙවලම (Health Check Tool) භාවිතා කරමින් මූල්‍යමය නොවන අංශයේ වූ රාජ්‍ය ව්‍යවසාය 41 ක මූල්‍ය ශක්‍යතාවය සහ අවදානම් විශ්ලේෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට රජය අදහස් කරයි. මෙමඟින් එක් එක් ආයතනයට අවදානම් ශ්‍රේණිගත කිරීමක් ලබාදීමට මෙන්ම රාජ්‍ය ව්‍යවසාය කළමඹහි මූල්‍ය ස්ථායිතාවය කාලයත් සමඟ ඇගයීමට ඉඩ සැලසේ. මූල්‍යමය අංශයේ ආයතන 11 ක් දැනටමත් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ස්වාධීන අධීක්ෂණයට යටත් වන අතර, එමඟින් ඔවුන් මෙම විශ්ලේෂණයෙන් ආවරණය නොවන්නේ මන්දැයි පැහැදිලි වේ.

අවදානම් අවම කිරීමේ පියවර

පසුගිය වසර දෙක තුළ, රජය විසින් රාජ්‍ය ව්‍යවසායන්හි මෙහෙයුම් කාර්යසාධනය වැඩිදියුණු කිරීම සහ ඒවාට බලපෑ අවදානම් සඳහා විසඳුම් ලබා දීමට සැලකිය යුතු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අනුගමනය කර ඇත.

අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර අතරට:

- පිරිවැය-නිරූපිත මිලකරණ ප්‍රතිපත්ති
  - පිරිවැය-ආවරණය කෙරෙන මූලධර්ම මත පදනම්ව විදුලිය සහ ඉන්ධන මිල ප්‍රතිව්‍යුහගත කිරීම.
  - මිල නියම කිරීමේදී සත්‍ය වශයෙන් දරනු ලබන සේවා පිරිවැය පිළිබිඹු කරන බව සහතික වීම සඳහා හඳුන්වා දුන් ජල ගාස්තු සූත්‍රය.
- ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම
  - ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්හි කාලාන්තරයක් මුළුල්ලේ එකතු වූ ණය (legacy debt) රජයේ ශේෂ පත්‍රයට මාරු කිරීම.
  - රාජ්‍ය ව්‍යවසායයන් සහ අදාළ රාජ්‍ය ආයතන අතර ඇති වගකීම් නිරවුල් කිරීම.
- ආයතනික සංවර්ධනය
  - ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 ක පාලනය සහ මෙහෙයුම් ශක්තිමත් කිරීම සඳහා පියවර ගෙන ඇත.
- විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ
  - 2024 අංක 36 දරන විදුලිබල පනත:
    - ලංකා විදුලිබල මණ්ඩලය වෙත සැළකිය යුතු මට්ටමේ මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වයක් ලබා දීම;
    - විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වයට ඉඩ දීම; සහ
    - කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම
  - විදුලිබල පනත සමාලෝචනය කර සංශෝධන යෝජනා කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කර ඇත.
- ඛනිජ තෙල් වෙළෙඳපොළෙහි නිදහස් වෙළෙඳපොළ තරඟකාරීත්වයට ඉඩ සැලසීම
  - 2023 වසරේ දී වෙළඳපොළ සැපයුම්කරුවන් සංඛ්‍යාව 3 ක් වූ අතර එය 2024 වසරේ දී 5 දක්වා වැඩි වීම.
  - තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.
- ශ්‍රීලංකන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීම
  - 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී සංශෝධිත ව්‍යාපාර සැලැස්ම (පෞද්ගලීකරණයකින් තොරව) අනුමත කිරීම.
  - ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පවතින විකල්ප ආකෘති රජය විසින් සෙවීම.
- ජල සැපයුම් අංශය ප්‍රතිසංස්කරණය
  - ජල ගාස්තු ප්‍රතිපත්තිය සහ ජල ගාස්තු සූත්‍රය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීම.
  - 2024 වසරේ ජූලි මාසයේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආයතනික අභිප්‍රාය පිළිබඳ ප්‍රකාශය (SCI) අත්සන් කිරීම.
  - අධීක්ෂණය සඳහා, ආයතනික අභිප්‍රාය පිළිබඳ ප්‍රකාශය තුළ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) ඇතුළත් කිරීම.
- රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තිය
  - රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයේ (SOERU) ක්‍රියාකාරකම් සමස්ත ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම තෙක් තාවකාලිකව අත්හිටුවීම.

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සඳහා අවශ්‍ය අන්තර්ගතයන්

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව (PFMA) මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි (FSS) ඇතුළත් විය යුතු අවම අන්තර්ගතයන් නියම කරන අතර එයට ඇතුළත් වනුයේ:

I. රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ එම ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති;

II. රාජ්‍ය ණය තිරසාර මට්ටමකට අඩු කිරීම සඳහා යෝජිත කාල රාමුව;

III. වගකිවයුතු මූල්‍ය කළමනාකරණය තහවුරු කිරීම සඳහා රජයේ උපායමාර්ගික ප්‍රමුඛතා;

IV. රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ ප්‍රතිපත්ති වගකිවයුතු මූල්‍ය කළමනාකරණයේ අරමුණු සමඟ අනුකූල වන ආකාරය පැහැදිලි කිරීම;

V. මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව;

VI. මූල්‍ය ක්‍රමෝපායයට සාපේක්ෂව කාර්ය සාධනය තක්සේරු කිරීමට, ඇතුළත් වනුයේ,

- පෙර මූල්‍ය වර්ෂයේ දී මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල වීම පිළිබඳ තක්සේරුවක් ද , එම ඉලක්ක සමඟ අනුකූල නොවීම පිළිබඳ පැහැදිලි කිරීමක් ;
- වත්මන් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ඉලක්ක සමඟ අපේක්ෂිත අනුකූලතාවය පිළිබඳ තක්සේරුවක්;
- ඉදිරි මූල්‍ය වර්ෂය සහ ඊළඟ වසර හතර සඳහා මූල්‍ය ඉලක්ක සමඟ අපේක්ෂිත අනුකූලතාවය පිළිබඳ තක්සේරුවක්; සහ
- වත්මන් මූල්‍ය වර්ෂය සහ ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල නොවීමේ අවදානම් පිළිබඳ තක්සේරුවක්;

VII. වගකීම් සහගත මූල්‍ය කළමනාකරණයේ පවතින අරමුණු සාක්ෂාත් කර ගැනීමට බාධා වන ප්‍රධානතම මූල්‍ය අවදානම් මූලාශ්‍ර; සහ

VIII. පසුගිය වසර තුන ඇතුළත ගනු ලැබූ මූල්‍ය තීරණවල සාර්ව ආර්ථික බලපෑමයි.

මූල්‍ය තිරසාරභාවයට සහාය වීම සඳහා ගනු ලැබූ නිශ්චිත ප්‍රතිපත්තිමය පියවර

1. මූල්‍ය විනය සඳහා නව නීතිමය ආකෘතියක්
   - 2024 වසරේ ජූනි මාසයේ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත (PDMA) බලාත්මක කිරීම.
   - 2024 වසරේ අගෝස්තු මාසයේ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (PFMA) බලාත්මක කිරීම.
   - 2024 වසරේ දෙසැම්බර් මස 02 වන දින රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම.
   - බදු වියදම් ප්‍රකාශය ප්‍රකාශයට පත් කිරීම.

2. ප්‍රධාන බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ: බදු පදනම පුළුල් කිරීම, අනුපාත දර්ශකගත කිරීම

   2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි;

   - සම්මත එකතු කළ අගය මත බදු (VAT) අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම.
   - ප්‍රධාන අයිතම සඳහා අදාළ වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්වලින් බහුතරයක් ඉවත් කිරීම.
   - එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 දක්වා අඩු කිරීම.
   - සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 120 සිට වසරකට රු. මිලියන 60 දක්වා අඩු කිරීම.
   - උද්ධමනය අනුව සකස් කරන ලද දර්ශකය මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදුවලට යටත් සියලුම භාණ්ඩවල නිෂ්පාදන බද්ද සියයට 14 කින් සංශෝධනය කිරීම.
   - වාර්ෂික උද්ධමනය අනුව සකස් කරන ලද දර්ශකයක් මත පදනම්ව සියලුම මත්පැන් වර්ග සඳහා සුරා බද්ද සියයට 14 කින් වැඩි කිරීම.

   2025 වසරේ ජනවාරි මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි;

   - වාර්ෂික උද්ධමනය මත පදනම්ව දර්ශකකරණය අනුව ඒකක අනුපාත නිෂ්පාදන බදු සහිත සියලුම භාණ්ඩ සඳහා නිෂ්පාදන බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.
   - වාර්ෂික උද්ධමනය මත පදනම්ව දර්ශකකරණය අනුව, සියලුම මත්පැන් වර්ග සඳහා සුරා බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.

   2025 වසරේදී අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි;

   - පුද්ගලයෙකු සඳහා අදාළ වන පුද්ගල ආදායම් බදු සහනය වාර්ෂිකව රු. 1,200,000/- සිට රු. 1,800,000/- දක්වා වැඩි කිරීම සහ පුද්ගලයෙකුගේ බදු අය කළ හැකි ආදායමට අදාළ වන බදු අනුපාත සංශෝධනය කිරීම.

පුද්ගල ආදායම් බදු (PIT) ව්‍යුහයේ සංශෝධන

| | වාර්ෂික බදු අය කළ හැකි ආදායම (රු.) | |
|---|---|---|
| ආන්තික බදු අනුපාතය % | පෙර අනුපාත | වත්මන් අනුපාත |
| 0 | මිලියන 1.2 දක්වා | මිලියන 1.8 දක්වා |
| 6 | මිලියන 1.2 - 1.7 | මිලියන 1.8 - 2.8 |
| 12 | මිලියන 1.7 - 2.2 | - |
| 18 | මිලියන 2.2 - 2.7 | මිලියන 2.8 - 3.3 |
| 24 | මිලියන 2.7 - 3.2 | මිලියන 3.3 - 3.8 |
| 30 | මිලියන 3.2 - 3.7 | මිලියන 3.8 - 4.3 |
| 36 | මිලියන 3.7 ට වැඩි | මිලියන 4.3 ට වැඩි |

3. බදු පරිපාලනය සහ ආයතනික ව්‍යුහය නවීකරණය කිරීම

   දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

   - අපරාධ විමර්ශන ඒකකය පිහිටුවීම.
   - රැකියා සහ පොලී ආදායම පමණක් ඇති පුද්ගලයින් සඳහා 2023/2024 තක්සේරු වර්ෂය සඳහා සරල කළ පුද්ගල ආදායම් බදු වාර්තා යොමු කිරීමේ පෝරමයක් හඳුන්වා දීම.
   - අවදානම් කළමනාකරණ ඒකකය පුළුල් කිරීම.
   - 2025 වසරේ ඔක්තෝම්බර් මස සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය අහෝසි කිරීමෙන් පසු අපනයනකරුවන් සඳහා එකතුකළ අගය මත බදු ආපසු ගෙවීම් කඩිනම් කිරීම සඳහා අපනයනකරුවන් සඳහා මුදල් ආපසු ගෙවීමේ ඒකකයක් ආරම්භ කිරීම.
   - අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම.

   ශ්‍රී ලංකා රේගුව

   - 2024–2028 වර්ෂයන් සඳහා උපායමාර්ගික සැලැස්මක් දියත් කිරීම.
   - අභ්‍යන්තර කටයුතු ඒකකයක් ස්ථාපිත කිරීම.
   - සතිපතා ප්‍රධාන කාර්ය සාධන දර්ශක ලකුණු කාඩ්පත් සමඟ "දින 80 විශිෂ්ටතා" වැඩසටහන දියත් කිරීම.
   - අවදානම් නීති සහ බහාලුම් පරීක්ෂා සාර්ථකත්ව අනුපාතය ප්‍රතිසංස්කරණය කිරීම.
   - ASYHUB පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

   සුරාබදු දෙපාර්තමේන්තුව

   - සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.
   - රට පුරා බලපත්‍රලාභී සුරාබදු පරිශ්‍රවල අධීක්ෂණය වැඩි දියුණු කිරීම.
   - දින 100 විශේෂ බලාත්මක කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. (2024.05.20 සිට 2024.08.27 දක්වා).
   - පැය 24 පුරා ක්‍රියාත්මක 1913 ක්ෂණික ඇමතුම් අංකය දියත් කිරීම.
   - මධ්‍යසාර පාන වර්ග සඳහා දැඩි තත්ත්ව පාලනයන් පවත්වා ගැනීම සඳහා මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීම.
   - සුරාබදු ආදායම් එකතු කිරීම හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීම.
   - මූල්‍ය බුද්ධි ඒකකයක් (FIU) ස්ථාපිත කිරීම.
   - ආරක්ෂිත ලේබල් කිරීමේ පද්ධතියක් හරහා නීත්‍යානුකූලව නිෂ්පාදනය කරන ලද මධ්‍යසාර පාන වර්ග හඳුනා ගැනීම සඳහා නිර්මාණය කර ඇති නව ජංගම යෙදුමක් හඳුන්වාදීම.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.07]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
**(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)**
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට පෙර කථා කරපු ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ කථාවේ ආරම්භය අනුව තේරෙන්නේ හරියට මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය වර්තමාන ආණ්ඩුවේ initiative එකක් වාගේයි. ඇත්තවශයෙන්ම මේ Fiscal Strategy Statement එක ඉදිරිපත් කරන්නේ, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11වැනි වගන්තිය අනුවයි. ඒක සම්මත වෙච්ච නිසා තමයි මේ ප්‍රකාශය කරලා තිබෙන්නේ. ඉතින් මේ ප්‍රකාශය ඉදිරිපත් කරන එක හොඳයි. ඒක නරකයි කියලා මම කියන්නේ නැහැ.

ඒ වාගේම දැන් එතුමා කියපු ආකාරයට වර්තමාන ආණ්ඩුව යම් යම් කැප කිරීම් කරලා තිබෙනවා. ඒක අපි පිළිගන්න සූදානම්. මොකද, හැම එකම විවේචනය කරන එක නොවෙයි අපි කරන්න ඕනෑ. නමුත්, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ තිබෙන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශයක්. මේකේ targets achieve කරන විධිය කොහොමද කියලා නැහැ. ඇත්තවශයෙන්ම දැන් ජනාධිපතිතුමා බලයට පත්වෙලා මාස නවයයි, මේ ආණ්ඩුව බලයට පත්වෙලා මාස හතහමාරයි. Sri Lanka Development Update වාර්තාව අනුව රටේ ජනගහනයෙන් තුනෙන් එකක් -සියයට 33ක්- දුගීභාවයේ ඉන්නේ; දරිද්‍රතා රේඛාවෙන් පහළ ඉන්නේ. එතකොට ඒ අය ඒකෙන් මුදා ගැනීම සඳහා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද, කොයි කාලයේද ඒක කරන්නේ, මොන පියවරෙන් පියවරද ඒ සඳහා ක්‍රියාත්මක වෙන්නේ කියන එක ගැන මේ සභාවට සහ රටට දැනුම් දෙනවා නම් වඩා හොඳයි කියලා මම කියනවා. ඒ වාගේම 2023 වර්ෂයේ ආපු ආර්ථික අර්බුදයත් එක්ක කරපු ගෘහස්ථ සමීක්ෂණය අනුව ගෘහස්ථ වියදම සියයට 91.1කින් වැඩි වෙලා තිබෙනවා. ඒක සම්පූර්ණයෙන් නැති කරන්න බැරි වෙයි. නමුත් ඒක පාලනය කරන්නේ කොයි කොයි stepsවලින්ද, කවර කාලයකදීද කියන එකත් මේකට ඇතුළත් වුණා නම් හොඳයි. මොකද, දැනගෙන නේ ඔක්කෝම කරනවා කිව්වේ. ඒ නිසා එහෙම වුණා නම් හොඳයි. දැන් ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා මේ දේවල් ලියා ගන්නවා. එතුමාගේ පිළිතුරු කථාවේදී මේවාටත් පිළිතුරක් දෙනවා නම් හොඳයි. ඊළඟට, ඇත්තවශයෙන්ම ව්‍යාපාර කටයුතු කරපු අයගෙන් සියයට 15.1කගේ රැකියා අහිමි වෙලා තිබෙනවා. එතකොට රජය ඒ සඳහා ගන්නා වූ පියවර මොකක්ද? කොයි කාලයේදීද ගන්නේ? ඒ ගැනත් කියනවා නම් හොඳයි.

පරාටේ නීතිය අද රෑ ඉඳලා නේද නැවත බල පැවැත්වෙන්නේ, නියෝජ්‍ය ඇමතිතුමනි? එතකොට SME sector එකට මොකක්ද දෙන alternative විසඳුම? ඒ ගැනත් ප්‍රකාශ කරන්න කියලා අපි රජයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, අපේ රටේ ණයබරතාව සියයට 22කින් වැඩි වෙලා තිබෙනවා. එතකොට ණයබරතාව නැති කරන්නේ කොහොමද, ඒ සඳහා මොනවාද කරන්නේ, කොයි කාලයේද කරන්නේ, මොකක්ද වැඩ පිළිවෙළ කියලා රටට කියන්න ඕනෑ, කාලය සහ ඉලක්කම් එක්ක. අපේ රටේ ණයබරතාවෙන් පෙළෙන අයගෙන් සියයට 31ක් උකස් කටයුතුවලින් ණයබරතාවට පත් වූ අය. ඒ, ඇයි? පසුගිය කාලයේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් තම කන කර ආභරණ ඔක්කෝම උකස් කරපු අයගේ තමයි ණයබරතාව වැඩි වෙලා තිබෙන්නේ. මූල්‍ය ආයතනවලින් ණය ගත්ත ප්‍රමාණය සියයට 8.7යි. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමන්ලාගේ මූල්‍ය ප්‍රකාශයට ඇතුළත් වුණා නම් හොඳයි කියන එක තමයි මගේ අදහස. මේවා අපි ආණ්ඩුව විවේචනය කරන්නවත්, ආණ්ඩුව අපහසුතාවට පත් කරන්නවත් කියන ඒවා නොවෙයි. මේ කරුණුත් address කරන්න. මේ කරුණුත් address කළා නම් ඉතා හොඳයි කියන එක අපි කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කළ සමීක්ෂණ අනුව පුද්ගලයෙකුගේ මාසික වියදම රුපියල් 16,207යි. එතකොට හතරදෙනෙක් ඉන්න පවුලකට මාසයක් ජීවත් වෙන්න රුපියල් 64,000ක්, 65,000ක් ඕනෑ. එතකොට මේ රටේ පවුල් සංඛ්‍යාවෙන් කීයකට ඒ හා සමාන ආදායමක් ලැබෙනවාද? එහෙම නැති අයට ආණ්ඩුව දෙන විකල්පය මොකක්ද කියන එකත් කියනවා නම් හොඳයි.

මම දැක්කා, සමාජ මාධ්‍යවල සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාව විවේචනය කරලා තිබුණා. ඇමතිතුමා, English is a language; it is not knowledge. ඔබතුමාට දැනුම තිබෙනවා නම් එච්චරයි. මම දැක්කා, ඔබතුමා යම් තොරතුරු ටිකක් එකතු කරගෙන ගිහිල්ලා රට ගැන presentation එකක් කළා, picture එකක් දුන්නා. පොඩි පොඩි අඩුපාඩු තිබෙන්න පුළුවන්, ඉංග්‍රීසි උච්චාරණයේ. ඒක ප්‍රශ්නයක් නැහැ. මොකද, හැමෝම හොඳටම දැනගෙනද කරන්නේ? නමුත්, විවේචන එල්ල වෙන්නේ මොකද? ඔබතුමන්ලා කිව්වේ, හැම එකම දන්නවා කියලා. ඒකයි මම කියන්නේ, මේකේ තිබෙන අඩුපාඩුවලට ඉලක්කම්, කාල වකවානු ඉදිරිපත් කරන්න කියලා.

එතකොට එක පුරවැසියෙකුගේ මාසික වියදම රුපියල් 16,207ක් වෙනකොට හතරදෙනෙක් ඉන්න පවුලක මාසික වියදම රුපියල් 65,000යි. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමනි, එතැනදී විශේෂයෙන්ම එහි ගොදුරක් බවට පත්වෙලා තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව. ඔවුන් තමයි ඒකෙන් විශාල වශයෙන් පීඩාවට පත් වෙලා තිබෙන්නේ. මොකද, පිට පළාත්වල ගෙවල්වල නම් කොස් ගහක්, දෙල් ගහක් තිබෙනවා; වී ටිකක් හම්බ වෙනවා. නමුත් කොළඹ අග නගරයේ ජීවත් වන ජනතාව ගත්තොත්, ඔවුන් ලුණු කැටයේ, අබ ඇටයේ ඉඳලා හැම දෙයම සල්ලි දීලා ගන්න ඕනෑ. ඒවාත් මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශවලට ඔබතුමන්ලා ඇතුළත් කළා නම් හොඳයි. ඔබතුමන්ලා පළාත් පාලන ආයතනවල බලය පිහිටුවන්න - විශේෂයෙන්ම කොළඹ මහ නගර සභාවේ බලය ලබා ගැනීම සඳහා - තිබුණු උනන්දුව, උත්සාහය මේ නගරයේ ජීවත් වන ජනතාව පීඩාවෙන් මුදා ගැනීම සඳහාත් යොදවනවා නම් ඉතාම හොඳයි කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ.

බලශක්ති ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ නැහැ. අද ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ලැබුණා. එතුමා විවේචනය කරනවා, World Bank එකෙනුයි, ADB එකෙනුයි Sectoral Oversight Committee එකේ ඉන්න අයට ලියුමක් එව්වා කියලා. මොකද, Sectoral Oversight Committee එක තමයි, Committee Stage එකේ Amendments ටික ගෙනෙන්නේ. එතකොට ඒගොල්ලන් යම් අදහසක් ඉදිරිපත් කර තිබෙනවා නම් එතුමා කොහොමද ඒක විවේචනය කරන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. මොකද, විදුලි බිල සියයට 30කින් අඩු කරනවා කියලා බලයට ආපු ආණ්ඩුව විදුලි බිල අඩු කරලා නැහැ. මිල වැඩි කරලා දැන් Sectoral Oversight Committee එකට බැණලා වැඩකුත් නැහැ.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, අපි කියන්න කැමැතියි, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අයත් පර්යේෂණ නෞකාවක් වන "Dr. Fridtjof Nansen" නෞකාවට ලංකාවට ඇතුළු වෙන්න අනුමැතිය ලබා දීම ප්‍රමාද වීම නිසා මේ කාර්යක්ෂම ආණ්ඩුවට ඩොලර් මිලියනයක දඩයක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන බව. ඒවා ගැන කියන්නේ නැහැ. ඩොලර් මිලියනයක වන්දියක් ගෙවන්න ඕනෑ, අනුමැතිය ලබා දෙන්න පරක්කු වුණු එකට. ගරු ඇමතිතුමනි, එතුමන්ලා සංචාරකයෝ, ආයෝජකයෝ ඔක්කොටම කථා කළා. ඒ අයට එන්න කියලා කිව්වා. ඒක හොඳයි.

IMF Programme එකෙන් 2028දී අයින් වෙනවාය කියනවා. IMF Programme එකෙන් අයින් වෙනවා නම් ණය ගෙවීමේ හැකියාව වර්ධනය කරන ඉලක්ක මොනවාද? ඒ වනකොට අපි ආදායම හදා ගන්නවා කියන උත්තරය නොවෙයි, කොයි විධියටද ඉලක්ක ළඟා කර ගන්නේ කියන එක පිළිබඳව කියන්න ඕනෑ. Foreign Direct Investmentsවලින් කොච්චර වැඩි කරනවාද? Exportsවලින් කොච්චර වැඩි කරනවාද? අලුත් revenue generate කරන්නේ කොයි විධියටද? ඒ හරහා නිෂ්පාදන capacity එක කොච්චරද වැඩි වෙන්නේ? රැකියා අවස්ථා කොච්චර නිර්මාණය වෙනවාද? අන්න එවැනි ඉලක්ක කිව්වොත් ජනතාවට පිළිගන්නත් පුළුවන්, අපට පිළිගන්නත් පුළුවන්. එතකොට විපක්ෂයට ඔබතුමන්ලාව විවේචනය කරන්නත් බැරි වෙනවා. මේ සම්පූර්ණ වාර්තාව කියෙව්වත් මම මේ කියපු ඒවාට උත්තර ලැබෙන්නේ නැහැ. ඒකේ guidelines විතරයි තිබෙන්නේ, targets නැහැ; ඒ targets achieve කරන විධිය නැහැ; ඒවා achieve කරන්න බැරි වුණාම ගන්නා ඊළඟ පියවර මොකක්ද කියලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අවුරුද්දේ වුණත් අය වැය පරතරය පියවන්න ඩොලර් බිලියන 7.3ක ප්‍රමාණයක ණය ගන්න තිබෙනවා. අවුරුදු 76ටම ණය අරගෙන තිබෙන්නේ ඩොලර් බිලියන 95යි. එතකොට ඉලක්කගත ආදායම් සපුරා ගන්න බැරි වුණොත් ඩොලර් බිලියන 7.3ක් නොවෙයි, ඊට වඩා ණය ගන්න වෙනවා. ඒ නිසා මේ ඉලක්ක ටිකත් පැහැදිලි කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලයි අවසානයි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්, ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමනි. ජූලි 01වැනි දා ඉඳලා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ fixed depositsවලට වැඩිපුර ලබා දෙනවා කියපු සියයට තුන ලබා දෙනවාද නැද්ද කියන කාරණය සම්බන්ධයෙනුත් පැහැදිලි කරන්න. මොකද, රාජ්‍ය බැංකු ඒකට පොඩි මැලිකමක් දක්වනවා වාගේ feeling එකකුත් තිබෙනවා. ඒ නිසා ඔබතුමා ඒකට උත්තරයක් ලබා දෙයි කියා බලාපොරොත්තු වෙමින්, මේ කියපු කරුණු positive විධියට ගන්න කියාත් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.14]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

அஸ்ஸலாமு அலைக்கும், ආයුබෝවන්, வணக்கம்!

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டினதும் நாட்டு மக்களினதும் நலன்கருதி இன்று முன்வைக்கப்பட்டு இருக்கின்ற நிதி செயல்நுணுக்கக் கூற்றை வரவேற்பதோடு, அரசாங்கத்துக்குப் பாராட்டுக்களையும் தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த நாடு எந்தளவுக்குப் பொருளாதாரத்தில் பின்தங்கி இருக்கின்றதோ, அந்தளவுக்கு இந்த நாட்டு மக்களும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். எங்கு பார்த்தாலும், மக்கள் வாழ்வாதாரத்துக்காக - உணவுக்காகவும் இருப்பிடத்துக்காகவும் - மிகவும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். எங்களுடைய நாடு அதிகளவு கடனில் இருப்பதால், விலைவாசியும் மக்கள்படும் துன்பங்களும் அதிகமாகவே இருக்கின்றன. இதற்குக் காரணம், சென்ற அரசாங்கங்கள் வெளிநாடுகளிலிருந்து பெற்ற கடன்களைச் சரியான முறையில் பயன்படுத்தாமைதான். முறையற்ற கடன்களைப் பெறுவதால் நாட்டின் கடன் சுமை அதிகரித்து, மக்கள்மீது விதிக்கப்படுகின்ற வரிகளும் அதிகரிக்கப் படுகின்றன. இந்த முறையற்ற கடன்களால் நாட்டுக்கு நலவு இருக்கிறதா என்றால், இல்லை! மக்களுக்கு நலவு நடக்கிறதா என்றால், அதுவும் இல்லை! இந்த முறையற்ற கடன்களால் கடந்த கால அரச தலைவர்கள் நல்லமுறையில் வாழ்ந்து இருக்கின்றார்களே ஒழிய, இந்த நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் நலவு நடக்கவில்லை. எமது அரசாங்கம் முன்வைத்திருக்கின்ற நிதி செயல்நுணுக்கக் கூற்றானது, இந்த நாட்டையும் நாட்டு மக்களையும் எதிர்காலத்தில் சிறப்பாக வழிநடத்திச் செல்வதற்கு உதவியாக இருக்குமென நினைக்கின்றேன்.

அத்தியாவசியமற்ற தேவைகளுக்குக் கடன்களை வாங்காமல், அத்தியாவசியத் தேவைகளுக்கு மாத்திரம் கடன்களைப் பெற்றால் அது மக்களுக்கு மிகவும் நன்மை பயக்கும். அத்தியாவசியமற்ற தேவைகளுக்காக நாங்கள் பிற நாடுகளில் இருந்து கடன்களைப் பெறுவதால், எமது நாட்டுக்கு எந்தவிதமான நன்மையும் கிடைக்கப்போவதில்லை. அவ்வாறான கடன்கள்மூலம் இந்த நாட்டுக்கும் மக்களுக்கும் எந்தவிதமான பிரயோசனமும் இல்லாத - பயனுமில்லாத - சில அபிவிருத்திகளைச் செய்திருக்கிறார்கள். உதாரணத்துக்கு, விமான நிலையமொன்றை அமைத்திருக்கிறார்கள். அந்த விமான நிலையத்தால் மக்களுக்கு எந்தவிதமான நன்மையும் இல்லை என்பதுடன், அரசாங்கத்துக்கும் எந்தவித வருமானமும் இல்லை. கடந்த அரசாங்கங்கள் இவ்வாறான கடன்கள்மூலம் மக்கள்மீது கடன் சுமையையும் கஷ்டங்களையும்தான் அதிகரித்து இருக்கின்றனவே ஒழிய, மக்களுக்கு எந்தவிதமான பலனையும் பெற்றுக்கொடுக்கவில்லை. எவ்வளவு கடனைப் பெறுவது, எவ்வாறு பயன்படுத்துவது, எவ்வளவு பயன்படுத்துவது போன்ற எந்தவிதத் திட்டமிடலும் இல்லாமல் கடனைப் பெற்ற அரச தலைவர்கள், தாங்கள் வசதியாக வாழ்வதற்கே அதைப் பயன்படுத்தியிருக்கிறார்கள். அடுத்த உதாரணம்தான் தாமரைக் கோபுரம்! பிற நாடுகளில் இருந்து கடன் பெற்று அமைக்கப்பட்டு இருக்கின்ற தாமரைக் கோபுரமானது இந்த நாட்டுக்கு வெளிச்சமாக இருக்கின்றதே தவிர, கொழும்பில் வாழ்கின்ற மக்களுக்குப் பிரகாசமாக இல்லை. கொழும்பில்

[ගරු මුහම්මද් ෆයිසාල් මහතා]

வாழ்கின்ற மக்கள் மிகவும் கஷ்டமான நிலையிலே வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். அந்தக் கோபுரத்தை அமைப்பதற்காக கடன் பெற்ற கடந்த கால அரச தலைவர்கள் மிகவும் வசதியாக வாழ்கின்றார்கள். இருட்டிலும் கஷ்டத்திலும் வாழுகின்ற கொழும்பு வாழ் மக்களுக்கு அதனால் எந்தவித நன்மையும் இல்லை. அவர்கள் வரி செலுத்துவதற்கே மிகவும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கடன்களைத் திட்டமிட்டுப் பெற வேண்டும். வருமானத்தைத் தாண்டி கடன்களைப் பெற்றதனால்தான் எமது நாடும் நாட்டு மக்களும் கஷ்டப்படுகின்றார்கள். இது தனி மனிதனுக்கும் பொருந்தும்; அரசாங்கத்துக்கும் பொருந்தும். ஒரு மனிதன் தனது வருமானத்துக்கு அதிகமாகக் கடன் பெற்றால், அவன் மிகவும் கஷ்டப்படவேண்டி இருக்கும். நூறு ரூபாய் வருமானத்தைப் பெறுகின்ற ஒருவர், அதற்குக் குறைவான தொகையைக் கடனாகப் பெற்றால், அவனால் வாழ்க்கையைச் சரியான முறையில் வழிநடத்திச் செல்ல முடியும். அதேநேரம் அவன் நூறு ரூபாய்க்கும் அதிகமான தொகையைக் கடனாகப் பெற்றால், கஷ்டத்தில் விழக்கூடிய சந்தர்ப்பம் ஏற்படும். அதேபோல், அரசாங்கம் தனது வருமானத்தைவிட அதிகமாகக் கடன்பெற்றால், நாட்டு மக்களுக்கே அது சுமையாக இருக்கும். இந்தக் கடன் சுமையில் இருந்து எமது நாட்டு மக்களை மீட்சி பெறச் செய்வதற்காக எமது அரசாங்கம் முன்வைத்திருக்கின்ற இந்த நிதி செயல்நுணுக்கக் கூற்றை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கடனிலிருந்து மீளாமல் எமது நாட்டில் எந்தவித நலவையும் எதிர்பார்க்க முடியாது. எமது நாட்டை ஆட்சி செய்த எந்தவோர் அரசாங்கமும் கடன்பெறுவதைக் குறைத்தாக இல்லை. கடன் தொடர்பான வரைபு மேலும் கூடிக்கொண்டு போகின்றதே தவிர, குறைந்ததாக இல்லை. இதற்குக் காரணம், திட்ட மிடாமல் கடன்களைப் பெறுவதுதான். இந்த நாடு இரண்டு வகையான கடன்களைப் பெறுகின்றன. ஒன்று, ஆடம்பரக் கடன். மற்றையது, அத்தியாவசியக் கடன். அத்தியாவசியக் கடன் என்பது, மக்களுக்குத் தேவையான அத்தியாவசியப் பொருட்களைப் பிற நாடுகளிலிருந்து கொள்வனவு செய்வதற்காகப் பெறக்கூடிய கடனாகும். இதன்மூலம் மக்களுக்கு நலவு செய்யலாம்.

ஆடம்பரக் கடன்களைப் பெறுவதால் மக்களுக்கு எந்தவிதமான நலவும் ஏற்படப்போவதில்லை. இவ்வாறான கடன்கள்மூலம் கடந்த அரசாங்கங்களில் இருந்த அரசியல் தலைவர்கள் நல்ல முறையில் வாழ்ந்தார்களே தவிர, மக்களுக்கு எந்தவிதமான நலவும் செய்யவில்லை. நாட்டின் கடன் சுமையை இல்லாமலாக்கி, தங்களுக்கு நல்லதொரு வாழ்க்கையை அமைத்துக் கொடுப்பார்கள் என மக்கள் மாறி மாறி வந்த அரசாங்கங்களை நம்பி நம்பிக் கஷ்டத்தில் விழுந்ததனால்தான், அவற்றைத் துரத்திவிட்டு புதியதோர் அரசாங்கத்தைக் கொண்டுவந்தார்கள். மக்களின் எதிர்பார்ப் புகளை நிறைவேற்றுவதற்காகவே இந்த அரசாங்கம் இந்த நிதி செயல்நுணுக்கக் கூற்றைக் கொண்டுவந்துள்ளது.

சென்ற அரசாங்கங்கள் பிற நாடுகளிலிருந்து பெற்ற கடன்கள்மூலம் உள்நாட்டு உற்பத்தியை அதிகப்படுத்தி இருக்கின்றதா என்றால், இல்லை! உள்நாட்டு உற்பத்தியை அதிகரித்திருந்தால், எமது நாட்டுக்குத் தேவையான சீமெந்தை வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்ய வேண்டிய அவசியம் ஏற்பட்டிருக்காது. எமது நாட்டில் சீமெந்தை உற்பத்தி செய்வதற்கான வாய்ப்பு அதிகமாக இருப்பதனால், சீமெந்துத் தொழிற்சாலைகளை உருவாக்கி யிருக்கலாம். அதைக்கூட சென்ற அரச தலைவர்கள் செய்யத் தவறிவிட்டார்கள். அதேபோல் எமது நாட்டு மக்களுக்குத் தேவையான பால்மாவைக்கூட பிற நாடுகளில் இருந்து கடனுக்குப் பெறவேண்டிய அவசியமில்லை. ஏனெனில், அவற்றை உற்பத்தி செய்யக்கூடிய அதிகமான வாய்ப்புகள் எமது நாட்டில் இருக்கின்றன. அவற்றைக்கூட அவர்கள் சரியான முறையில் செய்யாமல், கடன்களுக்கு மேல் கடன்களைப் பெற்று, மக்கள்மீது கடன் சுமையையும் வரிச் சுமையையும் அதிகரித்திருக்கிறார்கள். இதனை நிவர்த்தி செய்வதற்காகத்தான் எமது அரசாங்கம் நிதி செயல்நுணுக்கக் கூற்றைக் கொண்டுவந்து இருக்கின்றது.

எமது நாட்டில் அதிகமான குளங்களும் வயல் நிலங்களும் இருக்கின்றன. குளங்களைப் புனரமைத்து, வயல் நிலங்களைச் சரியான முறையில் பயன்படுத்தாததனால்தான் நாம் பிற நாடுகளிலிருந்து அரிசியை இறக்குமதி செய்யவேண்டி ஏற்பட்டிருக்கிறது. முன்னைய அரசாங்கங்கள் பெற்ற கடன்களைச் சரியான முறையில் நாட்டின் அபிவிருத்திக்குப் பயன்படுத்தாமல் விட்டதனாலும், அவற்றின்மூலம் கிடைத்த நிதியை அரசியல்வாதிகள் சூறையாடியதனாலும் களவெடுத்ததனாலும்தான் எமது நாட்டு மக்கள் இன்னும் கடன் சுமையால் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள்.

எமது நாட்டில் மேம்படுத்தவேண்டிய இன்னும் பல விடயங்கள் இருக்கின்றன. குறிப்பாக, போக்குவரத்துத் துறையை மேம்படுத்த வேண்டும். அதற்காகப் பாதைகளை அபிவிருத்தி செய்ய வேண்டும். சென்ற அரசாங்கங்களில் இருந்த சுற்றுலாத்துறை அமைச்சர்கள், சுற்றுலாத் துறையை மேம்படுத்த வேண்டுமெனக் கூறிக்கொண்டிருந்தார்களே தவிர, அதனை மேம்படுத்துவதற்கான எந்தவித நடவடிக்கையும் எடுத்ததாகத் தெரியவில்லை. எமது அரசாங்கம் சுற்றுலாத் துறையை மேம்படுத்துவதற்கான எல்லா வழிவகைகளையும் செய்திருக்கின்றன. உதாரணத்துக்கு, புத்தளம் மாவட்டத் திலுள்ள கற்பிட்டி பிரதேசத்தை சுற்றுலா மையமாக மாற்ற இருக்கிறது. அதற்குத் தேவையான எல்லா வேலைத் திட்டங்களும் சிறப்பான முறையில் நடந்துகொண்டிருக் கின்றன. இவ்வாறு எமது அரசாங்கம் நாட்டையும் நாட்டு மக்களையும் பாதுகாப்பதற்கான சகல நடவடிக்கைகளையும் மேற்கொண்டு வருகின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

முன்னைய அரசாங்கங்கள் IMFஇடமிருந்து கடன்களைப் பெற்றன. நாட்டு மக்கள் தங்களுக்கு நலவு நடக்கப்போகின்றது என்று நாடு பூராவும் பட்டாசு கொளுத்தினார்கள். எனினும், அதன்மூலம் இந்த நாட்டு மக்களுக்கு நலவு நடந்ததா என்று தெரியவில்லை. மாறாக, அவர்களுக்கு அநியாயம்தான்

நடந்தது. உதாரணத்துக்கு, மின் கட்டணம் அதிகரித்தது. இந்த நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் நல்லது செய்வதற்காகவே எங்களுடைய அரசாங்கம் இவ்வாறான நிதி செயல்நுணுக்கக் கூற்றை முன்வைத்துள்ளது என்பதையும், அதன்மூலம் நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் நலவு நடைபெறும் என்றும் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.25]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දවසේ ඉදිරිපත් කර ඇති සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම IMF එකට එකඟ වෙමින්, ඒ රාමුව තුළ ගමන් කරමින් මූල්‍ය විනය පිළිබඳ පනතට ආණ්ඩුව එකඟ වුණා. ඒ වාගේ පනතක් නොතිබීම නිසා පසුගිය කාලයේ ඇති වුණු මූල්‍යමය ප්‍රශ්න ගණනාවකට එතැනින් පස්සේ පිළිතුරු ලැබෙන නිසා රටක් හැටියට ඒක ඉතා වැදගත් පනතක් හැටියට අපට සලකන්න පුළුවන්.

ඒ වාගේම දිගින් දිගටම දෛවය මේ ආණ්ඩුවට සරදම් කරනවා. මොකද, ඒ පනත ගෙනෙන අවස්ථාවේදී ඒකට විරුද්ධව කටයුතු කරපු පක්ෂය අද දවසේ දකුණු පැත්තේ වාඩි වෙලා ඒ පනතට එකඟව අදහස් දැක්වීමම දෛවය දිගින් දිගටම ඔවුන්ට කරන සරදමක් විදියට මම දකින්න කැමැතියි. මේ රටේ ඇති වුණු ආර්ථික ප්‍රශ්නය විසඳාගෙන යන ගමනේදී, ඇත්තටම මේ රටේ ඇති වුණු ආර්ථික ප්‍රශ්නයේ දිග පළල මොකක්ද කියන එක පිළිබඳව අදහසක් ආණ්ඩුවට තියෙන්න ඕනෑ. මූල්‍ය විනය නැතිවීම පමණක්ම නොවෙයි මේ රට ආර්ථික අර්බුදයට ලක්වෙන්න බලපෑවේ. ඒකත් එක හේතුවක් තමයි. නමුත් ඊට අමතරව 2022දී, එවකට පැවැති ආණ්ඩුව රාජ්‍ය බදු මුදල් විශාල වශයෙන් කපා හැරීම නිසා ඇති වුණු අර්බුදය සහ කොවිඩ් වසංගතය නිසා සංචාරකයන්ගෙන් සහ රැකියා කරන අයගෙන් විදේශීය මුදල් රටට නොපැමිණීම එක් වරම මේ රාජ්‍යය කඩාගෙන වැටීමට බලපෑ ප්‍රධාන හේතු දෙක වුණා.

මූල්‍ය විනයට අමතරව මේ රටේ පැවති ආර්ථික අස්ථායීකරණයට, අස්ථාවරත්වයට දීර්ඝ කාලීනව බලපෑ තවත් හේතු ගණනාවක් තිබෙනවා. 1956, 1971, 1983, 1988 සහ 2018 කියන ඒ සෑම කාල සීමාවකම ඇති වුණු සිවිල් කැරලි කෝලාහල, යුද්ධ මේ රටේ ඇති වුණු ඒ ආර්ථික අර්බුදයට හේතු වුණා. ඒ ආර්ථික අර්බුදයට ඔය කාරණා හේතු වෙන අතරතුර මූල්‍ය විනය බිඳ වැටීමත්, රටේ ආර්ථිකයට දේශපාලන මැදිහත්වීම වැරදි ආකාරයට යොමුවීමත් ඒ ප්‍රශ්නවලට හේතු හැටියට අපි දකිනවා.

විශේෂයෙන්ම රටක් ස්ථායීකරණය කරන්න පුළුවන් මූලික ක්‍රම දෙකක් තිබෙනවා. එක්කෝ බදු රාජ්‍යයක් විදියට මේක ගෙනයන්න ඕනෑ, එක්කෝ ණය රාජ්‍යයක් විදියට ගෙනයන්න ඕනෑ. විශේෂයෙන්ම දක්ෂිණාංශික දේශපාලන ව්‍යාපාරයක් පිළිබඳ විශ්වාසය තියන අපි බදු ආදායමින් රටේ ප්‍රශ්න විසඳිය යුතුයි කියලා විශ්වාස කරනවා. ණය ආදායමින් රටේ ප්‍රශ්න විසඳිය යුතුයි කියලා විශ්වාස කරන්නට යාමේ ප්‍රතිඵලයක් ලෙස තමයි මේ ප්‍රශ්නය මේ තරම් විශාල වශයෙන් රට ඇතුළට දැනෙන්න පටන් ගත්තේ. ඒ නිසා ආණ්ඩුවෙන් අපි ඉල්ලීමක් කරනවා. ඒ, මේ ණය උගුලට යළි යළිත් අහු වෙන්නේ නැතිව, 2028 ඉඳලා මේ ණය ගෙවන්න ආරම්භ කරනකොට ඒ සඳහා අවශ්‍ය ආදායම් මේ කාල සීමාව තුළ උපයා ගනිමින්, සාර්ථක ණය ගෙවීම් ක්‍රියාවලියකට යොමු වන පරිදි තමන්ගේ ආදායම් පිළිබඳ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම.

මොකක්ද මේ මූල්‍ය විනය? මූල්‍ය විනය කියලා කියන්නේ රටක ආදායමට ගැළපෙන විදියට වියදම් සහ ආදායමට ගැළපෙන විදියට ණය ගැනීමේ හැකියාව සලසා ගැනීමේ ක්‍රියාවලිය. හැබැයි ලංකාවට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් මේ ණය සහ ණය වාරිකවල පොලිය ගෙවන්න යන එක. IMF කොන්දේසිවලට අමතරව රජය හැටියට ඉදිරි කාල සීමාව වෙනුවෙන් අරගෙන තිබෙන අලුත් ක්‍රියාමාර්ග මොනවාද, මේ ප්‍රතිශතය අඩු කරන්න? මොකද, ජපානය අපට වඩා වැඩි ණය බරක් සහිත රටක්. නමුත් ජපානය ඇතුළේ ණය ගෙවීමේ හැකියාව වැඩියි, එහෙම නැත්නම් ණය සහ පොලිය රාජ්‍ය ආදායමෙන් අපට වඩා අඩු ප්‍රතිශතයක තිබෙන්නේ. ඒවා තමයි ඒ වාගේ රටවල් අපට වඩා වේගයෙන් ඉස්සරහට යන්න හේතු බවට පත් වුණේ. අලුත් බලාපොරොත්තු තියාගෙන ඉන්න ආණ්ඩුවක් හැටියට IMF කොන්දේසිවලට අමතරව ඔබේ ආණ්ඩුවේ අලුත් ඉලක්ක සහ ඔබ අරගෙන තිබෙන නිර්මාණශීලී පියවර මොනවාද කියලා දැනගන්න මම කැමැතියි. නමුත් මූල්‍ය විනය පිළිබඳ දිගින් දිගටම කථා කරන ආණ්ඩුව -අද උදේ ඉඳලාත් ඒ ගැන සාකච්ඡා කළා- විශේෂයෙන් රේගුව හා සම්බන්ධ කන්ටේනර් පිළිබඳ තොරතුරු සැඟවීම මූල්‍ය විනය බිඳ වැටීමක් ලෙස තමයි අපට දකින්න තිබෙන්නේ. ඒ වාගේම, මන්ත්‍රීවරුන්ගේ වැටුප් පක්ෂ අරමුදලකට යැම රාජ්‍ය මූල්‍ය විනය බිඳ වැටීමක් විදියට තමයි අප දකින්නේ. තමන් වෙනත් රටවල් සමඟ ඇති කරගෙන තිබෙන ආර්ථික ගිවිසුම් තවමත් පාර්ලිමේන්තුවට පෙන්වන්නේ නැතුව සඟවාගෙන සිටිමින් මූල්‍ය විනය පිළිබඳව කථා කරන ආණ්ඩුවක්, මෙය.

COPE එකේ, COPA එකේ විමර්ශන පිළිබඳව මේ රටේ මිනිස්සු දිගින් දිගටම දකිනවා. හැබැයි, මේ රටේ ඇත්ත ප්‍රශ්නය තිබෙන්නේ ටෙන්ඩර් ගනුදෙනුවල. මේ රටේ ටෙන්ඩර් ගනුදෙනු online system එකකට අනුව කරලා මේ රටේ මිනිසුන්ට විනිවිදව පෙනෙන පරිදි ටෙන්ඩර් ගනු දෙනු සිදු වන දවස මේ රටේ දියුණුවේ විශේෂ ආරම්භක ලක්ෂ්‍යයක් ලෙස මම දකිනවා. මා හිතන විදියට, IMF යෝජනා ඇතුළේ ඒකත් තිබෙනවා. ඉක්මනින් මේ ටෙන්ඩර් ප්‍රශ්න ටික විසඳා ගත යුතුමයි. මොකද, ඒක ඇතුළේ විශාල සොරකම්, වංචා සිදු වෙනවා. පළාත් පාලන ආයතනවල පෙර ආකාරයටම ඒ ක්‍රියාවලිය යළිත් ක්‍රියාත්මක වන බව දකින්න ලැබෙනවා. මූල්‍ය විනය පිළිබඳව කරනු ලබන සාකච්ඡාවලදී ටෙන්ඩර් පිළිබඳ විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් හඳලා ආණ්ඩුව එය ඉක්මනින්ම ක්‍රියාත්මක කළ යුතුම වෙනවා.

පසුගිය කාල සීමාවේ රජයේ වාහන වෙන්දේසියක් ගැන කථා වුණා. හැබැයි, ඒ වාහන වෙන්දේසිය පිළිබඳව සැක සංකා මතු වන ප්‍රවෘත්ති දිගින් දිගටම අහන්න දකින්න ලැබුණා. මූල්‍ය විනය පිළිබඳව වැඩි වැඩියෙන් කථා කරන ඔබතුමන්ලා මේ ආණ්ඩුව හැටියට ඒ පිළිබඳව මීට වඩා විධිමත් ලෙස ජනතාවට වැඩි වශයෙන් දැනුවත් කිරීම් කරලා මූල්‍ය විනය වාගේම විනිවිදභාවය රටට පෙනෙන ආකාරයට කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි ආයෝජන පිළිබඳ අදහස. ආයෝජන පිළිබඳ අදහස ගත්තාම, මේ රටට පැමිණි ආයෝජනවල වටිනාකම් පිළිබඳව ආණ්ඩුව නැවත වතාවක් පරස්පර අදහස් ඉදිරිපත් කරමින් ඉන්නවා. ඇමතිවරයෙකු එක අදහසක් කියද්දී, නියෝජ්‍ය

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඇමතිවරයෙකු තව අදහසක් කියද්දී, ජනාධිපතිවරයා වෙන ඉලක්කමක් කියනවා. ආයෝජන කියන එක මූල්‍ය විනය පිළිබඳ ශක්තියත් එක්ක කරන්න ඕනෑ ගනු දෙනුවක්. නමුත් ආණ්ඩුවක් හැටියට ජනතාව රැවටීමේ අදහසින් විවිධ අගයන් ඉදිරිපත් කරමින් රටේ මිනිසුන් අන්දවන ස්වභාවයක් දකින්න ලැබෙනවා.

ඒ වාගේම, මූල්‍ය විනය පිළිබඳව සාකච්ඡා කරන අතරතුර කිව යුතු, පසුගිය කාලයේ අපට විශේෂයෙන් දකින්න ලැබුණු තව තව දේවල් තිබෙනවා. ඒවායෙන් එකක් තමයි, රාජ්‍ය සේවය දේශපාලනීකරණය. රාජ්‍ය සේවය නිර්දේශපාලනීකරණය කරන්න ඕනෑ කියලා, එය මේ රටේ දේශපාලන ව්‍යාපෘතියක් විධියට පෙන්වමින් ඡන්දයට කලින් කථා කරපු අය අද කිසිම හිරිකිතයකින් තොරව පැලවත්තේ ලැයිස්තුවෙන් මේ පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයෙකු මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා බවට පත් කර තිබෙනවා. ඇත්තටම එතුමාත් රූපවාහිනී වැඩසටහනක රාජ්‍ය සේවයට කබ්රාල්ලා වාගේ අය මහින්ද මහත්මයාගේ ආණ්ඩු කාල සීමාවේ පත් කළා කියලා විවේචන ඉදිරිපත් කරනවා මම දැක්කා. එහෙම අය අද යළි යළිත් ඒ දේම සිදු කරමින්, නිර්දේශපාලනීකරණයක් පිළිබඳව කථා කරමින් ඉන්නවා.

මූල්‍ය විනය පිළිබඳව කථා කරන කොට, පසුගිය දවස්වල ආන්දෝලනාත්මක සිදු වීමක් වෙනවා. ඒ තමයි ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ විශේෂඥ වෛද්‍යවරියක අත් අඩංගුවට ගැනීම. ඒ අත් අඩංගුවට ගැනීම හරහා විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු වෛද්‍ය සේවය කැලඹිලි ස්වභාවයකට ලක් වෙලා තිබෙනවා. රටකට විශේෂඥ වෛද්‍යවරුන් ඉන්නේ, ඉතා අල්ප ප්‍රමාණයක්. විශේෂයෙන් මොළය හා සම්බන්ධ වෛද්‍යවරුන් ලංකාවටම 10ක්වත් නැහැ. එම වෛද්‍යවරිය අත් අඩංගුවට ගැනීම තුළ, ඒ අත් අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය තුළ දැනට සිටින විශේෂඥ වෛද්‍යවරු පිරිසත් කම්පනයට පත් වෙලා ඉන්නවා. ඒ ඇයි? කිසිදු වෛද්‍යවරයෙක් ශල්‍ය කර්මයක් සිදු කරන්නේ අසාර්ථක වෙන්න බලාගෙන නොවෙයි. මොළයේ ශල්‍යකර්ම කරන වෛද්‍යවරු අවුරුදු ගණනාවක් තිස්සේ practice කරලා අද්දැකීම් ලබාගත් අයයි. තමන් භාවිත කරන උපකරණයක් රෝහලේ නැත්නම් ඒ අවශ්‍ය උපකරණය තමන්ට විශ්වසනීය යම් තැනකින් ගෙනෙන්න කියලා කීම රෝගියාගේ ආරක්ෂාව වෙනුවෙන් ගන්නා තීරණයක්. ගත්තු එවැනි තීරණයක් අවසානයේදී අත් අඩංගුවට තුඩු දෙන එකක් බවට පත් වෙනවා.

අනෙක් එක තමයි, අත් අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ ගැටලු. මා දන්නා විධියට වසර ගණනාවක් පොලිස් දෙපාර්තමේන්තුව හා සම්බන්ධව සේවය කරන - පොලිස් රෝහලේ සේවය කරන - මෙම වෛද්‍යවරිය අත් අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය කම්පනය දනවන අතරතුර යළි යළිත් සමාජ මාධ්‍ය හා අනෙකුත් මාධ්‍ය හරහා සාෆි වෛද්‍යවරයාගේ නාට්‍යය නැවත ඒ audience එකටම රඟ දක්වමින් ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තවත් පොඩි වෙලාවක් -විනාඩියක පමණ කාලයක්- දෙන්න.

ඒ ක්‍රියාවලිය හරහා මේ රටේ රාජ්‍ය සේවය බය කරනවා. විශේෂයෙන්ම තමන්ට හිතෙන විධියට, තමන් විශ්වාස කරන විධියට ශල්‍යකර්මයක් මේ රට තුළ කර ගන්න බැරි මට්ටමක් දක්වා වෛද්‍යවරුන්ගේ මේ ප්‍රශ්නය ආණ්ඩුව ගෙන යමින් තිබෙනවා. ඒ වාගේම, මේ සියලු තීරණ සමාජ මාධ්‍ය හරහා සාධාරණීකරණය කරන්නත් මිනිස්සු ටිකක් ඉන්නවා. අවසාන වශයෙන් කිව්වොත්, ෂාෆි වෛද්‍යවරයාගේ නාට්‍යම තමයි යළි වතාවක් මේ රඟ දක්වමින් යන්නේ.

අද උදෑසන ඒ වෛද්‍යවරියගේ දියණිය බන්ධනාගාරයට ගියාම බන්ධනාගාර ආරක්ෂක නිලධාරින් එයාලාගෙන් අහනවා "මේ වාගේ හෙරක් ආරක්ෂා කරන්නද ඔබ එන්නේ" කියලා. මෙක මේ රටේ ඉතාම නරක තත්ත්වයක්. මොකද, ඒ වාගේ වෘත්තිකයන් ආරක්ෂා කර ගන්න ඕනෑ වෙලාවක ඒ විධියට වගකීම් විරහිතව නම් ක්‍රියා කරන්නේ, මේ රට ගමන් කරන්නේ එතරම් හොඳ පාරක නොවෙයි. එසේ කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.34]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026" ඉදිරිපත් කිරීමේ ක්‍රියාව මොන ආණ්ඩුවෙන් කළත් හොඳ කටයුත්තක්. එම ක්‍රියාවලිය විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට වැදගත් ක්‍රියාවලියක්. විපක්ෂයේ මේ තොත්ත බබාලා අපේ රට පාලනය කරලා විනාශ කරලා දාපු ආර්ථිකය ප්‍රතිසංස්කරණය කරන්න යද්දී විශේෂයෙන්ම මුදල් විනය පිළිබඳව, Fiscal Policy එකේ විනය පිළිබඳව, විනිවිදභාවය පිළිබඳව ඉතාම වැදගත් නීතියකට අදාළ වාර්තාවක් තමයි අද අප ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන්ම රටක ආර්ථිකය ඉස්සරහට අරගෙන යන කොට රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය, මුදල් ප්‍රතිපත්තිය සහ විදේශ විනිමය ප්‍රතිපත්තිය කියන තුන බෙහෙවින් වැදගත් වෙනවා. පසුගිය කාලයේ IMF programme එක යටතේ මේ රට යම්කිසි ආර්ථික ස්ථායීකරණ රාමුවකට එකඟ වෙලා තිබෙනවා. අන්න ඒ ආර්ථික ස්ථායීකරණ රාමුව තමයි මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්නේ කියන කාරණය අපි මැතිවරණයට කලිනුත් ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළා. මේ IMF Agreement එක ඇතුළේ අපි ඉන්නේ; එම මාර්ගයේ තමයි අපි ඉස්සරහට යන්නේ කියලා අපි කිව්වා.

ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන කිරීමේ පනත් කෙටුම්පත, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත ඇතුළු පනත් කෙටුම්පත් කිහිපයක් එක වසරක් ඇතුළත එක වර මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ ගරු සභාවේ විපක්ෂය පැත්තේ ඉස්සරහින් ඉන්න මේ මන්ත්‍රීවරුන්ට සහ ඔවුන් උදව් කරපු අයට අය වැය කළමනාකරණය කර ගැනීම සඳහා මීට කලින් යම්කිසි හෝ උනන්දුවක් තිබුණා නම්, අපේ රට මේ අගාධයට වැටෙන්නේ නැහැ. මේ අය දැන් ගොඩක් උපදෙස් දෙන්න ඇවිල්ලා ඉන්නවා, මෙහෙම කරන්න ඕනෑ, අරෙහෙම කරන්න ඕනෑ කියලා.

දේශපාලනිකවත් පරාජය වෙලා, ආර්ථික වශයෙනුත් රට බංකොලොත් කළාට පස්සේ ඒ අය දැන් ජාතික ජන බලවේගය ආණ්ඩුවට උපදෙස් දෙන්න එනවා, ආර්ථිකය හදන්නේ කොහොමද කියන එක ගැන. ජාත්‍යන්තරය මේ වන කොට තීරණය කරලා ඉවරයි, පසුගිය මාස 6 ඇතුළත, එහෙම නැත්නම් මාස 8 ඇතුළත මේ ආණ්ඩුව මේ ආර්ථිකය කොච්චර සාර්ථකව ඉස්සරහට ගෙන යනවා ද කියලා.

විශේෂයෙන්ම විපක්ෂය පැත්තේ ඉන්න ආර්ථික ඔස්තාර්ලා බලාපොරොත්තු වුණා, ණය ප්‍රතිව්‍යුහගතකරණය අසාර්ථකභාවයට පත් වෙලා ලංකාව අර්බුදයකට යයි කියලා, ගිය දෙසැම්බරයේදී. නමුත්, දෙසැම්බර් 28වන දා කොට අපි ඒ කටයුත්ත සාර්ථක කර ගත්තා. ඊළඟට ඔවුන් බලාගෙන හිටියා, ජනතාවගේ අපේක්ෂා ඉෂ්ට කර ගන්න බැරි වෙයි; ඒවා ඉෂ්ට කරන්න ගිහිල්ලා අය වැය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාමුවෙන් පිට පන්නා ගනීවි; ඒ අය වැය අර්බුදයකට ලක් කර ගනීවි කියලා. නමුත්, එහිදීත් ජාතික ජන බලවේගය ඉතාම සාර්ථකව කටයුතු කළා. තිබෙන වියදම් කළමනාකරණය කර ගනිමින්, පවතින රාමුව ඇතුළේ ඉඳගෙන ජනතාවටත්, විශේෂයෙන්ම සංවර්ධන කටයුතු සඳහාත් මුදල් වෙන් කරගෙන පසු ගිය අය වැය ඉදිරිපත් කර ගන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම තමයි, IMF එකේ review එක. විපක්ෂය කෙළ හල හලා බලාගෙන හිටියා, කෙළවෙයි කියලා. අවසානයේදී විපක්ෂයට කරන්න සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? තමන්ට කර ගන්න බැරි වෙච්ච ඒවා සම්බන්ධයෙන් දැන් අපට විවිධාකාර උපදෙස් දෙන්න ඒ අයට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මම කැමැතියි, මේ මුදල් විනය පිළිබඳව, එහෙම නැත්නම් රාජ්‍ය අය වැය විනය පිළිබඳව මේ මහත්වරුන්ට, විශේෂයෙන්ම 2015-2019 කාලයේ ආණ්ඩුව කරපු ඔස්තාර්ලාට පොඩ්ඩක් මතක් කරලා දෙන්න. මේ ආර්ථික අර්බුදය ඇති වෙන්න බලපාපු හේතු විධියට දැන් ඒ මහත්තුරු කියන්නේ ඉතාම සීමිත කාරණා සහිත කථාවක්. මොකද, මේක දශක 4ක් තිස්සේ ගෙන ගිය ආර්ථික ක්‍රමයේ වැරැද්දක්. නව ලිබරල් ආර්ථික ක්‍රමයේ වැරැද්ද තමයි අපි අද මේ අත් විඳිමින් ඉන්නේ. ඉතින් 2015-2019 කාලයේ ආණ්ඩුව කරපු ඔස්තාර්ලා රටේ බදු ටික එකතු කර ගන්න මොකක්ද කළේ? අපි දන්නවා, අපි කථා කරනවා 2019දී බලයට පත් වූ ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව බදු අඩු කරලා, බදු ආදායම අහිමි කර ගත්තා කියලා. නමුත්, බදු දැල පුළුල් කර ගන්න මේ ඔස්තාර්ලාට සත 5ක හැකියාවක් තිබුණේ නැහැ. එහෙම බදු දැල පුළුල් කරලා තිබුණා නම් මේ ආර්ථිකය මේ අර්බුදයට වැටෙන්නේ නැහැ. මම උදාහරණයක් කියන්නම්. අනෙක් රටවල් සියයට 20ත්, 26ත් අතර ප්‍රමාණයක් තමන්ගේ දළ දේශීය නිෂ්පාදිතයෙන් බදු විධියට එකතු කර ගන්න කොට, ලංකාව එකතු කර ගත්තේ අවසාන වශයෙන් සියයට 13යි. ඒක සියයට 8.5කට වට්ටගෙන තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්මයා අය වැය විනාශ කර ගත්තේ. එතැනදී එය කරන්න බැරි වෙලා අපි දැන් බදු දැල පුළුල් කරන්න හදන කොට ඒකට උපදෙස් දෙන්න එන්න එපා. ඔබතුමන්ලා නොකරපු දේ තමයි අපි කරන්න යන්නේ.

2015 - 2019 ආණ්ඩුව කාලයේ ඔබතුමන්ලාට බැරි වුණා අප ඉදිරිපත් කරපු අය වැයේ වාගේ රටේ ප්‍රමුඛතාවන්ට අදාළ වියදම්වලට අය වැයෙන් මුදල් වෙන් කරන්න. ප්‍රාග්ධන වියදම් ටික, වර්තන වියදම් ටික රටේ සංවර්ධනයට, රටේ අභිවෘද්ධියට සහ ජනතාවගේ උන්නතියට වෙන් කර ගන්න ඔබතුමන්ලාට බැරි වුණා. ඒ කියන්නේ, දූෂිත දේශපාලනය නවත්වා ගන්න බැරි වුණා; අත්තනෝමතික වියදම් ටික නවත්වා ගන්න බැරි වුණා. දැන් බොරුවට මෙතැන කෑ ගහලා, අපට උපදෙස් දීලා වැඩක් වෙන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලා විශේෂයෙන්ම සියයට 7, 8 පොලියට ගත්තු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - ISBs - ණය නිසා තමයි රට බංකොලොත් වුණේ. ඒ බව ඔබතුමන්ලාට අනිවාර්යයෙන් පිළිගන්න වෙනවා. ඒක දත්තවලින් ඔප්පු වෙලා තිබෙනවා. ඒවා ණය ගෙවන්න නොවෙයි අරගෙන තිබෙන්නේ. සියයට 6, 7 පොලියට ගත්තු ඒ ණය කාලා බීලා ඉවර කරලා තිබෙනවා, 2015 - 2019 දක්වා කාලය ඇතුළත. ඒ වාගේම ආර්ථික වර්ධනය සියයට 2.5කට වට්ටගත්තු ඔස්තාර්ලා අද කියනවා, "අනේ, දැන් ආර්ථික ස්ථායීකරණය කරලා වැඩක් වෙන්නේ නැහැ" කියලා. ඒ වාගේම අහනවා, "ඔබතුමන්ලා ආර්ථිකය වර්ධනය කරන්නේ කොහොමද? කෝ, ප්‍රාග්ධන වියදම් වියදම් සිදු වුණාද?" කියලා. ඇත්තටම 2015 - 2019 ආණ්ඩුව තමයි මේ රටේ ආර්ථිකය කඩා වැටෙන්න බලපෑ අවකළමනාකරණය අවසාන වශයෙන් සිදු කර ගත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නවා විශේෂයෙන්ම අපේ රටේ අය වැය අවභාවිත වෙන්න බලපෑවේ වංචාව, දූෂණය සහ අක්‍රමිකතාවලට තිත තියා ගන්න බැරි වීමයි කියලා. හැබැයි, මේ ආණ්ඩුව රට භාර ගත්තාට පසුව CIABOC එක ශක්තිමත් කරපු නිසා පසුගිය කාලයේ වුණු වංචා, දූෂණ සහ වර්තමානයේ වන වංචා, දූෂණ සම්බන්ධයෙන් අද වන කොට සතියකට පස්දෙනෙකු විතර නීතිය හමුවට පැමිණෙනවා. ඉතින්, ඔස්තාර්ලා කොච්චර හිටියත් වැඩක් වුණේ නැහැ නේ. ඔබතුමන්ලාට බැරි වුණා නේ, ආණ්ඩුවේ වියදම්වල leakage එක නැති කර ගන්න. අය වැය සම්බන්ධව fiscal discipline එක ගෙනෙන්න තමයි අප මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යන්නේ. එම නිසා එක පැත්තකින් නීතිමය රාමුව ඇතුළේ තමයි අද මේ ඉදිරිපත් කිරීම කරන්නේ. නමුත්, ඔබතුමන්ලාට ඔය නීතිමය රාමුව තිබුණත් අය වැය කළමනාකරණය කර ගන්න කවදාවත් බැහැ. මොකද, ඒකට සංස්කෘතික කැල්ලකුත් ඕනෑ. ඒ කියන්නේ, අය වැය කළමනාකරණය කර ගන්න දේශපාලන සංස්කෘතියේ වෙනසකුත් සිදු වෙන්න ඕනෑ.

පෞද්ගලික ආයතනයක වුණත් අය වැයක් ඉදිරිපත් කරනවා; ඒ අය වැය පුරෝකථනයක් බවට පත් කර ගන්නවා, දිගු කාලීන සහ කෙටි කාලීන කියලා. ඊට පසුව, ඒ ආයතනයේ තිබෙන මූල්‍ය විනය, audit process එක, එහෙම නැත්නම් ඒ සංස්කෘතිය ඇතුළේ තමයි ඒ අය වැය සාර්ථක කර ගන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්නේ. ඒ නිසා අපට බෙහෙවින් විශ්වාසයි ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ඒ හැකියාව, ඒ කුසලතාව, ඒ වුවමනාව තිබෙන දේශපාලනඥයන් සිටින නිසා අනිවාර්යයෙන් එය සාක්ෂාත් කර ගන්න පුළුවන් වෙයි කියලා. හැබැයි, අවුරුදු ගණනක් තිස්සේ බලයේ සිටියත් මේවා කර ගන්න බැරි වුණු සමහර අය අහනවා, අප මේ target එක achieve කර ගන්නේ කොහොමද කියලා. මහත්වරුනි, අපට පැහැදිලිව කියන්න තිබෙන්නේ මෙයයි. මේ තිබෙන්නේ අපේ රට ආර්ථික අර්බුදයෙන් ගොඩ ගිහිල්ලා, විශේෂයෙන් ආර්ථික ස්ථායීකරණය වෙත ළඟා වෙලා, සංවර්ධන මාවතකට ළඟා වෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළයි. අන්න ඒ වැඩ පිළිවෙළේ අවශ්‍ය කරන අවම ආර්ථික වර්ධන වේගය, එහෙම නැත්නම් ළඟා කර ගත හැකි අවම ආර්ථික වර්ධන වේගය තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ, සියයට 3.2 ඉඳලා සියයට 3.5 දක්වා කියලා. ඉතින්, මොකක්ද දැන් වෙන්න පුළුවන්? ඔබතුමන්ලා සතුටු වෙන්න එපායැ, සියයට 3.2ක් වූ ආර්ථික වර්ධන වේගය සියයට 3.5ක් වෙලා, සියයට 3.5 එක සියයට 4.8ක් වෙලා, ඉස්සරහට යන්න යන්න ආර්ථික වර්ධන වේගය තවත් වැඩි වන විට, එය ඇස් පනාපිට පෙනෙන විට. අවම අවශ්‍යතාවෙන් එහාට යන කොට නොවෙයිද රටට හොඳක් වෙන්නේ? එකතු කර ගන්න ඕනෑ බදු ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.1ක් වූ බදු ප්‍රමාණය, ඔබතුමන්ලා ගිය අවුරුද්දේ එකතු කර ගන්න යෝජනා කළේ බදු ගෙවන අයට බදු ගහලා; VAT එක ගෙවන අයට VAT එක වැඩි කරලා; ආදායම් බදු ගෙවන අයට ආදායම් බදු වැඩි කරලා; ආදායම් බදු අඩුවෙන් ගෙවපු සුළු හා මධ්‍ය පරිමාණ

[ගරු චතුරංග අබේසිංහ මහතා]

ව්‍යාපාරවලට බදු වැඩි කරලා. අප කරන්න හදන්නේ ඒක නොවෙයි. විශේෂයෙන්ම වත්කම් පිළිබඳ අණ පනත් හරහා මේ අවුරුද්දේ අග වෙද්දීම අපට පුළුවන් වෙනවා, මේ targets පහු කරලා යන්න. එය ඉතාම පැහැදිලියි. මොකද, අපේ බදු පදනම පුළුල් වෙනවා. ඉස්සර තමන්ගේ වත්කම තමන්ට අයිතියි කියලා ආණ්ඩුව ඔප්පු කරන්න ඕනෑ. හැබැයි, පසුගිය මාසයේ ඉඳලා තමන්ගේ වත්කම තමන්ට අයිතියි කියලා තමන් ඔප්පු කරන්න ඕනෑ. තමන්ගේ වත්කම තමන්ට අයිතියි කියලා ඔප්පු කරපු ගමන් ඒ වත්කම ආපු ආදායම මොකක්ද කියලා කියන්න ඕනෑ. ඒ ආපු ආදායම මොකක්ද කියලා කියනවා නම්, ඒකට සමානුපාත බදු ලිපි ගොනුවක් තිබෙන්න ඕනෑ. ඉතින් මේ නිසා අපි ඉතාම හොඳින් විශ්වාස කරනවා, අර වෙනත් රටවල එකතු කරන සියයට 18ක, සියයට 20ක බදු ප්‍රතිශතය එකතු කර ගන්න මේ ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා කියලා. මොකද, මේක වංචාව, දූෂණය හරණය කරපු ආණ්ඩුවක්. ඒ නිසා මෙතැනින් පස්සේ කාටවත් ගැලවිල්ලක් නැහැ, බදු වංචා කරන්න. අන්න ඒ ක්‍රියාවලිය හරහා විශේෂයෙන්ම ඩිජිටල් තාක්ෂණය ගෙන ඒම තුළ VAT එකේ leakage නැති කර ගන්න අපට පුළුවන්. 2015-2018 කාලයේ හිටපු ඔස්තාර්ලාට බැරි වුණා නේ, VAT එක එකතු කර ගන්න. VAT එකෙන් සියයට 60ක්, සියයට 40ක් නැති වෙනවා නේ. ඉතින්, ඒගොල්ලන්ට බැරි වුණා නේ, තාක්ෂණය ගෙනැල්ලා VAT එක එකතු කර ගන්න. අපි දැන් ඒක කර ගන්න තමයි යන්නේ. ඒක හින්දා තමයි මේ ක්‍රියාමාර්ග බලන්න නම්, අය වැය බලන්න කිව්වේ. මොකද, ක්‍රියාමාර්ග මේකේ නැහැ. මේකේ පැහැදිලිව කියලා තිබෙනවා, අවුරුදු තුනක පුරෝකථනයක්, අවුරුදු හතරක ආර්ථික රාමුව අවධානම් එක්ක තමයි ඉදිරිපත් කළ යුත්තේ කියලා. අවධානම් සහ පුරෝකථනය එකතු කරන මේ ප්‍රකාශයේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නැහැ. ඒ ටික තමයි පළමුවෙනි අවුරුද්දේ අය වැයෙන් ඉදිරිපත් කළේ.

අපි කොහොමද මේ අය වැය කළමනාකරණය කරද්දී, වියදම් ප්‍රමුඛතාවලට ලක් කරන්නේ? ඔස්තාර්ලාගේ 2015-2019 කාලයේ ඕනෑම අය වැයක් අරගෙන බලන්න, කොච්චර ප්‍රමාණයක් ඔයගොල්ලන් ඩිජිටල් තාක්ෂණයට වෙන් කළාද, කොච්චර ප්‍රමාණයක් අධ්‍යාපනයට වෙන් කළාද, කොච්චර ප්‍රමාණයක් සෞඛ්‍යයට වෙන් කළාද, කොච්චර ප්‍රමාණයක් උතුරු, නැඟෙනහිර සංවර්ධනයට යොමු කළාද, කොච්චර ප්‍රමාණයක් වරායවලට යොමු කළාද, කොච්චරදුරට පෞද්ගලික සහ රාජ්‍ය එකඟතා නැත්නම් partnerships හරහා ආයෝජන ගේන්න උත්සාහ කළාද කියලා. ඉතින් ඒ ඔක්කෝම මේ අය වැය තුළ අඩංගු වෙලා තිබෙන හින්දා දැන් කියන්න දෙයක් නැතුව මෙතැන විකාර කියවනවා.

ඊළඟට, සෘජු විදේශ ආයෝජන ගැන කථා කළා. සෘජු විදේශ ආයෝජන ගැන කථා කරද්දී, ඉතාම හොඳට BoI එකෙන් දත්ත දීලා තිබෙනකොට ඒක පටලවන්න හදනවා. ඉතාම පැහැදිලිව ජනාධිපතිතුමා කිව්වා, අපට ඩොලර් බිලියන 4කට එහා ඉල්ලුම්, එහෙම නැත්නම් යෝජනා ඇවිත් තිබෙනවා කියලා. ඒක තමයි ඇත්ත කථාව. අපට BoI එක හරහාම ඇවිල්ලා තිබෙනවා, ඩොලර් බිලියන 3කට එහා යෝජනා. ඒ එකක් ඇතුළේ තිබෙනවා, ඩොලර් බිලියන 2.3ක ඉතා විශාල ව්‍යාපෘතියක් වන green hydrogen project එක. ඉතින් ඒ යෝජනා ගැන කියද්දී, BoI එක පැහැදිලිවම කිව්වා, මේ කාලය ඇතුළත ඩොලර් මිලියන 650ක ආයෝජන සහතික වෙලා තිබෙනවා කියලා. ඒ ඩොලර් මිලියන 650 ආයෝජන ඇතුළේ ව්‍යාපාර expand කරන එකත් තිබෙනවා; අලුතෙන් ආපු ආයෝජනත් තිබෙනවා.

ඒ වාගේම තමයි දෙස් විදෙස් රටවල් මේ වෙනකොට ලංකාව සමඟ ආණ්ඩු-ආණ්ඩු අතර -G2G- ආයෝජන කරන්න පැහැදීමෙන් ඉන්නවා. ඒ, මේ ආණ්ඩුව කෙරෙහි ඇති වෙච්ච විශ්වාසය නිසා; රට ගැන ඇති වෙච්ච විශ්වාසය නිසා. හැබැයි, FDIs ආවේ නැත්තේ ඒ නිසාම නොවෙයි. මොකද, දැන් අපේ credit rating එක හෙමිහිට වැඩි වෙලා යනවා. නමුත් සමහර ජාත්‍යන්තර බැංකු ලංකාවට ණය දෙන්න තවම සූදානම් නැහැ. එතැනදී අපට අර්බුදයක් තිබෙනවා. ඒක නිසා අපට තව ටික කාලයක් යයි, ඒක හදාගන්න. ඒ වාගේම අපේ රටට විදේශ ආයෝජන ආවේ නැත්තේ වංචාව සහ දූෂණය පිරිලා තිබුණු නිසායි. නමුත් අද වෙනතුරු කිසිම ආයෝජකයෙකුගෙන් කිසිම complaint එකක් අපට ලැබිලා නැහැ. ඇමතිවරයෙක් හම්බ වෙලා සියයට ගානක් ඉල්ලුවා; මෙච්චර ගානක් ඉල්ලුවා; ඇමතිවරයා හම්බ වෙන්න ලක්ෂ 20යි; ඇමතිවරයා එක්ක ෆොටෝ එක ගහන්න ලක්ෂ 5ක් ඉල්ලුවා කියලා අපට පැමිණිලි ඇවිල්ලා නැහැ. ඒ, නියෝජිතයෝ. මෙතැනින් එහාට ඒ සංස්කෘතිය සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙන්නේ. ඒක නැති වුණා වාගේම තමයි ආයෝජන ආවේ නැත්තේ මෙතෙක් රටට සැලැස්මක් තිබුණේ නැති නිසායි.

ධීවර කර්මාන්තයේ සැලැස්ම මොකක්ද? සැලැස්මක් තිබුණේ නැහැ. මේ ආණ්ඩුව තමයි ඒ සඳහා ජාතික ප්‍රතිපත්තියක් හැදුවේ. ධීවර කර්මාන්තය අපනයන කර්මාන්තයක්, අපනයන අභිමුඛ කර්මාන්තයක් බවට පත් කරන්න අවශ්‍ය කරන SOP එක හැදුවේ මේ ආණ්ඩුව. පොල් කර්මාන්තයත් එහෙමයි. පොල් නිෂ්පාදනය අඩු කරලා, නැති කරලා පොල් අපනයන කර්මාන්තයක් හදන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පොල් අපනයන කර්මාන්තය බිලියන 2කට අපි අවුරුදු දෙකක් ඇතුළත ගෙනියනවා. ඒකට අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය තීරණය අපි ගත්තා. පොල් ගෙඩි ටික හැදෙනකල් පොල් මද සහ කිරි ආනයනය කරන්න සිද්ධ වෙනවා. ඒ ප්‍රතිපත්තිමය තීරණ. ඛනිජ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගත්තත්, ප්‍රතිපත්තියක් නැහැ. මැණික් හා ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ගත්තත් ප්‍රතිපත්තියක් නැහැ. ඒ වාගේම කෘෂිකර්මය සම්බන්ධවත් ප්‍රතිපත්තියක් නැහැ. ඉඩම් ප්‍රතිපත්තියකුත් නැහැ. ලංකාවට ආයෝජකයෙක් ආවොත්, ඉඩමක් හොයා ගන්න හතර අතේ යන්න ඕනෑ. ඇමතිතුමාගෙන් පටන් ගත්තාම ප්‍රාදේශීය මන්ත්‍රීවරයා ළඟට යනකම් පස්සෙන් යන්න ඕනෑ, ඉඩමක් ගන්න. ඊට පස්සේ විවිධ විවිධ ආයතනවලට ගිහිල්ලා approval ගන්න ඕනෑ. ඒකයි විදේශ ආයෝජන ආවේ නැත්තේ. අපි මේ අවුරුද්ද ඇතුළත තීරණයක් ගත්තා, ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය හැදීමට. ගිය සතිය වෙනකොට සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් සංචාරක අමාත්‍යාංශය පැහැදිලිව කිව්වා, මෙන්න අක්කර 1,000ක් තිබෙනවා, ඇවිල්ලා ආයෝජනය කරන්න කියලා. දැන් තත්ත්වය පැහැදිලියි.

කර්මාන්ත ක්ෂේත්‍රය ගත්තොත්, අපි මේ අවුරුද්ද අග වෙනකොට කියනවා, මෙන්න අක්කර 1,000ක් තිබෙනවා කර්මාන්ත හදන්න කියලා. කෘෂි කර්මාන්තය පැත්තෙන් ගත්තොත්, ඒ සඳහා සුදුසු ඉඩම් ටික නිදහස් කරලා කියනවා, අක්කර මෙච්චර ගණනක් තිබෙනවා, ඇවිල්ලා වගා කරන්න කියලා. ධීවර කර්මාන්තය ගත්තොත්, තව ටික දවසකින් කියන්න පුළුවන්, ඉස්සන් වගාවට සහ මත්ස්‍ය වගාවට මෙන්න මෙච්චර ප්‍රමාණයක් තිබෙනවා කියලා. මෙන්න මේ විධියට පහසුකම් ටික සලසන්න අවශ්‍යයි. එහෙම නොකර මෙච්චර කාලයක් ඉඳලා අවුරුදු 40ක් ඇතුළත ගෙන්වා ගත්තේ ඩොලර් බිලියන 22යි. කරගන්න බැරි වුණු දේවල් ගැන දැන් කෑ ගහලා වැඩක් නැහැ.

ඒ වාගේම තමයි, රාජ්‍ය ව්‍යවසායකත්වය. රාජ්‍ය ව්‍යවසායකත්වය ගැන බණ කිව්වත්, 2015-2019 කාලයේ හිටපු ඔස්තාර්ලාට බැරි වුණා, එක රාජ්‍ය ව්‍යවසායකත්වයක්වත් ප්‍රතිව්‍යුහගත කරන්න. පුළුවන් නම් කියන්න, කරපු එකක්. ඔච්චර ඔස්තාර් දැනුම තිබුණත් එකක්වත් කරගන්න බැරි වුණා නේ. දැන්

අපට කියනවා, ඉක්මනට කරන්න ලු. නැහැ, මම කියනවා විකුණන්න කියලා කෑ ගහන අය මේ දේවල් දූෂණය කරන්න පිටුපසින් ඉන්නවා කියලා. ඒගොල්ලෝ බලාපොරොත්තු වුණා, SriLankan Airlines එක වට්ටලා කුණු කොල්ලයට යාළුවන්ට විකුණාගන්න. ඒක තමයි කළේ. ඇමෙරිකානු ඩොලර් මිලියන 300ට ගන්න ඕනෑ airbus එකක් SriLankan Airlines එක ඩොලර් මිලියන 800ට ගත්තේ කොහොමද? අන්න ඒක තමයි කළේ. රාජ්‍ය ව්‍යවසායකත්වයන්ට හිතා මතා පාඩු කරලා ඒ ගොල්ලෝම privatize කරන්න තමයි උත්සාහ කළේ. ප්‍රතිව්‍යුහගතකරණය කියන වචනයක්වත් තිබුණේ නැහැ. ප්‍රතිව්‍යුහගත කරනවා කියන්නේ ජනතාවටත්, ආණ්ඩුවටත්, Treasury එකටත් අලාභයක් නොවන ලෙස ඒවා ප්‍රතිව්‍යුහගත කරන එකයි. සමහර ඒවා අතහරින්න වෙයි. මොකද, එක එක අමාත්‍යවරයාගේ නෑදෑයෝ දාගන්න හදපු SOEs තිබෙනවා. දැන් ඒවායින් 112ක් විතර අපි ප්‍රතිසංස්කරණය කරනවා; ඒකාබද්ධ කරනවා.

ඒ වාගේම රටට ආර්ථිකමය වශයෙන් වැදගත් වන මර්මස්ථාන තිබෙනවා. ජාතික ජන බලවේග රජය ඒවා කීයටවත් අතහරින්නේ නැහැ, ජනතාවගේ අයිතිය තබා ගන්නවා. එම නිසා මෙතැන ඉන්න ඔස්තාර්ලායි, එළියේ ඉන්න ඔස්තාර්ලායි කොච්චර කෑ ගැහුවත් වැඩක් නැහැ, ලෝකයේ රාජ්‍ය ව්‍යවසායකත්වය කියන්නේ රජයන්වල ප්‍රධාන පංගුවක්. විශේෂයෙන්ම රට සංවර්ධනය වන කාලයේ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවලට මැදිහත් වෙන්න, වෙළෙඳ පොළ තරගකාරීත්වය නැති අවස්ථාවලදී, ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලු තිබෙන අවස්ථාවලදී සංවර්ධන ක්‍රියාවලිය සඳහා රාජ්‍ය ව්‍යවසායකත්වය වැදගත් කාර්යයක් කරනවා. නව ලිබරල් ආර්ථික ක්‍රමය මේ මහ පොළොවේ ඉවරයි. ඒක නිසා ඒ ගැන කථා කරන්න එපා. මේ රජය රාජ්‍ය ව්‍යාපාර, පෞද්ගලික ව්‍යාපාර, සමුපකාරය සහ වෙළෙඳ පොළ සංවිධානය කියන හතරම පාවිච්චි කරලා තමයි මේ ආර්ථිකය ගොඩනඟන්න හදන්නේ. ඉතින්, මම අවසාන වශයෙන් කියන්නේ, මේ ඉදිරිපත් කළේ ලංකාවේ ඉතාම හොඳ පූර්වාදර්ශයක්. ඒ පූර්වාදර්ශය දෙන්න පුළුවන් ජාතික ජන බලවේගයට විතරයි. මොකද, මෙතැන නීතිමය ආවරණයකුත් තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය අය වැය කළමනාකරණය කර ගැනීම කියන කාරණයේදී අපේ දේශපාලන සංස්කෘතිය තුළත් ඉතා හොඳ අනුබලයක් තිබෙනවා. එක පැත්තකින් බදු එකතු කර ගන්න අපට නීතිය ශක්තිමත් කරන්න පුළුවන්. අනෙක් පැත්තෙන්, අපට අනවශ්‍ය වියදම් ටික අඩු කර ගන්න අපේ සංස්කෘතිය පාවිච්චි කරන්න පුළුවන්. මෙතෙක් කාලයක් තිබුණු කිසිම ආණ්ඩුවකට කර ගන්න බැරි වුණු ප්‍රතිසංස්කරණ තමයි, විශේෂයෙන්ම 2015-2019 කාලයේ හිටපු ඔස්තාර්ලාට කර ගන්න බැරි වුණු ප්‍රතිසංස්කරණ ටික තමයි අපි කරන්නේ. එම නිසා දැන් කෙඳිරි ගාලා වැඩක් නැහැ. එක්කෝ බලාගෙන ඉන්න, එහෙම නැත්නම් පුළුවන් විධියට අපට උදව් කරන්න. මම ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ කරන ජරා වැඩේ නවත්වන්න කියලා. මොකද, මේ වෙලාව රට නැඟිටින වෙලාව, මේ වෙලාව රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් වන වෙලාව, මේ වෙලාව අපේ රටේ නීති පද්ධතිය ශක්තිමත් වන වෙලාව, මේ වෙලාව ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනැඟෙන වෙලාව, ඒ වාගේම UNDP එක, ලෝක බැංකුව, IMF එක සහ වෙනත් ජාත්‍යන්තර සංවිධාන සහ රටවල් අපට උදව් කරන වෙලාව. මේගොල්ලෝ උත්සාහ කරනවා, දවසින් දවස මොකක් හෝ කොනක් අල්ලාගෙන මේ රට ආයෝජනවලට සුදුසු නැහැ කියලා මතයක් හදන්න. එම නිසා රටේ ජනතාවගෙනුත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් මම ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා, GDP එක දිහා බලාගෙන ඉන්න, පොඩ්ඩක් හරි පහළට ආවොත් මෙතැනට ඇවිල්ලා කෑ ගහමු. ඒ වාගේම exports දිහා බලාගෙන ඉන්න. පොඩ්ඩක් හරි පහළට ආවොත් මෙතැනට ඇවිල්ලා කෑ ගහමු. Inflation දිහා බලාගෙන ඉන්න, interest rate එක දිහා බලාගෙන ඉන්න, private capital expansion දිහා බලාගෙන ඉන්න, වෙනස් වුණොත්, මොනවා හෝ වුණොත් අපි මෙතැනට ඇවිල්ලා කථා කරමු. අන්න ඒ කරුණුත් එක්ක සාකච්ඡා කරන්න අපි සූදානම්. එම නිසා මෙතැනට බොරුවට කාරණා ගෙනැල්ලා රට අපහසුතාවට පත් කරන්න එපා කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විනාඩි 20, විනාඩි 16ට අඩුවෙලා තිබෙනවා. නමුත්, ඔබතුමියගේ නම්‍යශීලිභාවයත් එක්ක මට විනාඩි 20ම ලබා දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂය පැත්තෙන් කාලය ලබා දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ.

[අ.භා. 2.53]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද දින ඉදිරිපත් කර තිබෙන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026 සම්බන්ධව තමයි මේ අවස්ථාමේ කථා කරන්නේ. මම හිතන විධියට මේක පළමු වතාවට තමයි ඉදිරිපත් කරන්නේ. ඒ නිසා, මම උදේ වරුවේත් මතක් කරපු ආකාරයට අවශ්‍ය ණයගත කිරීම, ණයබරතාව අඩුවන ආකාරය ඉදිරිපත් කිරීම, ඉදිරිය පිළිබඳ prognosis එක තිබෙන්නේ කොහොමද කියලා ඉදිරිපත් කිරීම කියන දේවල් ඉදිරියට යනකොට fine-tune කරලා දෙන එක ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, ඒක දැනගත්තාම අපට පුළුවන් අවුරුදු 5ක පුරෝකථනය බලන්න. මීට පෙර තිබුණා වාගේ නොවෙයි දැන් අපේ අය වැය සූදානම් කරන්න තිබෙන්නේ. මීට පෙර අය වැය සකස් වුණේ ආදායම අනුව වියදම සහ ණය කොච්චර ගන්න පුළුවන්ද කියන හැකියාවත් අනුවයි. දැන් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13ක්, ඒකෙන් සියයට 4ක් capital expenditure, primary surplus එක තිබෙන්න ඕනෑ. ඒ නිසා මේක වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපි අර පුරෝකථනය බැලුවේ, අවුරුදු 5කට හිතන්න ඕනෑ කොයි ආකාරයටද කියලා. මම හිතන විධියට ඒක ඉදිරියට කරගෙන යන්න තිබෙනවා.

මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමන්ලා සහ ඇමතිතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා. හැම අවස්ථාවේදීම විපක්ෂයෙන් කියන්නේ "කරුණාකර උදවු කරන්න දෙන්න" කියන එකයි. ඒ වාගේම, ආණ්ඩු පක්ෂයත්, - තමුන්නාන්සේලා දැන් ආණ්ඩුවේ ඉන්නේ. ඒ නිසා කරුණාකර උදාහරණ ගන්නකොට ප්‍රායෝගිකව සිදු වෙලා තිබෙන ඒවා ගැන බලලා කථා කරන්න. හැම වෙලාවේම බැණ බැණ ඉඳලා හරියන්නේ නැහැ. දැන් ඔබතුමන්ලා ආර්ථිකය ගෙනයන්න අවශ්‍යයි. ඇමතිතුමා කිව්වා වාගේ ඔබතුමන්ලා දැනුවත්කමක් තුළින් තමයි කථා කරන්නේ. නමුත් ඒ කිව්වා වාගේම එම දත්ත **පිළිබඳවත් සඳහන් කරන්න ඕනෑ.**

[ගරු රවි කරුණානායක මහතා]

දැන් මේ කථා කරන මොහොතේ malnutrition සියයට 30කට වැඩි වෙලා තිබෙනවා. මේ ගැන ආණ්ඩුවට එක පාරට බැණලා වැඩක් නැහැ. මේක අවුරුදු ගණනාවක සිට තිබෙන ප්‍රශ්නයක්. 2024 අස්වැසුම ප්‍රතිලාභීන් සිටියේ ලක්ෂ 17යි. දැන් ඒ ප්‍රමාණය ලක්ෂ 24 දක්වා වැඩි වෙලා තිබෙනවා. ලංකාවේ පවුල් ලක්ෂ 57ක් ඉන්නවා. ග්‍රාම නිලධාරි වසම් 14,022ක් පමණ තිබෙනවා. 4දෙනෙකුගෙන් යුත් පවුලකට මාසයකට රුපියල් 67,000ක් අවශ්‍ය වුණා; දැන් රුපියල් 120,000ක් අවශ්‍ය වෙනවා. ආණ්ඩු වෙනස් වෙන අවස්ථාවලදී වෙනස් වන දේවල් තිබෙනවා නේ. පසුගිය සැප්තැම්බර් මාසයට වඩා අද වනවිට ණය බිලියන 29,134කින් වැඩි වෙලා තිබෙනවා. දැන් වැඩක් කරන්නේ නැතුව නොවෙයි. අපට එහෙමත් කියන්න පුළුවන්. නමුත්, අපි ඒ වාගේ විපක්ෂයක් නොවෙයි. අපි කියන්නේ, කරගෙන ආපු දේවල් ඉදිරියට කරගෙන යන්න අවශ්‍යයි කියලායි. හැබැයි, තරුණ අසහනය වැඩිවෙලා තිබෙනවා. ආර්ථිකය යම් විධියකින් වර්ධනය වෙනවා නම් අපි කැමැතියි. අපි මේක කරන්න ඕනෑය කියලා තමයි අපි හැම අවස්ථාවේ දීම උදාහරණ දුන්නේ. මීට පෙර කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මම හිතන විධියට පුළුවන් තරම් ව්‍යවසායකයන් ඇති කිරීම තමයි අවශ්‍ය වන්නේ. රජය පුළුල් කිරීම නොවෙයි, රජය සමඟ ව්‍යවසාය පුළුල් කිරීම තමයි අවශ්‍ය වන්නේ.

අද වන විට SriLankan Airlines ආයතනය US Dollars 175 million ප්‍රමාණයක ISBs අරගෙන තිබෙනවා. ඒ සඳහා High Court එකට ගිහිල්ලා stay order එකක් ගන්නවා. මේවා International Sovereign Bonds. මේක වුණු හැටියේම Hamilton Reserve Bank එකෙන් ප්‍රශ්නයක් ඇති කරනවා. බිලියන 20ක් දාලා SriLankan Airlines ආයතනය කවදාවත් හදන්න බැහැයි කියලා අපි එදා කිව්වා. මම හිතන විධියට ජනාධිපතිතුමාත් ඒක පිළිගත්තා. සරත් ගනේගොඩ දක්ෂයෙක්. නමුත්, මේක ගෙනයන්න පුළුවන් වෙන්නේ petty cashවලින් නොවෙයි. මේක පුළුවන් තරම් ඉක්මනට හොඳ ලොකු ව්‍යාපාරිකයෙක්, ව්‍යාපාරික කණ්ඩායමක්, - මේක airline එකක්. ඒකේ cash cows 3ක් තිබෙනවා, Ground Handling, SriLankan Catering සහ SriLankan Engineering වශයෙන්. මේ තුන cash cows හැටියට පාවිච්චි කරලා flying arm එකට දෙන්න පුළුවන්, ඕනෑ ආකාරයකට. මම ඒක පස්සේ පැහැදිලි කරන්නම්.

මම මේ අවස්ථාවේදී උදාහරණ ගත්තේ ඔබතුමන්ලාට පෙන්වන්න මේ ආර්ථිකය, - *[බාධා කිරීමක්]* නම්‍යශීලීව මට වෙලාව ලබා දීම පිළිබඳ අපේ විපක්ෂයේ නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාව මම බොහොම අගය කරනවා. මේ අවස්ථාවේදී අපට අවශ්‍ය වන්නේ මේ රටේ ආර්ථිකය හදන්න. හැම වෙලාවේම විපක්ෂයට බැණ බැණ ඉන්න එපා. මේ රටේ ආර්ථිකය වර්ග කරන්න එපා. අපි රට හදන මාර්ග එකතු කරමු. ඒක තුළින් මම මේ අවස්ථාවේදී ගන්නේ ඇමතිතුමා, - මම හැම වෙලාවේම අපේ අනිල් ජයන්ත ඇමතිතුමාට කථා කරනවා SMEs සම්බන්ධයෙන්. මම හිතන විධියට මේක අපි හැම දෙනාගේම පසුවට වැදෙන දෙයක්. අද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 67ක්ම මේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් තුළින් තමයි ආර්ථිකය ගෙනයන්නේ. මේ අය දේශපාලනය කරනකොට විපක්ෂයේ ඉන්නකොට එකක් වෙලා, ආණ්ඩු පක්ෂයට එනකොට ඒ තිබෙන ප්‍රශ්න නිසා යම් වෙලාවකට මඟ හැරෙනවා. නමුත්, මේක පිංපොං බෝලයක් වාගේ කරගන්නේ නැතිව මේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් හඳාගනිමු. ශ්‍රම බලකාය ලක්ෂ 80ක් වෙනවා. ඒකෙන් ලක්ෂ 16ක් රජයේ සේවයේ යෙදී සිටිනවා. පෞද්ගලික අංශය ගත්තාම; ඉතාම ලොකු කොම්පැනි ගත්තාම; අඩු ගණනේ ලක්ෂ 35ක් විතර මේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් තුළින් ගමන් කරන්නේ. මේ අයට ඉතාම අමාරු කාර්ය භාරයක් තමයි කරන්න තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අවස්ථාවේ ගැසට් කර තිබෙනවා, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ පඩි වැඩි කරන්න. දැන් පොලියත් වැඩි කර තිබෙනවා. දැන් පොලිය අඩු වෙලා නැහැනේ. මේ අවස්ථාවේදී යම් විධියකින් anti-inflation approach එකක් ගෙනියන ගමන් ඉන්නේ. අද උදේත් මේ ගැන කථා කළා. මම හිතනවා, ආණ්ඩුවක් වශයෙන් ඔබතුමන්ලා මීට වඩා මූල්‍ය බලයක් සමඟ කටයුතු කරන්න අවශ්‍යයි කියා, මහ බැංකුව තුළින්. අනිල් ජයන්ත ඇමතිතුමා මේ සම්බන්ධව දන්නවා ඇති; චතුරංග නියෝජ්‍ය ඇමතිතුමාත් දන්නවා ඇති. නමුත් මේ සම්බන්ධයෙන් අපි කථා කළේ නැත්නම් මේ අය ග්‍රහණයට ලක් වෙනවා. මීට පෙර පැවති ආණ්ඩු කාලවලදීත් මේ රටේ ලොකුම ප්‍රශ්න ඇති වුණේ වෙන මොකක්වත් නිසා නොවෙයි, මහ බැංකුවේ ඉදිරි දැක්මක් නැති ප්‍රතිපත්තිය නිසාය කියන එක මම මතක් කරන්න කැමැතියි.

මේ වන විට යටිතල පහසුකම් අවශ්‍යතාව සියයට 60කින් වැඩි වෙලා. ඒ වාගේම පරාටේ නීතියත් අද රෑ ඉඳලා නැවත ක්‍රියාත්මක වෙනවා. සියයට 36ක ඉහළ බදු ප්‍රමාණයකුත් මේ ව්‍යාපාරිකයන්ට ගෙවන්න තිබෙනවා. VAT එකට සියයට 18ක් ගෙවනවා. SVAT එක නවත්වනවා. මම ඒ සම්බන්ධවත් කථා කරන්නම්. Social Security Contribution Levy එක සියයට දෙකහමාරක් වනවා. මේ පොඩි ව්‍යාපාරිකයන්ට ප්‍රාග්ධනය අහිමි වෙලා තිබෙන අවස්ථාවක, ඒකට බදුත් එකතු වෙනකොට ව්‍යාපාර කරන එක ඒගොල්ලන්ට ලෙහෙසි කාර්ය භාරයක් නොවෙයි.

බලන්න, රට 2022 අවුරුද්දේ මැයි මාසයේ බංකොලොත් වෙනකොට මොකක්ද කිව්වේ? ඒකට soft landingද, hard landingද ඕනෑ එකක් කියන්න පුළුවන්. නමුත් රට බංකොලොත් වුණාය කිව්වා, පාර්ලිමේන්තුවේ අවසරයකුත් නැතුව. ඒ අවස්ථාවේදී කෙළින්ම කිව්වා, ඔවුන්ට ණය ගෙවන්න බැහැ කියලා. ණය ගෙවන්න බැරි වුණාම, ඔවුන්ට හැකියාව තිබෙනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කථා කරන්න. ඒ අයට ඉන්දියාවට කථා කරන්න පුළුවන්. ඉන්දියාව අපේ රටට ඩොලර් බිලියන 4ක් දුන්නා. අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. චීනයට කිව්වා, ඒගොල්ලන්ට තිබෙන ණය ගෙවන්න කල් ගන්නවා කියලා. ඊට පසුව ඒ අවස්ථාව උපයෝගී කරගෙන අන්තිමට අපි රටක් වශයෙන් කථා කරලා, අනේ ණය ගෙවන්න බැහැ, අපට කාලය දෙන්න කිව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මිනිත්තු 25ක විතර කාලයක් තිබෙනවා. මොකද, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාගේ වෙලාවත් මට ලැබුණා.

සුළු සහ මධ්‍ය පරිමාණ - SME - ව්‍යාපාරිකයන්ට කොහේටද යන්න පුළුවන් වන්නේ? ඒගොල්ලන් මහ බැංකුවට ගියාම කියනවා, වාණිජ බැංකුවට යන්න කියලා. වාණිජ බැංකුවට ගියාම, නුඹලාට තව දවස් 20යි තිබෙන්නේ, ණය ගෙවපන් කියනවා. ඒ තුළින් ඒගොල්ලන් අසරණ වෙලා තිබෙනවා. සමහරු ඇපය හැටියට තමන් ඉන්න නිවසේ ඔප්පුව තමයි තබා තිබෙන්නේ. මම දැක්කා, එහෙම තැනක අම්මත්, ළමයි ටිකත් ගෙදරින් එළියට දමනවා. එවැනි අමනුෂ්‍ය වැඩ කෙරෙනවා, මේ රටේ. මේවා නොවෙනවා නොවෙයි. මේක wilful default එකක් නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ අය අසරණ වෙලා ඉන්න අවස්ථාවේ මම ජනාධිපතිතුමාගෙන් සහ ආණ්ඩුවේ ඔබතුමන්ලාගෙන් මේ සම්බන්ධව යම් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා අද සිට තව අවුරුද්දක, අවුරුදු එකහමාරක පමණ හෝ කාලයක් මේ සඳහා ඔවුන්ට ලබා දෙන්න.

මම ගෙනෙනවා Private Members' Bill එකක්, "Small and Medium and Vulnerable Borrowers' Extraordinary Relief Bill" කියලා පසුගිය අවුරුදු 4ක කාලය සම්බන්ධව. ඒ කියන්නේ COVID period එකයි, බංකොලොත් වුණු period එකයි අදාළ කරගෙන. එනම්, 2020 ජනවාරි සිට 2024.12.31වැනි දා දක්වා වූ කාලය සම්බන්ධව. ඒ අය එම කාල පරිච්ඡේදය තුළ ගත් ණය ප්‍රමාණය වෙන ආකාරයකට ගෙවන්න ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න. දැන් ඒගොල්ලන් ණය ගෙව්වාම, ඒක outstanding loan එකට තමයි පාවිච්චි වන්නේ. ඊට පසුව සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් අනාථ වෙනවා. මම කථා කරන්නේ හැඟීම්බරව. මට පෙනෙනවා, ඒගොල්ලන් ඉතාම අමාරුවෙන් ඉන්නේ කියලා. අපේ කාලයේත් මේ ප්‍රශ්න තිබුණා. නැත්තේ නැහැ. ඔබතුමන්ලා කියන්න පුළුවන්, 76 වසරක ශාපයේ කොටසක් වාගේ වචන. ඒවා නොවෙයි, අපට අවශ්‍ය වන්නේ. කොහොමද, මේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ඉදිරියට ගෙනියන්නේ? තරුණ ව්‍යවසායකයින් ඇති කිරීම තමයි අත්‍යවශ්‍ය වන්නේ.

මම පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් විධියට ගෙනෙන දේ ඔබතුමන්ලාට පාවිච්චි කරන්න පුළුවන්. ඉදිරියේදී ණය දෙන්න පුළුවන් වන්නේ කොහොමද කියන එක සම්බන්ධව. " '120 Businesses Auctioned Daily': Sri Lanka’s Economic Collapse Turns Banks Into Liquidation Machines" එකේ කියා තිබෙනවා, එක පුවත් වාර්තාවක්.

ඊට පස්සේ, හාල් ආනයනය බලන්න. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් අනාථභාවයට පත් වෙලා තිබෙනවා. එම පුවත් වාර්තාවේම "The Revival of Parate Laws: Legalised Destruction" කියලා තිබෙනවා. මම මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාට තොරතුරු ඉදිරිපත් කළේ අපි මේ සම්බන්ධයෙන් උත්තරයක් ලබා දෙන්නේ කොහොමද කියන එක ගැන කියන්නයි. ඒ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අවස්ථාව දෙන්න, ගරු ඇමතිතුමනි. ඉන්දියාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10ක් මේ අය සඳහා පාවිච්චි කළා. අපි රුපියල් බිලියන 5ක් දෙන එකයි, ADB එකෙන් ඩොලර් මිලියන 50ක් දෙන එකයි නොවෙයි කරන්න ඕනෑ. ඉන්දියාව 2022 වර්ෂයේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10ක් වෙන් කළා. අන්න, ඒ වාගේ දෙයක් තමයි අපට මේ අවස්ථාවේදී කරන්න තිබෙන්නේ. ඒ නිසා අපි මේ අවස්ථාවේදී ඔබෙන් ඉල්ලන්නේ කරුණාකරලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට මේ සම්බන්ධයෙන් උත්තරයක් ලබා දෙන්න කියලායි, ඔවුන්ට වෙලාවක් ලබා දෙන්න කියලායි. අද මේ බැංකුවලට කියන්න, මේ රටට වුණු ආකාරයටම මේ අයට මේ සම්බන්ධයෙන් මතුව තිබෙන ප්‍රශ්නවලටත් මානුෂිකභාවයෙන් උත්තරයක් දෙන්න කියලා. මම කාරුණිකවයි ඒගොල්ලන් වෙනුවෙන් කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි, deemed exportersලා. මේ SVAT එක ඔක්තෝබර් මාසයේ පළමුවෙනි දා නවත්වන්න යනවා කිව්වා. මේ සම්බන්ධයෙන් අපි economy එක digitalize කරලා තිබෙනවා නම් මම හිතනවා, ඒක කිසි ප්‍රශ්නයක් නැහැ කියලා. ගරු ඇමතිතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවාම උත්තරයක් දුන්නේ නැහැ, මේ ප්‍රශ්නයට හරියාකාරව උත්තරයක් ලැබෙන තාක්කල් අපි මේ SVAT එක ගෙනෙන්නේ නැහැයි කියලා. නමුත් අපට පෙනෙනවා, මේකේ යම් විධියක ප්‍රගතියක් තිබෙනවා කියලා. නමුත්, අපනයනකරුවන්ගේ අවශ්‍යතාව සියයට සියයක් ඉෂ්ට නොවන විධියට ඔවුන් තුළ යම් අවිශ්වාසයක් ගොඩනැඟී තිබෙනවා. ඒ නිසා සමහර විට සියයට 18ක් ගෙව්වොත්, මේගොල්ලන් deemed exportersලාට උදව් කරනවා. අද අපේ අපනයන කටයුතු සිදු වුණේ නැත්නම් රටේ ආර්ථිකයේ ලොකු ප්‍රශ්නයක් උද්ගත වෙනවා. ඒ නිසා මේ deemed exportersලාට උදව් කරන්න බැරි වුණොත්, ඒගොල්ලන්ගේ chain එකේ එක link එකක් කඩා වැටෙනවා. මොකද, සියයට 18ක් VAT එකට ගෙවන්න කිව්වාම, සමහර අවස්ථාවල ඒගොල්ලන්ට සියයට 18ක profit එකක් හදන්නේ නැහැ. ඒ නිසා මේ අවස්ථාවේදී කරුණාකරලා automatic කරන්න පුළුවන් විධියට online VAT invoicing එකක් ගෙනෙන්න.

මම ඔබතුමන්ලාට අවශ්‍ය නම් ඒ සඳහා අදහසක් ලබා දෙන්නම්. මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලාංකික companies දෙකතුනක් තිබෙනවා. කෙන්යාවේ ඉතාම දක්ෂ system එකක් මේ සම්බන්ධව තිබෙනවා. ඒ රටේ, online invoicingවලින් අද සාර්ථකව ආදායමක් ලබා ගන්න පුළුවන් හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම තමයි මෙතැන කියනවා, SVAT එක නැවැත්තුවොත්, බිලියන 180ක ආදායමක් ලැබෙනවා කියලා. ඒක වෙන්න බැහැ. මේක only cash flow එකක්. මේකේ තිබෙන්නේ ආදායමක් උපයන එකක් නොවෙයි. දවස් 45කට cash flow එකක් එන එක ගැනයි මේ කථා කරන්නේ. ඉතින් නොදන්නා කෙනෙකුට කියන්න පුළුවන්, මේකෙන් ආදායමක් එනවා කියලා. නමුත් අනිල් ජයන්ත ඇමතිතුමාට කියන්න බැහැ, දවස් 45ක cash flow එකකින් ආදායමක් එනවා කියලා. ඉතින් මම කරුණාකරලා කියන්නේ මේකයි. අද වන විට මේ අපනයනකරුවන්ට අමාරු තත්ත්වයක් ඇති වී තිබෙනකොට, මේ SME ownersලා බිත්තියට හේත්තු කරලා, ඔවුන්ට තිබුණු එකම වත්කම වූ තමන්ගේ නිවස පවා නැති කරලා ඔවුන් අනාථ වෙනකොට මේ SVAT එකත් නැති කළොත් මොකක්ද වෙන්නේ? අපි මේ කථා කරන්නේ ඔබතුමන්ලාට. විපක්ෂයේ අපි බලාගෙන ඉන්නේ මේ සියල්ල වැටෙනකම් නොවෙයි. නමුත්, අපි මේ දේවල් කියනකොට අපට බැණ බැණ අපේ අදහස් උපයා

[ගරු රවි කරුණානායක මහතා]

ගන්නවාට වැඩිය, අපි ඔක්කෝම එකට එකතු වෙලා නිවැරදි ආර්ථික මාර්ගයක් හදාගනිමු. ඒක තමයි මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, අද ඔබතුමා පිළිතුරු කථාව කරනකොට මේ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න කියලායි. මේ SME ක්ෂේත්‍රයේ සිටින අය සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අද අදාළ අය හමු වෙන්න. ඔබතුමා මේ අය හමු වෙලා මේකට උත්තරයක් ලබා ගන්න, ඒකට නිර්දේශ කරන්න, ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමති වශයෙන් ඔබතුමාට කියන්න පුළුවන්, නැහැ, අපි කරන්නේ specific lending, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සියයට 8ට, සියයට 10ට ණය දෙන්න, අපට මහ බැංකුව ඇවිල්ලා කියන්න ඕනෑ නැහැ, අපට මේවා කරන්න පුළුවන් කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා උදේත් මේ ගැන කථා කළා. අගමැතිතුමිය මෙය ඉදිරිපත් කළ අවස්ථාවේදීත් මම ඔබතුමාට කරුණු ඉදිරිපත් කළා, Federal Reserve එකේ Chairman වන Jerome Powell කොහොමද Senate එකට ගෙනැල්ලා ප්‍රශ්න කරන්නේ කියලා. ඒ කියන Senatorsලා, Congressmenලා ප්‍රශ්න කරන ආකාරය සහ ඒගොල්ලන් උත්තර දුන් ආකාරය බලන්න.

ලංකාවේ මහ බැංකුව නම් ස්වාධීන වෙලා තිබෙනවා. ඒගොල්ලන් ස්වාධීන වුණාම ඒගොල්ලන්ට පාර්ලිමේන්තුවේ Committee on Public Finance එකට එන්න තිබෙන්නේ තුන් වතාවක් හරි එක වතාවක් COPE එකට හරි පමණයි. ඒ ආවාම ඒගොල්ලන්ගේ කාර්යභාරය ඉවරයි. නමුත්, ඇමෙරිකාවේ Federal Reserve එක Congress එකට උත්තර දෙන්න ඕනෑ. ඒගොල්ලන්ට ඒ තිබෙන committee එකට උත්තර දෙන්න සුමාන දෙකකට සැරයක් එන්න අවශ්‍යයි. නැත්නම් ඕනෑම අවස්ථාවක එතැන ඉන්න Senatorsලාට හෝ Congressmenලාට ඒ අය ගෙන්වා අහන්න පුළුවන්, ඇයි තවම මේ විධියට interest rate එක high තිබෙන්නේ කියලා. මෙහේ ඒ වාගේ දෙයක් නැහැ. මෙහේ කථා කරන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. මම මෙතැන මේ දේවල් පෞද්ගලික වශයෙන් නොවෙයි කියන්නේ. මට හිතෙන විධියට, මහ බැංකුව තමයි අපේ රටේ ආර්ථිකය මේ වාගේ තත්ත්වයකට ගෙනැල්ලා තිබෙන්නේ. කිසිම credit එකක් දෙන්නේ නැහැ, පත් වුණු මන්ත්‍රීවරුන්ට. හැබැයි, පත් නොවුණු මන්ත්‍රීවරුන්ට තමයි ඒගොල්ලෝ අවස්ථාව තියාගෙන, ස්වාධීනත්වය තියාගෙන කටයුතු කරන්නේ. මම හිතන විධියට, එදා Public Finance Committee එකේ චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා හිටියා. මම කිව්වේ ඔබතුමන්ලා ඒ බලය තමන්ගේ අතට ගන්න අවශ්‍යයි කියන එකයි. මේ ගෙනැවිත් තිබෙන්නේ ස්වාධීනත්වය නොවෙයි.

Monetary policy එක ඇති කරන්න අවශ්‍ය ස්වාධීනත්වය ලබා දෙන්න. නමුත් මහ බැංකුවේ හැසිරීම මොකක්ද? ඒගොල්ලනුත් සුමාන දෙකකට වතාවක් Monetary Policy Board එකට එන්න අවශ්‍යයි. මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාටවත් ඒ Monetary Policy Board එකට සහභාගි වෙන්න අවස්ථාවක් නැහැ. හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමා දැන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් නේ. එතුමාට අවස්ථාව තිබුණේ නැහැ, Monetary Policy Board එකට සහභාගි වෙන්න. ඒ නිසා මම ඉතාම ඕනෑකමින් ඔබතුමන්ලාට කියන්නේ Central Bank එක independent වුණා වාගේම Central Bank එකේ monetary policy එකට ඇඟිලි ගහන්නේ නැතුව කටයුතු කිරීම ප්‍රශ්නයක් නොවෙයි කියන එකයි. ඒත් මම මේ ගැන හිතන්නේ වෙනත් ආකාරයකටයි. මේක Indonesian or Thailand model එක වාගේ තිබෙන්න ඕනෑ. Singapore වාගේ exchange of reserves එකක් නොවෙයි අවශ්‍ය වන්නේ. නමුත් මම මේ අවස්ථාවේදී ඔබට කියනවා, කරුණාකරලා මේ සම්බන්ධයෙන් නැවත හිතා බලන්න කියලා. මේ අවස්ථාවේදී නිවැරදි නොකර අපි වැරදි මාර්ගයේ ගියොත් ඒගොල්ලන් කියයි,-

උද්ධමනය පාලනය කිරීම සම්බන්ධයෙන් අද තිබෙන තත්ත්වය අනුව මම උදාහරණයක් කියන්නම්. බලන්න, අද වනකොට රුපියල තිබෙන තත්ත්වය. ඒ පිළිබඳව ඉතාම භයානක තත්ත්වයක් තමයි පෙනෙන්න තිබෙන්නේ. දවස් කීපයක් තුළ - ජූනි 13වැනි දා සිට අද වෙනකම්- රුපියල් 296 සිට රුපියල් 301 දක්වා රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා. දැන් මේ සම්බන්ධයෙන් මොනවාද කරන්න තිබෙන්නේ? රුපියල අවප්‍රමාණය වූ හැටියේම අපේ debt stock එක වැඩි වෙනවා. එහෙම සෑම රුපියලක්ම අවප්‍රමාණය වෙනවා කියන්නේ රුපියල් බිලියන 50ක් අපේ වැයට එකතු වෙනවා කියන එකයි. රුපියල් 5කින් රුපියල අවප්‍රමාණය වෙනවා කියන්නේ වැය බර රුපියල් බිලියන 250ක් වනවා කියන එකයි. රුපියල් බිලියන 250ක වැය බරක් තිබෙනවා කියන්නේ පාරවල් හදන්න, dam එකක් හදන්න ගිය මුදලද? නැහැ, රුපියල අවප්‍රමාණය වීම නිසා සිදු වන වැය බර. Sterling Pound එකත් එක්ක බැලුවාම රුපියල 411ට අවප්‍රමාණය වෙලා තිබෙනවා. මම මේ ගැන කියන්නේ අපි එකට එකතු වෙලා අපේ ආර්ථිකය හදන්න අපට කැක්කුමක් තිබෙන නිසායි.

දැන්, Indian Rupee එක බලන්න. Indian Rupee එක අපිත් එක්ක බැලුවාම අවප්‍රමාණය වෙලා තිබුණාට, ඉන්දියාවේ ඒක අවප්‍රමාණය නොවෙයි, යම් ප්‍රමාණයකින් අධිප්‍රමාණයත් වීගෙන යනවා. මේ වාගේම තමයි අපේ Special Drawing Rights. මේකත් සියයට 4කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඒ කියන්නේ අපට පේනවා, අපේ රුපියල ශක්තිමත් නැහැ කියන එක. රුපියල ශක්තිමත් නැති වුණාම මේ ප්‍රශ්නය තිබෙන්නේ මහ බැංකුවේ. හැබැයි, මූල්‍යමය පැත්තෙන් මහ බැංකුවේ වියදම දරන්න වෙන්නේ ඔබතුමන්ලාට. අන්තිමට fiscal policy එකෙන් තමයි debt stock එක හොයලා දෙන්න වෙන්නේ. දැන් ඒගොල්ලන්ගේ Foreign Exchange Reserves බිලියන 1.4ක් අවතක්සේරු කරලා දීලා තිබෙනවා. බැරි වෙලාවත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෙක් තමන්ගේ වත්කම් බිලියන 1,400ක් වැඩි වෙලා තිබෙනවා කියලා බැංකුවට පෙන්වලා දුන්නොත් ඒගොල්ලන් කෙළින්ම කියයි, "මේක වැරදියි. යම්කිසි වංචනික වැඩක් කරලා තිබෙනවා" කියලා. හැබැයි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෙක් තමන්ගේ reserves පෙන්වන්න හැදුවාම ඒක වැරදියි කියනවා. වැරදෙනවා තමයි. වැරදුණාම එය නිවැරදි කරන්න අවශ්‍යයි. ඒ මනුෂ්‍යත්වයම කරුණාකරලා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ටත් දක්වන්න. මේවා නොදන්නවා නොවෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හිතනවා ඒගොල්ලන් තමයි, - මොකද, විශ්වවිද්‍යාලවලින් පිටවෙලා පළමුවැනි රැකියාව විධියට IMF එකට ගිහින් ඒගොල්ලන් අපේ ව්‍යාපාරිකයන්ට කියා දෙනවා, කොහොමද ව්‍යාපාර කරන්නේ කියලා. අපේ ව්‍යාපාරිකයෙක් යම් විධියකින් තනතුරක් ලබාගෙන කටයුතු කරනකොට ඒගොල්ලන් හිතන්නේ වෙනින් ආකාරයකට. මම කියන්නේ මේකයි. 16වැනි වතාවට IMF එකත් එක්ක කථා කරන්න මුදල් ඇමති වශයෙන් මම තමයි නායකත්වය ලබා දුන්නේ. ඒ අවස්ථාවේදී අපට ඒගොල්ලන්ට පෙන්වන්න පුළුවන් වුණා, කිසිම හානියක් නොවන විධියට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අරමුණු ඉෂ්ට කරන්න පුළුවන් විධියට අපට ආදායම් ලබා දෙන්න පුළුවන් කියන එක. මෙතැන දක්ෂයින් ඉන්නවා. සුදු හම තිබෙන කට්ටියට වැඩිය දක්ෂ අය අපි අතර ඉන්නවා. ඒ අයට අවස්ථාව ලබා දෙන්න. ආදායම කොච්චර ඕනෑද, ආදායම සම්බන්ධයෙන් මෙන්න අපේ අදහස කියන මේ කාරණා දෙක ගළපාගෙන කටයුතු කිරීම තමයි අවශ්‍ය වන්නේ.

IMF එකට ගිහින් කියන්න ඕනෑ නැහැ, අපේ ආයෝජකයන් දිරිගැන්වීමට බදු අඩු කරන්න අපට බැහැ කියලා. ඒගොල්ලන් කියනවා, 2028 අප්‍රේල් වෙනකොට අපි, අපේම ණය ගෙවන්න ඕනෑ කියලා. දැන් බිලියන 3ක් ගෙවනවා. මේ ප්‍රමාණය බිලියන 8කට විතර වැඩි වෙනවා, 2028 අවුරුද්ද වෙනකොට. 2028 අවුරුද්ද වෙනකොට අපේ ආයෝජනය මීට සරිලන ලෙස තිබුණේ නැත්නම් නැවත ප්‍රශ්නයක් ඇති වෙනවා නොවේද? මෙන්න මේක නිසා තමයි අපි Colombo Port City එක වාගේ තැන් හදා ගන්න අවශ්‍ය වන්නේ.

මම මේ කථා කරන මොහොතේදී මට යම් කාරණයක් දැනගන්න ලැබුණා. Board of Investment Chairman අර්ජුන හේරත් කියන්නේ දක්ෂ, හොඳ මනුස්සයෙක්. එතුමා මගේ classmate. මේ සම්බන්ධයෙන් එතුමා බොහොම ඕනෑකමින් කියනවා, "BOI Chief flags US$ 3.7bn Sinopec refinery as 'Fragile' " කියලා. මොනවා හෝ කරලා මේක ලබා දෙන්න. ආයෝජනයක් ගේනවා කියලා තිබුණා. මේ company එකට බදු දෙන්න එපා කියලා දැන් IMF එකට කියන්න බැහැ. ආයෝජනයක් එනවා, ඒක ලබා ගන්න අවශ්‍යයි, මේ refinery එක කරන්න. එදා refinery එක කරන්න කිව්වාම ඔබතුමන්ලා හොඳ නැහැ කිව්වාට අද ඒක පිළිගෙන තිබෙනවා. ඒකට අපි කැමැතියි. ලාල් කාන්ත ඇමතිතුමා වාගේ හිතලා හැමෝම වැඩ කරනවා නම් බොහොම හොඳයි. අර්ජුන හේරත් මහත්මයා කියන විධියට කරුණාකරලා අවසරයක් ගන්න පුළුවන් විධියට කටයුතු කරන්න. කැබිනට් පත්‍රිකාවක් ගෙනැල්ලා මේකට කෙළින්ම අවසර ලබා දෙන්න. මෙන්න මේ වාගේ කටයුතු තමයි කරන්න අවශ්‍ය වන්නේ.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, Star Garments කියන්නේ ලංකාවේ Katunayake Free Trade Zone එකේ හුඟ කාලයක් තිබුණු company එකක් බව. ඉදිරියේදී ලංකාවට ඩොනල්ඩ් ට්‍රම්ප්ගෙන් ඇති වන ප්‍රශ්න නිසා ඒගොල්ලන් අප්‍රිකාවට යනවා. ඒක පරණම company එකක්. Star Garments කියන company එක 1978 අවුරුද්දේ ඉඳලා කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ තිබුණු කොම්පැනියක්. Star Garments has started a state-of-the-art manufacturing facility in Togo. මේ සම්බන්ධයෙන් අපට කියන්න තිබෙන්නේ මේකයි. අපේ රට දාලා යන එක නවත්වලා, ඒගොල්ලන් දිරිගන්වලා, මේ රටට ආයෝජන ගන්න පුළුවන් විධියේ කටයුත්තක් කරන්න. IMF එකට ආණ්ඩුවට කියන්න බැහැ, දෙන්න එපා කියලා. මේ සඳහා දෙන්න පුළුවන් ඕනෑම දිරිගැන්වීමක් දෙන්න අවශ්‍යයි. ඒක විපක්ෂය විධියට අපි යෝජනා කරනවා. මොකද, ආර්ථිකය හදන ගමන තිබෙන්නේ අපේ අතේ. 2028දී IMF එකට ගියාට පසුව අහයි, "කෝ ඔයගොල්ලන්ගේ රටේ ආයෝජන" කියලා. එතකොට ඒගොල්ලන්ට කියන්න බැහැ "ඔයගොල්ලන් ඒ ආයෝජන ගේන්න අපට අවසර දුන්නේ නැහැ" කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා මේ අවස්ථාව උපයෝගී කර ගන්න. මම හිතන විධියට මේ අවස්ථාව තමයි, පුළුවන් තරම් ශ්‍රම බලකාය යොදා ගන්න පුළුවන් ව්‍යාපාර ඇති කරන්න තිබෙන අවස්ථාව.

තවත් කාරණයක් තමයි, Sri Lanka may lose the Russian tea market and the tourism market. අපි එදාත් කිව්වා වාගේ ඇයි අපිට Rubles ගන්න බැරි? දැන් ඩොනල්ඩ් ට්‍රම්ප්, ව්ලැදිමීර් පුටින් එක්ක යාළුවෝ විධියට ඉන්නවා, හැබැයි, මෙහේ මහ බැංකුවෙන් Rubles ගන්න බැහැ කියනවා. මොකද, සුද්දන්ට අපේ රටට ඇවිල්ලා Rublesවලින් ඕනෑ තරම් ගෙවන්න පුළුවන්. ඊට පස්සේ fertilizer ගන්න, රුසියාවට Rublesවලින් ගෙවන්න. ඇයි, ඒක කරන්න බැහැ කියන්නේ? විපක්ෂයෙන් අදහස් ලබා දෙන්නේ නැතුවා නොවෙයි. නමුත් මහ බැංකුව ඒගොල්ලන් හිතන විධිය වෙනස් කරන්න අවශ්‍යයි. ඒගොල්ලන් බැහැ කියනවා නම් ඊට පස්සේ ආර්ථිකය කරන්න ඒගොල්ලන්ට භාර දීලා, ආණ්ඩුව විධියට පත් වුණු ඔබතුමන්ලා ගෙදර යන්න. මොකද, ඒගොල්ලන්ගේ ස්වාධීනත්වය යටතේ රටේ ආර්ථිකය පවත්වාගෙන යන්න ඕනෑ නම් ඔබතුමන්ලා පත් වෙලා වැඩක් නැහැ නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව අනුව මූල්‍ය බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාගේ මිනිත්තු 9ක කාලයත් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කාලයත් එක්ක තමයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තු තුනක් තිබෙනවා නේ. මම ඒ කාලය පාවිච්චි කරන්නම්.

මම ඉතා අගය කරනවා, නලින්ද ජයතිස්ස ඇමතිතුමාව. He says that the Government would not be able to pay the higher salaries that health workers are demanding through strikes. මෙන්න මෙහෙම තමයි මම හිතන්නේ. දැන් අනවශ්‍ය ලෙස strikes නැහැ; පෙළපාළිත් නැහැ. දැන් ආයෝජන එන්නේත් නැති එක තමයි තිබෙන ප්‍රශ්නය. දැන් ඒ මොනවත් ප්‍රශ්න නැත්නම් ඇයි ආයෝජන එන්නේ නැත්තේ? ඒ ආයෝජන තමයි අපි ගේන්න හදන්නේ. ඒක තමයි අපි විපක්ෂය හැටියට කියන්නේ Sinopec එකට අවස්ථාව ලබා දෙන්න කියලා. ඔබතුමන්ලාට ඒගොල්ලන්ට බැහැ කියන්න බැහැ.

ඒ වාගේම තමයි, ලාල් කාන්ත ඇමතිතුමා කියනවා, "මමත්, ඔබත් -අපි හැමෝම- රටේ කඩා වැටීමට වග කිව යුතුයි" කියලා. ඒකට එතකොට 76 වසරක ශාපය කියලා අපිට බැණලා හරියන්නේ නැහැ. ඒ නිසා තමයි මම ඉතා ඕනෑකමින් කියන්නේ, අපේ රටේ ආර්ථිකය හදන්න අවශ්‍ය නම්, අපි මේ දේශපාලනික වශයෙන් වර්ගීකරණය කරන එක, පාට වශයෙන් වර්ගීකරණය කරන එක නැති කරන්න අවශ්‍යයි කියලා. ප්‍රතිපත්තියක් අනුව කටයුතු කරන්න. සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින් විතරක් නොවෙයි, තරුණයන් ව්‍යවසායකයින් බවට පරිවර්තනය කරන්න.

හාල් ප්‍රශ්නය තවම තිබෙනවා. තුන්වැනි වතාවටත් හාල් ආනයනය කරනවා. අපි එදා ඉඳන් කියනවා, "අපි වවමු - රට හදමු" කියලා. අපි ඒ ගැන කථා කරනවා. නමුත්, ඒක ක්‍රියාවෙන් වෙන්නේ නැහැ. මෙන්න මේක තමයි අපි ඇති කරන්න අවශ්‍ය වෙන්නේ. මේක මහා පරිමාණ ව්‍යාපාරිකයින්ට විතරක් නොවෙයි. සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයින්ට කිලෝග්‍රෑම් 50,000ක් බැගින් 4,000ක් හදන්න වැය වෙන්නේ රුපියල් බිලියන 250යි. ඒ අවස්ථාව ඔවුන්ට එක වතාවක් ලබා දුන්නා නම්, ඒ

[ගරු රවී කරුණානායක මහතා]

ව්‍යාපාරිකයින් ඉදිරි අනාගතයට ආයෝජනයක් වශයෙන් පරිවර්තනය වෙනවා. ඒ නිසා මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, ඒ කාරණාව කියන්න. අපි පුළුවන් තරම් මේ රටේ ආර්ථිකය හදන එක තමයි කරන්න ඕනෑ. යුද්ධයක් දිනුවාත් වැඩක් නැහැ, ආර්ථික යුද්ධය දිනුවේ නැත්නම්. ආර්ථික යුද්ධය දිනන්න තමයි අපි කටයුතු කරන්න ඕනෑ.

IMF එකේ ගීතා ගෝපිනාත් මහත්මිය ලංකාවට ආපු අවස්ථාවේදී ජනාධිපතිතුමා කියපු දෙයක් මම මේ අවස්ථාවේදී උපුටා ගන්නවා. එතුමා කිව්වා, "Sri Lanka is on track for debt -servicing capability by 2028" කියලා. හරි, ඒක අවශ්‍යයි. අද කරන ආයෝජනය තුළින් තමයි හෙට ආදායමක් ලබා ගන්න පුළුවන් මාර්ග ඇති වෙන්නේ. ඊට පස්සේ ජනාධිපතිතුමා කිව්වා, "We will lay the foundation for self-reflecting economic growth" කියලා. බොහොම හොඳයි. එතකොට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ first Deputy Managing Director, Dr. Gita Gopinath මොනවාද කියන්නේ? එතුමිය කියනවා, "This time, you have to be different from the rest. Let this be the last time an IMF programme is basically installed in Sri Lanka" කියලා. බොහොම හොඳයි. හැබැයි, අමාරු තීන්දු අද ගන්න අවශ්‍යයි. අපි සමහර වෙලාවට ලෙහෙසි ඒවා අත්හැරලා අමාරු ගමන ගිහිල්ලා, අන්තිමට ඔන්න මෙන්න තිබෙන අවස්ථාවේදී ඒක අත්හැරලා ආයෙත් ලෙහෙසි ගමන යන්න පටන් ගන්නවා. ඒක වෙනස් වෙන්න අවශ්‍යයි.

ඊට පස්සේ, bankersලා කියනවා, "A reform agenda is absolutely important" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ, ස්ථාවරභාවයට - stability එකට - වඩා reform agenda එක අවශ්‍යයි කියන එක. ඒ කියන්නේ කම්කරුවන්ට හොඳට වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් ඇති කරන්න වාගේම ඒගොල්ලන් වැඩ කරනකොට ඵලදායීතාවක් ඇති කරන්න පුළුවන් විධියට කටයුතු කිරීම; ඵලදායීතාව තුළින් ඉදිරියට යන එක.

දැන් අද හාල් සම්බන්ධයෙන් තිබෙන ලොකුම ප්‍රශ්නය මොකක්ද? අපේ හෙක්ටෙයාරයකින් කිලෝ 4,500ක්, 5,000ක් විතර තමයි ලැබෙන්නේ. නමුත් ඉන්දියාවේ සහ තායිලන්තයේ හෙක්ටෙයාරයකින් කිලෝ 7,500ක් විතර ලැබෙනවා. ඉතින් සියයට 30ක්, 35ක්, ඵලදායීතාව නැති වීම තමයි ප්‍රශ්නය. ඒ නිසා ඒකකයක් - unit එකක් - වැඩි වෙනවා. ඒ නිසා තමයි ඉදිරියට යන්න බැරි වෙලා තිබෙන්නේ; ලාභදායී තත්ත්වයකට ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මුහුණ බැලුවාම මට පෙනෙනවා, කාලයත් එක්ක තිබෙන සටන. ඒ නිසා මම තව මිනිත්තුවකින් කථාව අවසන් කරනවා. අපට අවශ්‍ය වන්නේ මේ රටේ ආර්ථිකය වර්ධනය කිරීමයි. මේ Fiscal Management (Responsibility) Act එක තුළ ඉදිරියේදී මූල්‍ය විනයක් සමඟ කටයුතු කරන්න පුළුවන් මාර්ගයක් තිබෙනවා. ඒ මාර්ගයට යන්න පුළුවන් එකම මාර්ගය තමයි හරියට ඒකේ දත්ත ගැන අවධානය යොමු කිරීම. මේක රජයේ නිලධාරින්ට විතරක් භාර දෙන්න එපා. The war cannot be fought by soldiers alone; the generals must take command of it. අද තිබෙන මේ නීතිමය පද්ධතිය නිසා අභිමත පරිදි වැඩ කරන අවස්ථාව නැති වෙලා තිබෙනවා. අද රජයේ නිලධාරින් අභිමත පරිදි වැඩ කරන්නේ නැහැ; discretionary power එක ගන්නේ නැහැ. ඒ ගොල්ලන් බයයි. බැරි වෙලාවත් ප්‍රශ්නයක් ඇති වුණොත්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ නිසා ඒගොල්ලන් ගැනත් හිතලා තිබෙන නිසාත්, අලුත් ගමනක් ආරම්භ වෙලා තිබෙන නිසාත් 1948දී සුද්දන්ගෙන් ගත්තාට වඩා අද අපි ආර්ථිකය හදන්න පුළුවන් මාර්ගයට වැටෙමු. මේ Fiscal Management (Responsibility) Act එක අනුව ඒ අඩිතාලම තියාගෙන ගමන් කරන එක තමයි අවශ්‍ය වන්නේ. හැම දවසක්ම රට ඉදිරියට ගෙන යන්න පුළුවන් මාර්ගයකට උදව් වෙනවා මිසක්, පස්සට යන ප්‍රතිපත්ති ඇති නොකොට කටයුතු කරන්න. වමට signal දාලා, දකුණට හැරෙන්න එපා. යන්න ගත්ත එක හරියාකාරව යන්න. ප්‍රගතිශීලීභාවය ඉදිරියට ගෙන එක තමයි අවශ්‍ය වන්නේ. ඒක ප්‍රායෝගික බැවින්, ආර්ථිකය හදන ගමන අපි හදාගෙන ඉදිරියට ගමන් කරමු කියලා මතක් කරමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එක තමයි, Quorum එක maintain කරන්න ඕනෑ. බලන්න, අපි අද කොච්චර සල්ලි වියදම් කරලා තිබෙනවාද කියලා. නමුත් ආණ්ඩු පක්ෂයේ දහදෙනෙක්වත් නැහැ පාර්ලිමේන්තුව ඇතුළේ. එතකොට රටේ සල්ලි කොච්චර නාස්ති වෙලාද? ලබන සතියේ ගන්න තිබුණා නේ මේ විවාදය. ගණන් කරලා බලන්න. දහසයදෙනායි ඉන්නේ. පොඩ්ඩක් නැගිටලා ගණන් කරලා බලන්න. දැන් ඔන්න ආවා එක්කෙනෙක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගණපූරණය සඳහා අවශ්‍ය මන්ත්‍රීවරු සංඛ්‍යාව, විසිදෙනෙක්, ඉන්නවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
විසිඑක්දෙනෙක් ඉන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීම්]* ඔබතුමා කථාව පටන් ගන්න.

[අ.භා. 3.23]

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහසින් පසු මේ රට මුහුණ දුන් දරුණුම ආර්ථික අර්බුද කිහිපයකට අපට අද මුහුණ දෙන්න සිදු වුණා. විශේෂයෙන්ම 2022දී ඇති වූ ආර්ථික අවපාතය ගත්තත්, ආර්ථික අර්බුදය ගත්තත්, රටේ මූල්‍ය විනය පිරිහීමේ ප්‍රතිඵලයක් විධියට තමයි ඒ ආර්ථික අර්බුදය අපට අත්දකින්න වුණේ. බාල, මහලු, තරුණ හැමෝටම ඒකෙන් දුක් විඳින්න වුණා. අපට මතකයි, සමහර උදවිය මං මාවත්වල, එහෙම නැත්නම් ඉන්ධන පිරවුම්හල් අසල මැරිලා වැටුණා. කුඩා දරුවන් දුක් වින්දා. ඒ විතරක් නොවෙයි. තරුණයන්ගේ හීන මරා දැමුණා. ඔවුන් බලාපොරොත්තු රහිත ජීවිත බවට පත් වෙලා තිබුණා. විශේෂයෙන්ම වෘත්තීය සමිති, තරුණයන් මහ පාරට ඇදලා දමපු යුගයක් අපි පසු කළා. අන්න ඒ යුගය නැවත ඇති නොවෙන්න, මූල්‍ය විනය නැවත හදන්න තමයි මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය එළි දක්වන්නේ.

විශේෂයෙන්ම රටක ජනතාව වෙහෙස මහන්සි වෙලා උපයා ගන්නා මුදලින් බදු විධියට රජයට -මහා භාණ්ඩාගාරයට- ලබාදෙන මුදල ආරක්ෂා කිරීම ජනාධිපතිවරයාගේ වාගේම මේ පාර්ලිමේන්තුවේ හැම දෙනාගේමත් වගකීමක්. ඒ නිසා තමයි මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පිළිබඳව අද මේ පාර්ලිමේන්තුවේ විවාද කරන්නේ. අපි විවාද කරනවා විතරක් නොවෙයි, මේ කෙටි කාලය තුළ භාවිතයෙන් පවා ඔප්පු කරලා තිබෙනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව විවාද කරනවාට අමතරව ඒවා ක්‍රියාවෙන් ඔප්පු කරන ආණ්ඩුවක් බව.

අපි පසුගිය කාලයේදී සම්මත කළා අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත. එය ගෙනාවේත් මෙහි කලින් පියවරක් විධියටයි. මූල්‍ය වංචා කරපු, මේ රටේ මහජනතාවගේ ධනය කොල්ලකාපු දේශපාලකයන් ඇතුළු රාජ්‍ය නිලධාරින් සියලුදෙනාටම එරෙහිව මේ පනත මගින් නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ වාගේම ඔබට පෙනෙනවා ඇති, පසුගිය කාලයේත් නීතිය හරියට ක්‍රියාත්මක වුණු බව. අපරාධවලට වගකිව යුතු, මේ රටේ මූල්‍ය වංචා කරපු, මූල්‍ය පරිහානියට වගකිව යුතු සියලුදෙනාම නීතිය ඉදිරියට ගෙන යමින් ඉන්නවා. විශේෂයෙන්ම බාල බෙහෙත් ගෙන්වපු කණ්ඩායම් දැන් පවුල් පිටින් ඇතුළට යනවා. ඒ විතරක් නොවෙයි, වසර දෙකක් වාගේ කාලයක් ඇතුළත රුපියල් කෝටි 15ක් උපයා ගත්ත ආකාරය කියන්න බැරි මන්ත්‍රීවරු අන්න අද ඇතුළට යමින් ඉන්නවා. මිග් යානා ගනුදෙනුව වාගේම මහා පරිමාණ වංචා පිළිබඳවත් තවදුරටත් විමර්ශනය කරන්න නියමිතව තිබෙනවා.

ඒ නිසා ඉදිරිය කියන්නේ, හොරා කාපු දේශපාලකයන්ට අමාරු යුගයක්. සාටක මහත්තයෙක් කියනවා මට ඇහුණා, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තුළ ඉදිරි දැක්ම පැහැදිලි නැහැ කියලා. විශේෂයෙන්ම මම එතුමාට කියන්න ඕනෑ ඉදිරි දැක්ම පිළිබඳව මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි පිටු 34ක් ඇතුළත ඉතාම ක්‍රමවත්ව පැහැදිලි කර තිබෙනවා කියලා. එතුමාට පැහැදිලි නැතිව ඇත්තේ, එතුමාගේ බාප්පාට වෙන දේ; එතුමාගේ ලොකු තාත්තාට වෙන දේ; එතුමාගේ මාමාට වෙන දේ; එතුමාගේ මල්ලිට වෙන දේ. මෙහි ඉදිරි දැක්ම නම් හොඳට පැහැදිලියි. ඒ නිසා එතුමන්ලාගේ ඉදිරි දැක්ම ඉදිරියේදී බලාගන්න පුළුවන් වෙයි කියලා මම මතක් කරන්න කැමැතියි.

විමර්ශන හරියට ක්‍රියාත්මක වෙනකොට, විමර්ශන ඉදිරියට යනකොට මේ අය කොච්චර බය වෙලාද කිව්වොත්, දේශපාලන වේදිකාවේ නයි, මුගටි වාගේ හිටපු කට්ටිය අද සියලු වාද භේද අමතක කරලා එකතු වෙලා ඉන්නවා, ජාතික ජන බලවේගය බලය ගත්ත පළාත් පාලන ආයතනවල බලය නැවත ඩැහැ ගැනීමේ වුවමනාව වෙනුවෙන්. ඊයෙත් මම දැක්කා කළුතර ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක්, දිනපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ගෙදරට දමාගෙන, දොරවල් වහගෙන, අගුළු දමාගෙන ඉන්නවා කියන පුවතක් මාධ්‍ය තුළ පළවෙලා තිබුණා. ඒ මොනවා කළත්, කවුරු අගුළු දැම්මත්, මේ වෙනකොටත් ජාතික ජන බලවේගයේ අපි පළාත් පාලන ආයතන බහුතරයක බලය පිහිටුවලායි තිබෙන්නේ. ඒ නිසා කවුරුත් බය වෙන්න දෙයක් නැහැ. අපි ඒ වැඩේ හරියට කරගෙන යනවා.

මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තුළ, රටේ මධ්‍යකාලීන ආර්ථික ක්‍රියාමාර්ග සාක්ෂාත් කරගන්නා ආකාරය දක්වා තිබෙනවා. දැනටමත් අපි රජයක් විධියට අපේ ඉලක්ක සපුරා ගනිමින් ඉන්නවා. ඔබතුමන්ලා දන්නවා, ජුනි මාසයේ 19වැනිදා වෙනකොට, අය වැයේ තම ඉලක්කගත ආදායම ඉක්මවා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සියයට 101ක ප්‍රමාණයකුත්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සියයට 104ක ප්‍රමාණයකුත්, ශ්‍රී ලංකා රේගුව සියයට 106ක ප්‍රමාණයකුත් වශයෙන් ආදායම් එකතු කරගෙන තිබෙන බව.

අපි දන්නවා, පසුගිය ආණ්ඩු වැඩ කරපු විධිය. රාජ්‍ය සේවකයන්ගේ වැටුප ගෙවා ගන්න බැරිව, පුනරාවර්තන වියදම් ටික කරගන්න බැරිව බැංකුවලට OD තියලා, බැංකුවලට ණය වෙලා තමයි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙව්වේ. එදා තමන්ගේ වැටුප ලැබෙන කල් විශ්වාසයක් තිබුණේ නැහැ, රාජ්‍ය සේවකයන්ට. අද රාජ්‍ය සේවකයන් වෙනුවෙන් බොරුවට හඬ නඟන මේ අය ආර්ථිකයට ඇති කරපු විනාශයේ ප්‍රතිඵලය තමයි, ඒ. හැබැයි මේ ආණ්ඩුව ඇවිල්ලා ඉතාම කෙටි කාලයක් ඇතුළත මේ වනකොට local cash buffer එකක් හදලා තිබෙනවා, ආර්ථිකය අස්ථාවර වෙච්ච වෙලාවක රාජ්‍ය සේවය ඇතුළේ සේවකයන්ගේ පඩි නඩි ගෙවා ගන්න පුළුවන් වන විධියට. අපි ආර්ථිකය ඒ මට්ටමට හදලා තිබෙනවා. මේ cash buffer එක නිසා රාජ්‍ය සේවකයන්ගේ හෙට දවසේ විශ්වාසය තහවුරු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ආයෝජකයන්ගේ විශ්වාසයත්, ව්‍යවසායකයන්ගේ විශ්වාසයත් මේ තුළ තහවුරු වෙලා තිබෙනවා, රට නැවත බංකොලොත්භාවයකට යන්න තිබෙන ඉඩ කඩ බොහෝ සෙයින් අඩු කර තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, මේ වන කොට සෘජු විදේශ ආයෝජනත් ඉහළ ප්‍රමාණයකින් වර්ධනය වෙලා තිබෙනවා. ඒක අපේ ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් විශේෂයෙන් සඳහන් කළා. BoI ආයතන සඳහා අලුතින් ඇමෙරිකානු ඩොලර් මිලියන 129ක ආයෝජන ඇවිත් තිබෙනවා. ඒ වාගේම, තිබිච්ච ආයෝජන වර්ධනය කර තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 521කින්. ඒ කියන්නේ, ආයෝජන දාලා යනවා කියලා විපක්ෂය කෑ ගැහුවාට ආයෝජන දාලා යන්නේ නැහැ කියන එකයි.

[ගරු වම්පික හෙට්ටිආරච්චි මහතා]

මට කලින් කථා කරපු ගරු රවී කරුණානායක මන්ත්‍රීවරයා කිව්වා, කටුනායක ප්‍රදේශයේ තිබෙන Star Garments එක ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ බදු නිසා වහලා අප්‍රිකාවට අරගෙන ගියා කියලා. අමූලික බොරු. ආණ්ඩුව මූල්‍ය විනය ඉතා හොඳින් ආරක්ෂා කරගෙන, මෙච්චර දෙයක් රටට කරලා තිබියදීත් එතුමන්ලා තවමත් බොරු කියනවා. මැයි මාසයේ 19වන දා වසා දමලා යන්නේ NEXT ආයතනය. හැබැයි, ඇත්තටම ඒ ආයතනය වසා දමලා නොව, සේවකයන් අඩු කරලායි තිබෙන්නේ. මගේ ළඟ සංඛ්‍යා ලේඛන තිබෙනවා. ඒ හැම ආයතනයකම සේවකයෝ වැඩ කරනවා. ඒ සේවක සීමා කිරීම කළේ ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ වැඩක් හින්දාම නොවෙයි. ඔවුන් මේ ආණ්ඩුව එන්නත් කලින්ම ගත්තු decision එකක් නිසා තමයි ඒ කටයුත්ත කළේ.

මේ විපක්ෂය හැම වෙලාවේම බොරු බිල්ලෝ මවමින් ඉන්නවා අපි දකිනවා. හොඳින් මතක තියා ගන්න ඕනෑ, එතුමන්ලා මේ ප්‍රහාර එල්ල කරන්නේ ජනතාවගේ ආර්ථිකයටයි, මේ පිබිදෙන රටටයි කියන එක. ආයෝජකයන්ගේ විශ්වාසය කඩලා ආයෝජකයන් එන්නේ නැති තැනට මේ රට පත් කරන්න හදන්නේ එතුමන්ලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳට මතක තියාගන්න, මේක එතුමන්ලා අපේ ආණ්ඩුවට ගහන පහරක් නොව, රටේ ජනතාවට ගහන පහරක් බව. එතුමන්ලා ජනතා විශ්වාසය කඩ කිරීමේ අරමුණින් කරන මේ බොරු ප්‍රචාරය මේ වන කොට පුස්සක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව විධියට අපි ජනතාවගේ ගමන් පහසුව -ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාව- වෙනුවෙන් සුව පහසු මගී බස් රථ ගෙනෙන්න ලෑහැස්ති කර තිබෙනවා. අපි දුම්රිය සේවයත් නවීකරණය කරනවා. ඒ වාගේම, මාර්ග පද්ධතියත් නවීකරණය කරනවා. අපි මේ කෙටි කාලය ඇතුළත මූල්‍ය විනය සහිතව කටයුතු කර තිබෙනවා. අපේ ඇමතිවරයෙක් කිව්වා මට මතකයි, එක රුපියලක්වත් හොරකම් කරපු නැති ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු ඉන්න එකම පාර්ලිමේන්තුව මේකයි කියලා. එහි ප්‍රතිලාභ දැන් ජනතාවට ලැබෙමින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපේ රටේ ගුවන් තොටුපළ ආශ්‍රිතව ජපානයේ ආයෝජන නැවත ලැබෙන්න පටන් ගනිමින් තිබෙන බව. ඒ විතරක් නොවෙයි, අපි දන්නවා, අද පෞද්ගලික අංශයේ ණය ගැනීම සියයට 16කට වඩා වැඩි වෙලා තිබෙන බව. ඒ කියන්නේ, එම ක්‍රියාවලිය වේගවත් වෙලා තිබෙනවා. ඇයි ඒ? එහෙම වෙන්නේ - ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ - මේ රටේ ආර්ථිකය පිළිබඳව ව්‍යාපාරිකයෝ, ආයෝජකයෝ විශ්වාස කරන නිසා.

රජය විධියට අපි මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙන් බලාපොරොත්තු වන්නේ මූල්‍ය විනය, යහපත් ආණ්ඩුකරණය සහ මූල්‍ය අවදානම කළමනාකරණයයි. ඒවා කිරීම අවශ්‍යයි. එය තවදුරටත් තහවුරු කරන එක තමයි මේ ආණ්ඩුව මේ ප්‍රකාශය ගෙනැල්ලා බලාපොරොත්තු වන්නේ. ජනතාවාදී ආණ්ඩුවක් විධියට අපි දන්නවා, අප ජනතාවගේ බදු මුදල්වලට වග කියන්න ඕනෑ කියලා. මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය හරහා ජනතාවගේ බදු මුදල්වලට අදාළව ඉදිරි අවුරුදු 5 සැලසුම් කරන්නේ කොහොමද කියන වගකීම්සහගත සහතිකය අපි දීලා තිබෙනවා. ඒ නිසා කාටවත් තර්ක නඟන්න බැහැ, කාටවත් දුක් වෙන්න අවශ්‍යතාවක් නැහැ. ඒ ඇයි? ඉදිරි අවුරුදු 5 තුළ මේ රටේ දිශානතිය මොකක්ද, මේ රටේ ආයෝජන මොනවාද, මේ රටේ බදු මුදල්වලට මොකක්ද වෙන්නේ කියන කාරණා සම්බන්ධයෙන් අපි මේ හරහා සැලසුම් කර තිබෙනවා. ඒ නිසා මෙය අප දුන්නු පොරොන්දු ඉෂ්ට කරමින්, ආර්ථිකය ස්ථාවර කරමින් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ඉතා නොබෝ කලකින් ජනතාවට අත් කර දීමේ වැඩ පිළිවෙළේ එක අවස්ථාවක් බව මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අරුණ පනාගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026" මේ ගරු සභාවේ විවාදයට ලක් වන මේ වෙලාවේ රජය විධියට අපි කල්පනා කරනවා, ඉදිරි අවුරුදු ගණනක කාල සීමාව සඳහා අපේ රට සැලසුම් කරන්නේ කොහොමද, මූල්‍ය විනය ඇති කර ගන්නේ කොහොමද කියන කාරණා ඉදිරිපත් කරන තැනට මේ සාකච්ඡාව ගෙන එන්න. එවැනි තැනකට මේ සාකච්ඡාව ගෙනෙන්න අප කල්පනා කරන කොට විපක්ෂය පැත්තෙන් නිරන්තරයෙන් මතු වෙනවා, "ආණ්ඩුවට දැක්මක් නැහැ, වැඩ පිළිවෙළක් නැහැ, නිවැරදි සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නේ නැහැ" වාගේ ප්‍රකාශ. විපක්ෂය තම සියලු කථාවලින් එවැනි ප්‍රකාශ බොහොමයක් ඉදිරිපත් කරන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ මේ රට පත් කරපු තත්ත්වයත් එක්ක කල්පනා කර බැලුවාම පෙනෙනවා, විපක්ෂයට මීට කලින් මෙවැනි වැඩ පිළිවෙළක් තිබුණේ නැති බව. විපක්ෂයට තිබුණේ ඉබාගාතේ යන පාලනයක් ඇතුළේ, ප්‍රතිපත්තිමය කාරණා පැත්තකින් තියලා තමන්ගේ දේශපාලන බල වුවමනාව වෙනුවෙන්, තමන්ගේ දේශපාලන බලය මේ රටේ තහවුරු කර ගැනීම වෙනුවෙන් අවශ්‍ය කටයුතු හිතු හිතු වෙලාවට කරන එකයි. ඒ විතරක් නොවෙයි, මූල්‍ය කළමනාකරණය පැත්තකින් තියලා, රටේ මූල්‍ය විනය පැත්තකින් තියලා, තමන්ට ඕනෑ විධියට, තමන්ගේ, තම හිතවතුන්ගේ, තම ගෝල බාලයන්ගේ මඩිය තර කර ගැනීමේ වුවමනාව වෙනුවෙන් කටයුතු කරන එකයි. කිසිදු විනයක්, පාලනයක් නැතිව ඉබාගාතේ යමින් මේ රටේ ආර්ථිකය විනාශ කරන්න මැදිහත්වීම් කරපු එක; තමන්ගේ ගෝල බාලයන්ගේ ආර්ථිකය වර්ධනය කරන්න අවශ්‍ය පහසුකම් සපයපු එක තමයි විපක්ෂය කළේ. නමුත්, රජය විධියට අදාළ සැලසුම් සකස් කරන්න, ඒවා ක්‍රියාත්මක කරන්න අප කල්පනා කරද්දී පවතින ප්‍රශ්නය හඳුනා ගැනීමත් ඉතා වැදගත් කියලායි මා හිතන්නේ. ප්‍රශ්නය හඳුනා ගන්නේ නැතිව ප්‍රශ්නයට උත්තර හොයන්න බැහැ. මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය හරියාකාරව කියවා බලනවා නම් අප ප්‍රශ්නය හරියාකාරව, නිවැරදිව හඳුනාගෙන තිබෙනවා කියන එක පෙනෙනවා. ඇති වෙලා තිබෙන ගැටලුව කොතැනින්ද මතු වෙලා තිබෙන්නේ, ඒ ගැටලුවට කුමන ආකාරයේ උත්තරයක්ද හොයා ගන්න කල්පනා කරන්නේ, ඉදිරි කාලය සඳහා කොහොමද සැලසුම් සකස් කර තිබෙන්නේ කියන කාරණා පිළිබඳව වඩා හොඳින්, සවිස්තරාත්මකව මෙහි දක්වා තිබෙනවා. අපේ ආදායම් මාර්ග ඉදිරි ඉලක්ක සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන් මෙහෙයවන්නේ කොහොමද, ඒවායේ තිබෙන අඩුපාඩුකම් මොනවාද, ඒවා වෙනස් කිරීම වෙනුවෙන් නීති සකස් කරන්නේ කොහොමද, ඒවා ශක්තිමත් කර ගන්නේ කොහොමද කියන කාරණාත් මෙහි සැකෙවින් දක්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණා ගැන මේ විධියට කථා බහ කරද්දී, සැලසුම් කරද්දී විපක්ෂය සමහර

වෙලාවට තමන්ටම ඇඟිල්ල දිගු කර ගන්නවා, තමන්ගේ ඉතිහාසය අමතක කරලා. අද උදේ කාලයේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියපු දේ මට ඇහුණා. එතුමා විපක්ෂයේ ලු; සජබ නියෝජනය කරනවා ලු; ඒ කාලයේ එතුමන්ලා ආණ්ඩුවේ හිටියේ නැති ලු. මා හිතන විධියට, එතුමාට මතක නැහැ වාගෙයි, තමන්ගේ ඉතිහාසය. එතුමා මේ පාර්ලිමේන්තුවේම අමාත්‍ය ධුර කීයක් දරලා තිබෙනවාද, අමාත්‍ය ධුරවල අවුරුදු කීයක් නම් ඉඳලා තිබෙනවා ද? හැබැයි, එතුමාට ඒ ඉතිහාසය අමතක වෙලා, එතුමා දැනට ඉන්න වත්මන් පක්ෂය විතරක් මතක් කරගෙන තමන් ආණ්ඩුවේ හිටියේ නැහැ කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. පසුගිය කාලය පුරා මේ රටේ ආණ්ඩු කරපු, ආණ්ඩුවලට සම්බන්ධ වෙලා මේ රටේ ආර්ථිකය විනාශ කරන්න තීන්දු තීරණ ගන්න අත් ඔසවපු, ඒ වාගේම මේ රටේ මහ ජනතාවගේ බදු මුදල් කිසිදු හිරිකිතයකින්, පැකිළීමකින් තොරව විනාශ කරන්න මැදිහත් වුණු කණ්ඩායමක් විපක්ෂයේ ඉන්නවා. අද අප මේ රටේ මූල්‍ය විනය නිවැරදි කරන්න යන කොට, රට ගොඩනඟන්න යන කොට, ජනතාවගේ ආර්ථිකය ගොඩනඟන්න අවශ්‍ය කරන මැදිහත් කිරීම් කරන කොට අභූත චෝදනා ඉදිරිපත් කරලා ඒ සැලසුම් අවුල් කරන්න ඒ අය කල්පනා කරනවා. ඒගොල්ලන් සතුටු වෙන්නේ මේ රටේ ආර්ථිකය වැටෙනවා නම් තමයි. ඒගොල්ලෝ කල්පනා කරනවා, අඩුම තරමින් ඉරාන - ඊශ්‍රායල යුද්ධය හෝ ඇවිලිලා ඒකේ ප්‍රතිඵලයක් හැටියට අපේ රටේ නැවත පෝලිම් යුගයක් එනවා නම් හොඳයි කියලා. අන්න එවැනි ලාභ සන්තෝෂයක් ගන්න තමයි ඒගොල්ලන් කල්පනා කරමින් ඉන්නේ. ඒවා තමයි ඒගොල්ලන් කල්පනා කරන්නේ. නැවත කොවිඩ් - 19 වාගේ වසංගතයක් එනවා නම් හොඳයි කියන පැත්තෙන් කල්පනා කරමින් තමයි ඒගොල්ලන් පසුගිය දවස්වල සමහර ප්‍රකාශ ඉදිරිපත් කළේ. මේ තත්ත්වය තමයි දිගින් දිගටම තිබෙන්නේ. හැබැයි, මේකේ ඇත්ත කාරණාව සොයා බැලුවාම මොකක්ද පෙනෙන්නට තිබෙන්නේ? ඒ ඇත්ත මා කියන්නම්. අද විපක්ෂයට හොඳින් දැනිලා තිබෙනවා, තමන්ගේ ඉතිහාසය ගැන ප්‍රශ්න කෙරෙන, තමන්ගේ ඉතිහාසයට අදාළව තමන්ට වග කියන්න සිද්ධ වන නීති රාමු ශක්තිමත් වන බව; ඒ නීති රාමු ඇතුළේ තමන් කටයුතු කළ ක්‍රියා දාමයන් හෙළිදරව් වන බව; ඒ විතරක් නොව, ඒවාට වග කියන්නත් සිද්ධ වන බව. මෙන්න මේ කියන කාරණා පිළිබඳව එතුමන්ලාට භය දැනිලා තිබෙනවා. භය දැනුණු එක ප්‍රකාශයට පත් වෙන්නේ කොහොමද? එය ප්‍රකාශයට පත් වෙන්නේ, ආණ්ඩුව අස්ථාවර වනවා කියන පැත්තේ ඉඳලායි. ආණ්ඩුව අස්ථාවර කිරීමේ වුවමනාවෙන් යුතුව කරුණු දක්වමින් ආයෝජකයන් බිය වද්දන්න උත්සාහයක් තමයි ඒ අය මේ දරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණා ඇතුළේ උදේ වරුවේ ඉඳලාම විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් වුණේ එවැනි චෝදනා ප්‍රමාණයක් විතරයි. අපට පේනවා, ඒගොල්ලන්ගේ භයගැන්වීම් කොහොමද කියලා. අපි දැක්කා, උදේ වරුවේ මේ සභාවේ විවිධ සංවාද මතු කළ මන්ත්‍රීවරු තමන්ගේ ඉතිහාසය අමතක කරලා කථා කළ ආකාරය. දෙකේ ඉලක්කම් 9කින් යුක්ත "සිරිලිය සවිය" කියලා ගිණුමක් තිබුණා. ඒ ගිණුමට වෙච්ච දේ පිළිබඳව කථා කරනකොට අපේ රටේ මූල්‍ය විනය කොහොමද කියලා පේනවා. මොනවාද වෙලා තිබෙන්නේ? ඒ අයම අද ඇවිල්ලා මූල්‍ය විනය ගැන කථා කරනවා. තමන් ඉතිහාසයේ මේ රටට කරපු මූල්‍ය අපරාධ හෙළිදරව් වෙනකොට, හිරේ යනවා කියලා මතක් වෙනකොට, නීතිය ක්‍රියාත්මක වෙනවා කියලා මතක් වෙනකොට, තමන්ගේ බල පරාක්‍රමයන් ඇතුළේ මේ රටේ මූල්‍ය විනය විතරක් නොවෙයි, දේශපාලන සදාචාරය ඇතුළු සියලු සදාචාර බිඳගෙන කටයුතු කළ යුගය අවසන් කියලා දැනෙනකොට ඒකට භය වෙලා අද ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන්න පටන් අරගෙන තිබෙනවා. මේක තමයි අද පේන්න තිබෙන තත්ත්වය. මේ තත්ත්වයන් තුළ මේ රට නිවැරදි දිශාවකට අරගෙන යන්න අද අපි විශාල වෙහෙස මහන්සියක් ගන්නවා. ඒක එක රැයකින් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. බංකොලොත් කළ, විනාශයට පත් කළ, සෑම අතින්ම පහළට ඇද වට්ටලා දාපු රටක් ඉතාම ඉක්මනින් කිසියම් සැලැස්මකට, වැඩ පිළිවෙළකට, කිසියම් ආර්ථික ස්ථායීකරණයක් දක්වා ඉහළට අරගෙන ඇවිල්ලා ශක්තිමත් රටක් බවට පත් කරන්න අපි කල්පනා කරනවා. අද විපක්ෂය පැත්තෙන් දක්නට තිබෙන්නේ ඒක කඩාකප්පල් කිරීමයි. ඒගොල්ලන් කල්පනා කරනවා, ආර්ථිකය ශක්තිමත් වෙන එක වළක්වන්න නම් ආයෝජකයෝ එන එක වළක්වන්න ඕනෑ, ආයෝජකයන් බිය ගන්වන්න ඕනෑ, මේක අස්ථාවරයි කියලා කියන්න ඕනෑ, වැටෙනවා, වැටෙනවා කියලා පෙන්වන්න ඕනෑය කියලා. ඒ අනුව නිරන්තරයෙන් එවැනි ප්‍රකාශ මතු කරමින්, පාර්ලිමේන්තුව තුළත්, එළියේත්, සමාජ මාධ්‍ය තුළත් -සෑම තැනම- එවැනි මතයක් ගොඩනඟන්න තමයි ඒ අය මේ සූදානම් වෙන්නේ. ඒ, කාට විරුද්ධවද? මේ රටේ ජනතාවට විරුද්ධව තමයි ඒ කටයුත්ත කරන්නේ. පසුගිය කාලයේ ඒ අයගේම තීන්දු තීරණ නිසා, ඒ අයගේම අපරාධ නිසා, මූල්‍ය අපරාධ නිසා බංකොලොත් කළ රටේ දුක් විඳපු ජනතාව නැවතත් ගොඩනඟාගෙන යන නව දේශපාලන සංස්කෘතිය තුළ රටේ ආර්ථිකය ගොඩනඟන අලුත් වැඩ පිළිවෙළ කඩාකප්පල් කරලා, රටේ ආර්ථිකය කඩා වට්ටලා නැවත වතාවක් මේ රටේ ජනතාව එතැනට ගෙන යන්න අවශ්‍ය මැදිහත්වීම තමයි ඒ කරන්නේ, ආයෝජකයන් බියගන්වමින්. පසුගිය කාලය තුළම දිගින් දිගටම විපක්ෂය විසින් සිදු කළ කටයුතුවල වාගේම ඒ සාකච්ඡාවල පේන්න තිබුණේ මේ කාරණා තමයි. හැබැයි, අපට කියන්නේ කොහොමද? අපි එකතු කර ගන්න, අපිවත් දායක කර ගන්න, සම්බන්ධ කර ගන්න, අපිත් කැමැතියි එකතු වෙන්න, උදවු කරන්න කියායි. ඒ ජාතියේ බැටළු හම් පොරවාගෙන තමයි ඒ අය කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තත්ත්වයන් හඳුනාගෙන ඉදිරි කාලයේදී ඒවා වෙනස් කිරීමට අදාළව විශේෂ මැදිහත්වීම් කරමින් තමයි අපි මේ රටේ ආර්ථිකය පෙළගස්වන්න හදන්නේ. ආයෝජකයන් ගැන කියනවා; ආයෝජකයන් එන්නේ නැහැ කියනවා. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සම්බන්ධ වෙලා සිටි අමාත්‍යවරයෙකුටත්, ආයෝජන මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂවරයාටත් අධිචෝදනා භාර දෙනවා අපි දැක්කා. මොකටද, ඒ? පසුගිය කාලයේ තමන් කළ ක්‍රියාකාරකම් මොන තරම් මේ රටේ මූල්‍ය විනය වාගේම මූල්‍ය තත්ත්වයන් විනාශ කරන්න බලපා තිබෙනවාද කියන එක අද ඒ තුළින් එළියට ඇවිල්ලා තිබෙනවා.

ඒ වාගේම ආයෝජන මණ්ඩලය සතු මුදල් රුපියල් ලක්ෂ ගණනින් වියදම් කරලා තිබෙනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දෙවන පදවි ප්‍රාප්තියේ දේශපාලන ප්‍රචාරක කටයුතුවලට. අද මොකද වෙලා තිබෙන්නේ? කෝ, මූල්‍ය විනය එතැන? මූල්‍ය විනයක් තිබුණේ නැහැ. රටේ මුදල් තමන්ගේ දේශපාලන වුවමනා වෙනුවෙන් පාවිච්චි කළා. අන්න ඒ නිසා තමයි අද ලක්ෂ්මන් යාපාටත්, ආයෝජන මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂවරයාටත් අධිචෝදනා ලැබිලා තිබෙන්නේ. එහෙම තමයි පසුගිය කාලයේ එතුමන්ලා අපේ රට තුළ කටයුතු කරලා තිබුණේ. නමුත්, වත්මන් ආණ්ඩුවේ කිසිම මන්ත්‍රීවරයෙකුට, කිසිම ඇමතිවරයෙකුට - කිසිවෙකුට - මූල්‍ය චෝදනා නැහැ. අපි දැක්කා නේ, රනිල් වික්‍රමසිංහ මහත්තයා පත් වෙලා මාසයක් ගත වනකොට මහ බැංකුව කඩාගෙන වැටුණා. කෝ, මූල්‍ය විනයක්? කොහේද මූල්‍ය විනයක් තිබුණේ? එහෙම කිසිවක් තිබුණේ නැහැ.

අද අපි ඒ තත්ත්වයන් වෙනස් කරලා, අලුත් දේශපාලන සංස්කෘතියක් මේ රටට දායාද කරන්නයි, උරුම කරන්නයි

[ගරු අරුණ පනාගොඩ මහතා]

හදන්නේ. මේ රට ගොඩනැඟීම වෙනුවෙන් දේශපාලනඥයාගේ වගකීම, වගවීම ඇති කරගෙන මේ රට ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියන අලුත් දේශපාලන සංස්කෘතියයි මේ රටට දායාද කරන්න හදන්නේ. එය කඩාකප්පල් කිරීම තමයි අද විපක්ෂයේ කටයුත්ත බවට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මේ විධියට එළි දක්වා ඉදිරි කාලයේ තිරසාර වගවීමකින්, වගකීමකින් වැඩ කරන්න පුළුවන් නව දේශපාලන සංස්කෘතියක් එක්ක මේ රටේ මූල්‍ය විනය ගොඩනැඟීමේ කටයුත්තට තමයි අපේ මැදිහත් වීම තිබෙන්නේ. ඒ කාරණා නැවත නැවත මතක් කරමින් විපක්ෂයට අපි කියනවා, අභූත චෝදනා ඉදිරිපත් කරලා මේ රටේ නැඟී එන ආර්ථිකය බිඳ වට්ටන්න උත්සාහ කරන්න එපා, ඒක මේ රටේ ජනතාවට කරන ද්‍රෝහිකමක්, අකටයුත්තක් කියලා. එම කාරණාවත් මතක් කරමින්, ඒ තත්ත්වයෙන් වැළකිලා මේ රට ගොඩ නඟන්න ආණ්ඩුවට උදවු කරන්න කියන ඉල්ලීමත් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.46]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதி செயல்நுணுக்கக் கூற்றுத் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு சந்தோசமடைகின்றேன். மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க தலைமையிலான இந்த அரசாங்கம் ஆட்சியைப் பொறுப்பேற்று கிட்டத்தட்ட 8 மாதங்கள் ஆகின்றன. இந்த நாட்டினுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்பும் நோக்கில் அரசாங்கம் முன்னெடுக்கின்ற புதிய முயற்சிகளை நாங்கள் பாராட்டுவதோடு, அதற்கு என்றென்றும் அரசாங்கத்துக்கு நன்றி உடையவர்களாக இருப்போம். எனவே, அரசாங்கம் இந்த நாட்டினுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்குத் தேவையான நடவடிக்கைகளை விரைவாக மேற்கொள்ள வேண்டும். இன்று இருக்கின்ற பொருளாதார நிலைமை புதிய அரசாங்கத்தால் ஏற்பட்டதல்ல. கடந்த பல தசாப்தங்களாக மாறி மாறி ஆட்சிசெய்த அரசாங்கங்கள் விட்ட தவறுகளாலும், சர்வதேச ரீதியில் ஏற்பட்ட சூழ்நிலைகளாலும்தான் இன்று நமது நாடு இவ்வாறானதொரு பொருளாதாரப் பிரச்சினைக்கு முகங்கொடுத்துக்கொண்டு இருக்கின்றது.

அண்மையில் அமெரிக்க ஜனாதிபதி டொனால்ட் டிரம்ப் அவர்களால் விதிக்கப்பட்ட வரியால் இலங்கை மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றது. இங்கு கௌரவ பிரதம அமைச்சர் உட்பட பல அமைச்சர்கள் இருக்கிறார்கள். அவர்களுக்கு நான் ஒரு விடயத்தைச் சொல்லி வைக்க வேண்டும். அமெரிக்க ஜனாதிபதி டொனால்ட் டிரம்ப் அவர்களுடைய புதிய வரி விதிப்பின் பிரகாரம், இலங்கையில் இருந்து அமெரிக்காவுக்கு ஏற்றுமதி செய்யப்படுகின்ற தைத்த ஆடைகளுக்கு விதிக்கப்பட்டிருந்த 5 சதவீத வரியானது - taxஆனது - 44 சதவீதமாக உயர்த்தப்பட்டிருக்கின்றது. பல மாதங்கள் கடந்தும் இன்னும் அந்த வரி குறைக்கப்படவில்லை. இது பற்றிக் கதைப்பதற்காக மாண்புமிகு ஜனாதிபதி அவர்களும் அமைச்சும் அதிகாரிகளை அங்கு அனுப்பினர்கள். எனினும், அதிகாரிகள் மட்டத்தில் நடந்த எந்தப் பேச்சுவார்த்தையும் இதுவரை சாத்தியமாகவில்லை. இந்த அதிக வரி விதிப்பு தொடர்ச்சியாக இருக்குமாகவிருந்தால், இந்த நாட்டில் எந்தவோர் ஆடைத் தொழிற்சாலையையும் நடத்த முடியாமல் போய் பாரிய விளைவுகள் ஏற்படும்.

" '120 Businesses Auctioned Daily': Sri Lanka's Economic Collapse Turns Banks Into Liquidation Machines " என்ற தலைப்பிலான ஒரு செய்தியை நான் பார்த்தேன். இதன்படி, ஒவ்வொரு நாளும் கிட்டத்தட்ட 120 வணிகங்கள் ஏலத்தில் விடப்படுகின்றன. அதுமாத்திரமன்றி, கடந்த ஒரு வருட காலத்தில் இலங்கையில் இருக்கின்ற 90,000 small and medium industries மூடப்பட்டிருக்கின்றன. இது இந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்தில் மாத்திரம் மூடப்பட்டவையல்ல. கடந்த அரசாங்க காலத்திலிருந்து மூடப்பட்டு வந்தவையாகும். இது இந்த நாட்டினுடைய பொருளாதாரத்தில் மிக மோசமான விளைவை ஏற்படுத்திக்கொண்டிருக்கின்றது. அதிக உற்பத்திச் செலவாலும் அமெரிக்கா விதித்திருக்கின்ற வரியாலும் இலங்கையில் காணப்படுகின்ற பல தொழிற்சாலைகளும் தொழிற்றுறைகளும் மிக மோசமாகப் பாதிக்கப்பட்டுள்ளன.

எனவே, நிதி அமைச்சரான மாண்புமிகு ஜனாதிபதி அவர்கள், நேரடியாக அமெரிக்காவுக்குச் சென்று, அமெரிக்க ஜனாதிபதியைச் சந்தித்து, அவரிடம் வேண்டுகோள் ஒன்றை விடுத்தால்தான் இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண முடியுமென நாங்கள் நினைக்கின்றோம். பல நாடுகளின் தலைவர்கள் அமெரிக்காவுக்குச் சென்று, நேரடியாக அமெரிக்க ஜனாதிபதி டொனால்ட் ட்ரம்பைச் சந்தித்த பிறகுதான் அந்த நாடுகளின் ஏற்றுமதிப் பொருட்களுக்கு விதிக்கப்பட்டிருந்த வரி குறைக்கப்பட்டது. இந்தப் பிரச்சினையானது, வெறுமனே இந்த அரசாங்கத்தின் பிரச்சினையல்ல. மாறாக, ஒட்டுமொத்த நாட்டையும் பாதிக்கின்ற பிரச்சினையாகும். ஐந்து சதவீதமாக இருந்த வரியை 44 சதவீதமாக உயர்த்தியிருப்பது சாதாரண ஒரு விடயமல்ல. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் எவ்வளவு விரைவாக அமெரிக்காவுக்குச் செல்ல முடியுமோ, அவ்வளவு விரைவாகச் சென்று, அமெரிக்க ஜனாதிபதியைத் தனிப்பட்ட முறையில் - personalஆக - சந்தித்து, இந்த வரியை மீண்டும் ஐந்து சதவீதமாகக் குறைக்கின்றபோதுதான், எமது நாட்டிலுள்ள தொழிற்சாலைகளைத் தொடர்ந்து நடாத்திச் செல்லக்கூடியதாக இருக்கும்.

நான் முன்னர் சொன்னதுபோல, கிட்டத்தட்ட 120 businesses - industries, factories, companies - நாளாந்தம் மூடப்பட்டுக்கொண்டு இருக்கின்றன. Ninety thousand small and medium industries கடந்த ஒரு வருட காலப் பகுதிக்குள் மூடப்பட்டிருக்கின்றன. இது இப்போதல்ல, இன்னும் ஆண்டுகள் போகப் போகப் பொருளாதாரத்தில் மோசமான பாதிப்பை ஏற்படுத்தும். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இது தொடர்பில் உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கடந்த தேர்தல் காலங்களில் நீங்கள் தேர்தல் மேடைகளில் "நாங்கள் IMFஇன் ஆட்டத்துக்கு ஆடமாட்டோம்; எங்களுடைய நாட்டு மக்களுடைய நன்மை கருதியே

தீர்மானங்களை எடுப்போம்; எது நாட்டு மக்களுக்கு நன்மையோ அவற்றையே செய்வோம்" என்று சொன்னீர்கள். IMF உடனான உடன்படிக்கையின் பிரகாரம், நாட்டில் இருக்கின்ற உள்ளூராட்சி மன்றங்களில் - Municipal Councils, Urban Councils, Pradeshiya Sabhas - பணிபுரிகின்ற ஊழியர்களின் சம்பளத்தில் 20 சதவீத்தை இந்த ஆண்டிலிருந்து உரிய சபைகள் செலுத்த வேண்டும். இது Colombo, Kandy போன்ற பெரிய Municipal Councilsக்குச் சாத்தியப்படலாமே ஒழிய, கிராமங்களில் இருக்கின்ற சபைகளுக்குச் சாத்தியப்படாது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்பொழுது அமைக்கப்பட்டு இருக்கின்ற புதிய சபைகள் கடும் சவாலை எதிர்நோக்கிக்கொண்டு இருக்கின்றன. நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்திலிருக்கின்ற அநேகமான சபைகளுக்கு எந்தவிதமான வருமானமும் கிடையாது. ஏனெனில், அவை அமைந்துள்ள பிரதேசங்கள் யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்கள்! குறிப்பாக, வாகரை, வாழைச்சேனை, களுவாஞ்சிக்குடி, ஆரையம்பதி, செங்கலடி போன்ற பிரதேசங்களிலுள்ள சபைகளுக்கு எந்த வருமானமும் இல்லை.

திடீரென்று 200 - 300 employeesக்கு அவர்களுடைய சம்பளத்தில் 20 per centஐ council கொடுக்க வேண்டுமென்று சொன்னால், எப்படிச் செய்வது? உடனடியாக வீடுகளுக்குச் சென்று வரி அறவிட முடியாது. ஒவ்வொரு வருடமும் 20 per cent என்ற அடிப்படையில், 5 வருடங்களாகும்போது அவர்களுக்கான முழுச் சம்பளத்தையும் local authorities கொடுக்க வேண்டும். இது சாத்தியமில்லாத ஒரு விடயமாகும். கௌரவ பிரதம அமைச்சர் அவர்களே, கௌரவ மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயத்தில் தலையிட்டு, உள்ளூராட்சி மன்றங்கள் வருமானத்தை ஈட்டுவதற்கான வழிவகைகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். உதாரணத்துக்கு, கடைகளை, சந்தைகளைக் கட்டி கொடுக்க வேண்டும். IMF உடைய நிபந்தனைக்கு இணங்க, இன்னும் ஐந்து வருடங்களில் அந்த ஊழியர்களுக்கான முழுச் சம்பளத்தையும் Council கொடுக்க வேண்டும் என்று சொல்வது, எந்த வகையிலும் ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, நான் இன்னுமொன்றைச் சொல்ல வேண்டும். இந்த வருடத்துக்கான Budgetஇல் 1,416 பில்லியன் ரூபாய் Capital Expenditureக்காக ஒதுக்கப்பட்டுள்ளது. ஆனால், இன்றுவரை 121 பில்லியன் ரூபாய் மாத்திரம்தான் - 10 சதவீதத்துக்கும் குறைவான தொகைதான் - செலவு செய்யப்பட்டிருக்கிறது. இந்த வருடம் முடிவடைவதற்கு இன்னும் 6 மாதங்கள்தான் இருக்கின்றன. இந்த வருடத்துக்காகச் சமர்ப்பிக்கப்பட்ட Budgetஇலுள்ள பெரும்பாலான முன்மொழிவுகள் 6 மாதங்களாகியும் இன்னும் முழுமையாக implement செய்யப்படவில்லை. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இது தொடர்பில் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். இது 2026ஆம் ஆண்டுக்குரிய Budget தயாரிக்கப்படுகின்ற நேரம்! ஆனால், கடந்த Budgetஇல் ஒதுக்கிய தொகையில் 10 per centகூட இன்னும் spend செய்யப்படவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பாக விரைவாக நடவடிக்கை எடுத்து, உரிய காலத்திற்குள் நிதியை வழங்கி, குறித்த வேலைத்திட்டங்களை நடைமுறைப்படுத்த வேண்டும். எமது நாட்டின் பொருளாதார நிலைமையை நாங்கள் மிக விரைவாக சீர்செய்ய வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, மத்திய வங்கியின் ஆலோசனைகளைக் கேட்பதோடு மாத்திரம் நின்றுவிடாமல், நீங்களும் தீர்மானங்களை எடுக்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Sir, please give me one more minute. I will wind up in a minute.

கௌரவ அமைச்சர் அவர்களே, எல்லா வழிகளிலும் வரிகள் விதிக்கப்படும்போது, அவற்றை மக்களால் தாங்க முடியாது. அது கஷ்டமான சூழ்நிலையையே ஏற்படுத்தும். எனவே, நீங்கள் இதற்கு உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். நான் நேற்றுக்கூட பத்திரிகைகளில் செய்தியொன்றைப் பார்த்தேன், இலங்கையிலுள்ள தொழில்முயற்சியாளர்கள் வேறு நாடுகளுக்குச் சென்று குறிப்பாக, African countriesக்குச் சென்று factories திறக்கிறார்கள் என்று. இது மிகவும் பாரதூரமான விடயமாகும். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.56]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප විශේෂ පාර්ලිමේන්තු සැසියක් පවත්වලා රජයක - ආණ්ඩුවක - මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයක්, නැත්නම් Fiscal Strategy Statement එකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පළමු අවස්ථාව, අද. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව තමයි ඉදිරි වසර පහ සඳහා මේ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ. ඒ, මධ්‍ය කාලීන මූල්‍ය ඉලක්ක හඳුන්වා දෙමින්. පසුගිය වසර තුනක කාලයක් තිස්සේ මූල්‍ය ක්ෂේත්‍රයේ; ආර්ථිකයේ කඩා වැටීමක් සහ IMF වැඩ පිළිවෙළක් ඇතුළේ ක්‍රියාත්මක වෙන රටක් විධියට, ආර්ථිකයේ නැග්මක් අපේක්ෂා කරන රටක් විධියට, ආර්ථිකයේ නැග්ම රටේ පැවැත්මට වෙනදාට වඩා තීරණාත්මක වෙලා තිබෙන මොහොතක මූල්‍ය සහ මූල්‍ය ඉලක්ක සම්බන්ධව කරන සාකච්ඡාව වැදගත් දෙයක් කියලා අපි හිතනවා. 2026 - 2030 කාලය සඳහා තමයි මේක ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිවරුන් ඇතුළු පිරිස කලින් ඉදිරිපත් කළා වාගේම මේකේ ඉලක්කය 2030 වෙද්දී ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක් දක්වා වර්ධනය කිරීම, රාජ්‍ය වියදම් සීමාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19.2 දක්වා අඩු කිරීම, රාජ්‍ය ආදායම සියයට 15.4 දක්වා වැඩි කිරීම, අය වැය හිඟය සියයට 3.2 දක්වා අඩු කිරීමයි. එවැනි ඉලක්කයන් සහිතව තමයි මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ ආණ්ඩුව බලයට පත් වෙලා මාස නවයකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙන තත්ත්වයක, මේ රටේ ආර්ථිකය තිබුණු තැනින් ඉදිරියට ගෙන එන්න මේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. අපට කඩා වැටිලා තිබුණු ආර්ථිකයක් තිබුණේ.

[ගරු නජිත් ඉන්දික මහතා]

අවිනිශ්චිත ආර්ථිකයක් තිබුණේ. පසුගිය අවුරුදු දෙකේත් ඒකට පැලැස්තර ගැහුවා මිසක් නිශ්චිත වැඩ පිළිවෙළක්, විශ්වාසයක් තැබිය හැකි වැඩසටහනක් ඉදිරිපත් වුණේ නැහැ. ඒ වෙනුවට දේශපාලන අධිකාරිය විසින් සාමාන්‍ය ආකාරයටම ඒ දේවල් කරගෙන ගිය ආකාරයක් තමයි අපි දැක්කේ. නමුත් වර්තමාන ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව පත් වීමත් එක්ක මේ රටේ නැවතත් දේශපාලනය, ආර්ථිකය සහ ස්ථාවරභාවය ගැන විශ්වාසයක් සෑම ක්ෂේත්‍රයක් තුළම අපි නිර්මාණය කරමින් ඉන්නවා.

ඒකේ ප්‍රතිඵලයක් විධියට පසුගිය දවසක එළියට ආපු මේ රටේ පළමු කාර්තුවේ ආර්ථිකය සම්බන්ධ ඉලක්කම් සහ සංඛ්‍යා ලේඛන ගත්තත් අපි දැක්කා, ඒ කාර්තුවේ ඉලක්ක පසු කරගෙන ගිහිල්ලා සෑම ක්ෂේත්‍රයකම වර්ධනයක් අත්පත් කර ගන්න පුළුවන්කමක් ලැබිලා තිබෙන බව. උදාහරණ විධියට ගත්තොත්, ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ පළමු කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 4.8ක්ව තිබියදී, මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රයේ සියයට 9.7ක වර්ධනයක්, සේවා ක්ෂේත්‍රයේ සියයට 2.8ක වර්ධනයක් අත්පත් කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ප්‍රාථමික ගිණුමේ ශේෂයත් අපි රුපියල් බිලියන 167කින් වැඩි කරගෙන තිබෙනවා. සංචාරකයන්ගේ පැමිණීමත් සියයට 14.8කින් වැඩි කරගෙන තිබෙනවා. විදේශ සේවා නියුක්තිකයන්ගේ -පිටරට ගිහිල්ලා රැකියා කරන අයගේ- විදෙස් ප්‍රේෂණත් සියයට 18.2කින් වැඩි කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒක ලොකු අගයක්. ලෝකයේ වෙනත් රටවල් එක්ක ගත්තාම මේ ප්‍රතිශත පොඩි අගයන් වෙන්න පුළුවන්. නමුත් අපේ රට තිබුණු තත්ත්වය, අපේ රටේ ආර්ථිකය ගැන තිබුණු අස්ථාවරත්වය ඇතුළු මේ සියලු දේවල් දෙස බැලුවාම අපට පේනවා, මේ රට යන්නේ මොන දිශාවට ද, මේ රටේ වර්ධනයක් වෙන්නේ කොහොමද, මේ රටේ ආර්ථිකය ගැන විශ්වාසයක්, ස්ථාවරභාවයක් හැදෙන්නේ කොහොමද කියන එක ගැන ඉතාමත් හොඳ indicator එකක් මේ පළමුවැනි කාර්තුවේ වාර්තා තුළින් අපට පෙන්නුම් කරනවා කියලා. මේක අහම්බෙන් වෙන්නේ නැහැ. ඒ තමයි වැදගත් දේ.

අද දවස පුරාම විපක්ෂයේ මන්ත්‍රීවරුන් කරපු කථාවල අදහස් හා යෝජනා ගත්තාට පස්සේ මට කියන්න තිබෙන්නේ මේකයි. මේ කිසිම දෙයක් අහම්බෙන් වෙන්නේ නැහැ. මේ අවුරුද්දේ පළමු කාර්තුවේ වර්ධනයන් ඇතිවීම, විදෙස් ප්‍රේෂණ වැඩිවීම, සංචාරකයන්ගේ පැමිණීම වැඩිවීම අහඹු සිදුවීම් නොවෙයි. ඒවාට අදාළව ආර්ථික, දේශපාලන, ආරක්ෂක ඇතුළු සියලු ක්ෂේත්‍රවල ස්ථාවරත්වයක් හදන්න ඕනෑ. ඒ ස්ථාවරත්වය තමයි මේ ආණ්ඩුව හදලා තිබෙන්නේ. ඒක ඇතුළේ තමයි මේ දේවල් සිද්ධ වෙමින් තිබෙන්නේ. මේ සියලු ක්ෂේත්‍රයන්ගේ වර්ධනයක් සිද්ධ වෙමින් තිබෙන්නේ ඒක ඇතුළේ. ඒක පසුගිය මාස 8ක, 9ක කාලයක් තුළ අපට ගන්න පුළුවන් වෙච්ච හොඳ ආරම්භයක්. ඒක හොඳ signal එකක්. මේ රටේ ව්‍යාපාරිකයන්ට වාගේම ආයෝජකයන් ඇතුළු සියලුදෙනාට පෙනෙනවා, මේ රටේ ආර්ථිකය යන්නේ ඉදිරියට කියලා. මේ රටේ යම් අස්ථාවරත්වයක් තිබුණා තමයි. හැබැයි, දැන් ඒක යම්කිසි ආකාරයකට ස්ථාවර වෙලා ඉදිරියට යනවා කියන සංඥාව - signal එක - අපට දෙන්න පුළුවන් වෙලා තිබෙනවා. අපි හිතනවා, ඒක ලොකු ජයග්‍රහණයක් කියලා.

ඒ වාගේම අමතක කරන්න එපා, අපේ ආණ්ඩුව මේ ගමන පටන් ගත්තේ කොතැනින් ද කියලා. අපේ ආණ්ඩුව මේ ගමන පටන් ගත්තේ ඉතාමත් අමාරු තත්ත්වයක් යටතේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩ පිළිවෙළට ඇතුළත් වෙලා තියෙද්දී, ආර්ථිකය ගැන තීන්දු-තීරණ ගැනීමේ සියලු ස්වාධීනත්වයන් තව වසර කිහිපයක් යනකම් අපි මේ ව්‍යාපෘතිය ඇතුළේ හිරවෙලා ඉන්නකොට තමයි මේ ආර්ථිකය සම්බන්ධ තීන්දු-තීරණ ගන්නේ. ඒ වාගේම පසුගිය වසර දෙක, තුන තුළ මේ රට බංකොලොත්වීම නිසා විශාල වන්දියක් ගෙවපු ජනතාවක් අපි ඉස්සරහ හිටියේ. සියයට 14ට තිබිච්ච දුප්පත්කම සියයට 25ක්, 26ක් දක්වා වර්ධනය වෙච්ච, දරුවෝ පාසල්වලින් පිටමං වෙච්ච, සාමාන්‍යයෙන් එදිනෙදා තමන් ගනිපු ආහාර රටාවට ආහාර ගන්න බැරි වෙච්ච, මේ රටේ දිළිඳුකම කඩා වැටුණු, හැම තිසේසේම තමන් හිටපු මට්ටමට වඩා කඩා වැටුණු ජනතාවක් ඉන්න රටක් තමයි අපි භාර ගත්තේ. ආර්ථිකයේ ඉලක්කම්, දර්ශක, ස්ථාවරභාවය හදනවා වාගේම ඒ ජනතාවගේ ජීවිතත් දශමයකින් හරි ඉස්සරහට ගන්න ගමන් මේ කටයුතු කරන්න ඕනෑය කියන අභියෝගය අපට තිබුණා. ඒ දෙකම අපි කළ යුතුව තිබුණා. එක පැත්තකින් රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව ආර්ථිකයේ ඉලක්කම් සමහර වෙලාවට ඉස්සරහට ගත්තා නේ. හැබැයි, ගත්තේ කොහොමද? අනෙක් පැත්තෙන් බදු පිට බදු වැඩි කරලා, VAT එක වැඩි කරලා, මේ රටේ අනෙකුත් භාණ්ඩවල මිල ඉහළට යන්න සලස්වා, ඒකට වන්දිය මේ රටේ සාමාන්‍ය මිනිසුන්ට ගෙවන්න සලස්වා තමයි මේ ඉලක්කම් ඉස්සරහට ගත්තේ. අපිත් මේ ඉලක්කම් ඉස්සරහට අරගෙන තිබෙනවා. හැබැයි, මේ රටේ සුබසාධන ක්ෂේත්‍රය සහ මේ රටේ අනෙකුත් සියලු දේවල්, මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය අපි එනකොට තිබුණු තත්ත්වයට වඩා අඟලක්, අඩියක් හරි ඉස්සරහට ගනිමින්, මේ දෙකම එකසැරේ ඉස්සරහට ගනිමින්. ඒක තමයි මේකේ තිබෙන වැදගත්කම. මේකේ බර ජනතාව මත පටවමින් නොවෙයි අපි මේක ඉස්සරහට ගන්නේ. මේ රට බංකොලොත් කරලා, IMF programme එකට ඇතුළු කරපු රටක්, වළකට වැටිච්ච රටක් තමයි අපි භාර ගත්තේ. මේ සියලු දේවල්වලින් පෙන්නුම් කරමින් තිබෙනවා, ඒ වළෙන් අපි ගොඩ එමින් ඉන්නවා කියලා. හෙමින් නමුත් ස්ථාවරව ගොඩ එමින් ඉන්නවා. ඒ නිසා පසුගිය මාස 9ක කාලය සම්බන්ධයෙන් මේ රටේ ආර්ථිකය ගැන අපට සුබවාදී ඇසකින් බලන්න පුළුවන්.

එවැනි තත්ත්වයක් ඇතුළේ තමයි අද දවසේ විපක්ෂයේ විවේචන, කෑ ගැසීම් ඇතුළු ලොකු දේවල් ඔක්කෝම එන්නේ. ඇත්තටම ඒ කථාවලට ඇහුම්කන් දුන්නාම මොකක්ද හිතෙන්නේ? කෝ, ඕගොල්ලන් මොකක්වත් කරලා නැහැ නේ, කරන්නේ නැද්ද, මෙහෙම කරන්න පුළුවන් නේ, හරම කරන්න පුළුවන් නේ කියලා විපක්ෂය දහසක් කථා කියනවා. දහසක් අදහස්, යෝජනා ඉදිරිපත් කරනවා. මේ කථා අහගෙන ඉන්න අපට හිතෙනවා, පසුගිය කාලයේ මේ මහත්වරුම ද මේ රට පාලනය කළේ කියලා. පුදුම විධියට දියුණු අදහස් නේ මේ අයට තිබෙන්නේ? උපදෙස් දීමේ පුදුම හැකියාවක් නේ විපක්ෂයට තිබෙන්නේ? ඔය හැකියාව පාවිච්චි කරලා මේ රට හදන්න තිබුණා නේ. ගිය අවුරුද්ද වෙනකම් මේ රට පාලනය කළේ මේ උදවිය නේ. ඕවා ඒ කාලයේ මතක් වුණේ නැද්ද? ඕවා ඒ කාලයේ මතක් වෙලා, ඔය විධියට තමන් ආණ්ඩු කරද්දී හිතන්න පුරුදු වුණා නම්, එහෙම නම් අපි කාටවත් මේ වළේ වැටෙන්න වෙන්නේ නැහැ නේ.

මෙතැන බොරුවනේ තිබෙන්නේ. මේ කැකෝ ගහනවා, මොකුත් කරන්නේ නැහැ කියනවා, මෙහෙම කරන්න කියනවා. මේවා එහෙම කරන්න පුළුවන් දේවල් නොවෙයි. මේ ආණ්ඩුව යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. ජනාධිපතිතුමාගේ මේ ආණ්ඩුව ප්‍රතිපත්තියකට අනුව තමයි මේ වැඩ පිළිවෙළ කරගෙන යන්නේ. සැරින් සැරේ ඇවිල්ලා, අරකට මෙහෙම කරන්න පුළුවන්, මේකට මෙහෙම කරන්න පුළුවන් කිව්වාට එහෙම කරන්න බැහැ. දීර්ඝ කාලීන, විධිමත් වැඩ පිළිවෙළක මේ ආණ්ඩුව යන නිසා තමයි අපි මේ ප්‍රතිඵල පෙන්වා තිබෙන්නේ. එම නිසා හැම තිස්සේම මේ ආණ්ඩුව ගැන, ආණ්ඩුව ගෙන යන මේ ක්‍රියාවලිය ගැන රටටත්, රටෙන් එළියටත් negative picture එකක් දෙන්න එපා. මේක වෙන්නේ නැහැ,

මේක කරන්නේ නැහැ, මේක හැදෙන්නේ නැහැ වාගේ පින්තූරයක් මවන එක තමයි මේ අය දිගටම කරන්නේ. ඒක වැරදියි.

මම දැක්කා, විපක්ෂයේ ඔක්කෝම ඒක කියනවා. ඒ අස්සේ නාමල් රාජපක්ෂත් කියනවා, ඉදිරියේ මොකක්ද වෙන්නේ කියලා එතුමාටත් පැහැදිලි නැහැයි ලු. ඇත්තටම ඉදිරියේ වෙන්නේ මොකක්ද කියලා එතුමාට පැහැදිලි වෙන්න විධියක් නැහැ නේ. තාත්තලා, බාප්පලා, මාමලා, නැන්දලාගේ පුතාලා ඔක්කෝම එක්ක ආණ්ඩුවක් කරනකොට ඉදිරිය ගැන දශමයකින් හෝ හිතන්න පුළුවන් ද? එහෙම ආණ්ඩුව කරගෙන ගිහිල්ලා 2022දී මුහුණ බිත්තියේ හැප්පෙන තෙක් මොකුත්ම දැක්කේ නැහැ නේ. මුහුණ බිත්තියේ හැප්පෙන තෙක් මොකුත් කරන්නත් බැරි වුණා නේ. ඒකටනේ මේ රටේ මිනිසුන් අදටත් වන්දි ගෙවන්නේ. ඒගොල්ලන්ට ඉදිරිය පෙනෙන්නේ නැහැ තමයි. ඒගොල්ලන්ට ඉදිරිය නොපෙනුණු නිසා තමයි මේ රටේ මිනිස්සු අපට ඉදිරිය දකින්න පුළුවන් කියලා විශ්වාස කරලා මේ ආණ්ඩුව භාර දුන්නේ. මේ ජනාධිපතිතුමාව පත් කළේ. ඒ වගකීම තමයි දැන් අපි මේ ඉටු කරමින් ඉන්නේ. එම නිසා මේ ගෙන යන වැඩ පිළිවෙළ තමන්ගේ හිතට අල්ලන්නේ නැති නිසා විවේචනය කරන්න එපා. ඊට පස්සේ එතුමා කියනවා, මිනිස්සු හිරේ දැම්මා කියලා ආයෝජකයෝ එන්නේ නැහැයි ලු. කවුරු ගැනද මේ කියන්නේ? මිනිස්සු හිරේ දැම්මා නොවෙයි. හිටපු ඇතැම් දේශපාලනඥයන්ට තිබුණු චෝදනා සම්බන්ධව යම් යම් නඩු තීන්දු හම්බ වෙලා තිබෙනවා. තවත් නඩු ගොනුවෙමිනුත් තිබෙනවා. අපි දකිනවා, එතුමාගේ පවුලේත් සැලකිය යුතු පිරිසකට නඩු ගොනු වනවා; චෝදනා එල්ල වනවා කියලා. ඒක ඉතින්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරන වැඩක් නේ. මේ රටේ මූල්‍ය වංචාවලට සම්බන්ධ මිනිස්සු හිරේ දැම්මාම එතුමා කියනවා, ආයෝජකයෝ එන්නේ නැහැ කියලා. දැන් එහෙම නේ. මූල්‍ය වංචා සම්බන්ධවනේ හිටපු ඇමතිලා, මන්ත්‍රීතුමන්ලා දැනට හිරේ ගිහින් තිබෙන්නේ, චෝදනා ගොනුවෙමින් තිබෙන්නේ. මේ රටට ආයෝජකයෝ නොඑන්නේ ඇයි? මේ රටේ පවතින යථාර්ථය මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා, ජාතික පුවත් පතක පළ වෙච්ච ලිපියක්. මෙම ලිපිය මම මීට කලින් වතාවකත් පාර්ලිමේන්තුවේදී සභාගත කළා. එම නිසා මා නැවතත් එය සභාගත කරන්නේ නැහැ. මේ, ලංකාවේ අවුරුදු තුනක් හිටපු ජපන් තානාපතිතුමා මේ අවුරුද්දේ ජනවාරි මාසයේ තමන්ගේ සේවා කාලය අවසන් වෙලා යද්දී ලංකාවේ පුවත් පතකට දීපු interview එකක්. ඒකේ headline එක තිබෙන්නේ මෙහෙමයි: "There are cases where SL politicians seek benefits for their interests - outgoing Japanese ambassador". එම interview එකේදී එතුමා විස්තර කරලා කියනවා, ලංකාවේ දේශපාලනඥයෝ තමන් එක්ක ගනුදෙනු කරද්දී ඔවුන්ගේ වාසියට කොහොමද කටයුතු කළේ කියලා. පගා ඉල්ලපු හැටි, කප්පම් ඉල්ලපු හැටි, ඒක තමන්ගේ රටේ කොම්පැනිවලට කොයි තරම් අසීරු වුණාද කියලා එතුමා කියනවා. එතකොට ඒ ජපානයම තමයි අපේ ජනාධිපතිතුමා පත් වෙලා මාසයක් ඇතුළත නැවතිලා තිබුණු JICA projects 13ක් පටන් ගන්න එකඟ වෙන්නේ. එම ව්‍යාපෘති දෙකක වැඩ මේ වන විට ආරම්භ කරලාත් තිබෙනවා. හොරු හිරේ දැම්මා කියලා ආයෝජකයෝ එන්නේ නැහැ කියනවා තමයි. නමුත්, මේ දේවල් කළේ නැත්නම් මොකක්ද වෙන්නේ? මේ දූෂිත දේශපාලන ක්‍රමය ලංකාවට ලොකුම බාධාවක් වෙලා තිබුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

මෙතෙක් පැවති දූෂිත දේශපාලන ක්‍රමය නිසා මේ රටේ ආර්ථිකය එක තැන නැවතිලා තිබුණේ. එම නිසා මේක විහිළුවක් නොවෙයි. මේ රටේ ආර්ථිකය නඟාසිටුවීම පැහැදිලිව සම්බන්ධයි, ශිෂ්ට සම්පන්න, දූෂිත නැති ක්‍රමයක් ගොඩනඟන එකට. ඒක තමයි අපි මේ කරමින් ඉන්නේ. ඒක නිසා තමයි මේ දේවල් වෙමින් තිබෙන්නේ. දැන් කියනවා, අපි ආපු ගමන් IMF එක එළවනවා කිව්වා ලු. ඔල්මාදේද දන්නේ නැහැ. කොහේද එහෙම කියලා තිබෙන්නේ? එහෙම එළවන්න පුළුවන්ද, රට තිබුණු තත්ත්වය ඇතුළත? IMF එකත් එක්ක වැඩ කරන හැටි, negotiate කරන විධිය, මේ රටේ ජනතාවගේ පැත්තෙන් හිතලා IMF එකත් එක්ක ගනුදෙනු කරන්නේ කොහොමද කියලා තමයි අපි කිව්වේ. දැන් මේ විකාර කියවනවා. මට තේරෙන්නේ නැහැ, මොනවා නිසා මෙහෙම කියනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ආර්ථිකය ඉස්සරහට යනවා. මේ රටේ මිනිස්සු මේ රට අපට භාර දුන්නේ මේ තිබෙන තත්ත්වයෙන් මුදාගෙන රට ඉස්සරහට අරගෙන යන්න. මේ මූල්‍ය සැලැස්ම ඇතුළේ ඒකට ස්ථාවර වැඩ පිළිවෙළක් අපට තිබෙනවා. අපි මේ රට ගොඩනඟමින් ඉන්නේ. ඒ නිසා මේකට හුල්ලන්න එපා. මේක බලාගෙන ඉන්න. මොකද, මේක බලාගෙන ඉන්න එක විතරයි ඔබතුමන්ලාට කරන්න පුළුවන්. ඒ බලාගෙන ඉන්න වෙන්නේ ගෙදර ඉඳගෙනද, නැත්නම් හිර ගෙදරක ඉඳගෙනද කියලා අපිත් බලාගෙන ඉන්නවා. ඒ නිසා බලාගෙන ඉන්න. මේ රටේ ආර්ථිකය අපි හදලා පෙන්වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් වෙන්වී තිබෙනවා.

[අ.භා. 4.08]

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමන් විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලද පරිදි මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026 පිළිබඳව ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් වූ විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මා සතුටු වනවා. මෙම යෝජනාව ඉදිරිපත් කරද්දීම ගරු කෞශල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා වාගේම ගරු ඇමතිතුමාත් ප්‍රකාශ කළා, ඊළඟ අය වැය ඉදිරිපත් කිරීමට පෙර මේක නීතිමය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමක් බව.

නමුත්, අපි දිගටම දැකපු කාරණය තමයි, විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ නීතිමය අවශ්‍යතාව - නීතිමය කාරණය - පසෙකලා තමන්ගේ දේශපාලන කාරණා ඉදිරිපත් කරමින්, ආණ්ඩුවට මඩ ගහමින් තමන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීම. ඒක තමයි අපට දිගින් දිගටම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් දකින්න පුළුවන්කම

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

ලැබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි අවශ්‍යතාවක් රටේ නිර්මාණය වෙන්න බලපෑ මූලික කාරණා කිහිපයක් පසුගිය පාලන කාල වකවානු තුළ අපේ රටේ මතු වෙලා තිබුණා. ඒ පසුගිය පාලනයන් විසින් අපේ රටට කරන ලද විනාශය, වැරැද්ද නිවැරදි කිරීම සඳහා වන මැදිහත් වීම තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට අපි මේ මොහොතේදී සිදු කරමින් තිබෙන්නේ. විශේෂයෙන් අපට රටක් ලෙස, ආර්ථිකයක් ලෙස පසුගිය කාල වකවානු තුළ දකින්න ලැබුණු කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි, මූල්‍ය විනය පිළිබඳ ප්‍රශ්නය. මූල්‍ය විනය පිළිබඳ බරපතළ ගැටලු අපේ රටේ නිර්මාණය වුණා. එක් පැත්තකින් ජාතික වශයෙනුත්, අනෙක් පැත්තෙන් ප්‍රාදේශීය වශයෙනුත් පැවැති පාලනයන් තුළ මේ මූල්‍ය විනය පිරිහීම සහ මූල්‍ය අවභාවිතය ඉහ වහා ගිහිල්ලා තිබුණා. ඒක මහ බැංකු හොරකමේ සිට -මහ බැංකුවේ මුදල් වංචා කිරීමේ සිට; මහ බැංකු සංචිත වංචා කිරීමේ සිට- දකින්න ලැබුණා. අපේ රටේ විගණකාධිපතිතුමා එක මොහොතක කියනවා, එක් වසරක අපේ රටේ ප්‍රාග්ධනය වෙනුවෙන් වෙන් කර තිබුණු රුපියල් බිලියන 11ක මුදල වියදම් කරලා අවසානයේ නැවත විගණනය කරද්දී වත්කම් ලෙස හමු වුණේ රුපියල් බිලියන 1.8ක විතර ප්‍රමාණයක් -රුපියල් බිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක්- කියලා. එතරම් බරපතළ මූල්‍ය පිරිහීමක් අපේ රට තුළ දිගින් දිගටම, දිගින් දිගටම පසුගිය පාලනයන් තුළ දකින්න තිබුණා. ඒක එක් කාල වකවානුවක සිදුවීමක්. එහෙම ගලා ඒමක් තුළ තමයි අපට ඒ පිරිහීම දකින්න පුළුවන්කම ලැබෙන්නේ. එවැනි ලක්ෂණ අපට සෑම පාලනයක් තුළම දකින්න පුළුවන්කම තිබුණා.

එතැනින් එහාට ගිහින් අපේ රටේ ප්‍රාදේශීය සභාවක් ගත්තත්, ඒ ප්‍රාදේශීය සභාව තුළ මුදල් -රාජ්‍ය මුදල්; ප්‍රාදේශීය සභාවේ මුදල්; ජනතා මුදල්; මහජන මුදල්; බදු මුදල්- වියදම් කරද්දී ඔවුන් එළිපිට කථා කරන්න පටන් ගත්තා, සෑම ව්‍යාපෘතියකින්ම සියයට 5ක් ගන්න ඕනෑ කියලා. මන්ත්‍රීවරයාට සියයට 5ක කොමිස් එකක් ගන්න ඕනෑ කියලා ප්‍රකාශ කළා. ඒ තරම් මේ මූල්‍ය විනය පිරිහිලා තිබුණේ. ඒ නිසා අපේ රටට නැවත ප්‍රතිසංස්කරණයක් වුවමනා වෙලා තිබුණා. අන්න ඒ ප්‍රතිසංස්කරණීය අවශ්‍යතාව තමයි ආණ්ඩුවක් ලෙස අපි මේ ඉෂ්ට කරන්න සූදානම් වෙලා තිබෙන්නේ. අපි මේ කරමින් ඉන්නේ ඒ කාර්යයයි. එක පැත්තකින් මේ මූල්‍ය විනය පිරිහීම වාගේම අනික් පැත්තෙන් අපේ රටේ විනිවිදභාවය පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ආණ්ඩුව කරන්නේ; රාජ්‍යය කරන්නේ මන්ත්‍රීවරු. තමන් බලය පවරපු ඒ රාජ්‍ය තාන්ත්‍රිකයින් කරන්නේ මොනවාද කියලා රටේ ජනතාව දන්නේ නැහැ. ජනතාවට සඟවලා ජනතා මුදල්, ජනතා දේපළ අවභාවිත කරපු පාලනයක් තමයි අපි පසු කර ඇවිත් තිබෙන්නේ. එක් පැත්තකින් එහෙම ලක්ෂණ තිබුණා.

අනික් පැත්තෙන්, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ප්‍රශ්න තිබුණා. ඒවා බරපතළ ගැටලු. ප්‍රජාතන්ත්‍රවාදයේ අංශ ගොඩක් තිබුණා. එකක් තමයි, පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්න. ජනතාවට නිදහසේ ජීවත් වීම සඳහා වන අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් අපේ රටේ තිබුණා. ඒ වාගේම ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය බරපතළ විධියට අවභාවිත කර තිබුණා. ප්‍රජාතන්ත්‍රවාදයේ ආර්ථික ක්ෂේත්‍රය බරපතළ විධියට අවභාවිත කර තිබුණා, පාලකයින්, එහෙම නැත්නම් බලධාරීන් විසින්. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ගිලිහුණු - අහිමි වුණු - ජනතාවක් අපේ රටේ හිටියා. ඒක අපේ ආර්ථිකයට බරපතළ ලෙස බලපෑවා. ජනතාව ආර්ථිකයෙන් පිටමං වෙලා හිටියේ; පිටමං කරලා හිටියේ. ඒක අනික් පැත්තට ආර්ථිකයේ වර්ධනයට බලපානවා. එහෙම විනාශයක් අපේ රටේ සිද්ධ වෙමින් තිබුණා. ඒ, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්න.

ඊළඟ එක තමයි, තොරතුරු පිළිබඳ ප්‍රශ්න. අපේ රටේ තොරතුරු පිළිබඳව බරපතළ විධියේ ගැටලු ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබුණා. මොකද, ඒ තොරතුරු නිරවද්‍ය නැහැ කියන බරපතළ ගැටලුව අපේ රටේ නිර්මාණය වෙලා තිබුණා. මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙක් හෝ අමාත්‍යවරයා එක මොහොතක ප්‍රකාශ කළා, ආර්ථික වර්ධන වේගය ඔහුට ඕනෑ විධියට හදන්න ඕනෑ කියලා. ඔබට ඒ ගැන මතක ඇති. ඔහු නිශ්චිත ඉලක්කමක් කියලා කිව්වා, මේකට ආර්ථික වර්ධන වේගය සකස් කරලා දෙන්න කියලා. ඒ මට්ටමට අපේ රටේ තොරතුරු පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙලා තිබුණා. රාජ්‍ය තොරතුරු නිරවද්‍ය නැහැ. ඒක අපට ආණ්ඩු බලය ගත්තාට පසුවත් බරපතළ ලෙස දැනෙන්න පටන්ගෙන තිබුණා. සැලසුම්කරණයට යද්දී, රාජ්‍ය යන්ත්‍රණයේ තිබෙන තොරතුරු අරගෙන දේවල් සැලසුම් කරන්න යද්දී, රාජ්‍ය නිලධාරින්ගේ පැත්තෙන්ම ආපු කාරණයක් තමයි, දැනට අපි ළඟ තිබෙන තොරතුරු සියයට 70ක් විතර බොරු, නිරවද්‍ය නැහැ කියන එක. ඒ නිසා නැවත අලුත් තොරතුරු මත මේවා සැලසුම් කරනවා මිස මේ තිබෙන තොරතුරු මත සැලසුම් කරලා අපට ඉදිරියට යන්න බැහැ කියන එක ඒ සමහර නිලධාරින් අපට කියන්න පටන් ගත්තා. එවැනි තත්ත්වයකට අපේ රට ඇද වැටිලා තිබුණා. එවැනි ගමන් මඟක ඇවිල්ලා තමයි, මෙවැනි ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න පටන් ගන්නේ, අපි බලය ගන්න වේලාව වෙනකොට. විශේෂයෙන් 2022 අවුරුද්දෙන් පසුව. 2022 අවුරුද්දට පසු අපේ රට බරපතළ ආර්ථික කඩා වැටීමකට ලක් වෙන්නේ මෙවැනි ගමන් මඟක් තුළ අපේ රටේ පාලනයන් ඉදිරියට ආපු නිසායි. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි මේ ආර්ථික කඩා වැටීම අපට හමු වෙන්නේ. එවැනි පාලනයක් අවසන් කරලා නව පාලනයක් ස්ථාපිත කළාට පස්සේ ඒ අලුත් පාලනයට, අලුත් ආණ්ඩුවට, අලුත් රාජ්‍යයට පැවරෙන කාර්යය තමයි, මේ නිරවද්‍ය නොවන රාජ්‍යය නැවත නිවැරදි රාජ්‍යයක් බවට පත් කරන එක. නිරවද්‍ය නොවන රාජ්‍යය නැවත නිවැරදි රාජ්‍යයක් බවට පත් කිරීම අපට පැවරෙන - අපේ ආණ්ඩුවට පැවරෙන - කාර්යයක්. අන්න, ඒ අවශ්‍යතාව ඉෂ්ට කිරීමේ මූලික ක්‍රියාදාමයන්ගෙන් එකක් ගැන තමයි, අපි අද මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරමින් ඉන්නේ. ඒ වාගේම අපේ ආර්ථික ගමන් මඟ, එහෙම නැත්නම් අපේ ආර්ථික සැලසුම් ඉදිරියට අරගෙන යද්දී, වාර්ෂිකව ඉදිරිපත් කරන අය වැය ප්‍රකාශය සකස් කරද්දී, ඒ අය වැය ප්‍රකාශය කුමන ආකාර විය යුතුද කියන එක පිළිබඳව තමයි අප අද මේ කථා කරමින් ඉන්නේ.

විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කථා කරද්දී ඔවුන්ගේ පැත්තෙන් මතු වුණා, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය නිර්මාණශීලී නැහැ කියලා. ඒක නිර්මාණශීලී ප්‍රකාශයක් නොවෙයි. ඒක නීතිමය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමක්. මේකේ නිර්මාණශීලී කටයුත්ත හමු වෙන්නේ අය වැය ඉදිරිපත් කරන වේලාවට. මේක නිර්මාණශීලී ක්‍රියාවලියක් නොවෙයි. මේක පනතට අනුව නීතිමය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමක්. සමහර මන්ත්‍රීවරු ඕනෑම දෙයකට තමන්ගේ මතය ඉදිරිපත් කිරීම සඳහා වචන කීමට හුරු වෙලා සිටිනවා. එවැනි දෙයක් තමයි අපිට අද මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් තුළින් දකින්න ලැබෙන්නේ. තමන්ගේ අරමුණු ඉෂ්ට කර ගන්න බැරි වෙච්ච පාපයට සමහර මන්ත්‍රීවරු කන්ටේනර්වල එල්ලිලා ඉන්නවා. මාස ගණනාවක් තිස්සේ එක මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේදී කථා කරන්නේ කන්ටේනර් 323 ගැන. ඇත්තටම මට හිතෙන විධියට එතුමාට තිබෙන්නේ කන්ටේනර් 323 එළියට යෑම ගැන ප්‍රශ්නයක් නොවෙයි. කන්ටේනර් එක්ක තිබෙන ප්‍රශ්නයක් තමයි මම හිතන විධියට එතුමාට තිබෙන්නේ. එතුමාගෙන් වචනයක් පිට වුණොත් ඒ තුළ තිබෙන්නේ කන්ටේනර් ගැන. ඒ, එක මන්ත්‍රීවරයෙක්.

තව මන්ත්‍රීවරයෙක් කියනවා, මේවා නිර්මාණශීලී නැහැ කියලා. එතුමා හිතනවා, එතුමා තමයි මාර නිර්මාණශීලීයා කියලා.

එතුමා මගේ වම් පැත්තෙන් ඉන්නවා. ඊට පස්සේ තව මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කරනවා, නඩු ගැන. එතුමාට තිබෙන ප්‍රශ්නය තමයි, නඩු. පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන්නේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයක්ද, අය වැය ද එහෙම නැත්නම් වෙන පනතක්ද කියන එක එතුමාට අදාළ නැහැ. එතුමාට අදාළ වෙන්නේ වෙන මුකුත් නොවෙයි. එතුමාට අදාළ වෙන්නේ නඩු. ඒකට හේතුව තමයි, එතුමාට බලපාන නඩු ප්‍රමාණයක් එළියේ තිබෙන එක. ඒ නඩුවලින් නිදහස්වීම වෙනුවෙන් මොනවා හෝ මතයක් සකස් කිරීම සඳහා වන කරුණු ඉදිරිපත් කරමිනුයි එතුමා ඉන්නේ. එවැනි කරුණු තමයි මේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඉදිරිපත් කරමින් සිටින්නේ. ඒ නිසා අපි හිතනවා, අපේ ආණ්ඩුවේ මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය කියන්නේ නෛතික අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම කියලා. ඒ මත පදනම්ව මේ රට වෙනස් කරලා, අලුත් දිශාවකට රැගෙන යන වැඩ පිළිවෙළ අපි සහතික වශයෙන්ම ඉදිරියට අරගෙන එනවා. ඒ මත පදනම්ව අපි මේ රට ඉතිහාසයේ අලුත් පරිච්ඡේදයක් කරා ගමන් කිරීම ආරම්භ කරනවාය කියා ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

ගරු ඇමතිතුමාගේ කථාව අවසන් කිරීමට පස් වරු 4.45 දක්වා කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමා කථා කරන්න.

[අ.භා. 4.19]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඇත්තවශයෙන්ම 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන අනුව - එහි වගන්තියකට අනුව - ජුනි මාසයේ 30වැනි දිනට කලින් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ අනුව තමයි මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබුවේ. හැබැයි මෙහි අන්තර්ගතය, මෙහි ක්‍රමෝපාය, ඒ ක්‍රමෝපාය අනුව රාජ්‍ය ආදායම් කළමනාකරණය කිරීම, රාජ්‍ය ආදායම සොයා ගැනීම, රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම, අය වැය පරතරය අඩු කිරීම, රාජ්‍ය ආදායම් සහ වියදම් කළමනාකරණයේදී ඇති විය හැකි අවදානම් තත්ත්වයන් පාලනය කර ගැනීම කියන කාරණා ඉදිරිපත් කිරීම තුළින් අපි නිරන්තරයෙන්ම මතු කරපු අවශ්‍යතාවක පදනම සකස් කර දෙනවා. මේ රට අපට භාර ගන්න සිදුවුණු වෙලාවේ, රට පත් කර තිබුණු තත්ත්වයෙන් ඉදිරියට අරගෙන එනකොට මුහුණ දෙන අභියෝගයේදී අපට තිබුණු පළමු කඩඉම, නැත්නම් අභියෝගය බවට පත් වෙන්නේ මේ ස්ථායීකරණය සිද්ධ කරගන්නේ කොහොමද කියන කාරණයයි.

අපේ රටේ දේශපාලන ඉතිහාසය අරගෙන බැලුවොත් අපි දන්නවා, මේ වපසරිය ඇතුළේ විශේෂයෙන් රාජ්‍යය මැදිහත් වීමේදී මූල්‍ය විනය, පාරදෘශ්‍යභාවය, යහපත් ආණ්ඩුකරණය, වගවීම, ඒ වාගේම වංචාවෙන්, දූෂණයෙන් තොර පාලනය කියන මෙන්න මේ කාරණා වචනවලට විතරක් සීමා වෙලා තිබුණු කාලයක් තමයි තිබුණේ කියන එක. ඒ වාගේම මිනිස්සු ඒ වචන හැල්ලුවට ලක් කළා, උසුළු විසුළු කරන තත්ත්වයට පත්වෙලා තිබුණා. ඒ නිසාම තමයි සමහර ආණ්ඩුවලට "යහ පාලන ආණ්ඩු" කියලා නම වැටුණේ. යහ පාලනය කියන්නේ යහපත් ආණ්ඩුකරණය; හොඳ දෙයක්. හැබැයි, යහපත් ආණ්ඩුකරණය ඇතුළේ සිද්ධ කරපු ක්‍රියා නිසා සමාජයේ නම් පටබැඳුණා, වංචාවෙන්, දූෂණයෙන් පිරුණු පාලනයන් තමයි යහ පාලන ආණ්ඩු කියන්නේ කියලා. එවැනි තත්ත්වයක් තුළ තමයි අපට මේ අභියෝගය භාර ගන්න සිද්ධ වුණේ.

එම අභියෝගය භාර ගන්න කොට අපට කවුරුන් හෝ පිටස්තර පාර්ශ්වයකින් කිසිවක් නැතත්, අණපනතක් මඟින් ඉදිරිපත් කර තිබුණත් නැතත්, අපේ වගකීම, වගවීම තමයි මේ ස්ථායීකරණය ඇතුළේ නිවැරදි මූල්‍ය විනයක් පවත්වාගෙන යෑම. ඒ නිසා මේ අණපනත් එකක්වත් නොතිබුණත් බදු මුදල් වශයෙන් මහජනතාවගෙන් එකතු කර ගන්නා සෑම ශතයක්ම, සෑම රුපියලක්ම අපි ඉතාම වගවීමෙන් කළමනාකරණය කරනවා. නමුත් ආණ්ඩුවක් තුළ වැඩකටයුතු කිරීමේදී අදාළ රාමුව අපට අවශ්‍ය වෙනවා. ඒකයි මම කියන්න උත්සාහ කළේ. අපි ආණ්ඩු කරන්න කලින් පවා අපේ භාවිතය තමයි, වංචාවෙන්, දූෂණයෙන් තොර පාලනය, යහපත් ආණ්ඩුකරණය, මහජනතාව වෙනුවෙන් වගවීම සහ පාරදෘශ්‍යභාවය. ඒ යථාර්ථය ඇතුළේ අපි ආණ්ඩුව ලබා ගන්නකොට වැඩසටහනක් නිර්මාණය වෙලා තිබුණා. විපක්ෂයේ සිටින කණ්ඩායම් විවිධ තර්ක ඉදිරිපත් කරමින් කරුණු කාරණා ඉදිරිපත් කළත්, ඔවුන්ගේ කාල පරිච්ඡේදවල මෙවැනි අර්බුදයකට මුහුණ දෙන්න වුණේ නැහැ. රට පාලනය කරගෙන ඇවිල්ලා ඔවුන් විසින්ම; ඔවුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන්ම රට අර්බුදයට පත් කරලා තිබුණා. හැබැයි, ඔවුන්ට ඒ අර්බුදයේ ගති ලක්ෂණ, විශේෂයෙන් 2010න් පස්සේ, ඒ වාගේම 2015දී ආර්ථික දත්තවලින් පෙන්නුම් කළා. විදේශ සංචිත අඩු වන හැටි, ආර්ථික වර්ධන වේගය අඩු වන හැටි, ණය බර වැඩි වන හැටි පෙන්නුම් කළා. නමුත් කිසිම වගවිභාගයකින් තොරව රාජ්‍ය මුදල් අවභාවිත කරමින් ඔවුන් මේ රට මේ අනතුරට ඇද වැට්ටුවා. හැබැයි, එතැනදී ඔවුන්ට තනිවම නැඟිටින්න බැරි වුණා. ඒ නිසා තමයි රට බංකොලොත්භාවයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනක් ඇවිල්ලා, ඔවුන් මේ රාජ්‍ය තන්ත්‍රය අත්අඩංගුවට අරගෙන යම් වැඩ පිළිවෙළක් සකස් කළේ. ඒ වැඩ පිළිවෙළ ඇතුළේ මූල්‍ය විනය ඇති කරමින් ඉදිරියට යෑමේදී යම් ප්‍රතිසංස්කරණ සහ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා, අණපනත් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ආණ්ඩු බලය ලබා ගන්නකොට, ඒ වැඩසටහන යම් තාක් දුරකට ඇවිල්ලා තිබුණා. ක්‍රමවත්, විධිමත් මූල්‍ය විනය අනුගමනය කරන පක්ෂයක් විධියට අපි ඒ ස්ථාවරත්වය ඇතුළේ ඒ වැඩසටහන නිවැරදිව ඉදිරියට කළමනාකරණය කිරීමට තමයි මේ කටයුත්ත කළේ.

විපක්ෂයෙන් අදහස් ඉදිරිපත් කරපු ගොඩක් අයට ඇත්තටම මේ තත්ත්වය දරාගන්නට ටිකක් අපහසුයි. මොකද, ඔවුන් දන්නවා, ජාතික ජන බලවේගයේ දේශපාලනය විසින් රට ස්ථාවර කළාට පසුව දශක ගණනාවක් තිස්සේ විනාශ වී තිබුණු ආර්ථිකය අපි ක්‍රමයෙන් වර්ධනය කර, රටක් විධියට පොහොසත්වීමට

[ගරු අනිල් ජයන්ත මහතා]

අමතරව ජාත්‍යන්තර වශයෙනුත් ඉහළ තලයකට ආර්ථිකය ඔසවමින් යන බව. ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රධානම දේ තමයි ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කැඳවීම. ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කැඳවීමේ පරිසරය අපි නිර්මාණය කර තිබෙනවා. මෙන්න මේ අභියෝගයට දේශපාලන වශයෙන් මුහුණ දෙන්න බැරි නිසා, බොහෝ දුරට පාර්ලිමේන්තුව ඇතුළතදී ඔවුන් රටේ සිද්ධ වෙන දේවල්, නැති දේවල් කියමින්, අලුත් ප්‍රවෘත්ති නිර්මාණය කරමින් විකෘති කතන්දර සමාජගත කරන්න බොහෝ දුරට උත්සාහ කරනවා. ඒක ඒගොල්ලන්ගේ දේශපාලන උපක්‍රමය විය හැකියි. අපි මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කළාම මෙහි ඇතුළාන්තයේ තිබෙන ප්‍රධාන කාරණා සාකච්ඡා කරනවා වෙනුවට බය නිර්මාණය කිරීම, අවිනිශ්චිතතාව නිර්මාණය කිරීම පිළිබඳ කරුණු කාරණා විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් සිදු කළා.

එයින් එක් කාරණයක් තමයි, ණය. ඉතා විශාල ණය ප්‍රමාණයකට යනවා, කළමනාකරණය කරගන්න බැරි වෙයි, ගෙවන්න බැරි වෙනවා, ණය පිළිබඳව සැලැස්ම ඉදිරිපත් කර නැහැ යනාදී වශයෙන් කියනවා. නමුත් ඒ පිළිබඳව වන සැලැස්ම, ක්‍රමෝපාය, උපාය මාර්ග සංඛ්‍යා දත්ත වශයෙන්, ලේඛන වශයෙන් අපි ඉතාම නිවැරදිව ඉදිරිපත් කර තිබෙනවා. මෙම ප්‍රකාශයේ පිටු අංක 05 තුළ සඳහන් පළමුවෙනි වගුවෙන් දක්වා තිබෙන්නේ එම උපාය මාර්ගවලට වන ප්‍රවිෂ්ටයයි; ඉලක්කයයි. මේවා පවතින තත්ත්වය යටතේත්, ආර්ථික උපකල්පන මතත් තමයි හදා තිබෙන්නේ. එතැනදී බලා ගන්න පුළුවන් වන ප්‍රධානම කාරණය තමයි ප්‍රාථමික ශේෂය. ප්‍රාථමික ශේෂයෙන් කියන්නේ, පොලිය හැර ආණ්ඩුවේ වියදම්, ඒ කියන්නේ පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම්. අපි ඉදිරිපත් කර තිබෙන නිර්ණායක තුළ ඒ ප්‍රමාණය 2022දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2ක් වශයෙන් හා ඉන් අනතුරුව සියයට 2.3කට ඇවිල්ලා 2029-2030 වෙනකොට සියයට 2.4ක ස්ථාවරයකින් පවත්වා ගෙන යනවා. මේකෙන් මොකක්ද අදහස් කරන්නේ? ප්‍රාථමික ශේෂය මෙසේ ස්ථාවරත්වයට ගෙන ඒමෙන් ආණ්ඩුව ණය ලබා ගැනීමේ සීමාව අපි අවම කර තිබෙනවා. ඒවා ගැන තමයි තිබෙන දත්ත අනුව ගැඹුරට ගිහිල්ලා විශ්ලේෂණය කරලා, වාද විවාද කළ යුතු වන්නේ.

මම මෙතැනදී උදාහරණයක් දක්වන්නම්. මේ ඉලක්කය ඇතුළත 2025 වර්ෂයේදී අපි 2.3ක ප්‍රාථමික ශේෂයට යනකොට, අපිට අය වැය පරතරයක් නිර්මාණය වෙනවා, රුපියල් බිලියන 2,200ක. ඒ වාගේම ගත් ණය ආපසු ගෙවන්න තිබෙනවා, රුපියල් බිලියන 1,600ක. ඒ වාගේම භාණ්ඩාගාර බැඳුම්කර බිල්පත් වෙනුවට තවත් බිලියන 200ක ගැළපුම් කරන්න සිද්ධ වෙනවා. ඒ අනුව රුපියල් බිලියන 4,000ක ණය සීමාවක් දමා තිබෙනවා. අන්න ඒ රුපියල් බිලියන 4,000ක ණය සීමාව කළමනාකරණය කර තිබෙන්නේ කොහොමද, ඒ සීමාවට ලබා ගන්නේ කොහොමද, ඒකට මූල්‍යකරණය කරන්නේ කොහොමද, පොලී අනුපාතය පහළට එන්නේ කොහොමද කියන තොරතුරු අය වැය වාර්තාවේත් ඉදිරිපත් කර තිබුණා. ඒකත් අරගෙන බැලුවාම පෙනෙනවා, මේ අය වැය පරතරය පියවනකොට, -අපට අතීතයේ තිබුණු අත්දැකීම තමයි විශේෂයෙන්ම මූල්‍ය වෙළෙඳ පොළෙන් අනවශ්‍ය විධියට විදේශීය ණය ගැනීමේදී අධික පොලියට ණය ලබා ගැනීම නිසා පොලී හිරවීමක් වුණු බව. අපිට ඒගොල්ලන්ගේ ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්නත් වෙනවා. නමුත් අපි 2025දී මේ තත්ත්වය කළමනාකරණයට ලක් කර තිබෙනවා. අර රුපියල් බිලියන 2,200 තුළ ඇත්තවශයෙන්ම විදේශීය ණය ගන්නේ රුපියල් බිලියන 125යි. දේශීය වෙළෙඳ පොළෙන් තමයි බිලියන 2,175ක් ලබා ගන්නේ. එයින් අදහස් කරන්නේ මොකක්ද? අපි දේශීය වශයෙන් මේ ණය කළමනාකරණය කරනවා. ණය බර ක්‍රමිකව පහළට ගෙන ඒම තමයි මෙයින් අදහස් කරන්නේ. ඒ වාගේම තමයි ණය ආපසු ගෙවීමේදී රුපියල් බිලියන 1,600න් සැලකිය යුතු ප්‍රමාණයක්; රුපියල් බිලියන 680ක් විදේශීය ණය ගෙවා දමනවා.

මේ කරුණු ඉදිරිපත් කිරීමේදී ණය සම්බන්ධයෙන් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් වැරදි තොරතුරු ඉදිරිපත් කළා. 2025 ණය සම්බන්ධයෙන් රවී කරුණානායක මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කිරීමේදී ණය වැඩිවීමක් ගැන සඳහන් කළා. ඒක වැඩිවීමක් නොවෙයි. එතුමා කිව්වා, ණය රුපියල් බිලියන විසිනවදහස් ගණනකින් වැඩි වෙලා කියලා. විසිනවදහස් ගණනක වැඩිවීමක් නොවෙයි, විසිනවදහස් ගණනට ඇවිල්ලා තිබෙනවා. මම හිතනවා ඒක හරි කියලා. ඇත්තටම ඒ විසිනවදහස් ගණනට ආපු එක, ප්‍රමාණාත්මක වැඩිවීමක් නොවෙයි සංඛ්‍යා දත්ත ගෙන බැලුවාම. 2023දී තිබුණු මධ්‍යම ආණ්ඩුවේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 28,695යි. 2024 අග වෙනකොට අපේ ආණ්ඩුවත් බලයට ඇවිල්ලා මාස කිහිපයකට පසුව එය රුපියල් බිලියන 28,738කට වැඩි වෙලා තිබෙන්නේ. ඒ වාගේම 2025 මැයි මාසයේ අග වෙනකොට බිලියන 29,898ක් තිබුණා.

ඒකේ යම්කිසි ප්‍රමාණයක් විදේශ විනිමය අනුපාතය එහා මෙහා වීමෙනුත් එකතු වෙලා තිබෙනවා කියලා අපි පිළිගන්නවා. හැබැයි, ඒ විදේශ විනිමය අනුපාතය ඉහළ පහළ යෑම, ඒ විචලනය - volatility එක - විශාල එකක් නොවෙයි. එය, රුපියල් 299, 301, 302 වෙන්න පුළුවන්. හැබැයි, අපි ආණ්ඩුව ගන්නකොටම හදලා තිබුණේ ඩොලරයේ අගය රුපියල් 320, 325, 340, 400 දක්වා ඉහළ යනවා කියන මතයයි. අපි අන්න ඒ tension එක පොඩ්ඩක් පහළට ගෙන ආවා. ඒ කියන්නේ, විදේශ විනිමය අනුපාතය යම් ආකාරයකට කළමනාකරණය කිරීමක් එහිදී සිදුව තිබෙනවා.

අපි ණය කළමනාකරණය ද සිදු කර තිබෙනවා. නමුත්, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ණය පිළිබඳව කථා කරමින් කිව්වා, අපි ඩොලර් බිලියන 7.3ක ණය අරගෙන තිබෙනවා කියලා. මම දන්නේ නැහැ මේ මොනවා කියනවා ද, මේ දත්ත කොහෙන් ගන්නවා ද, පාර්ලිමේන්තුව ඇතුළේ මෙවැනි ප්‍රකාශ කරන්න පුළුවන් ද කියලා. මොකද, ඒවා ඉතාම වැරැදිසහගත දත්ත.

ආර්ථික වර්ධනය පිළිබඳ කතන්දරයේදීත් අපි මේ අර්බුදකාරී තත්ත්වයෙන් හිමින් ගොඩ එනකොට ඇත්තටම අපට අත් විඳින්න වෙන්නේ කුඩා ආර්ථික වර්ධනයක් තමයි. හැබැයි, ඒ අපේක්ෂාසහගත, ඉලක්කගත වර්ධනයන් අභිභවා යන්න අපේ ආණ්ඩුවට හැකියාව ලැබුණා. විශේෂයෙන්ම ආයෝජන හා වෙළෙඳාමේ ක්‍රියාකාරකම් වැඩි වීම කෙරෙහි බලපානවා, ආයෝජකයන්ගේ විශ්වාසය. අපේ ආණ්ඩුව පත්වීමත් එක්කම එම විශ්වාසය වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපේ රට 2024 වසරේදී සියයට 5ක ආර්ථික වර්ධනයක් අත් පත් කර ගන්නවා. ඔව්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව පුරෝකථනය කරලා තිබුණේ සියයට 3.5ක් වාගේ ප්‍රමාණයක්. නමුත්, ඔවුන් පවා 2024 නොවැම්බර් මාසයේදී ඒ පුරෝකථන වේගයෙන් වෙනස් කළා. පවතින දත්ත, තොරතුරු මත පුරෝකථන වෙනස් වෙනවා. තම පුරෝකථන වෙනස් කරමින් ඒ අය කිව්වා, ආර්ථික වර්ධන වේගය සියයට 4කට වඩා වැඩි ඉලක්කයකට -සියයට 4.5ක ඉලක්කයකට- යන්න අපේ රටට පුළුවන් කියලා. 2024 වසර අවසන් වන්නේ සියයට 5ක ආර්ථික වර්ධන වේගයකින්.

අපි අය වැය සම්මත කර ගත්තේ මේ වසරේ මාර්තු මාසයේදී. ඒ දක්වා අතුරු සම්මත ගිණුමකින් තමයි වැඩ කටයුතු කරගෙන ගියේ. අපි පිළිගන්නවා, වෙන් කර තිබෙන ප්‍රාග්ධන මුදල්, එහෙම නැත්නම් රාජ්‍ය ආයෝජන සැලකිය යුතු ප්‍රමාණයක් වියදම් වෙලා නැති බව. එහෙත් අපට හැකියාව ලැබුණා මේ අවුරුද්දේ

පළමුවෙනි කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 4.8ක් බවට පත් කර ගන්න. ඒ සියයට 4.8 ඇතුළේ අපේ කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා යන අංශ වැදගත් වනවා. මේ ආර්ථිකය ඉහළට එසවීමේ -ආර්ථික වෘද්ධියේ- පදනම යොදන්න කාර්මීකරණය, කර්මාන්ත ඉතාම වැදගත් වනවා. එම සියයට 4.8ක් වූ ආර්ථික වර්ධනය ලබා ගන්නකොට කර්මාන්ත අංශයේ වර්ධනය සියයට 9.7 යි. අන්න ඒවා තමයි දත්ත. විපක්ෂයේ මන්ත්‍රීවරුන් ළඟ මේ දත්ත තිබෙනවා. මේවා ගැන කථා කරන්නේ නැති ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ආර්ථික වෘද්ධියක් ඇති වී තිබෙනවා. එය ඉදිරියටත් අඛණ්ඩව පවත්වාගෙන යෑමේ වුවමනාවෙන් අප මැදිහත් වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි උපාය මාර්ග නැහැ කියන කථාවක් කිව්වා. උපාය මාර්ග තමයි අප මේ තුළ සමස්තයක් විධියට ඉදිරිපත් කරලා තිබෙන්නේ. හැබැයි තේරුම් ගන්න ඕනෑ, උපාය මාර්ග කියන්නේ මොකක්ද කියලා. උපාය මාර්ග කිව්වාම, ඒක දකින්න පුළුවන්, විවිධ විධියට. සාමාන්‍යයෙන් strategy එකක් කියන්නේ මොකක්ද? යම්කිසි සැලසුමක්, ඉලක්කයක්, අරමුණක් ළඟා කර ගන්න, නතු කර ගන්න ගනු ලබන ක්‍රියාමාර්ග තමයි උපාය මාර්ග වෙන්නේ. උපාය මාර්ගය තීරණය වෙනවා අපේ ඉලක්කය මොකක්ද කියන එක මත. සමහර විට කෙනෙක් ව්‍යාපාරික දෘෂ්ටි කෝණයකින් දකිනවා නම් සියලු දේ රුපියල් ශතවලින්, ලාභයෙන් විතරයි පෙනෙන්නේ. එහෙම නම් එයාලාගේ උපාය මාර්ගය මුළුමනින්ම පදනම් වන්නේ ලාභය මත පමණයි. එයින් එහා කිසි දෙයක් උපාය මාර්ග විධියට ඔවුන් දකින්නේ නැහැ. යුද්ධයක් ගත්තොත්, උපාය මාර්ගය වන්නේ අවම උපකරණ භාවිත කර සතුරා නසන්නේ කොහොමද කියන එකයි. ඒ උපාය මාර්ග හැදෙන්නේ ප්‍රස්තුතයට අනුවයි. ඒ නිසා ඔබතුමන්ලා දන්නා පොදු උපාය මාර්ගය මේක අස්සට ගෙනෙන්න එපා. මේ උපාය මාර්ගය හදලා තිබෙන්නේ රටක් විධියට, සමස්තයක් විධියට අරගෙන. අප රටේ සමස්ත ජනතාවට වගකීමේ උපාය මාර්ග තමයි මේක ඇතුළේ තිබෙන්නේ. ඒ උපාය මාර්ගවලිනුත් සීමාසහිත කොටසක් විතරයි තිබෙන්නේ. තේරුම් ගත යුතු කාරණය ඒකයි. මොකක්ද, ඒ උපාය මාර්ගය? මෙතැනදී සීමාසහිත වන්නේ ආදායම් මූල්‍ය ක්‍රමෝපායයි. කොහොමද, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නේ? රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමේදී බදු පදනම වැඩි කර ගැනීම, රටේ ආර්ථිකය වර්ධනය කර ගැනීම, සාධාරණ විධියට බදු අය කර ගැනීම, බදු කාර්යක්ෂමතාව, බදු අනුකූලතාව, තාක්ෂණය කැඳවීම යනාදී කාරණා සියල්ල මේ ක්‍රමෝපායයන් ඇතුළේ තිබෙනවා. එතැන තමයි ක්‍රමෝපාය තිබෙන්නේ. එහෙම නැතිව මේක අස්සේ ලාභ උපයන ක්‍රමෝපාය නැහැ. හැබැයි, වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රමෝපාය මේ තුළ ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට කිව්වා ඇමෙරිකානු තීරු බදු පැනවීම් සම්බන්ධයෙන් අපි මැදිහත් වුණේ නැහැ කියලා. ඇත්තටම කියන්න කනගාටුයි, තොරතුරු නැතිව තමයි විපක්ෂය ඒ දේවල් ඉදිරිපත් කරන්නේ. මේ වන කොට ආසියානු කලාපයෙන් අපේ රට පමණයි ඇමෙරිකානු එක්සත් ජනපදයත් එක්ක මේ ද්විපාර්ශ්වීය ගනුදෙනුවේ බදු සහනය ලබා ගැනීමේ සාකච්ඡාවේ ඉන්නේ. දැනට ලැබෙන තොරතුරු අනුව අපට ඉතාම වාසිදායක තත්ත්වයකින් ඒ කටයුත්තත් අවසන් කර ගන්න පුළුවන් වෙයි කියලා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය ප්‍රාග්ධන වියදම් පිළිබඳ කාරණය සම්බන්ධයෙන් කියමින්, ප්‍රාග්ධන වියදම් දරා ඇත්තේ සියයට 10කට වඩා අඩුවෙන් යැයි කිව්වා. ඒක වැරැදියි. අපි මේ වන කොට සියයට 13.5ක් වියදම් කර තිබෙනවා, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරපු රුපියල් බිලියන 1,315ක මුදලින්. ඒ කියන්නේ රුපියල් බිලියන 178.6ක්. ඒ කියන්නේ, ප්‍රාග්ධන වියදම්වලින් සියයට 13.5ක් වියදම් කර තිබෙනවා. අපි දන්නවා අභියෝගයක් තිබෙන බව. හැබැයි, අපි ඉදිරියේ දී මේ කටයුත්ත වේගවත්ව අවසන් කරලා ප්‍රාග්ධන වියදම් උපරිමයෙන් වියදම් කරන්න සැලසුම් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ තත්ත්වයත් තේරුම් ගන්න ඕනෑ. අපි අර්බුදයක ඉඳලා ගොඩ යමින් තිබෙන තත්ත්වයක් තමයි මේ තිබෙන්නේ. ඒ වාගේම, අපට මුහුණ දෙන්න සිදු වුණු තත්ත්වය තමයි මේ තිබෙන්නේ. හැබැයි, මෙවැනි තත්ත්වයන් නැතිවත් අතීතයේදීත් ප්‍රාග්ධන වියදම් මේ විධියට සියයට සියයක් වියදම් කරලා නැහැ. පසුගිය වර්ෂයේදීත් වියදම් කරලා තිබෙන්නේ සියයට 65.4 යි. ඒ තත්ත්වයන්ට සාපේක්ෂව අපේ ආණ්ඩුව යටතේ මේ කටයුත්ත ඉදිරියට කරගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

ආණ්ඩුකරණයේ ස්ථායීකරණය තුළ අප කොච්චර දුරට ඉදිරියට ආවාද කියන කාරණාව විශ්ලේෂණය කර බලන්න ඕනෑ. අපි එය හැම පැත්තක්ම ස්ථායීකරණය කරලා තිබෙනවා. එකක් තමයි ආණ්ඩුවේ ආදායම් ස්ථායීකරණය. ඒකට අදාළ හොඳම දත්තය අපට ලැබිලා තිබෙනවා. ජුනි 26 වන කල් තිබෙන දත්ත අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේත්, සුරාබදු දෙපාර්තමේන්තුවේත්, ශ්‍රී ලංකා රේගුවේත් සියලු ඉලක්ක අබිබවා ගිහින් තිබෙනවා. මූල්‍ය ක්‍රමෝපාය සම්බන්ධ ප්‍රකාශනයකදී -මූල්‍ය ක්‍රමෝපායේදී- ඉතාම වැදගත් වන කාරණයක් තමයි, විචලතාව අඩු කර ගන්නා එක. අප විචලතාව අඩු කරගෙන තිබෙනවා විතරක් නොවෙයි, ඇත්තටම එය ඉක්මවා ගිහින් තිබෙනවා. අපි ඒ සියලු ඉලක්ක සෑම මාසයකම නිසි පරිදි ළඟා කරගෙන තිබෙනවා. අපට තිබෙන දත්ත අනුව පසුගිය වර්ෂය ගෙන බැලුවත් ඒ බව තහවුරු වෙනවා.

ආර්ථිකය සාමාන්‍ය තත්ත්වයේ තිබියදී එම වර්ෂයේ පළමුවැනි මාස හය ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකතු කරගෙන තිබෙන්නේ අපේක්ෂිත ආදායමෙන් සියයට 40යි. ඒක තමයි සාමාන්‍ය තත්ත්වය; තිබිලා තියෙන තත්ත්වය. හැබැයි, ඉතිරි සියයට 60 එකතු කරන්නේ දෙවැනි හය මාසයේදී. නමුත්, මේ වසරේ පළමු මාස හය අවසන් වන විට -ජුනි මාසයේ 26වැනි දා වන විට- අපට පුළුවන්කම ලැබී තිබෙනවා, අපේක්ෂිත ආදායමෙන් සියයට 47ක් එකතු කර ගන්න; සියයට 50 ආසන්නයට එන්න. මම හිතනවා, ඒක ඉතාම හොඳ ඉලක්කමක් කියලා. හොඳ ප්‍රවණතාවක් තමයි අප ඒ ලබාගෙන තිබෙන්නේ. ඒ වෙනුවෙන් අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ, ඒ සඳහා මැදිහත් වෙලා වැඩ කටයුතු කරන නිලධාරීන් ඇතුළු සියලුදෙනාට. ඒ සඳහා ආණ්ඩුව පැත්තෙන් අප ලබා දුන් සහාය සහ මැදිහත්වීමත් -විශේෂයෙන් එම කටයුතු සඳහා තාක්ෂණය, ඩිජිටල්කරණය කැඳවීම- වැදගත් කියලා මම හිතනවා. ඒ වාගේම, අපි යෝජනා කරමින් තිබෙන කාරණාවක් මීට පෙර කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකුත් සඳහන් කළා. එතුමා කිව්වේ, digitalization programme එක තුළට e-invoicing ක්‍රමවේදය ගෙන එන්නට ඕනෑ කියලායි. ඇත්තටම අපි දැනටමත් ඒ කටයුත්ත යෝජනා කරලායි තිබෙන්නේ. අපි කවුරුත් දන්නවා, ලංකාවේ අය කරන සියයට 18ක් වන VAT එක - එම වක්‍ර බද්ද - ආර්ථිකය වේගයෙන් ප්‍රසාරණය වෙලා ඉදිරියට යනකොට වැඩි ප්‍රමාණයක් බව. නමුත් අප අද මුහුණ දෙන තත්ත්වය හමුවේ අපට ඒ සියල්ල එක වර අඩු කරන්න බැහැ. අපි ආණ්ඩුකරණය පටලවා ගනියි කියලා සමහර විට විපක්ෂය ඒකට කැමැති වෙන්න පුළුවන්. අපි ක්‍රමිකව ආර්ථිකය ස්ථාවර කර ගත්තාට පස්සේ මේ බදු පහළට ගේන්න ඕනෑ. එලෙස බදු පහළට ගෙන එන්නට නම් VAT ගණනය වීම, එකතු කිරීම, ආණ්ඩුවට ප්‍රේෂණය කිරීම කියන යන්ත්‍රණය තාක්ෂණය තුළට ගේන්න ඕනෑ. එහි මූලික පියවරක් විධියට තෝරා ගත් ක්ෂේත්‍රවලට, විශේෂයෙන් ඉහළ වටිනාකමක්

[ගරු අනිල් ජයන්ත මහතා]

තිබෙන, ලියාපදිංචි පුද්ගලයන් සඳහා e-invoicing ක්‍රමය හඳුන්වා දෙන්න අපි මේ වනකොට වැඩ කටයුතු කරමින් ඉන්නවා. අපි ඒ සඳහා අදාළ ජාත්‍යන්තර සංවිධානවල තාක්ෂණික සහාය සහ උපදෙස් ද ලබා ගනිමින් ඉන්නවා.

Point of sale සහ e-invoicing ක්‍රමයට වෙළෙඳාමක්, අළෙවියක් සිද්ධ වුණු වහාම ඒ සියල්ල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සන්නිවේදනය වන ආකාරයට මේ e-invoicing ක්‍රමය වැඩිදියුණු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒකේ පළමුවැනි පියවර විධියට තමයි අපි අපනයනකරුවන් සම්බන්ධ කර ගන්නේ. අපි දන්නවා, SVAT සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙන බව. SVATවලදී යම් යම් තර්ක දෙපැත්තට, තුන්පැත්තට ඉදිරිපත් වෙනවා. තිබෙන තත්ත්වය යටතේ අප එය වඩාත් පාරදෘශ්‍යව කරන්න නම්, refund එක වේගයෙන් ලබා දෙන මට්ටමට e-invoicing ක්‍රමය ගෙනෙන්න ඕනෑ. ඒ සඳහාත් අදාළ වැඩ කටයුත්ත අපි සිදු කරමින් ඉන්නවා.

ඒ වාගේම, ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් අපි ජනාධිපති ලේකම් කාර්යාලයට අනුබද්ධව විශේෂ කාර්යාංශයක් පිහිටෙව්වා, ආදායම් ලබා ගන්නා ක්ෂේත්‍ර එකට එකතු කරලා, අතිරේක ලේකම්වරයෙකු හරහා. ආදායම් පරිපාලනය, reforms ඇති කිරීම, නවීකරණය යනාදිය එම කාර්යාංශය හරහා වේගවත් කිරීමේ වැඩ කටයුත්ත අපි සිදු කරමින් තිබෙනවා.

ඊළඟට මෙතැනදී මතු කරන්න ඕනෑ කාරණය තමයි, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ, ක්‍රමෝපාය ඇතුළේ අවධානය යොමු කර තිබෙන ක්ෂේත්‍ර මොනවාද කියන එක. ප්‍රධාන වශයෙන් එහි කොටස් දෙකයි. එකක් තමයි, මූල්‍ය ක්‍රමෝපාය. මූල්‍ය ක්‍රමෝපායට ආදායම් ලං කර ගැනීම, වියදම් කළමනාකරණය සහ ණය කළමනාකරණය ඇතුළත් වෙනවා. දෙවැනි එක තමයි, අවදානම් කළමනාකරණය කියන කොටස. එහිදී වගන්ති කිහිපයකට මම අවධානය යොමු කරන්නම්. එකක් තමයි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11වන වගන්තියේ 5*(a)* යටතේ තිබෙනවා, fiscal targets and policies. මේවා තමයි අපි මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ පිටු අංක 05හි, 1 වගුවෙහි ඉදිරිපත් කර තිබෙන්නේ. මෙතැනදී ප්‍රධාන වශයෙන් targets තුනක් අපිට වැදගත් වෙනවා. එකක් තමයි, ආදායම පිළිබඳ target එක. ඒක 2030 වනතුරුම සියයට 15 ඉක්ම වූ අගයක් ලබා ගන්නවා. වියදම් පිළිබඳව ඉලක්කය සහ අය වැය අවසානයේදී අය වැය පරතරය තීරණය වීමට බලපාන්නේ ප්‍රාථමික ශේෂයයි. මෙය දිහා අපි ඉතා සැලකිල්ලෙන්, අවබෝධයෙන් බැලුවොත් පෙනෙනවා, මේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඇතුළේ විශේෂයෙන් 2021 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට රාජ්‍ය ආදායම තිබුණේ සියයට 7.8ක වාගේ ප්‍රමාණයක් බව. නමුත්, 2024දී එය සියයට 13යි දශම ගණනකට වැඩි වුණා. 2025දී සියයට 15.1ක ඉලක්කයක් වාගේම 2026දී 15.2ක ඉලක්කයක් තිබෙනවා. මෙන්න මේ සියයට 15.2ක ඉලක්කයත් ප්‍රාථමික වියදම් පිළිබඳව තිබෙන සංඛ්‍යාවත් අතර වෙනස තමයි ප්‍රාථමික ශේෂය බවට පත් වෙන්නේ. සියයට 15.2න් 2026දී ප්‍රාථමික වියදම් පිළිබඳ ඉලක්කය සියයට 12.9යි. සියයට 15.2න් සියයට 12.9 අඩු කළාම තමයි සියයට 2.3ක ඉලක්කයට ළඟා වෙන්නේ. මේ ස්ථාවර කර ගැනීමේ පදනම, ඒ වාගේම රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 20 ඉක්මවා ඉදිරියට යන්න පුළුවන් නම් තමයි, වේගවත් ආර්ථික වර්ධනයක් ඉදිරියේදී අත්පත් කර ගන්න පුළුවන් වෙන්නේ. අපි එතැනට යන්න සැලසුම් කිරීම සඳහා අවශ්‍ය පදනම දමා ගැනීම තමයි මේ කරන්නේ. විශේෂයෙන්ම ආසියානු කලාපයේ ආණ්ඩුවක ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගණන් හදලා බැලුවාම, සියයට 20 ඉක්මවා තිබෙනවා. අපිට තිබෙන තත්ත්වය හමුවේ සියයට 7.8ක තිබුණු එක දැන් ක්‍රමිකව සියයට 15ට ගෙනැල්ලා සියයට 15 ස්ථාවර කර ගැනීම තමයි අපේ ක්‍රමෝපාය වන්නේ. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. වියදම් කළමනාකරණයත් ඒක ඇතුළේ නිසි පරිදි තිබෙනවා.

ඊළඟට, Section 5*(b)* යටතේ තිබෙනවා, proposed timeframe for the reduction of public debt. ණය කළමනාකරණයේ රාමුවත් මේක ඇතුළේ ඉතා පැහැදිලිව පෙන්නුම් කරමින් තිබෙනවා. මේකට ආනුෂංගික වන තවත් වාර්තාවක්, රාජ්‍ය ණය ගැනීම පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් වෙනවා. එහිදී විශේෂයෙන් අපි අවධානය යොමු කරලා බලන්න ඕනෑ, මේ ණය ගැනීමේ සීමාව අඩු වෙන්නේ ප්‍රාථමික ශේෂය ස්ථාවරව පවත්වාගෙන ගියොත් පමණයි. ඒ අනුව තමයි, 2030 වෙනකොට ප්‍රාථමික ශේෂය සියයට 2.4 සීමාවට ගෙන එන්නේ. ඒ වනකොට අපි අපේක්ෂා කරනවා, දැනට තිබෙන පොලී ප්‍රමාණයත් ක්‍රමිකව අඩු කර ගැනීමෙන් අය වැය පරතරය -space එක- අඩු කර ගන්න. අය වැය පරතරය අඩු කර ගන්නා විට ණය ගැනීමේ අවශ්‍යතාවත් අඩු වෙනවා.

ඒ වාගේම, ණය කළමනාකරණය කිරීමේ කාරණයේදී අපි දැන් වැඩසටහනක ඉන්නවා. එහිදී දුන් එක් නිර්ණායකයක් තමයි, 2032 වෙනකොට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95ක ප්‍රතිශතයක් ලබා ගන්නට ඕනෑ කියන එක. 2032දී තමයි සියයට 95ක ඉලක්කයට යන්න ඕනෑ. ඒ අනුව ප්‍රවණතාව පෙන්වන්නට ඕනෑ, අපි සියයට 95ට යනවාද කියලා. ඇයි? අපි ආණ්ඩුව ලබා ගන්න කොට සියයට 128ක විශාල ණය බරක් තිබුණේ. අපි වාගේ රාජ්‍යයකට දරන්න බැරි ණය බරක්. ඒක ක්‍රමිකව අඩු වෙලා දැන් සියයට 96ක වාගේ ප්‍රමාණයකට ඇවිල්ලා තිබෙනවා. දැන් පෙනෙනවා, සියයට 95ක ඉලක්කයට යැම ගැටලු සහගත නැහැ කියලා. මේ ණය පිළිබඳව තිබෙන ප්‍රශ්නවලදී අපි මතු කළා, Debt sustainability Analysis එක පිළිබඳව නැවත අපි විමර්ශනය කිරීම, සාකච්ඡා කිරීම් කළ යුතුයි කියන එක. ඒක කරන්නේ කොහොමද, කවදාද, මොන විධියටද කියන ඒවා වෙනස් වෙන්න පුළුවන්. ඒක එකවරම ආණ්ඩුව ගත්ත ගමන් රණ්ඩු කරලා වෙනස් කර ගන්නවාට වඩා හොඳම දේ තමයි අපේ පාරදෘශ්‍යභාවය පෙන්වමින්, කැපවීමෙන්, ස්ථාවර කරමින් අපේ performance අනුව ඒ වෙනස් කිරීම් අපි ඉදිරියේදී කර ගැනීම. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉලක්කය තිබුණේ සියයට 95, ඒගොල්ලන්ගේ නවතම පුරෝකථනයට අනුව දැන් කියනවා, අපේ රටේ ණය ප්‍රමාණය 2032 වන විට සියයට 90ට ගේන්න පුළුවන් කියලා. එහෙම නම් අපි සමාජයේ අනවශ්‍ය භයක්, බිල්ලෙක් මැවීම හොඳ නැහැ. මේ සමාජයේ අපි යන ගමන අඩාළ කිරීමට තමයි ඒක දායක වෙන්නේ. සියයට 90ට ගේන්න පුළුවන් කියලා ඒගොල්ලන්ම කියනවා. ඒ විතරක් නොවෙයි, 2040 වෙනකොට මේක අපි සියයට 60ක ඉලක්කයට ගේන්නත් සැලසුම් සකස් කරමින් තිබෙනවා. ඒ නිසා ණය පිළිබඳව ඇති කර ගන්නා බිය පදනම් විරහිතයි. මෙය ක්‍රමෝපායිකව අපි ඉදිරියට අරගෙන යමින් තිබෙනවා. ඒ වාගේම, බොහෝදුරට වියදම් කළමනාකරණයේදී සිදු වන දේ තමයි වියදම් කප්පාදු කිරීම, අත්‍යවශ්‍ය වියදම් නොකිරීම, ඒ වාගේම ඒවා ඇතුළේ වංචාව, දූෂණය හා නාස්තිය තිබීම. අපි මෙන්න මේ කාරණා අයින් කරලා, වියදම් කළමනාකරණය කරලා තිබෙනවා. එක පැත්තකින්, අවශ්‍යතාවන් ප්‍රමුඛතාගත කරලා, විශේෂයෙන් යටිතල පහසුකම් දියුණු කිරීමට වියදම් කර තිබෙනවා. අනෙක් පැත්තෙන්, මේ ක්‍රියාවලිය ඉදිරියට යනකොට සාමාන්‍ය ජනතාව විශාල පිරිසක් පීඩනයට පත් වෙනවා. ඒ පීඩනයට පත් වන ජනතාව බේරා ගැනීම සඳහා ඉලක්කගත සමාජ ප්‍රතිලාභ -දැනටමත් තිබෙනවා. ඊට අමතරව අලුතිනුත් ලබා දෙන ඉලක්කගත සමාජ ප්‍රතිලාභ- වෙනුවෙන් සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරලා

තිබෙනවා. කියන්න ඉතාම සන්තෝෂයි, මෙන්න මේ සමාජ ප්‍රතිලාභ වියදම් කිරීම අප විසින් ඉදිරිපත් කරන ලද ඉලක්ක මැයි මාසය වනකොට අභිභවා යමින් තිබූ බව. 2024 වර්ෂය අවසාන වනකොටවත් මේ කාරණය ඉෂ්ට කර ගන්න අපට බැරි වුණා. නමුත් දැන් 2025 මැයි මාසය වනකොට අපි මේ ඉලක්ක සියල්ල අභිභවා ගිහින් තිබෙනවා.

මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අවසාන කොටස, මේ අවදානම කළමනාකරණය කරන්නේ කොහොමද කියන එකයි. ඒ පිළිබඳව තිබෙන ප්‍රකාශ මොනවාද? මෙහිදී අවදානම පිළිබඳව අපට රාමුවක් ඉදිරිපත් කරලා තිබෙනවා, අවබෝධය සඳහා. එහිදී ප්‍රධාන විචල්‍යයන් 4ක් හඳුනාගෙන තිබෙනවා, සාර්ව ආර්ථික විචල්‍යයන්, ස්වාභාවික විපත්, රාජ්‍යය සතු ව්‍යවසායන්, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයන් යනුවෙන්. මේ සියලු තත්ත්වයන්ට බලපෑ හැකි තත්ත්වයන් විශ්ලේෂණය කරලා මේ ප්‍රකාශයේ ඉදිරිපත් කර තිබෙනවා, එවැනි විචලතාවන් මතු වෙනවා නම් ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ ඒවාට මුහුණ දෙන්නේ කොහොමද කියලා. ඒ අනුව සමස්තයක් වශයෙන් ගත්තාම, ඉතිහාසයේ පළමුවැනි වතාවට ඉදිරිපත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තමයි අද මේ ඉදිරිපත් කළේ. මම හිතනවා, මේ රට වැටිලා තිබෙන අර්බුදයෙන් ගොඩ ගෙන සැබෑ ලෙසම "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ඇති කිරීමේ ගමන් මාර්ගය දෙසට යනකොට ආයෝජන කැඳවීමට ඉතාම ස්ථාවර අඩිතාලමක් දැමීම මේ තුළින් සිදු වෙනවා කියලා. මේ උපාය මාර්ග විශ්ලේෂණය කරමින් ඉදිරියට වැඩ කටයුතු කරමු කියා යෝජනා කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

සියලුදෙනාට බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 4.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.45ට, අද දින සභා සම්මතිය අනුව, 2025 ජූලි 08වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 4.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 4.45க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2025 யூலை 08, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 4.30 p.m., THE HON.PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 4.45p.m. until 9.30 a.m. on Tuesday, 08th July, 2025, pursuant to the Resolution of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts
Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.